මම පළතුරු අතරින් ස්ට්‍රෝබෙරි වලට ගොඩක් කැමතියි.
· 투안 씨는 제 친구 중에서 키가 제일 커요.
තුඅන් මහතා මගේ යහළුවන් අතරින් උසම කෙනා.

직접 කෙළින්ම (තමා විසින්ම සහ පෞද්ගලිකව යන අර්ථයන් ද ඇත)
· 환전을 하려면 직접 은행에 가야 해요.
මුදල් මාරු කරන්න නම් කෙළින්ම බැංකුවටම යන්න ඕනේ.
· 저는 음식을 사 먹지 않고 직접 요리해서 먹어요.
මම කෑම මිලදී ගන්නේ නැතුව කෙළින්ම හදලා කනවා.



කොන්වූ හා තුඅන් ලෙස දෙබස නැවත කියවන්න. හොඳින් සවන් දී අනුගමනය කළා ද? එසේනම් පහත ප්‍රශ්නවට පිළිතුරු සපයන්න.

1. 두 사람은 지금 어디에 있어요? දෙදෙනා දැන් කොහේද යන්නේ?
2. 투안 씨가 한국에서 제일 좋아하는 음식은 뭐예요?
තුඅන් කොරියානු කෑම අතරින් වඩාත්ම කැමති කෑම ජාතිය කුමක්ද?

정답 1. 식당 2. 삼겹살

어휘 2 වචන මාලාව 2 재료 및 조리법 අමුද්‍රව්‍ය හා සාදන අන්දම



කෑම පිසීමට ගන්න අමුද්‍රව්‍ය හා ආහාර පිසින අන්දම හා සම්බන්ධ ප්‍රකාශනයන් මොනවා දැයි දැනගනිමු ද?





ඉහත ඉගෙන ගත් වචන නැවත මතක් කරමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයා බලමු ද?



정답 ① ㉠ ⓓ ② ㉢ ⓒ ③ ㉣ ⓑ ④ ㉡ ⓐ

문법 2 සංවාදය 2 -아서/어서



ක්‍රියාපදයකට සම්බන්ධ වී මුල් වාක්‍යයේ ක්‍රියාකාරකම පිටුපස වාක්‍යයෙහි ක්‍රියාකාරකමට වඩා කාලානුකූලව කලින් සිදුවූ බව අදහස් කිරීමේදී භාවිතා වේ.

ㅏ, ㅗ → -아서	ㅓ, ㅜ, ㅣ ආදී → -어서	하다 → 해서
가다 → 가서 만나다 → 만나서	찍다 → 찍어서 내리다 → 내려서	하다 → 해서 요리하다 → 요리해서

- 가: 오늘 저녁은 밖에 **나가서** 먹을까요? අද රෑ කෑම එළියට ගිහිල්ලා කමුද?
  나: 아니요, 그냥 집에서 먹어요. නැහැ, නිකං ගෙදරින් කමු.
- 가: 가족들에게 선물을 보냈어요? පවුලේ අයට තෑගි යැව්වද?
  나: 네, 옷을 **사서** 보냈어요. ඔව්, ඇඳුම් මිලට ගෙන යැව්වා.



비교해 보세요 සංසන්දනය කර බලන්න

✓ '-아서/어서' සහ '-고'

'-아서/어서' හා '-고' ක්‍රියාවන් සිදුවන අනුපිළිවෙල පෙන්වයි. '-아서/어서' ක්‍රියාවන් දෙක එකිනෙකට සමීප සම්බන්ධතාවක් ඇති විට යොදා ගන්නා අතර පළමු වාක්‍යයේ ක්‍රියාවේ අකර්මක සහ සකර්මක සියල්ලම අඩංගු විය හැකිය. නමුත් '-고' ක්‍රියාවන් දෙක සිදුවූ අනුපිළිවෙල පමණක් දක්වන අතර ක්‍රියාවන් දෙකේ සම්භන්ධයක් ඇතිවිට භාවිතා නොකරයි. එමෙන්ම පළමු වාක්‍යයේ සකර්මක ක්‍රියාපද බහුලව භාවිතා වේ.

- 밥을 먹어서 이를 닦아요.(X) 밥을 **먹고** 이를 닦아요.(O)
- 책을 **사서** 읽었어요.(O) 책을 사고 읽었어요.(X)



'-아서/어서' හොඳින් අවබෝධ වුනාද? එසේ නම් ඉහත ව්‍යාකරණයන් යොදා දෙබස සම්පූර්ණ කරන්න.

2. 그림을 보고 '-아서/어서'를 사용해서 대화를 완성하세요.
පින්තූර දෙස බලා '-아서/어서' භාවිතා කර දෙබස සම්පූර්ණ කරන්න.

1) 
가: 양파는 어떻게 해요? ලූනු වලට මොකද කරන්නේ?
나: ________________ 넣으세요.

2)
가: 이 음식은 어떻게 먹어요? මේ කෑම ජාතිය කන්නේ කොහොමද?
나: ________________ 먹으면 돼요.

정답 1) 볶아서 2) 끓여서



유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

기가 막히게 맛있어요. හොඳටම රසයි.

가: 불고기 맛이 어때요? බුල්ගෝගි රස ද?
나: **기가 막히게 맛있어요.** හොඳටම රසයි.



활동 ක්‍රියාකාරකම්

어제 저녁에 무슨 음식을 먹었어요? 〈보기〉처럼 이야기해 보세요.

ඊයේ රෑට මොනවද කෑවේ? උදාහරණයේ දැක්වෙන ආකාරයට කතා කර බලන්න.



〈උදාහරණ〉





가: 모니카 씨, 어제 저녁에 뭐 먹었어요?
මොනිකා මහත්මිය ඊයේ රෑට මොනවද කෑවේ?


나: 집에서 고기를 구워서 먹었어요.
ගෙදරදී බුල්ගෝගි කනවා.

가: 맛있었어요?
රසයි ද?

가: 네, 정말 맛있었어요.
ඔව්. ඇත්තටම රසයි.

〈재료〉
〈අමුද්‍රව්‍ය〉






〈조리법〉
〈සාදන ආකාරය〉












특별한 날 먹는 음식

විශේෂ දිනවලදී ආහාරයට ගන්නා කෑමජාති



여름철 중 가장 더운 때를 '복날'이라고 하는데 한국 사람들은 이때 삼계탕을 먹습니다. 여름에는 땀을 많이 흘려서 기운이 없는데 인삼, 밤, 마늘 같은 좋은 재료가 많이 들어간 삼계탕을 먹으면 힘이 나기 때문입니다. 여러분도 힘이 없는 여름 날 삼계탕을 드셔 보세요.

ගිම්හාන කාලයේ වඩාත් රස්නේ දිනය 복날 ලෙස හඳුන්වයි. කොරියානු ජාතිකයන් මෙම දිනයට සම්ගෙත්ථං ආහාරයට ගන්නවා. ගිම්හාන කාලයට වැඩිපුර දහඩිය දමන නිසා තෙහෙට්ටුවට පත්වෙන විට ඉන්සම්, සුදුලූනු, වැනි හොඳ අමුද්‍රව්‍ය ගොඩක් අඩංගු වන සම්ගෙත්ථං ආහාරයට ගතහොත් ඇගට පණක් ලැබෙනවා. ඔබත් ඇගට පණක් නැති ගිම්හාන දිනයක සම්ගෙත්ථං ආහාරයට ගෙන බලන්න.



한국 사람들은 생일에 무슨 음식을 먹을까요? 케이크도 먹고 맛있는 음식도 많이 먹습니다. 그런데 생일날 꼭 빠지지 않는 음식이 있습니다. 그것은 바로 미역국입니다. 미역국은 산모가 아기를 낳은 후 먹는 음식입니다. 그래서 생일에 미역국을 먹는 것은 낳아 주신 어머니의 은혜를 기억하고 감사한다는 의미가 있습니다.

කොරියානු ජාතිකයන් උපන්දිනයට කුමන ආහාර වර්ග ගන්නවාද? කේකුත් ආහාරයට ගන්න අතර වෙනත් රසවත් කෑමත් ආහාරයට ගන්නවා. නමුත් උපන්දිනයට අනිවාර්යයෙන්ම ආහාරයට ගන්න කෑම ජාතියක් තිබෙනවා. ඒ මියෝක් කුක්. මියෝක් කුක් මවක් දරුවෙකු බිහිකළ පසු කෑමට ගන්න ආහාරයයි, ඒ නිසා උපන්දිනයට මියෝක්කුක් ආහාරයට ගැනීම අපව බිහිකළ මවගේ සෙනෙහස සිහිකර ඒ වෙනුවෙන් ස්තුතිවන්ත වීම අර්ථවත් වෙයි.

함께 먹는 음식 එකට ගන්නා ආහාර

한국에서는 밥과 국을 제외하고는 반찬이나 찌개와 같은 음식은 식탁 위에 놓고 밥을 먹는 사람들과 같이 먹습니다. 식탁 위에서 고기를 구워 먹거나 찌개를 끓여 먹을 때에는 각자의 접시에 덜어서 먹으면 됩니다.

කොරියවේදී නම් බත් සහ කුක් (සුප්) හැර අනෙකුත් කෑම ජාති කෑම මේසය මත තබා බෙදාහදාගෙන ආහාරයට ගන්නවා. කෑම මේසය මත මස් පුළුස්සා කෑම හෝ ඉස්ටු රත්කර කන විට තම තමන්ගේ පිඟානට දමාගෙන කනවා.





EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK



අංක 1 සිට 2 දක්වා දැක්වෙන්නේ පින්තූරය දෙස බලා එම පින්තූරයට අදාල වාක්‍ය තෝරන ප්‍රශ්න වේ. හොඳින් සවන් දී ගැළපෙන පින්තූරය තෝරන්න.

[1~2] 다음 그림을 보고 알맞은 대답을 고르십시오.
පහත පින්තූර දෙස බලා ගැළපෙන පිළිතුර තෝරන්න.

Track 102

1. 이것은 무엇입니까? මේක මොකක්ද?

① ② ③ ④

2. 지금 무엇을 합니까? දැන් මොකද කරන්නේ?

① ② ③ ④



පහත දැක්වෙන්නේ දෙබසට සවන්දී ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ. දෙබසට සවන්දීමට පෙර උදාහරණය එක්වරක් හොඳින් කියවා බලන්න.

[3~5] 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오.
කතාවට සවන්දී ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

3. 이 사람은 왜 한국 음식을 좋아합니까? මෙම පුද්ගලයා ඇයි කොරියානු කෑමවලට කැමති?

① 한국 음식은 시고 답니다. ② 한국 음식은 맵지 않습니다.
③ 한국 음식은 맵지만 맛있습니다. ④ 한국 음식은 싱겁지만 맛있습니다.

4. 무슨 음식에 대한 설명입니까? කුමන කෑම වර්ගයක් පිළිබඳ හැඳින්වීමක් ද?

① 불고기 ② 비빔밥
③ 김치찌개 ④ 된장찌개

5. 이 사람이 여름에 먹는 음식이 아닌 것은 무엇입니까?
මෙම පුද්ගලයා ගිම්හාන කාලයට කන්නේ නැති කෑම ජාතිය කුමක්ද?

① 냉면 ② 삼계탕
③ 삼겹살 ④ 콩국수



듣기 대본 ශ්‍රවණ පිටපත

1. ① 남: 양파입니다. ලූනු.
   ② 남: 당근입니다. කැරට්.
   ③ 남: 감자입니다. අර්තාපල්.
   ④ 남: 생선입니다. මාළු.
2. ① 여: 생선을 굽습니다. මාළු පුච්චනවා.
   ② 여: 생선을 튀깁니다. මාළු බදිනවා.
   ③ 여: 생선을 삶습니다. මාළු තම්බනවා.
   ④ 여: 생선을 볶습니다. මාළු ගැඹුරු තෙලේ බදිනවා.
3. 남: 수피카 씨는 한국 음식을 좋아해요? සුපිකා මහත්මිය කොරියානු කෑමවලට කැමති ද?
   여: 네, 정말 좋아해요. 한국 음식은 맵지만 맛있어요.
   ඔව්. ගොඩක් කැමතියි. කොරියානු කෑම සැර වුනත් රසයි.
4. 여: 김치찌개는 어떻게 만들어요? කිම්චි සුප් හදන්නේ කොහොමද?
   남: 먼저 김치를 볶으세요. 그리고 물을 넣고 끓이면 돼요.
   මුලින්ම කිම්චි බදින්න. ඊට පසුව වතුර දාලා තැම්බුවහම හරි.
5. 남: 수진 씨는 요즘처럼 더운 여름에 보통 뭘 먹어요?
   සුජින් මහත්මිය මේවාගේ රස්නේ දිනවලට මොනවගේ කෑමද කන්නේ?
   여: 저는 시원한 냉면이나 콩국수를 자주 먹어요. 그리고 힘이 없을 때는 삼계탕도 먹어요.
   මම සිතල නෙන්මියෝන් හෝ කොංකුක්සු නිතර ආහාරයට ගන්නවා. ඒවගේම ඇඟට පණක් නැතිවුනහම සම්ගෙත්තං ආහාරයට ගන්නවා.

정답 1. ② 2. ① 3. ③ 4. ③ 5. ③

확장 연습 වැඩිදුර අභ්‍යාස

L-32

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු තෝරන්න.

   다음 중 들은 내용과 같은 것은 무엇입니까?
   පහත දැක්වෙන පිළිතුරු අතරින් අන්තර්ගතයට සමාන පිළිතුර කුමක්ද?

   ① 여름에는 삼계탕이 인기가 없습니다.
   ② 두 사람은 오늘 시원한 음식을 먹을 겁니다.
   ③ 복날에는 삼계탕을 먹는 사람들이 많습니다.
   ④ 삼계탕은 뜨겁지 않아서 사람들이 좋아합니다.

확장 연습 듣기 대본 වැඩිදුර අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 남: 오늘이 복날이라서 삼계탕을 먹으러 온 사람이 많네요. 좀 기다려야겠어요.
   අද පොක්නල් (රස්නේ වැඩිම දවස) නිසා සම්ගෙත්ථං කෑමට ආපු මිනිස්සු ගොඩක් ඉන්නවානේ. ටික වේලාවක් රැඳී ඉන්න වෙයි.
   여: 이렇게 더운 날씨에 왜 뜨거운 음식을 먹어요?
   මෙවාගේ රස්නෙ කාලගුණයක ඇයි උණුසුම් ආහාර කෑමට ගන්නේ?
   남: 여름에 뜨거운 음식을 먹으면 땀을 더 많이 흘리잖아요. 땀이 나면 체온이 낮아져서 오히려 시원해지거든요.
   ගිම්හානයේදී උණුසුම් ආහාර ගන්නා විට බොහෝ සෙයින් දහඩිය දමනවා. දහඩිය දැමූ විට ශරීර උෂ්ණත්වය පහළ ගොස් සිසිල් වෙන නිසයි.

정답 1. ③



EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සහ 2 පින්තූරය දෙස බලා ගැළපෙන වාක්‍ය තෝරන ප්‍රශ්න වේ. අංක 3 අන්තර්ගතය කියවා ඒ හා ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ. ප්‍රශ්න හොඳින් කියවා ගැළපෙන පිළිතුර තෝරන්න.

[1~2] 다음 그림을 보고 맞는 문장을 고르십시오. පහත පින්තූර බලා ගැළපෙන වාක්‍යය තෝරන්න.

1.



① 식탁이 큽니다. ② 컵이 필요합니다.
③ 그릇이 많습니다. ④ 음식이 뜨겁습니다.

2.



① 당근을 볶고 있습니다. ② 계란을 삶고 있습니다.
③ 감자를 튀기고 있습니다. ④ 라면을 끓이고 있습니다.

3. 다음 질문에 답하십시오. පහත ගැටළුවට පිළිතුරු සපයන්න.

한국 사람들은 식사를 할 때 밥과 함께 국이나 찌개, 그리고 여러 가지 반찬을 같이 먹어요. 이때 밥하고 국, 찌개는 숟가락으로 먹고 반찬은 젓가락으로 먹어요.

කොරියානු ජාතිකයන් බත් ආහාරයට ගන්නාවිට ඒ සමඟ සුප් වර්ග හෝ ඉස්ටු වර්ග හා තවත් බොහෝ අතුරු කෑම වර්ග ආහාරයට ගනී. එවිට බත්, සුප් හා ඉස්ටු හැන්දකින් ආහාරයට ගන්නා අතර අතුරු කෑම වර්ග ලී කූරු වලින් ආහාරයට ගනී.

위 글의 내용과 같은 것을 고르십시오. ඉහත වාක්‍ය හා ගැළපෙන යෙදුම් තෝරන්න.

① 한국 사람들은 보통 빵과 우유를 먹어요.
② 한국 사람들은 국을 먹을 때 숟가락을 사용하지 않아요.
③ 한국 사람들은 식사할 때 숟가락과 젓가락을 모두 사용해요.
④ 한국 사람들은 숟가락과 젓가락을 한 손에 같이 잡고 밥을 먹어요.



පහත දැක්වෙන්නේ කෑම සාදන ආකාරය පිළිබඳ ඡේදයකි. ඉගෙනගත් දේ සිහි කරමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

[4~5] 다음 글을 읽고 물음에 답하십시오. පහත ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

〈재료 අමුද්‍රව්‍ය〉
김치 300g, 돼지고기 100g, 양파 1개, 파 조금, 식용유 조금
කිම්චි ග්‍රෑම් 300, ඌරු මස් ග්‍රෑම් 100, ලූනු 1 ක ගෙඩියක්, ලීක්ස් ටිකක්, ආහාර පිසින තෙල්

〈조리 방법 සාදන ආකාරය〉
1. 김치하고 돼지고기를 적당하게 써세요. කිම්චි හා ඌරු මස් ඇති පමණින් කපාගන්න.
2. 김치하고 돼지고기를 냄비에 넣고 식용유를 조금 넣어서 볶으세요.
කිම්චි හා ඌරු මස් භාජනයකට දමා ආහාර පිසින තෙල් ටිකක් දමා බැදගන්න.
3. 냄비에 물을 넣고 끓이세요. භාජනයට වතුර දමා රත් කරන්න.
4. 물이 끓으면 양파와 파를 넣으세요. වතුර හොඳින් නැටූ පසු ලූනු හා ලීක්ස් දමන්න.



4. 이 음식에 들어가지 않는 재료는 무엇입니까? මෙම කෑමට නොදැමූ අමුද්‍රව්‍ය කුමක්ද?

① 
② 
③ 
④ 

5. 읽은 내용과 같은 것을 고르십시오. කියවූ ඡේදයට ගැළපෙන ප්‍රකාශනය තෝරන්න.

① 물과 김치를 같이 넣고 끓여야 돼요.
② 김치하고 돼지고기는 따로 볶아야 돼요.
③ 양파하고 파는 돼지고기하고 같이 넣어요.
④ 김치하고 돼지고기를 볶은 후에 물을 넣으면 돼요.

정답 1. ④ 2. ① 3. ③ 4. ③ 5. ④

확장 연습 වැඩිදුර අභ්‍යාස

[1~2] 다음 글을 읽고 무엇에 대한 글인지 고르십시오.
පහත දැක්වෙන ඡේදය කියවා කුමක් පිළිබඳ සඳහන් වී ඇති ඡේදයක්ද යන්න තෝරන්න.

1. 한국 사람들은 계절마다 즐겨 먹는 음식이 있습니다. 여름에는 차갑고 시원한 냉면, 콩국수, 팥빙수 등을 많이 먹습니다. 겨울에는 뜨거운 국이나 따뜻한 팥죽, 군고구마, 호떡 등을 자주 먹습니다.

කොරියානු ජාතිකයන් සෘතුවක් පාසා අනුභව කරන විශේෂ ආහාර තිබේ. ගිම්හානයේදී නෙංමියොන් (සිසිල් නූඩ්ලස්), කොංකුක්සු (සෝයා නූඩ්ලස්) , පත්පිංසු (සූරපු අයිස් වලින් සාදන අතුරුපස) වැනි සීතල කෑම වර්ග ආහාරයට ගනියි. ශීත සෘතුවේදී බොහෝ විට උණුසුම් රතු බෝංචි සුප්, පුළුස්සපු පැණි අර්තාපල් සහ හොත්තොක් වැනි කෑම වර්ග නිතරම ආහාරයට ගනියි.

① 음식 재료 ② 계절 음식 ③ 조리 도구 ④ 조리 시기

2. 한국 사람들은 여름에 더위를 이기기 위해 삼계탕을 먹습니다. 삼계탕을 만드는 방법은 어렵지 않습니다. 먼저 냄비에 물을 붓고 닭과 마늘, 대추, 인삼 등을 넣은 후 오래 끓이면 됩니다.

කොරියානු ජාතිකයන් ගිම්හානයේදී රස්නෙට ඔරොත්තු දීමට සම්ගෙත්ථං ආහාරයට ගනියි. සම්ගෙත්ථං සෑදීම අපහසු නොවේ. පළමුව බඳුනකට වතුර වක්කර කුකුල් මස්, සුදු ළූනු, තේවු සහ ජින්සෙන්ග් වැනි කොරියානු ඖෂධ පැළෑටි එක් කර වැඩි වේලාවක් රත් කරන්න.

① 계절 소개 ② 날씨 정보 ③ 음식 주문 ④ 조리 방법

정답 1. ② 2. ④



송편을 만드는 체험도 할 수 있어요


සොංපෙයාන් හදන අත්දැකීමක් ලබා ගන්න පුළුවන්

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

▫ අධ්‍යයන අරමුණු	අනුමාන කිරීම, අනාගත සැලැස්මක් ගැන කතා කිරීම
▫ ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස්	-겠-, -는
▫ වචන භාවිතය සඳහා උපදෙස්	අලුත් අවුරුද්ද, චූසොක්
▫ සංස්කෘතික තොරතුරු	කොරියාවේ නිවාඩු



대화 1 සංවාදය 1





පහත දැක්වෙන්නේ රිහන් මහතා හා ජිහුන් මහතා අතර සිදු වන සංවාදයයි. මුලින්ම දෙබසට දෙවරක් සවන් දී ඉන්පසුව අනුගමනය කරමින් කියවන්න.

리한 지훈 씨, 설날에 고향에 잘 다녀왔어요?
ජිහුන් මහතා, අලුත් අවුරුද්දේ ගමට පරිස්සමෙන් ගිහින් ආවා ද?

지훈 네, 오랜만에 가족들을 봐서 정말 좋았어요. 리한 씨는 설날에 뭐 했어요?
ඔව්, ගොඩක් කාලයකින් පවුලේ අයව දැක්ක නිසා ඇත්තටම සතුටුයි. රිහන් මහත්මා අලුත් අවුරුද්දට මොකද කළේ?

리한 한국 친구 집에 가서 떡국도 먹고 윷놀이도 했어요.
කොරියානු යහළුවෙකුගේ ගෙදර ගිහින් තොක්කුක් කාලා යුන්නොරිත් සෙල්ලම් කළා.

지훈 재미있었겠어요. විනෝදජනක වෙන්න ඇති.


리한 네, 정말 재미있었어요. 그리고 친구 부모님께 세배도 하고 세뱃돈도 받았어요.
ඔව්, ඇත්තට ම විනෝදජනක වුණා. ඒ වගේම යහළුවාගේ දෙමාපියන්ට ආචාරත් කරලා අවුරුදු තෑගි මුදලුත් ලැබුණා.

지훈 우와, 정말 특별한 경험을 했네요. 정말 좋았겠어요.
නියමයි, ඇත්තටම විශේෂ වූ අත්දැකීමක්නේ. ඇත්තට ම සතුටුවෙන්න ඇති.

오랜만 ගොඩ කාලයකින්

යම් සිදුවීමක් සිදුවී නැවත ඒ සිදුවීම ඇති වීම දක්වා කාලය/ බොහෝ කලක් ගත වීමෙන් පසු

- 오랜만에 초등학교 때 친구를 만났어요.
  ගොඩක් කාලයකින් ප්‍රාථමික පාසලේ යහළුවෙක්ව මුණ ගැසුණා.
- 가: 투안 씨, 오랜만이에요.
  තුඅන් මහත්මා, ගොඩ කාලයකින්
  나: 네, 2년 만에 뵙네요.
  ඔව්, අවුරුදු 2 කින් වගේ මේ හමුවුවෙන්නේ.



경험 අත්දැකීම

- 이 회사에서 일한 것은 저에게 좋은 경험이었어요.
  මේ සමාගමේ සේවය කරපු එක මට හොඳ අත්දැකීමක් වුණා.
- 여행을 하면 여러 가지 좋은 경험을 할 수 있어요.
  සංචාරය කරන්නේ නම් විවිධ වූ හොඳ අත්දැකීම් ලබා ගන්න පුළුවන්.



හොඳින් සවන් දී අනුගමනය කළා ද? එසේ නම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 지훈 씨는 설날에 어디에 갔어요? ජිහුන් මහත්මා අලුත් අවුරුද්දේ කෝහේද ගියේ?
2. 리한 씨는 설날에 무엇을 했어요? රිහන් මහත්මා අලුත් අවුරුද්දේ කෝහේද ගියේ?

정답 1. 고향 2. 한국 친구 집에 가서 떡국도 먹고 윷놀이도 했어요.



어휘 1 වචන මාලාව 1 설날 අලුත් අවුරුද්ද



පහත දැක්වෙන්නේ අලුත් අවුරුද්ද හා සම්බන්ධ විවිධ ප්‍රකාශ වේ. කුමන ප්‍රකාශ තිබේදැයි දැන ගනිමු ද?

			
한복을 입다 හන්බොක් අඳිනවා	세배하다 අලුත් අවුරුදු ආචාර කරනවා	덕담을 하다 ආශිර්වාද කරනවා	덕담을 듣다 ආශිර්වාද අසනවා
			
세뱃돈을 주다 අලුත් අවුරුදු තෑගි මුදල් දෙනවා	세뱃돈을 받다 අලුත් අවුරුදු තෑගි මුදල් ලබනවා	떡국을 먹다 තොක්කුක් කනවා	윷놀이를 하다 යුත්නොරි සෙල්ලම් කරනවා



ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ගැටළුව විසඳීමට උත්සාහ කරන්න.

1. 그림을 보고 알맞은 말을 연결하세요. පින්තූරය බලා ගැළපෙන වචනය යා කරන්න.

① •　　　　• ㉠ 윷놀이를 하다

② •　　　　• ㉡ 세배하다

③ •　　　　• ㉢ 한복을 입다

④ •　　　　• ㉣ 세뱃돈을 받다

⑤ •　　　　• ㉤ 떡국을 먹다

정답 ① ㉢ ② ㉣ ③ ㉤ ④ ㉡ ⑤ ㉠


문법 1 සංවාදය 1 -겠-



G33-1

ක්‍රියා පදයක් සමඟ හෝ විශේෂණ පදයක් සමඟ එකතු කර කථාවට පාදක වන අවස්ථාව හෝ තත්ත්වය සළකා අනුමාන කර පැවසීමේදී යොදා ගැනේ. (අතීත කාල ක්‍රියාවක් අනුමාන කිරීමේදී '-겠-' ඉදිරියෙන් '-았/었-' යෙදිය යුතුය.)

- 가: 설날에 한국 친구 집에 초대를 받았어요.
  අලුත් අවුරුදු දිනයේ කොරියන් මිතුරකුගේ නිවසට යාමට ආරාධනාවක් ලැබුණා.
  나: 정말 **좋겠어요**. ඇත්තටම හොඳයිනේ.
- 가: 요즘 일이 많아서 너무 바빠요. මේ දවස්වල වැඩ වැඩි නිසා කාර්යබහුලයි.
  나: 일이 많아서 **힘들겠어요**. වැඩ බොහෝ නිසා අමාරු ඇති.
- 가: 어제 우리 팀 회식이 있었는데 노래방에도 갔어요.
  ඊයේ අපේ කණ්ඩායමේ පිටතින් කෑම තිබුණ අතර කැරෝකේ වලටත් ගියා.
  나: 그래요? **재미있었겠어요**. එහෙමද? විනෝදවත් වෙන්න ඇතිනේ.





비교해 보세요 සංසන්දනය කර බලන්න

✔ ස්ථානය '에' සහ '에서'

'-겠-' හා '-(으)ㄹ 거예요' කර්තෘගේ චේතනාව පිළිබිඹු කිරීම හෝ යම් දෙයක් පිළිබඳව අනුමානය කරන විට භාවිතා කෙරේ. චේතනාව දැක්වීමේ දී කර්තෘ උත්තම පුරුෂ වන විට '-겠-' හෝ '-(으)ㄹ 거예요' යන සියල්ලම අභිප්‍රාය දැක්වීම අර්ථවත් කරයි. අනුමාන කිරීමක් දැක්වීමේ දී මධ්‍යම පුරුෂ හෝ ප්‍රථම පුරුෂ කර්තෘ පදයක් සමග භාවිතා වන අතර අනුමානය සඳහා පාදක වන කාරණාව කතා කරන පුද්ගලයාගේ පෞද්ගලික මතය ප්‍රකාශ කරන විට '-겠-' භාවිතා වන අතර යම් විෂය බද්ධ මතයක් හෝ සාමාන්‍ය සත්‍යයක් පැවසීමේ දී '-(으)ㄹ 거예요' භාවිතා වේ.

- 바루 씨가 야근을 하겠어요. (X)
  바루 씨가 야근을 **할 거예요**.(O)
- 여기를 누르면 불이 켜지겠어요. (X)
  여기를 누르면 불이 **켜질 거예요**.(O)



'-겠-' හොඳින් අවබෝධ වුනා ද? එහෙම නම් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා දෙබස සම්පූර්ණ කරන්න.

2. 대화를 읽고 맞는 대답을 고르세요. දෙබස කියවා ගැළපෙන පිළිතුර තෝරන්න.

1)
가: 요즘 일이 너무 많아요. මේ දවස්වල වැඩ ගොඩක් වැඩියි.
나: ______________________.

① 바쁘겠어요　　② 바빴겠어요

2)
가: 지난주에 제주도로 여행을 다녀왔어요. ගිය සතියේ ජේජු දූපතට සචාරියක් ගිහින් ආවා.
나: ______________________.

① 정말 재미있겠어요　　② 정말 재미있었겠어요

정답 1) ① 2) ②



대화 2 සංවාදය 2

Track 104



හඹං මහත්මිය හා සෝපියා මහත්මිය චුසොක් නිවාඩුව ගැන කතා කරමින් සිටියි. දෙදෙනා මොනවගේ කතාවක් කරමින් සිටී ද? ප්‍රථමයෙන් දෙබසට දෙවරක් සවන් දෙන්න.

연휴 නිවාඩුව
- 연휴에 여행 온 가족들이 많이 있어요?
  නිවාඩුවට සංචාරය කරන්න ගිය පවුල් ගොඩක් ඉන්නවා ද?
- 이번 주에는 금요일이 공휴일이라서 사흘 동안 연휴예요.
  මේ සතියේ සිකුරාදා නිවාඩු නිසා දවස් 4ක් නිවාඩු වේ.

흐엉 수피카 씨, 추석 연휴에 뭐 할 거예요?
සුපියා මහත්මිය, චුසොක් නිවාඩුවට මොකද කරන්න ඉන්නේ?

수피카 글쎄요. 아직 잘 모르겠어요. 흐엉 씨는요?
ඒක තමයි. තවම දන්නේ නැහැ. හඹං මහත්මිය?

흐엉 저는 친구들하고 경복궁에 가려고 해요. 거기에서 고향에 못 가는 사람들을 위해서 여러 가지 행사를 해요.
මම යහළුවොත් එක්ක ක්‍යොංබුක් මාළිගාවට යන්න කියලා ඉන්නවා. එහෙදී ගමට යන්න බැරි අය සඳහා විවිධ වැඩ සටහන් තියනවා.

행사 උත්සව
- 어린이날이 되면 어린이를 위한 여러 가지 행사가 열려요.
  ළමා දිනය දාට ළමුන් සඳහා විවිධ උත්සව පවත්වනවා.
- 지난 연말에 우리 회사에서는 직원들을 위해서 여러 행사를 준비했어요.
  ගිය අවුරුද්දේ අවසානයේ අපේ සමාගම සේවකයන් සඳහා විවිධ උත්සව සූදානම් කළා.

수피카 그래요? 가면 뭘 할 수 있어요?
එහෙමද? ගියොත් මොනවද කරන්න පුළුවන්?

흐엉 한국의 전통 놀이도 할 수 있고 송편을 만드는 체험도 할 수 있어요. 수피카 씨도 같이 가요.
කොරියාවේ සාම්ප්‍රදායික ක්‍රීඩාවන් කරන්නත් පුළුවන්. සොංපෙයාන් හදන අත්දැකීමුත් ලබන්න පුළුවන්. සොපියා මහත්මියත් එකට යමු.



සොපියා මහත්මිය හා හුඹං මහත්මිය ලෙස දෙබස අනුගමනය කරන්න. හොඳින් සවන් දී අනුගමනය කළා ද? එහෙම නම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 흐엉 씨는 추석에 뭘 하려고 해요?
   හඹං මහත්මිය චුසොක්වලට මොනවා කරන්න කියලා ද හදන්නේ ?
2. 경복궁에서는 어떤 행사가 있어요? ක්‍යොංබුක් මාළිගාවේ මොන වගේ උත්සව තියෙනවා ද?

정답 1. 경복궁에 가려고 해요. 2. 한국의 전통 놀이를 하고 송편을 만들 수 있어요.



어휘 2 වචන මාලාව 2 추석 චුසොක්

චුසොක් හා සම්බන්ධ ප්‍රකාශ මොනවාදැයි සොයා බලමු ද?



고향에 내려가다
ගමට යනවා



친척집에 가다
නෑදෑ ගෙවල්වල යනවා



차례를 지내다
පින් දෙනවා



절하다
පුද පූජා පවත්වනවා



성묘하다
මුතුන්මිත්තන්ගේ සොහොන්කොතට ආචාර කරනවා



송편을 만들다
සොංපෙයොන් හදනවා



보름달을 보다
පූර්ණ චන්ද්‍රයා බලනවා



소원을 빌다
ප්‍රාර්ථනා කරනවා



ඉහත ඉගෙනගත් වචන නැවත මතක් කර ප්‍රශ්නවලට පිළිතුරු සපයා බලමු ද?

1. 그림에 맞는 표현을 〈보기〉에서 골라 넣으세요.
පින්තූරයට ගැළපෙන ප්‍රකාශය උදාහරණ කොටසින් තෝරා ලියන්න.



1)




2)



3)




4)




5)




6)





7)




8)

보기

차례를 지내다	친척집에 가다	성묘하다	송편을 만들다
보름달을 보다	소원을 빌다	절하다	고향에 내려가다

정답 1) 고향에 내려가다 2) 친척집에 가다 3) 절하다 4) 송편을 만들다 5) 차례를 지내다 6) 성묘하다 7) 보름달을 보다 8) 소원을 빌다

문법 2 සංවාදය 2 -는



ක්‍රියා පදයක අගට එකතු වී නාම පදය විස්තර කරයි. ඒ අනුව යම් සිදුවීමක් හෝ ක්‍රියාකාරකමක් වර්තමානයේ සිදුවන බව හැඟවේ. ('ㄹ' හල් අවස්ථාවේදී 'ㄹ' ඉවත් වේ. උදා : 살다 → 사는)

· 가: 한국 사람들은 명절에 보통 뭐 해요? කොරියානු ජාතිකයෝ අවුරුද්දට සාමාන්‍යයෙන් මොකද කරන්නේ?
  나: 고향에 **내려가는** 사람이 많아요. ගමට යන අය බහුලයි.
· 가: 지금 **듣는** 노래가 뭐예요? දැන් අහන සින්දුව මොකක්ද?
  나: 요즘 한국에서 **유행하는** 노래예요. මේ දවස්වල කොරියාවේ ජනප්‍රිය සින්දුවක්.
· 가: 바루 씨는 무슨 일을 하세요? පාරු මහතාගේ රැකියාව මොකද්ද?
  나: 저는 가구를 **만드는** 일을 해요. මම ගෘහ භාණ්ඩ හදන රැකියාවක් කරනවා.



'-는' හොඳින් අවබෝධ වුනා ද? එහෙම නම් ගැළපෙන යෙදුම කොටුවෙන් තෝරා දෙබස සම්පූර්ණ කරන්න.

2. 빈칸에 맞는 표현을 〈보기〉에서 골라 대화를 완성하세요.
හිස්තැනට ගැළපෙන ප්‍රකාශ උදාහරණයෙන් තෝරා දෙබස සම්පූර්ණ කරන්න.

1) 가: 안녕하세요. 저는 한국건설에 ____________ 아딧입니다.
   ආයුබෝවන්. මම කොරියාවේ ඉදිකිරීම් අංශයේ වැඩ කරන අපිත්.
   나: 반갑습니다. හමුවීම සතුටක්.

2) 가: 요즘 날씨가 참 따뜻하지요? මේ දවස්වල කාලගුණය ගොඩක් රස්නෙයි නේද?
   나: 네, 그래서 밖에서 ____________ 사람이 많네요.
   ඔව්, ඒක නිසා එළියේ ක්‍රීඩා කරන මිනිස්සු ගොඩයිනේ.

3) 가: 바루 씨는 어떤 일을 하세요? පාරු මහත්මා මොනවගේ රාජකාරි ද කරන්නේ?
   나: 저는 가구를 ____________ 일을 해요.
   මම ගෘහ භාණ්ඩ (හදන) වැඩ කරනවා.

보기 만들다 / 다니다 / 운동하다

정답 1) 다니는 2) 운동하는 3) 만드는





තව ටිකක් පාඩම් කරමු ද? '-는' භාවිතා කර වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. 투안이 회사에서 일해요. 그 회사는 시청 근처에 있어요.
   ______________________________.

2. 리한이 주스를 마셔요. 그 주스는 오렌지 주스예요.
   ______________________________.

정답 1. 투안이 일하는 회사는 시청 근처에 있어요 2. 리한이 마시는 주스는 오렌지 주스예요

유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

이건 한국말로 뭐예요? මේක කොරියන් භාෂාවෙන් මොකක්ද?

가: **이건 한국말로 뭐예요? මේක කොරියන් භාෂාවෙන් මොකක්ද?**
나: 그건 종이라고 해요. ඒකට කඩදාසි '종이' කියලා කියනවා.



활동 ක්‍රියාකාරකම්

다음을 읽고 질문에 답하세요. පහත ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

지난주 금요일은 설날이었습니다. 저는 설날에 한국 친구 집에 초대를 받아서 친구의 집에 갔습니다. 친구의 할아버지와 할머니는 한복을 입고 계셨습니다. 저는 할아버지와 할머니, 친구의 부모님께 절을 했습니다.

한국에서는 설날에 어른들께 절을 하면서 새해 인사를 드리는데 이것을 '_____㉠_____'(이)라고 합니다. 절을 한 후에 가족들이 모여서 같이 떡국을 먹었습니다. 한국에서 처음 먹어 봤는데 정말 맛있었습니다. 그리고 친구의 가족과 함께 윷놀이를 하면서 즐거운 하루를 보냈습니다.

ගිය සතියේ සිකුරාදා අලුත් අවුරුදු දිනය විය. මට අලුත් අවුරුද්දට කොරියන් යහළුවාගේ ගෙදරට ආරාධනාවක් ලැබුණු නිසා යහළුවාගේ ගෙදර ගියා. යහළුවාගේ සීයා හා ආච්චි හන්බොක් ඇඳගෙන හිටියා. මම සීයාට, ආච්චිට හා යහළුවාගේ දෙමාපියන්ට වැඳ ආචාර කළා. කොරියාවේ අලුත් අවුරුද්දට වැඩිහිටියන්ට ආචාර කරමින් සුභ පැතීම '㉠' ලෙස හඳුන්වනවා. ආචාර කිරිමෙන් පසු පවුලේ අය හා එක්ව තොක්කුක් කෑවා. කොරියාවේ දී මුලින්ම කාලා බැලූ ආහාරයක් වුවත් ඇත්තට ම රසවත් වුණා. ඒ වගේම යහළුවාගේ පවුලේ අයත් එක්ක යුත්නොරි සෙල්ලම් කරමින් විනෝදවත් දිනයක් ගත කළා.

1. ㉠에 들어갈 말로 알맞은 것을 고르세요. ㉠ වලට ගැළපෙන පිළිතුර තෝරන්න.

   ① 덕담　　② 세배　　③ 성묘　　④ 차례

2. 위의 내용과 같으면 ○, 다르면 X에 표시하세요.
   ඉහත අන්තර්ගතය හා සමාන නම් ○ ද වැරදි නම් X ද යොදන්න.

   1) 한국에서는 설날에 떡국을 먹습니다.　○　×
   2) 한국에서는 새해 인사를 할 때 절을 합니다.　○　×
   3) 이 사람은 설날에 한국 친구를 집으로 초대했습니다.　○　×

정답 1. ② 2. 1) O 2) O 3) X

한국의 명절

කොරියාවේ නිවාඩු

설날 අලුත් අවුරුද්ද

설날은 음력 1월 1일로 한 해가 시작되는 것을 축하하면서 기념하는 날입니다. 가족들이 모여서 차례를 지내고 어른들께 세배를 합니다. 세배를 하면 어른들이 덕담을 해 주시고 세뱃돈을 주시기도 합니다. 그리고 설날에는 "새해 복 많이 받으세요."라는 인사를 합니다.



අලුත් අවුරුද්ද, චන්ද්‍රමාස දින දර්ශනයට අනුව ජනවාරි මස පළමු වෙනිදා වන අතර අවුරුද්දක ආරම්භයට සුභ පැතුම් එක්කරමින් සමරන දිනයක් වේ. පවුලේ අය එකතු වී මුතුන්මිත්තන්ට පින්දී වැඩිහිටියන්ට වැඳ ආචාර කරනවා. වැඩිහිටියන්ට වැඳ ආචාර කළ විට ඔවුන් විසින් ආශිර්වාද ලබාදී තෑගි මුදල් දීමත් කරනවා. ඒ වගේම අලුත් අවුරුද්දේ සුභ අලුත් අවුරුද්දක් වේවා‹ කියා සුභ පතනවා.

정월대보름 අලුත් අවුරුද්දේ ප්‍රථම පූර්ණ චන්ද්‍රයා

정월대보름은 음력 1월 15일로 새해 첫 보름달이 뜨는 날입니다. 사람들은 다섯 가지 곡식으로 지은 오곡밥과 말린 나물을 요리해서 먹습니다. 그리고 땅콩이나 호두 등 껍질이 딱딱한 견과류를 먹는데, 이를 '부럼'이라고 합니다. 부럼을 깨 먹으면 몸에 부스럼이 생기지 않는다는 이야기가 있습니다.



정월대보름 යනු අලුත් අවුරුද්දේ පළමු පූර්ණ චන්ද්‍රයා පායන චන්ද්‍රමාස ක්‍රමයේ ජනවාරි මස 15 වන දිනයයි. මෙදිනට මිනිසුන් වර්ග 5 කින් යුක්ත ධාන්‍ය වර්ග වලින් පිසින ලද ඔකොක් බත් හා වියලන ලද ඖෂධ පැළ පිසා ආහාරයට ගන්නවා. ඒ වගේම රටකජු හෝ හොදු ආදි පොතු සනකම් ඇට වර්ග කන අතර මෙය බොරම් ලෙස හඳුන්වනවා. මෙය ආහාරයට ගන්නවා නම් ශරිරයේ උෂ්ණය ඇති වන්නේ නැතැයි කියා විශ්වාස කරයි.

추석 චුසොක්

추석은 음력 8월 15일로 '한가위'라고도 합니다. 추석에도 성묘를 하고 차례를 지내는데, 추석에는 갓 수확한 쌀로 쌀밥을 짓고 송편을 만들어서 먹습니다. 그리고 밤에는 보름달을 보면서 소원을 빕니다. 추석의 대표적인 놀이로는 '강강술래'가 있는데 이는 밤에 달 아래 여성들이 동그랗게 손을 잡고 노래를 부르면서 빙글빙글 도는 놀이입니다.



චුසොක්, චන්ද්‍ර මාස ක්‍රමයේ අගෝස්තු මස 15 වන දින සමරන අතර මෙදින ඬහන්කවිඬ යන නමින්ද හඳුන්වනු ලබයි. චුසොක් වල දීත් මුතුන්මිත්තන්ගේ සොහොන්වලට ගොස් පුද පූජා පවත්වන අතර අලුත් අස්වනු වලින් ලබාගත් සහල් නෙලා ගෙන එයින් බත් සහ සොංපෙ‍යාන් සාදා ආහාරයට ගනු ලැබේ. ඒ වගේම රාත්‍රීයට පූර්ණ චන්ද්‍රයා දෙස බලමින් ප්‍රාර්ථනා කිරිමද සිදුකරයි. චුසොක්වලදී කරන ක්‍රීඩා අතරින් කංකංසුල්ලේ ප්‍රධාන වන අතර මෙය රාත්‍රියේ හඳ පායා ඇති විට කාන්තාවන් රවුමට සැදී අත් අල්ලාගෙන සිංදු කියමින් රවුමට කැරකෙමින් කරන සෙල්ලමක් වේ.





අංක 1 සිට 3 දක්වා ඇත්තේ කතාවට සවන්දී ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ.
හොඳින් සවන්දී ගැළපෙන පිළිතුර තෝරන්න.

[1~3] 이야기를 듣고 질문에 알맞은 답을 고르십시오.
කතාවට සවන්දී ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරන්න.



1. 남자는 설날 연휴에 무엇을 했습니까?
   පිරිමි පුද්ගලයා අලුත් අවුරුදු නිවාඩුවේ මොකද කළේ?

   ① 떡국을 먹었습니다. ② 집에 혼자 있었습니다.
   ③ 세배를 받았습니다. ④ 친구하고 영화를 봤습니다.

2. 한국 사람들이 추석에 하는 일과 관계 없는 것을 고르십시오.
   කොරියානු ජාතිකයින් චුසොක්වලදී කරන වැඩ හා සම්බන්ධතාවයක් නොමැති දෙය තෝරන්න.

   ① 고향에 갑니다. ② 세배를 합니다.
   ③ 차례를 지냅니다. ④ 맛있는 음식을 먹습니다.

3. 두 사람은 무엇에 대해 이야기하고 있습니까?
   පුද්ගලයන් දෙදෙනා කුමක් පිළිබඳව ද කතා කරමින් සිටින්නේ?

   ① 명절에 먹는 옷 ② 명절에 하는 인사
   ③ 명절에 입는 음식 ④ 명절에 하는 놀이



පහත දැක්වෙන්නේ දෙබසට සවන්දී ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ.
දෙබස ඇසීමට ප්‍රථමයෙන් දී ඇති අන්තර්ගතය එක් වරක් කියවා බලන්න.

[4~5] 하나의 이야기를 듣고 두 개의 질문에 대답하십시오.
එකම කතාවට සවන්දී ප්‍රශ්න දෙකටම පිළිතුරු සපයන්න.

4. 여자는 왜 추석에 고향에 안 내려갑니까?
   කාන්තාව ඇයි චුසොක් වලට ගමට යන්නේ නැත්තේ?

   ① 일을 해야 돼서 ② 연휴가 너무 짧아서
   ③ 고향이 너무 멀어서 ④ 기차표가 다 팔려서

5. 두 사람은 추석 연휴에 무엇을 할 것입니까?
   පුද්ගලයින් දෙදෙනා චුසොක් නිවාඩුවට මොනවා කරන්නද ඉන්නේ?

   ① 집에서 쉴 것입니다. ② 같이 일을 할 것입니다.
   ③ 콘서트에 갈 것입니다. ④ 영화를 보러 갈 것입니다.



듣기 대본 ශ්‍රවණ පිටපත

1. 여: 투안 씨는 설날 연휴에 뭐 했어요? තුඅන් මහතා අලුත් අවුරුදු නිවාඩුවේ මොකද කළේ?
   남: 친구 집에 가서 어른들께 세배도 하고 떡국도 먹었어요.
   යහළුවාගේ ගෙදර ගිහින් වැඩිහිටියන්ට අලුත් අවුරුද්දට වැඳ ආචාර කරලා තොක්කුක් කෑවා.
2. 여: 한국 사람들은 추석에 보통 뭐 해요?
   කොරියානු ජාතිකයින් චුසොක් වලදී සාමාන්‍යයෙන් මොකද කරන්නේ?
   남: 고향에 내려가는 사람들이 많아요. 고향에 가서 가족들과 맛있는 음식도 먹고 차례도 지내요.
   ගමට යන පුද්ගලයන් ගොඩයි. ගමට ගිහින් පවුලේ අයත් එක්ක රසවත් කෑමක් කාලා මුතුන්මිත්තන්ට පින්දීමත් කරනවා.
3. 여: 명절에 가족들이 만나서 하는 놀이가 있어요? උත්සව කාලයට පවුලේ අය හමු වී කරන ක්‍රීඩා තියනවා ද?
   남: 네, 설날이나 추석 같은 명절에 가족들이 모여서 윷놀이를 해요.
   ඔව් අලුත් අවුරුද්දේ හෝ චුසොක් වැනි උත්සවවලදී පවුලේ අය එකතු වී යුත්නොරි සෙල්ලම් කරනවා.

4-5. 남: 미영 씨, 이제 곧 추석인데 언제 고향에 내려가요?
   මියොං මහත්මිය, තව ටික දවසකින් චුසොක්නෙ, කවදා ද ගමට යන්නේ?
   여: 이번 추석에는 고향에 안 내려갈 거예요. මෙවර චුසොක්වලට ගමේ යන්නේ නැහැ.
   남: 왜요? 추석에도 일을 해야 돼요? ඇයි? චුසොක් වලත් වැඩ කරන්න ඕනේ ද?
   여: 아니요, 일은 안 하는데 고향에 가는 기차표가 없어요.
   නැහැ. වැඩ කරන්නේ නැති වුනත් ගමට යන දුම්රිය ප්‍රවේශ පත්‍ර නැහැ.
   남: 아, 그럼 우리 추석 연휴에 만날까요? ආහ්.. එහෙම නම් අපි චුසොක් නිවාඩුවේ දී හමුවෙමු ද?
   여: 좋아요. 같이 영화도 보고 밥도 먹어요. හොඳයි. එකට චිත්‍රපටයකුත් බලලා කෑමත් කමු.

정답 1. ① 2. ② 3. ④ 4. ④ 5. ④

확장 연습 වැඩිදුර අභ්‍යාස L-33

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු තෝරන්න.

   다음 중 들은 내용과 같은 것은 무엇입니까?
   පහත දැක්වෙන පිළිතුරු අතරින් අන්තර්ගතයට සමාන පිළිතුරු කුමක්ද?

   ① 여자는 추석 연휴 계획을 세워 두었습니다.
   ② 추석 연휴에 경복궁은 문을 열지 않습니다.
   ③ 남자는 이번 추석 연휴에 고향에 가려고 합니다.
   ④ 추석 연휴에 경복궁에서 송편을 만들 수 있습니다.

확장 연습 듣기 대본 වැඩිදුර අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 남: 수피카 씨, 이번 추석 연휴에는 고향에 안 간다고 했죠? 뭐 할 거예요?
   සුපිකා මහත්මිය, මෙවර චුසොක් නිවාඩුවට ගමේ යන්නේ නෑ කිවුවා නේද? මොකද කරන්න ඉන්නේ?
   여: 글쎄요. 뭘 할지 아직 잘 모르겠어요. 투안 씨는요?
   හ්ම්. මොකද කරන්නේ කියලා තවම හිතුවේ නැහැ. තුවාන් මහතා මොකද කරන්න ඉන්නේ?
   남: 저는 친구들하고 경복궁에 구경 가려고 해요. 거기 가면 한국 전통 놀이도 하고 송편 만들기도 직접 해 볼 수 있대요. මම මගේ මිතුරන් සමඟක්‍යොංබොක් මාළිගය බලන්න යන්න කියලා.
   එතනට ගියොත් කොරියානු සාම්ප්‍රදායික ක්‍රීඩාත් කරලා සොංපෙයානුත් සාදන අත්දැකීමත් ලබා ගන්න පුළුවන්ලු.

정답 1. ④



EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සිට 3 දක්වා ඇත්තේ දෙබසේ හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ. අන්තර්ගතයට ගැළපෙන පිළිතුර තෝරන්න.

[1~3] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. 가: 한국의 전통 옷이 한복이지요? 한복은 보통 언제 입어요?
   කොරියාවේ සාම්ප්‍රදායික ඇඳුම හන්බොක් නේද? හන්බොක් සාමාන්‍යයෙන් කවදා ද අඳින්නේ?
   나: 설날이나 추석 같은 __________에 주로 입어요.
   අලුත් අවුරුද්දේ හෝ චුසොක් වැනි උත්සව වලදී ප්‍රධාන වශයෙන් අඳිනවා.

① 생일 ② 명절 ③ 계절 ④ 회의

2. 가: 지훈 씨는 설날 연휴에 뭐 할 거예요?
   ජිහුන් මහත්මා අලුත් අවුරුද්දේ නිවාඩුවට මොකද කරන්නේ?
   나: 저는 고향에 ____________________. මම ගමට යනවා.

① 다닐 거예요 ② 내려갈 거예요 ③ 돌아올 거예요 ④ 이사할 거예요

3. 가: 저는 지난 설 연휴에 친구 집에 가서 떡국도 먹고 세뱃돈도 받았어요.
   මම පසුගිය අලුත් අවුරුද්දේ නිවාඩුවට යහළුවාගේ ගෙදර ගිහින් තොක්කුක් කාලා අලුත් අවුරුදු මුදලුත් ලබා ගත්තා.
   나: 우와, 정말 ____________________. 저는 집에만 있었는데 부러워요.
   නියමයිනේ. ඇත්තටම විනෝදජනක වෙන්න ඇති මම නම් ගෙදරමයි හිටියේ, ඊර්ෂියයි.

① 추웠겠어요 ② 속상했겠어요 ③ 재미있었겠어요 ④ 사람이 없었겠어요



පහත දැක්වෙන ඡේදය කියවා දී ඇති ප්‍රශ්නයන්ට පිළිතුරු සපයන්න. ඉගෙනගත් දේ මතක් කරමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

[4~5] 다음 글을 읽고 물음에 답하십시오.

한국의 대표적인 명절은 설날과 추석입니다. 설날은 음력 1월 1일로 한 해의 시작을 축하하는 날입니다. 설날에는 가족이 모여 조상들께 차례를 지내고 어른들께 세배를 합니다. 그리고 떡국도 먹습니다. 추석은 음력 8월 15일로 과일과 곡식을 거둔 것을 감사하는 날입니다. 추석에는 차례를 지내고 송편을 먹습니다. 밤에는 보름달을 보고 소원도 빕니다. 추석에는 과일과 음식이 많아서 '더도 말고 덜도 말고 한가위만 같아라'라는 말도 있습니다.

කොරියාවේ ප්‍රධාන නිවාඩු ලෙස අලුත් අවුරුද්ද සහ චුසොක් හැඳින්විය හැකි ය. අලුත් අවුරුද්ද චන්ද්‍ර මාස දින දර්ශකයේ ජනවාරි මස 1 වෙනි දින උදා වන අතර එක් වර්ෂයක ආරම්භය ලෙස සලකා සුබ පැතුම් එක් කරන දිනය වේ. අලුත් අවුරුද්දට පවුලේ අය එකතු වී මුතුන් මිත්තන්ට පින් දීමේ පූද පූජා පවත්වා වැඩිහිටියන්ට ආචාර කිරීම සිදු කරයි. ඒ වගේම තොක්කුකුත් ආහාරයට ගනියි. චුසොක් චන්ද්‍ර මාස දින දර්ශනයට අනුව අගෝස්තු මස 15 වන දිනට යෙදී ඇති අතර නෙලාගත් පළතුරු හා ධාන්‍ය අස්වැන්න සඳහා ස්තුතිය පළ කරන දිනය වේ. චුසොක්වලදී පූදපූජා පවත්වා සොංපෙයොන් ආහාරයට ගනියි. ඒවගේම රාත්‍රියේ දී පූර්ණ චන්ද්‍රයා දෙස බලා ප්‍රාර්ථනා කිරීම ද කරයි. චුසොක්වල පළතුරු, ධාන්‍ය සහ වෙනත් ආහාර වර්ගත් පමණට ඇති බැවින් vවැඩිත් නැති අඩුත් නැති සතුටික් පිරි සමබර ජීවිතයක් ගත කිරීමට ලැබේවාv යැයි පතන පැතුමකුත් තිබේ.



4. 한 해의 시작을 축하하는 날은 언제입니까?
සෑම අවුරුද්දකම ආරම්භය සැමරීම සඳහා යොදාගන්නා දිනය කවදා ද?

① 설날　② 추석　③ 명절　④ 한가위

5. 읽은 내용과 같은 것을 고르십시오. කිය වූ අන්තර්ගතය හා සමාන පිළිතුර තෝරන්න.

① 추석은 음력 1월 1일이다.
② 설날에 송편을 만들어서 먹는다.
③ 설날에는 조상들께 차례를 지내지 않는다.
④ 추석에는 과일과 음식을 많이 먹을 수 있다.

정답 1. ② 2. ② 3. ③ 4. ① 5. ④

확장 연습 වැඩිදුර අභ්‍යාස

[1~3] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. 이번 연휴 때는 고향에 다녀올 생각입니다. 싸게 파는 비행기 표가 있어서 지난주에 표를 ________ 샀습니다.
මේ නිවාඩු කාලයේ ගමේ ගිහින් එන්නයි හිතන් ඉන්නේ පසුගිය සතියේ ලාබෙට විකුණන ගුවන් ටිකට් පත් තිබූ නිසා කලින්ම මිලට ගත්තා.

① 훨씬　② 아직
③ 매우　④ 미리

2. 다음 주는 명절 연휴입니다. 연휴 때는 일을 하지 않는 공장이 ________ 우리도 쉴 수 있을 것 같습니다.
ඊලඟ සතිය උත්සව නිවාඩු කාලයයි. නිවාඩු කාලයේ වැඩ නොකරන කර්මාන්තශාලා බොහෝ තිබෙන නිසා අපටත් විවේකගත හැකියි.

① 많을 때　② 많으니까
③ 가까울 때　④ 가까우니까

3. 오늘은 설날이라서 회사 사람들과 함께 사장님 댁에 인사를 드리러 갔습니다. 사장님 댁에서 떡국을 처음 ________.
අද අලුත් අවුරුදු දිනය නිසා කාර්යාල සගයන් සමඟ කාර්යාල ප්‍රධානිතුමාට ආචාර කිරීමට ඔහුගේ නිවසට ගියා. ප්‍රධානිතුමාගේ නිවසේදී පළමු වතාවට තොක්ගුක් කාලා බැලුවා.

① 먹어 봤습니다　② 팔면 안 됩니다
③ 팔아 봤습니다　④ 먹으면 안 됩니다

정답 1. ④ 2. ② 3. ①



아기 옷을 선물하는 게 어때요?


දරුවාට ඇඳුම් තෑගි විදිහට දෙන එක කොහොමද?

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

- අධ්‍යයන අරමුණු: අනුමාන කිරීම , පිළිවෙල පිළිබඳ කතා කිරීම
- ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස්: -는 게 어때요, -고 나서
- වචන භාවිතය සඳහා උපදෙස්: විශේෂ දින , විවාහ සංස්කෘතිය
- සංස්කෘතික තොරතුරු: කොරියානුවන්ගේ පවුලේ උත්සව



대화 1 සංවාදය 1





පහත දැක්වෙන්නේ මොනිකා සහ සොහී අතර සංවාදයයි. මුලින්ම සංවාදයට දෙවරක් සවන්දී අනුගමනය කරන්න.

모니카 소희 씨도 이번 주말에 순영 씨의 아기 돌잔치에 가요?
සොහී මහත්මියත් මේ සතිඅන්තයට සුන්යොං මහත්මියගේ දරුවාගේ දොල්ජාන්චි උත්සවයට යනව ද ?

소 희 네, 저도 갈 거예요.
ඔව්. මමත් යනවා.

모니카 돌잔치에 가면 뭐 해요?
දොල්ජාන්චි උත්සවයට ගිහින් මොකද කරන්නේ?

소 희 가족과 친구들이 아기의 첫 번째 생일을 축하하고 밥도 먹어요.
පවුලේ අය සහ යහළුවන්, දරුවාගේ මුල්ම උපන් දිනයට සුබ පතලා ආහාරත් ගන්නවා.

모니카 그런데 아기한테 무슨 선물을 하는 게 좋아요?
නමුත් දරුවාට මොන වගේ තෑග්ගක් ද අරන් යන්නේ?

소 희 아기 옷이나 인형을 많이 선물해요. 저는 인형을 샀으니까 모니카 씨는 옷을 선물하는 게 어때요?
බෝනික්කෝ නැත්නම් ඇඳුම් තෑගි විදිහට ගොඩක් දෙනවා. මම බෝනික්කෙක් ගත්ත නිසා මොනිකා මහත්මිය ඇඳුමක් තෑගි දෙන එක හොඳයි නේද?

모니카 그게 좋겠네요. 고마워요.
ඒක හොඳයි. ස්තුතියි.

번째 වෙනි / වන

යම් දෙයක පිළිවෙල, ස්ථානය, අංකය දැක්වීමේදී භාවිතා කරනු ලැබේ

- 다음 달 첫 번째 토요일에 만나요.
  ලබන මාසයේ පළමුවෙනි සෙනසුරාදා හමුවෙමු.
- 한국 방문은 이번이 두 번째예요.
  කොරියාවේ දෙවන වර සංචාරයයි.

선물 ත්‍යාගය

- 모니카 씨의 생일 선물로 꽃을 준비했어요.
  මොනිකා මහත්මියගේ උපන්දින ත්‍යාගය ලෙස මල් සූදානම් කළා.
- 어린이날에 제 조카에게 장난감 선물을 할 거예요.
  ළමා දිනයේදී මගේ සහෝදරයාගේ දරුවාට සෙල්ලම් බඩුවක් තෑග දෙන්නයි ඉන්නේ.



හොඳින් සවන් දී අනුගමනය කළා ද? එසේ නම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 이번 주말은 무슨 날이에요? මේ සති අන්තයේ යෙදෙන්නේ කුමන දිනයක් ද?
2. 두 사람은 무슨 선물을 준비할 거예요?
   පුද්ගලයින් දෙදෙනා මොනවගේ තෑග්ගක් සූදානම් කරයි ද?


정답 1. 순영 씨의 아기 돌잔치 2. 인형과 옷



어휘 1 වචන මාලාව 1 특별한 날 විශේෂ දවස්



කොරියාවේ විශේෂ දින හා සබැඳි විවිධ වචන හා ප්‍රකාශයන් මොනවා දැයි විමසා බලමු ද?



생일
උපන් දිනය



백일
100 වැනි උපන්දින සැමරුම




돌
පළමු උපන් දිනය



집들이
ගෙට ගෙවදීමේ උත්සවය



어버이날
දෙමාපියන්ගේ දිනය



스승의 날
ගුරු දිනය



어린이날
ළමා දිනය



결혼기념일
විවාහ සංවත්සරය



환갑
60 වන උපන්දිනය



칠순
70 වන උපන්දිනය






ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ප්‍රශ්නයට පිළිතුරු සපයන්න උත්සහ කරන්න.

1. 그림을 보고 알맞은 말을 연결하세요. පින්තූරය බලා ගැළපෙන වචනය යා කරන්න.



정답 ① ㉡ ② ㉤ ③ ㉣ ④ ㉢ ⑤ ㉠

문법 1 සංවාදය 1 –는 게 어때요



ක්‍රියාපදයකට සම්බන්ධ කර සංවාදයේ යෙදෙන අනෙක් පාර්ශවය වෙත යම් ක්‍රියාවක් කර බලන ලෙස පැවසීමේදී හෝ උපදෙස් දීමේදී යොදාගැනේ.

- 가: 주말에 친구 집들이가 있는데 무슨 선물이 좋을까요?
  සති අන්තයේ මිතුරකුගේ ගෙටගෙවදීමේ උත්සවයක් තියෙනවා. මොනවගේ තෑග්ගක් හොඳ වෙයිද?
  나: 세제나 휴지를 **사는 게 어때요**? රෙදි සෝදන කුඩු හෝ ටිෂූ මිලදී ගන්න එක ගැන මොකද හිතන්නේ?
- 가: 지금 밥을 먹을까요? දැන් බත් කමුද?
  나: 영화를 본 후에 밥을 **먹는 게 어때요**? චිත්‍රපටිය බැලුවට පස්සේ බත් කන එක ගැන මොකද හිතන්නේ?



'–는 게 어때요?' හොඳින් අවබෝධ වුනා ද? එසේ නම් මෙම යෙදුම් භාවිතා කර දෙබස සම්පූර්ණ කරන්න.

2. 그림을 보고 '–는 게 어때요?'를 사용해서 대화를 완성하세요.
තව ටිකක් පාඩම් කරමු ද? '–는 게 어때요?' භාවිතා කර වාක්‍ය සම්පූර්ණ කරන්න.

1)



가: 수진 씨가 집들이를 하는데 무슨 선물을 하면 좋을까요?
සුජින් මහත්මයා ගෙට ගෙවදීමේ උත්සවයක් කරන නිසා මොනවගේ තෑග්ගක් දෙන එකද හොඳ?

나: ______________________________?

2)



가: 다음 주 토요일이 모니카 씨 생일인데 뭘 살까요?
ඊලඟ සෙනසුරාදට මොනිකා මහත්මියගේ උපන්දිනය, මොනවද මිලදී ගන්නේ?

나: ______________________________?


정답 1) 휴지를 선물하는 게 어때요 2) 티셔츠를 선물하는 게 어때요

තව ටිකක් පාඩම් කරමුද? '–는 게 어때요?' භාවිතා කර වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. 가: 목이 좀 아파요.
   나: 따뜻한 물을 ____________________?
2. 가: 주말에 어디로 여행을 갈까요?
   나: 제주도에 ____________________?
3. 가: 어디에서 만날까요?
   나: 시내에서 ____________________?
4. 가: 저는 공포 영화를 싫어해요.
   나: 그럼, 다른 영화를 ____________________?

정답 1. 마시는 게 어때요 2. 가는 게 어때요 3. 만나는 게 어때요 4. 보는 게 어때요

대화 2 සංවාදය 2





මියොන් සහ ලිලී කොරියවේ විවාහ උත්සව පිළිබඳ කතා කරමින් සිටියි. මුලින්ම සංවාදයට දෙවරක් සවන් දෙන්න.

미영 신랑하고 수진 씨가 참 잘 어울리지요?
මනමාලයා සමග සුජින් මෙනවිය ඇත්තටම ගැළපෙනවා නේද?

리리 네, 정말 잘 어울려요. 그런데 한국에서는 결혼할 때 한복을 안 입어요?
ඔව් ඇත්තටම හොඳට ගැළපෙනවා. නමුත් කොරියාවේ විවාහ වීමේදී හන්බොක් අඳින්නේ නැද්ද ?

미영 결혼식이 끝나고 나서 폐백을 드리는데 그때 한복을 입어요.
ඔව් ඇත්තටම හොඳට ගැළපෙනවා. නමුත් කොරියාවේ විවාහ වීමේදී හන්බොක් අඳින්නේ නැද්ද ?

리리 폐백이 뭐예요?
පොයබෙක් කියන්නේ මොකද්ද?

미영 결혼할 때 신랑 부모님과 친척들께 하는 인사예요.
විවාහ වෙනකොට මනමාලයාගේ දෙමාපියන්ට සහ ඥාතීන්ට කරන ආචාරයයි.

리리 아, 그렇군요. 한국의 전통 혼례도 보고 싶어요.
ආ එහෙමද. කොරියාවේ සාම්ප්‍රදායික විවාහ උත්සවයකුත් බලන්න ආසයි.

> **참** ඉතා
> · 오늘은 날씨가 참 좋네요.
> අද කාලගුණය ඉතාමත් සීතලයිනේ.
> · 투안 씨는 일을 참 잘해요.
> තුවාන් මහත්මයා වැඩ ඉතා හොඳින් කරනවා.

> **어울리다** ගැළපෙනවා
> · 가: 민수 씨하고 미영 씨가 결혼한다면서요?
> මින්සු මහතා සහ මියොන් මහත්මිය විවාහ වෙනවලු නේද?
> 나: 네, 저도 들었어요. 두 사람이 정말 잘 어울리는 것 같아요.
> ඔව්. මටත් ඇහන්න ලැබුණා, දෙදෙනා ඇත්තටම හොඳට ගැළපෙනවා.



මින්සු මහතා සහ මියොන් මහත්මිය ලෙස දෙබස අනුගමනය කරන්න. හොඳින් සවන් දී අනුගමනය කළා ද? එසේ නම් පහත ගැටළුවට පිළිතුරු සපයන්න.

1. 미영 씨와 리리 씨는 지금 어디에 있어요?
   මියොන් මහත්මිය සහ මින්සු මහතා දැන් කොහෙද ඉන්නේ?
2. 폐백이 뭐예요? පොයබෙක් කියන්නේ කුමක්ද?

정답 1. 수진 씨의 결혼식 2. 신부가 신랑 부모님과 친척들께 하는 인사

어휘 2 වචන මාලාව 2 결혼 문화 විවාහ සංස්කෘතිය




විවාහ සංස්කෘතිය හා සම්බන්ධ ප්‍රකාශයන් මොනවා දැයි බලමු ද?



결혼식
විවාහ උත්සවය



청첩장
විවාහ ආරාධනාව




축의금
සුභ පැතුම් මුදල් තෑගි

신랑
මනමාලයා

신부
මනමාලිය

주례
විවාහය සිදුකරන දේවගැතිතුමා

하객
අමුත්තන්(ආරාධිතයන්)



사진 촬영을 하다
පින්තූර ගැනීම
(ෆොටෝ ෂූට්)



피로연을 하다
විවාහ උත්සවයෙන් පසුව
අමුත්තන්ට සංග්‍රහ කිරීම



폐백을 드리다
සාම්ප්‍රදායික ලෙස
මනමාලයාගේ දෙමාපියන්ට
ආචාර කරනවා





ඉහත ඉගෙන ගත් වචන නැවත මතක් කරමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයා බලමු ද?


1. 그림에 맞는 표현을 〈보기〉에서 골라 문장을 완성하세요.
පින්තූරයට ගැළපෙන ප්‍රකාශය උදාහරණ කොටසින් තෝරා ලියන්න.


1)  제 한국 친구한테서 ___________을 받았어요.

2)  그래서 저는 지난주 토요일에 친구의 ___________에 갔어요.

3)  선물 대신 ___________을 준비했어요.

4)  결혼식이 시작되고 먼저 ___________이 입장했어요.

5)  그리고 ___________가 입장했는데 정말 아름다웠어요.




보기
결혼식
청첩장
신부
축의금
신랑



정답 1) 청첩장 2) 결혼식 3) 축의금 4) 신랑 5) 신부

문법 2 සංවාදය 2 -고 나서



ක්‍රියා පදයකට එකතු කර යම්කිසි ක්‍රියාවක් කර අවසන් වූ පසු තවත් ක්‍රියාවක් කරයි හෝ යම්කිසි සිදුවීමක් සිදුවෙයි යන්න අදහස් කිරීමට භාවිතා වේ.

- 가: 미영 씨, 언제 밥 먹을 거예요? මියොං මහතා කීයටද බත් කන්නේ?
  나: 이 일을 **끝내고 나서** 먹으러 갈 거예요. මේ වැඩය ඉවර වුණාට පස්සේ කන්න යන්නම්.
- 가: 모니카 씨, 당근하고 양파는 어떻게 할까요? මොනිකා මහත්මිය, කැරට් සහ ළූණු වලට මොකද කරන්නේ?
  나: 고기를 **삶고 나서** 볶으세요. මස් යන්තම් තැම්බුවට පස්සේ තෙලේ බදින්න.



'-고 나서' හොඳින් අවබෝධ වුනා ද? එසේ නම් මෙම යෙදුම භාවිතා කර දෙබස සම්පූර්ණ කරන්න.

2. 그림을 보고 '-고 나서'를 사용해서 대화를 완성하세요.
   පින්තූරය බලා '-고 나서' භාවිතා කරමින් සංවාදය සම්පූර්ණ කරන්න.

1) 

가: 언제 폐백을 드려요? කොයි වෙලාවට ද පොසපෙක් කරන්න යන්නේ?
나: ________________ 폐백을 드려요.

2) 

가: 언제 밥 먹으러 갈까요? කීයට බත් කන්න යමු ද?
나: ________________ 갑시다.

정답 1) 결혼식을 하고 나서 2) 사진을 찍고 나서



තව ටිකක් පාඩම් කරමු ද? '-고 나서' භාවිතා කරමින් වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. 아침을 ________________________________.
2. 장을 ________________________________.

정답 1. 먹고 나서 회사에 가요 2. 보고 나서 요리해요



활동 ක්‍රියාකාරකම්

〈보기〉처럼 이야기해 보세요. උදාහරණයෙන් පෙන්වාදී ඇති අයුරින් කතා කරලා බලන්න.

보기

다음 주 토요일 ලබන සෙනසුරාදා

수진 씨 아기 돌
සුජින් මහත්මියගේ දරුවාගේ පළමු වන උපන්දිනය

가: 다음 주 토요일이 수진 씨 아기 돌인데 무슨 선물을 하면 좋을까요?
ලබන සෙනසුරාදට සුජින් මහත්මියගේ දරුවගේ පළමු උපන්දිනය, මොනවගේ තෑග්ගක් දෙන එකද හොඳ?

나: 아기 옷을 선물하는 게 어때요?
ළමා ඇඳුම් තෑගි ලෙස දෙන එක කොහොමද?

1) 5월 15일

스승의 날

2) 내일

친구 생일

3) 다음 주 일요일

친구 결혼식

4) 이번 주 토요일

반장님 집들이

유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

일할 맛이 나요. වැඩ කරන්න ආස හිතෙනවා.

가: 상여금을 받아서 기분이 좋네요. ප්‍රසාද දීමනා (බෝනස්) ලැබුනු නිසා හිතට සතුටුයි නේ.
나: 맞아요, **일할 맛이 나요**. ඔව්. **වැඩ කරන්න ආස හිතෙනවා.**

한국인의 경조사

කොරියානුවන්ගේ පවුලේ උත්සව

돌 පළමු උපන්දිනය

아기가 태어난 후 1년이 되면 돌잔치를 합니다. 아기의 부모는 친척과 친구들을 초대해서 같이 밥을 먹는데 이때 '돌잡이'를 합니다. '돌잡이'는 아기의 미래를 알아보기 위해 여러 가지 물건을 놓고 아기가 잡게 하는 것입니다.



දරුවෙකු ඉපදී අවුරුද්දක් ගතවූ පසු එන පළමු උපන් දිනයට "දොල්ජන්චි" උත්සවය ගන්නවා. දරුවාගේ දෙමාපියන් ඥාතීන් සහ යහලුවන්ට ආරාධනා කර එකට ආහාර ගැනීම සිදු කරන අතර මේදිනට "දොල්ජාබි"ත් කරනවා. දරුවාගේ අනාගතය දැන ගැනීම සඳහා විවිධ වර්ගයේ බඩු තියා දරුවාට අල්ලන්න සැලැස්වීම " දොල්ජාබිv යනුවෙන් හඳුන්වනවා.

결혼 විවාහ උත්සවය

한국인의 결혼식에는 전통 혼례와 현대적인 결혼식이 있는데 요즘은 결혼식장이나 호텔에서 현대적인 결혼식을 많이 합니다. 그렇지만 전통적인 모습도 많이 남아 있는데, 결혼식이 끝나고 나서 신랑 부모님과 친척들께 드리는 인사인 폐백이 대표적입니다.



කොරියානුවන්ගේ විවාහ උත්සව සාම්ප්‍රදායික ක්‍රමයට සහ නවීන ක්‍රමයට යන දෙවිදිහටම පවත්වයි. වර්තමානයේ බොහොමයක් විවාහ උත්සව උත්සව ශාලාවක හෝ හෝටලයක නවීන ක්‍රමයට සිදුකරයි. ඒ වුනත් සමහර සාම්ප්‍රදායික විවාහ චාරිත්‍ර අදටත් දක්නට ලැබෙයි. විවාහ උත්සවය අවසන් වු පසු මනමාලයගෙ දෙමාපියන්ට සහ ඥාතීන්ට කරන ආචාර (පෙයපෙක්) අදටත් දක්නට ලැබෙන ප්‍රධාන සාම්ප්‍රදායික විවාහ චාරිත්‍ර ක්‍රමයකි.

제사 පූජාව

어른이 돌아가시면 매년 돌아가신 날에 가족들이 모여 제사를 지냅니다. 요즘은 많이 간소화 되었으나 제사상에는 전, 나물, 과일, 고기 등 정성스럽게 만든 음식들을 올립니다. 명절 아침에 드리는 제사는 차례라고 합니다.



වැඩිහිටියන් මියගිය පසු සෑම අවුරුද්දක් පාසා ඔවුන් මියගිය දින පවුලේ අය එකට එකතු වී එම වැඩිහිටියන් සිහි කරමින් ඔවුන් සඳහා පූජාවක් පවත්වයි. මෙය වර්තමානයේ ඉතා සරල ලෙස සිදුකරද සාමාන්‍යයෙන් මේ සඳහා ඖෂධ පැළෑටි, පළතුරු, මස් ආදී ආහාර වර්ග හදපිරි දයාවෙන් සූදානම් කර පූජා කරයි. සැමරුම් දින උදෑසන පවත්වන පූජා 'චාරෙ' ලෙස හඳු න්වයි.

장례 අවමංගල්‍ය උත්සවය

장례식장에 갈 때에는 검은색 옷을 입고 갑니다. 장례식장에서는 돌아가신 분에 대한 묵념을 하거나 절을 하고 돌아가신 분의 가족들에게 인사를 합니다. 보통 한국에서는 돌아가신 날로부터 3일이나 5일 동안 장을 치릅니다.



අවමංගල්‍ය උත්සවයකට යනවිට කළු ඇඳුමින් සැරසී යා යුතුය. අවමංගල්‍ය උත්සවයේදී මොහොතක් නිශ්ෂබ්දව සිටිමින් මිය ගිය පුද්ගලයා හට ගෞරව කොට එම පුද්ගලයාගේ පවුලේ අයට ආචාර කරනු ඇත. සාමාන්‍යයෙන් කොරියාවේ මිය ගිය දිනයේ සිට දින 3 ත් 5 ත් අතර කාලයක් පුරා අවමංගල්‍ය කටයුතු සිදුකරනු ලැබේ.



EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK



අංක 1 සිට 3 දක්වා ඇත්තේ ප්‍රශ්නයට සවන් දී ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්නය වේ. හොඳින් අසා ගැළපෙන පිළිතුර තෝරන්න.

[1~3] 질문을 듣고 알맞은 대답을 고르십시오.
ප්‍රශ්නයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන්න.



1. ① 감사합니다. ② 미안합니다.
   ③ 괜찮습니다. ④ 축하합니다.

2. ① 지난주에 결혼을 했지요?
   ② 옷을 선물하는 게 어때요?
   ③ 이런 선물을 줘서 고마워요.
   ④ 제 생일은 다음 주 토요일이에요.

3. ① 아기가 참 예쁘네요.
   ② 돌잔치가 참 재미있어요.
   ③ 금반지를 선물하는 게 좋아요.
   ④ 아기 생일을 축하하고 같이 밥을 먹어요.



පහත දැක්වෙන්නේ සංවාදයට සවන් දී ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්නය වේ. සංවාදයට සවන් දීමට පෙර උදාහරණයේ අන්තර්ගතය එක වරක් විමසා බලන්න.

[4~5] 하나의 이야기를 듣고 두 개의 질문에 대답하십시오.
පහත දැක්වෙන කතාවට සවන්දී ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

4. 두 사람은 어디에 가려고 합니까? පුද්ගලයින් දෙදෙනා කොහෙද යන්න ඉන්නේ?
   ① 집들이 ② 돌잔치
   ③ 장례식 ④ 결혼식

5. 남자는 무슨 색 옷을 입을 것입니까? පිරිමියා කුමන වර්ණයේ ඇඳුමක්ද අඳින්න ඉන්නේ?
   ① 빨간색 ② 까만색
   ③ 하얀색 ④ 파란색



듣기 대본 ශ්‍රවණ පිටපත

1. 여: 지훈 씨, 정말 멋있네요. 결혼 축하해요.
   චිහුන් මහතා ඇත්තටම කඩවසම්. විවාහයට සුභපැතුම්.
2. 남: 다음 주 토요일이 친구 생일인데 무슨 선물을 하면 좋을까요?
   ලබන සතියේ සෙනසුරදා මගේ මිතුරාගේ උපන්දිනය යි. මොනවගේ තෑග්ගක් දුන්නොත් හොඳයි ද?
3. 여: 건우 씨, 한국에서는 돌잔치 때 뭐 해요?
   කොන්වු මහතා, කොරියවේ පළමුවන උපන්දිනයට මොනවද කරන්නේ?

4-5.

여: 소식 들었어요? 현석 씨 아버지가 돌아가셨어요.
ආරංචිද? හොයාන්සොක් මහත්මියගේ තාත්තා මිය ගිහින්.

남: 정말이요? 현석 씨가 많이 힘들겠네요.
ඇත්තට? හොයාන්සොක් මහත්මියට හිතට ගොඩක් අමාරු ඇති.

여: 오늘 저녁에 리한 씨하고 가 보려고 하는데 같이 갈래요?
අද හවසට ලිහන් මහත්මයා සමඟ බලන්න යන කියලා. එකට යමු ද?

남: 네, 오늘 저녁에 같이 가요. ඔව්. අද හවසට එකට යමු.

여: 그런데 장례식장에 갈 때는 까만색 옷을 입고 가야 돼요.
නමුත් අවමංගල්‍ය උත්සවයට යනකොට කළු ඇඳුම් ඇඳලා යන්න ඕනේ.

남: 그럼 집에 가서 까만색 옷을 입고 올게요. එහෙනම් ගෙදර ගිහින් කළු ඇඳුම් ඇඳන් එන්නම්.

정답 1. ① 2. ② 3. ④ 4. ③ 5. ②

확장 연습 වැඩිදුර අභ්‍යාස

L-34

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු තෝරන්න.

   여자가 이사를 하려고 하는 이유는 무엇입니까? ඇයි කාන්තාව ගෙවල්මාරු කරන්න යන්නේ?

   ① 교통이 불편해서
   ② 방이 좁고 불편해서
   ③ 주변이 시끄러워서
   ④ 공기가 깨끗하지 않아서

확장 연습 듣기 대본 වැඩිදුර අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 여: 다음 주에 지하철역 근처로 이사를 가려고 해요.
   ඊළඟ සතියේ උමං දුම්රිය ස්ථානය අසලට ගෙවල් මාරු කරලා යන්න කියලා හදන්නේ.

   남: 왜요? 지금 기숙사가 좋지 않아요? 방도 크고 깨끗하잖아요.
   ඇයි? දැන් ඉන්න නේවාසිකාගාරය හොඳ නැද්ද? කාමරයත් ලොකුයි වගේම පිරිසිදුයිනේ.

   여: 기숙사가 편하고 좋은데 대중교통을 이용하기가 너무 불편해요.
   නේවාසිකාගාරය පහසුයි වගේම හොඳ වුවත් පොදු ප්‍රවාහනය භාවිතා කිරීමට ගොඩක් අපහසුයි.

   남: 맞아요. 지하철역 근처로 이사하면 교통은 편리하겠네요.
   ඇත්ත. උමං දුම්රිය ස්ථානය අසලට ගෙවල් මාරු කරලා යනවා නම් පොදු ප්‍රවාහන පාවිච්චිය නම්. පහසුවෙයි.

정답 1. ①



EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සිට 3 දක්වා ඇත්තේ හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්නයි. අන්තර්ගතයට ගැළපෙන පිළිතුර තෝරන්න.

[1~3] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1.

한국에서는 아기의 첫 번째 생일을 ____________(이)라고 합니다. 이를 기념하기 위해 가족과 친척들이 모여 같이 밥을 먹고 축하를 해 줍니다.

කොරියාවේ දරුවන්ගේ පළමු උපන්දිනය පළමු උපන් දිනය කියා හඳුන්වයි. මෙය සැමරීමට පවුලේ අය සහ ඥාතීන් එකට එකතු වී ආහාරගෙන දරුවාගේ පළමු උපන්දිනය වෙනුවෙන් සුභපතයි.

① 돌 ② 백일 ③ 집들이 ④ 결혼기념일

2.

가: 진영 씨 소식 들었어요? 진영 씨가 다음 달에 결혼해요.

ජියොන් මහත්මිය ගැන ආරංචි ද? ජියොන් මහත්මිය ලබන මසයේ විවාහ වෙනවා.

나: 네, 저도 어제 ____________을 받았어요. 남자 친구를 사귄 지 얼마 안 됐는데 벌써 결혼을 한다니 깜짝 놀랐어요.

ඔව්. මටත් ඊයේ (ආරාධනා පත්‍රයක්) ලැබුනා. පෙම්වතා එක්ක යාලුවෙලා ලොකු කාලයක් ගතවුනේ නැති නිසා දැන්ම විවාහ වෙනවා කිව්වහම පුදුම හිතුනා.

① 선물 ② 피로연 ③ 청첩장 ④ 축의금

3.

한국의 결혼은 전통 혼례와 서양식 결혼식이 있습니다. 요즘에는 보통 웨딩드레스를 입고 서양식 결혼식을 많이 하지만 전통 혼례의 풍습도 아직 남아 있습니다. 결혼식이 끝난 후에 신랑 부모님과 친척들에게 인사를 드리는데 이것을 ____________(이)라고 합니다.

කොරියාවේ විවාහ උත්සවයන් සාම්ප්‍රදායික ක්‍රමයට සහ බටහිර ක්‍රමයට පවත්වයි. වර්තමානයේ සාමාන්‍යයෙන් වෙඩින් ඇඳුම් ඇඳ බටහිර ක්‍රමයේ විවාහ උත්සව ගොඩක් පැවැත්තුවත් සාම්ප්‍රදායික විවාහ උත්සව වල්දී අනුගමනය කළ සමහර චාරිත්‍ර අදටත් දක්කට ලැබෙයි. විවාහ උත්සවය අවසන් වූ පසුව මනාලයාගේ දෙමාපියන් සහ ඥාතීන්ට ආචාර කරන අතර මෙය (පෙයිබෙක්) කියා කියයි.

① 함 ② 맞선 ③ 폐백 ④ 상견례

පහත දැක්වෙන ඡේදය කියවා දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ඉගනගත් දේ මතක් කරමින් ගැටලුව විසඳන්න.

[4~5] 다음 글을 읽고 물음에 답하십시오. පහත ඡේදය කියවා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

새로운 집에 이사를 가면 가족이나 친구를 초대해서 ____________을/를 합니다. 초대를 받아서 갈 때에는 선물을 사 가는데 보통 휴지나 세제를 많이 선물합니다. 휴지는 일이 잘 되라는 의미가 있고 세제는 빨리 부자가 되라는 의미가 있습니다. 요즘은 부부가 함께 쓸 수 있는 커피 잔이나 화분같은 것을 선물하기도 합니다.

අලුත් නිවසකට ගෙවල් මාරුකර යාමේදී පවුලේ අයට සහ යහළුවන්ට ආරාධනා කර (ගෙට ගෙවදීමේ උත්වයක්) පවත්වයි. ආරාධනාවක් ලබා උත්සවයට යන විට තෑග්ගක් මිළදීගෙන රැගෙන යන අතර සාමාන්‍යයෙන් තෑගි ලෙස ජෙපර් සර්වියට් දෙනු ලැබේ. ජෙපර් සර්වියට් වලින් වැඩ සියල්ල හොඳින් සිදුවේවා යන්න අර්ථවත් කරන අතර පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය වලින් ඉක්මනින් පොහොසත් වේවා යන අර්ථ ගෙනදෙයි. වර්තමානයේ ජෝඩුවකට එකට භාවිතා කළ හැකි කෝපි කෝප්ප හෝ මල් බඳුන් ආදියත් තෑගි ලෙස දෙනු ලබයි.



4. 빈칸에 들어갈 말로 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

① 돌잔치 ② 집들이 ③ 결혼식 ④ 생일 파티

5. 세제를 선물하는 것은 어떤 의미입니까? පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය තෑගි ලෙස දීමෙන් කුමන අදහසක් ප්‍රකාශ වේද?

① 일이 잘 되기를 바랍니다. ② 건강하게 살기를 바랍니다.
③ 빨리 부자가 되기를 바랍니다. ④ 새 집에서 오래 살기를 바랍니다.

정답 1. ① 2. ③ 3. ③ 4. ② 5. ③

확장 연습 වැඩිදුර අභ්‍යාස

[1~3] 다음 글을 읽고 무엇에 대한 글인지 고르십시오.
පහත දැක්වෙන ඡේදය කියවා කුමක් පිළිබඳ සදහන් වී ඇති ඡේදයක්ද යන්න තෝරන්න.

1.

매년 5월 8일은 부모님의 은혜에 감사하는 날입니다. 자녀들이 부모님에게 꽃을 달아 드리고 감사의 마음을 전합니다.

සෑම අවුරුද්දකම මැයි 8 වෙනිදා දෙමාපියන්ගේ කරුණාවට අපගේ කෘතවේදීත්වය පළ කරන දිනයයි. දරුවන් දෙමාපියන්ට මල් ලබා දී හදවතින්ම කෘතඥතාව පළ කරයි.

① 어린이날 ② 어버이날 ③ 스승의 날 ④ 국군의 날

2.

한국 사람의 집에 들어갈 때는 신발을 벗고 들어가야 합니다. 또 집에 들어가면 먼저 집 안 어른께 인사를 드려야 합니다.

කොරියානු නිවසකට ඇතුල් වන විට පාවහන් ගලවා ඇතුල් විය යුතුය. එසේම නිවසට ඇතුලු වීමෙන් පසු පළමුව නිවසේ සිටින වැඩිහිටියන් හට ආචාර කල යුතුය.

① 방문 예절 ② 언어 예절 ③ 직장 예절 ④ 식사 예절

3.

저는 회사에서 오전 9시부터 오후 6시까지 일합니다. 12시부터 1시까지는 점심시간입니다. 일이 많을 때에는 저녁 9시까지 야근을 할 때도 있습니다.

මම උදෑසන 9 සිට සවස 6 දක්වා කාර්යාලයේ වැඩ කරනවා. දහවල් 12 සිට 1 දක්වා දිවා ආහාරය කාලයයි. වැඩ ගොඩක් ඇති විට රාත්‍රී 9 දක්වා වැඩ කරන වෙලාවන්ද තියෙනවා.

① 퇴근 시간 ② 회의 시간 ③ 근무 시간 ④ 출근 시간

정답 1. ② 2. ① 3. ③




한국 드라마가 재미있잖아요

කොරියන් නාට්‍ය විනෝදජනකය

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

▫ අධ්‍යයන අරමුණු	හේතුදැක්වීම, අනුමාන කිරීම
▫ ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස්	–잖아요, –는/(으)ㄴ 것 같다
▫ වචන භාවිතය සඳහා උපදෙස්	කොරියාවේ ජනප්‍රිය සංස්කෘතිය, ආර්ථිකය සහ කර්මාන්ත
▫ සංස්කෘතික තොරතුරු	හන්ල්‍යු සංචාර

대화 1 සංවාදය 1





මිළගට සුපිකා සහ හඹං අතර සංවාදයි. මුලින්ම සංවාදයට දෙවරක් සවන් දී අනුගමනය කරන්න.

수피카 지금 드라마가 시작돼요. 흐엉 씨, 빨리 오세요.
ටෙලිනාට්‍ය දැන් පටන්ගන්නවා, හඹං මහත්මිය ඉක්මනට එන්න.

흐　엉 오, 김수현 씨 정말 멋있지 않아요?
우리 고향 친구들도 아주 좋아해요.
ඕ, කිම්සුහ්‍යොන් ඇත්තටම හරිම කඩවසම්, නැද්ද? අපේ ගමේ යහළුවොත් ගොඩක් කැමතියි.

수피카 흐엉 씨 고향에서도 한국 드라마가 인기가 있어요?
හඹං මහත්මියගේ ගමේත් කොරියන් ටෙලිනාට්‍ය ජනප්‍රිය ද?

흐　엉 그럼요. 한국 드라마가 재미있잖아요.
수피카 씨는 한국 연예인 중에 누구를 제일 좋아해요?
නැත්නම්(කොරියන් ටෙලිනාට්‍ය විනෝදාත්මකයිනේ. සුපිකා මහත්මිය කොරියනු කලාකරුවන් අතරින් කාටද වැඩියෙන්ම කැමති?

수피카 저는 빅뱅을 제일 좋아해요. 멋있잖아요.
මම බිග්බෑං ට ගොඩක් කැමතියි. කඩවසම්නේ.

–지 않아요?
තමන් සිතමින් සිටින දෙයක් පිළිබඳව අනික් පුද්ගලයාගෙන් තහවුරු කරගැනීමට හදන අවස්ථා වලදී භාවිතා කරයි.

· 가: 이 드라마 참 재미있지 않아요?
　මේ නාට්‍ය ගොඩක් විනෝදජනකයි, නැද්ද?
　나: 네, 재미있어요.
　ඔව්ල විනෝදජනකයි.
· 가: 김치찌개가 맵지 않아요?
　කිම්චිචිගේ සැර නැද්ද?
　나: 아니요, 안 매워요.
　නැහැ. සැර නැහැ.

인기 ජනප්‍රියයි
· 민수 씨는 여자들에게 인기가 많아요.
　මින්සු මහත්මයා කාන්තාවන් අතර ජනප්‍රියයි.
· 이 영화는 남자보다 여자에게 더 인기가 있어요.
　මෙම චිත්‍රපටය පිරිමින්ට වඩා කාන්තාවන් අතර තවත් ජනප්‍රියයි.



හොඳින් සවන් දී අනුගමනය කළා ද? එසේ නම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 두 사람은 무엇을 보고 있어요? පුද්ගලයින් දෙදෙනා කුමක් ද බලමින් සිටින්නේ?
2. 수피카 씨는 한국 연예인 중에 누구를 제일 좋아해요?
   සුපිකා කොරියන් කලාකරුවන් අතරින් කාටද වැඩියෙන්ම කැමති?

정답 1. 드라마 2. 빅뱅



어휘 1 වචන මාලාව 1 　 한류 හන්ල්‍යු (කොරියාවේ ජනප්‍රිය සංස්කෘතිය)

කොරියාවේ ජනප්‍රිය සංස්කෘතිය හා සම්බන්ධ මොනවාගේ ප්‍රකාශයන් ඇත් දැයි බලමු ද?

케이팝(K-pop)
කොරියන් පොප්

드라마
ටෙලි නාට්‍ය

한류
හන්ල්‍යු (කොරියාවේ ජනප්‍රිය සංස්කෘතිය)

예능프로그램
විනෝදාත්මක වැඩසටහන්

영화
චිත්‍රපට

음악프로그램
සංගීත වැඩසටහන්

연예인
කලාකරුවා

가수
ගායකයා

영화배우
නලුවා

아이돌
සංගීත කලාකරුවන්



ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට උත්සහ කරන්න.

1. 그림을 보고 알맞은 말을 연결하세요. පින්තූරය බලා ගැළපෙන වචනය යා කරන්න.




① ② ③ ④

㉠ 영화 　 ㉡ 음악 프로그램 　 ㉢ 드라마 　 ㉣ 예능 프로그램

정답 ① ㉠ ② ㉢ ③ ㉡ ④ ㉣

문법 1 සංවාදය 1 -잖아요



ක්‍රියාපද හා විශේෂණ පද, නාම පදයකට එකතු කර, සවන් දෙන්නා සහ කථකයා කතාවට ලක්වන අන්තර්ගතය දැනටමත් දන්නා විටදී භාවිතා වේ. නාම පදයක් සමග යෙදෙන විට 'නාම පදය + -(이)잖아요' ස්වරූපය භාවිතා කරයි.

· 가: 수피카 씨의 친구들도 한국 가수를 좋아해요?
  සුපීකා මහත්මියගේ මිතුරනුත් කොරියානු ගායකයන්ට කැමතිද?
  나: 그럼요. 노래도 잘하고 **멋있잖아요**. එහෙනම්! සින්දුත් හොඳට කියනවා වගේම ස්මාට්නේ.
· 가: 주말에 쇼핑하러 백화점에 갈까요? සතිඅන්තයේ ෂොපින් කරන්න දෙපාර්තමේන්තු වෙළෙඳසැලට යමුද?
  나: 다음 주말에 가는 게 어때요? 다음 주말부터 세일 **기간이잖아요**.
  ලබන සතියේ යන එක ගැන මොකද හිතන්නේ? ලබන සති අන්තයේ ඉඳලා සේල් දානවානේ.



'-잖아요' හොඳින් අවබෝධ වුනා ද? එසේ නම් පහත සංවාදය කියවා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

2. 대화를 읽고 맞는 대답을 고르세요. සංවාදය කියවා ගැළපෙන පිළිතුර තෝරන්න.

1) 가: 모니카 씨, 이 사과 어디에서 샀어요? මොනිකා මහත්මිය, මේ ඇපල් කොහෙන්ද මිළට ගත්තේ?
   나: 시장에서 샀어요. ______________. පොළෙන් ගත්තේ. (පොළේ ලාබයිනේ).

   ① 시장이 싸잖아요　　② 시장이 비싸잖아요

2) 가: 투안 씨, 왜 우산을 가지고 왔어요? තුවාන් මහත්මයා, ඇයි කුඩයක් අරන් ආවේ?
   나: 밖을 보세요. ______________. පිටත බලන්න. (වහිනවානේ).

   ① 비가 오잖아요　　② 날씨가 좋잖아요

정답 1) ① 2) ①



තව ටිකක් පාඩම් කරමු ද? '-잖아요' භාවිතා කර පහත දෙබස සම්පූර්ණ කරන්න.

1. 가: 이 식당에 자주 오네요.
   나: 음식이 ______________.
2. 가: 투안 씨는 한국어를 참 잘하지요?
   나: 네, 열심히 ______________.
3. 가: 왜 채소만 먹어요?
   나: 건강에 ______________.
4. 가: 상우 씨가 인기가 많네요.
   나: 친절하고 ______________.

정답 1. 맛있잖아요 2. 공부하잖아요 3. 좋잖아요 4. 멋있잖아요

유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

입에 잘 맞아요. මගේ කටේ රසට ගැළපෙනවා.

가: 한국 음식이 매워서 먹기 힘들지요? කොරියන් ආහාර සැර නිසා කන්න අමරු ද?
나: 아뇨, **입에 잘 맞아요**. නැහැ. **මගේ කටේ රසට ගැළපෙනවා.**



대화 2 සංවාදය 2

Track 110



රිහාන් සහ තුආන් කොරියාවේ ජංගම දුරකතන පිළිබඳ කතා කරමින් සිටියි. දෙදෙනා කුමක් පිළිබඳ කතාකරමින් සිටියි ද? මුලින්ම සංවාදයට දෙවරක් සවන් දෙන්න.

리한 투안 씨, 스마트폰 새로 샀어요?
තුවාන් මහත්මයා, ස්මාට් ෆෝන් එකක් අලුතින් මිලදී ගත්ත ද?

투안 네, 삼성전자에서 나온 신제품이에요.
ඔව්, සම්සොං එකෙන් අලුතින්ම හඳුන්වා දීපු ෆෝන් එක.

리한 저도 휴대폰을 바꿔야 되는데 그거 어때요?
මමත් ජංගම දුරකථනය මාරු කරන්න ඕනේ ඕක කොහොමද?

투안 화면도 크고 편리한 기능도 많은 것 같아요.
ස්ක්‍රීන් එක ලොකුයි වගේම පහසුකමුත් ගොඩක් තියනවා වගේ.

리한 한번 봐도 돼요?
එක සැරයක් බලන්න පුළුවන් ද? (මට ටිකක් බලන්න දෙනව ද)

투안 네, 요즘 한국 휴대폰이 우리 나라에도 많이 수입되는 것 같아요. 제 친구들도 많이 써요.
ඔව්, මේ දවස් වල කොරියන් ජංගම දුරකථන අපේ රටටත් ගොඩක් ආනයනය කරනවා වගේ. මගේ යහළුවොත් ගොඩක් පාවිච්චි කරනවා.

리한 휴대폰이 한국의 대표적인 수출품이잖아요.
ජංගම දුරකථන කොරියාවේ ප්‍රධානතම අපනයන භාණ්ඩයනේ.

> **새로** අලුත්
> ① මෙතෙක් තිබූ දේවල් හා වෙනස් අලුතින් නැතහොත් අලුත් දෙයක් මගින්
> ② මෙතෙක් නොතිබුණු දෙයක් ප්‍රථමයෙන්ම
> · 컴퓨터가 고장이 나서 새로 컴퓨터를 샀어요.
> පරිගණකය කැඩුන නිසා අලුත් පරිගණකයක් මිලදී ගත්තා.
> · 이 집은 새로 지어서 깨끗해요.
> මෙම නිවස අලුතින් ඉදිකල නිවසක් නිසා පිරිසිදුයි.

> **대표적인** නියෝජනය කරන / ප්‍රධාන
> යම් විෂය ශ්‍රේස්ත්‍රයක හෝ යම් කාණ්ඩයක ගුණාංගයක් හෝ ස්වභාවයක් නිරූපනය කිරීමේදී ප්‍රධාන වශයෙන් කැපීපෙන දේ.
> · 한국의 대표적인 관광지는 제주도예요.
> කොරියාවේ සංචාරක ස්ථාන අතරින් ප්‍රධාන තැනක් ගන්නේ ජේජු දූපත වේ.
> · 비빔밥은 한국의 대표적인 음식이에요.
> පිබිම්පබ් කොරියාවේ ප්‍රධාන ආහාරයකි.



පහත දැක්වෙන රිහාන් සහ තුවාන්ගේ සංවාදය අනුගමනය කරන්න. හොඳින් සවන් දී අනුගමනය කළා ද? එසේ නම් දී ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. 투안 씨가 새로 산 물건은 어때요? තුවාන් අලුතින් මිලදී ගත් භාන්ඩය කොහොමද?
2. 한국의 대표적인 수출품은 뭐예요?
   කොරියාව නියෝජනය කරන ප්‍රධාන අපනයන භාණ්ඩය කුමක් ද?

정답 1. 화면도 크고 기능도 많아요. 2. 휴대폰



어휘 2 වචන මාලාව 2 경제 및 산업 ආර්ථිකය සහ කර්මාන්ත



ආර්ථිකය සහ කර්මාන්ත හා සම්බන්ධ ප්‍රකාශයන් මොනවාදැයි බලමු ද?



수출하다
අපනයනය කරනවා



수입하다
ආනයනය කරනවා



수출품
අපනයන භාණ්ඩ



수입품
ආනයන භාණ්ඩ



선진국
දියුණු රටවල්



개발도상국
දියුණු වෙමින් පවතින රටවල්



무역
වෙළෙඳාම



경제 발전
ආර්ථික සංවර්ධනය



ඉහත ඉගෙන ගත් වචන නැවත මතක් කර ප්‍රශ්නවලට පිළිතුරු සපයා බලමු ද?



1. 그림에 맞는 표현을 〈보기〉에서 골라 넣으세요.
පින්තූරයට ගැළපෙන ප්‍රකාශය උදාහරණ කොටසින් තෝරා ලියන්න.

1)
2)
3)
4)
5)
6)

보기 수출하다 선진국 수입품 개발도상국 수출품 수입하다

정답 1) 수출하다 2) 수출품 3) 선진국 4) 수입하다 5) 수입품 6) 개발도상국

문법 2 සංවාදය 2 -는/(으)ㄴ 것 같다



ක්‍රියාපදයක හෝ විශේෂණ පදයක අගට එකතු කර වර්තමාන කාලයේ කෙරෙන කාර්යයක් හෝ තත්ත්වයක් අනුමාන කිරීමේදී හෝ තමන්ගේ සිතුවිල්ලක් මෘදු ලෙස පැවසීමේදී යොදාගැනේ.

동사 (ක්‍රියා පදය)	형용사 (විශේෂණ පදය)		명사 (ව්‍යඤ්ජනය)
-는 것 같다	자음 (ස්වරය) → -은 것 같다	모음 (නාම පදය) → -ㄴ 것 같다	인 것 같다
가다 → 가는 것 같다 먹다 → 먹는 것 같다 있다 → 있는 것 같다	크다 → 큰 것 같다 작다 → 작은 것 같다		학생 → 학생인 것 같다 의사 → 의사인 것 같다

· 사람들이 우산을 쓰고 있어요. 밖에 비가 **오는 것 같아요**.
  මිනිස්සු කුඩ ඉහළගෙන ඉන්නවා. එළියේ වහිනවා වගේ.

· 가: 모니카 씨, 화장품을 사야 하는데 어떤 게 좋아요?
  මොනිකා මහත්මිය, රූපලාවන්‍ය බඩු මිලදී ගන්න ඕනේ. මොනවගේ ඒවාද හොඳ?
  나: 이거 한번 써 보세요. 싸고 **좋은 것 같아요**. මේක එක සැරයක් මිළට අරන් බලන්න, මිළත් අඩුයි. හොඳයි වගේ.



대조적 정보 වෙනත් තොරතුරු

අනුමානය හඟවන ප්‍රකාශනයක් කිරීමේදී සිංහල භාෂාවේ 'මල්ලි අද සතුටින් ඉන්නවා වගෙයි' යන්නෙහි 'ඒ වගෙයි' යන්න යොදා ගන්නා ලෙසම කොරියානු භාෂාවේදිත් වාක්‍යයක අවසානයේ යෙදෙන ආඛ්‍යාතයට '-은/는 것 같다' එකතු කර අනුමනාර්ථය ප්‍රකාශ කරනු ලැබේ. එහෙත් වාක්‍යයේ අඛ්‍යාතය ලෙස යෙදෙන පදවර්ගය හෝ කාලභේදයට අනුව '은' සහ '는' ප්‍රභේදනයකොට භාවිතා කරනු ලැබේ.

· 언니가 기분이 좋**은 것 같아요**. තඅක්කා සතුටින් වගෙයි.



'-는/(으)ㄴ 것 같다' හොඳින් අවබෝධ වුනා ද? එසේ නම් පහත සංවාදය කියවා ගැළපෙන පිළිතුර තෝරන්න.

2. 대화를 읽고 맞는 대답을 고르세요. සාංවාදය කියවා ගැළපෙන පිළිතුර තෝරන්න.

1) 가: 모니카 씨는 항상 주말에 친구들을 만나요. මොනිකා මහත්මිය නිතරම සති අන්තයේ මිතුරන් හමු වෙනවා.
나: ______________________.

① 친구가 아주 많은 것 같아요 ② 친구가 한 명도 없는 것 같아요

2) 가: 방가 씨가 한국어 실력이 많이 늘었어요.
පංගා මහතාගේ කොරියානු භාෂා කුසලතාවය ගොඩක් දියුණු වෙලා.
나: ______________________.

① 요즘 한국어 공부를 안 하는 것 같아요 ② 요즘 한국어를 열심히 공부하는 것 같아요

정답 1) ① 2) ②

유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

눈코 뜰 새 없이 바빠요. වැඩ ගොඩක් අධිකයි / කාර්යයබහුලයි.

가: 요즘도 일이 많아요? මේ දවස්වලත් වැඩ වැඩියි ද?
나: 네, **눈코 뜰 새 없이 바빠요**. ඔව්. **ගොඩක් කාර්යයබහුලයි**.



활동 ක්‍රියාකාරකම්

한류 열풍과 수출의 관계에 대한 신문 기사입니다. 잘 읽고 질문에 답하세요.

කොරියාවේ ජනප්‍රිය සංස්කෘතියේ පිබිදීම සහ අපනයනයේ සම්බන්ධතාව පිළිබඳ පත්තර වාර්තාවකි. හොඳින් කියවා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

NEWS TIMES

화장품 수출과 한류 열풍

LG경제연구원이 발표한 보고서에 따르면 한국 문화에 관심이 높을수록 화장품, 의류, 음료, 전자제품, 자동차 등의 상품의 수출이 늘어나는 것으로 나타났다. 미국의 경우 한류에 대한 인터넷 검색이 많아질수록 화장품의 수출도 크게 증가한 것을 알 수 있다. 또한 드라마에 나온 한류 스타들이 화장품 모델을 하면서 수출도 크게 늘었다. 특히 중국과 아시아 지역에서는 최근 5년간 매년 30%씩 꾸준히 수출이 증가한 것으로 나타났다.



검색량은 K-pop과 드라마 검색량의 합(분기별 추이)

රූපලවන්‍ය ආලේපන අපනයන සහ කොරියාවේ ජනප්‍රිය සංස්කෘතියේ පිබිදීම

LG ආර්ථික සමීක්ෂණ ආයතනය කල වාර්තා වලට අනුව ලොවපුරා කොරියන් සංස්කෘතිය පිළිබඳ අවධානය ඉහළයාමත් සමඟම සුවඳ විලවුම්, ඇඳුම්. බීම වර්ග. විදුලි උපකරණ,, වාහන ආදී භාණ්ඩයන්හි අපනයනයේ වැඩි වීමක් ද දක්නට ලැබේ. ඇමරිකාවේ ප්‍රචලිත කොරියාන් ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ අන්තර්ජාල තුළින් ප්‍රචලිත වීමේ ප්‍රතිඵලයක් ලෙස සුවඳ විලවුන් අපනයනය විශාල වශයෙන් වැඩි වීමක් දැක ගත හැකිය. තවද කොරියානු ටෙලිනාට්‍යයෙහි රංගනයේ නිරත වන කළාකරුවන් සුවඳ විලවුන් සඳහා නිරූපිකාවන් ලෙස පෙනීසිටීමත් නිසාවෙන් අපනයන විශාල ලෙස වැඩි විය. විශේෂයෙන්ම චීනය සහ ආසියාතික රටවල පසුගිය වසර 5 තුළ සෑම වසරක් පාසා 30% ඒකාකරී අපනයන වැඩි වීමක් පෙන්වයි.

1. 읽은 내용과 같으면 ○, 다르면 X에 표시하세요.
   කියවූ අන්තර්ගතය හා සමාන නම් ○, අසමාන නම් X ලකුණ යොදන්න.

   1) 중국과 아시아에서는 최근 화장품 수출이 줄어들고 있다. ○ ×

   2) 한국 문화에 대한 관심 때문에 화장품을 사는 사람들이 늘었다. ○ ×

   3) 수출이 늘어난 것은 한류 스타들이 화장품 모델을 하고 있기 때문이다. ○ ×

정답 1) X 2) O 3) O

한류 여행

හන්ලියු සංචාර



한류 열풍으로 인해 한국으로 여행을 오는 외국인 관광객의 수도 늘어났습니다. 2000년대 초반에 방영된 〈겨울연가〉가 큰 사랑을 받고 일본과 중국으로 수출되면서 〈겨울연가〉의 촬영지인 '남이섬'은 이제 아시아의 여행지가 되었고 최근에 방영된 〈별에서 온 그대〉가 중국에서 큰 인기를 끌면서 드라마 촬영지인 거제도, 인천, 가평 등의 여행지가 새로운 관광명소로 떠올랐습니다. 관광지 외에 주인공이 커피를 마시던 카페나 치킨과 맥주를 먹던 치킨 전문점 등을 여행 코스로 한 '별그대 테마 여행' 상품도 등장했습니다.

කොරියාවේ ජනප්‍රිය සංස්කෘතියේ ප්‍රතිඵලයක් ලෙස කොරියාවේ සංචාරයට පැමිණෙන විදේශික සංචාරකයින් ගණනත් ඉහළ යමින් පවත. 2000 වසරේ මුල් බාගයේ පමණ විකාශය වූ 겨울연가 ටෙලිනාට්‍යය ජපානයට සහ චීනයට අපනයනය කිරීමත් සමඟ එම ටෙලිනාට්‍යයෙහි එන දර්ශන අඩංගු නාමිසොම් ප්‍රදේශය ආසියාවේ ප්‍රසිද්ධ සංචාරක ස්ථානයක් බවට පත් වූ අතර වර්තමානයේ විකාශනය කරන 별에서 온 그대 ටෙලිනාට්‍යය චීනයේ විශාල ප්‍රසිද්ධියකට පත්ව ඇති අතර එහි රූගත කිරීම් සිදු කළ ගොජේ දිවයින, ඉන්චොන්, කාප්පොයාන් ආදී සංචාරක ස්ථාන නව සංකල්පයක් සහිත සංචාරක ආකර්ශනයන් බවට පත්ව ඇත, සංචාරක ස්ථාන වලට අමතරව නලුනිළියන් කෝපි බීපු කැෆේ, කුකුල් මස් කමින් බියර් පානය කළ කඩ ආදී ස්ථාන වල සංචාරක අත්දැකීමක් ලබා ගත හැකිවන ලෙස 별그대 තේමා සංචාරයක පැකේජයන්ද හඳුන්වා දී ඇත.



해외 한류 팬들은 한류 스타들을 보면서 그들이 입고 나오는 옷이나 화장품, 가방, 휴대폰 등에 큰 관심을 보여 한국 백화점이나 동대문, 명동 등을 찾는 외국인 관광객도 많아졌습니다. 여행사들은 드라마나 영화 촬영지를 볼 수 있는 여행 상품을 선보이거나 K-pop 스타 공연을 볼 수 있는 여행 상품을 내 놓는 등 다양한 상품을 개발하고 있습니다.

විදේශීක හන්ලියු රසිකයන් කොරියානු කලාකරුවන් අඳින ඇඳුම්, භාවිතා කරන සුවඳ විලවුන්, ජංගම දුරකතන ආදිය පිළිබඳ දැඩි ඇල්මක් දක්වන අතර මෙවැනි නිෂ්පාදන මිළදී ගැනීමට කොරියන් සුපිරි වෙළඳ සැල් සහ දොංදෙමුන්, මියොංදොං ආදි වෙළඳ නගර සොයා යන විදේශික සංචාරකයින් සංඛ්‍යාව වැඩි වී ඇත. සංචාරක ඒජන්සි මඟින් නාට්‍ය හා චිත්‍රපට රූපගත කල ස්ථාන නැරඹීමට හැකි සංචාරක පැකේජ සහ කොරියන් පොප් සංගීත තරු වල සංදර්ශන බැලීමට අවස්ථාව ලබා දෙන සංචාරක පැකේජ ආදී විවිධාකාර නිෂ්පාදනයන් වෙළඳපොලට හඳුන්වා දෙමින් සිටියි.



EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK



අංක 1 සිට 3 දක්වා ප්‍රශ්නය අසා ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්නය වේ. හොඳින් අසා ගැළපෙන පිළිතුර තෝරන්න.

[1~3] 질문을 듣고 알맞은 대답을 고르십시오.
ප්‍රශ්නයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන්න.

Track 111

1. ① 저는 드라마를 봐요.
   ② 음악을 자주 들었어요.
   ③ 저는 빅뱅을 좋아해요.
   ④ 영화에서 볼 수 있어요.

2. ① 석유를 많이 수입해요.
   ② 휴대폰하고 텔레비전이에요.
   ③ 저는 컴퓨터 게임을 많이 해요.
   ④ 요즘 경제가 안 좋아진 것 같아요.

3. ① 네, 재미있잖아요.
   ② 네, 콘서트를 많이 봤어요.
   ③ 아니요, 그래서 매일 봐요.
   ④ 아니요, 예능 프로그램을 좋아해요.



පහත දැක්වෙන්නේ සංවාදයට සවන් දී ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ. සංවාදය සවන් දීමට පෙර උදාහරණයේ අන්තර්ගතය එක වරක් කියවා බලන්න.

[4~5] 하나의 이야기를 듣고 두 개의 질문에 대답하십시오.
සංවාදයට සවන්දී ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

4. 두 사람은 무엇에 대해 이야기하고 있습니까?
   පුද්ගලයින් දෙදෙනා කුමක් පිළිබඳ කතා කරමින්ද සිටින්නේ?
   ① 한국어 ② 한국 노래
   ③ 한국 영화 ④ 한국 드라마

5. 두 사람은 지금 무엇을 할 것입니까?
   පුද්ගලයින් දෙදෙනා දැන් කුමක්ද කරන්නේ?
   ① 콘서트에 갈 것입니다. ② 쇼핑을 할 것입니다.
   ③ 텔레비전을 볼 것입니다. ④ 영화를 보러 갈 것입니다.



듣기 대본 ශ්‍රවණ පිටපත

1. 여: 리한 씨는 한국 연예인 중에 누구를 좋아해요?
   රිහාන් මහත්මයා කොරියන් කළාකරුවන් අතරින් කාටද කැමති?
2. 남: 한국의 대표적인 수출품은 뭐예요? කොරියාවේ ප්‍රධාන අපනයන භාණ්ඩය කුමක්ද?
3. 여: 투안 씨는 한국의 예능 프로그램을 참 좋아하네요.
   තුවාන් මහත්මයා කොරියාවේ විනෝදාත්මක වැඩසටහන් වලට හරියට කැමතියිනේ.

4-5.

여: 투안 씨, 이제 곧 제가 좋아하는 음악 프로그램이 시작되는데 같이 볼래요?
තුවාන් මහත්මයා, ළඟදී මම කැමති සංගීත වැඩසටහන පටන් ගන්න යන්නේ එකට බලමු ද?

남: 네, 좋아요. හරි.

여: 투안 씨도 한국 노래를 좋아해요? තුආන් මහත්මයත් කොරියන් ගීත වලට කැමති ද?

남: 그럼요. 한국 노래를 자주 들어요. නැත්නම්.. කොරියන් ගීත නිතරම අහනවා.

여: 그럼 우리 토요일에 같이 콘서트 보러 갈래요?
එහෙනම් අපි සෙනසුරාදට එකට කොන්සට් එකක් බලන්න යමු ද?

남: 좋아요. 저도 콘서트에 가 보고 싶었어요. හොඳයි. මමත් කොන්සට් එකක ට ගිහින් බලන්න කැමති යි.

정답 1. ③ 2. ② 3. ① 4. ② 5. ③

확장 연습 වැඩිදුර අභ්‍යාස

L-35

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු තෝරන්න.

   여자는 한국어 공부를 어떻게 하고 있습니까? කාන්තාව කොරියානු භාෂාව පාඩම් කරන්නේ කෙසේද?

   ① 학원에 다닙니다. ② 혼자 공부합니다.
   ③ 친구와 같이 공부합니다. ④ 선생님과 함께 공부합니다.

확장 연습 듣기 대본 වැඩිදුර අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 여: 투안 씨, 요즘 한국어 배우러 다닌다면서요?
   තුවාන් මහතා, ඔයා මේ දවස්වල කොරියානු භාෂාව ඉගෙන ගන්න යනවාලු නේද?

   남: 네, 주말마다 근로자센터에서 한국어를 배우는데 아주 재미있어요.
   ඔව්, හැම සති අන්තයකම කම්කරු මධ්‍යස්ථානයේ කොරියානු භාෂාව ඉගෙන ගන්නවා, හරිම විනෝදජනකයි.

   여: 그래요? 저는 혼자서 한국어를 공부해서 그런지 재미도 없고 실력도 늘지 않는 것 같아요. 저도 다음에는 근로자센터에 다녀야겠어요.
   ඇත්තද? මම තනිවම කොරියානු භාෂාව ඉගෙන ගන්නා නිසා එච්චර විනෝදයක් ලබන්නේත් නැ හැකියාව වර්ධනය වෙන්නේත් නැ වගෙයි. ඊලඟ වතාවේ මමත් කම්කරු මධ්‍යස්ථානයට යන්න ඕනේ.

정답 1. ②



EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 ඕදය කියවා ගැළපෙන මාතෘකාවක තෝරන ප්‍රශ්න වේ. අංක 2 සහ 3 ඕදය කියවා ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ. හොඳින් කියවා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

[1~3] 다음 질문에 답하십시오. පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. 다음은 무엇에 대한 글입니까? පහත දක්වෙන්නේ කුමක් හා සම්බන්ධ ඕදයක් ද?

   한국은 1950년에 한국전쟁이 끝난 후 세계에서 가장 가난한 나라였습니다. 그렇지만 1960년대 경제를 개발했고 이후 경제가 크게 발전했습니다.

   කොරියාව 1950 වර්ෂයේ කොරියන් යුද්ධය අවසන් වූ පසුව ලෝකයේ වඩාත්ම දිළිඳු රට බවට පත්විය. නමුත් 1960 වර්ෂයේ ආර්ථික සංවර්ධනය සිදුවූ අතර එතැන් සිට ආර්ථිකය සුවිශේෂී ලෙස වර්ධනය වන්නට විය.

   ① 무역　② 수출품　③ 수입품　④ 경제 발전

2. 이 사람에 대한 설명으로 맞는 것을 고르십시오. මෙම පුද්ගලයා සම්බන්ධ නිවැරදි විස්තරය තෝරන්න.

   저는 한국 노래를 좋아해서 한국에 왔습니다. 처음 텔레비전에서 우연히 한국 아이돌이 나오는 콘서트를 봤는데 춤도 잘 추고 노래도 잘하는 모습에 반했습니다. 그래서 한국 노래를 듣고 이해하고 싶어서 한국어를 공부하기 시작했습니다.

   මම කොරියන් සිංදු වලට කැමති නිසා කොරියාවට ආවා. මුලින්ම රූපවාහිනියෙන් අහම්බෙන් මෙන් කොරියන් ගායකයන්ගේ සංගීත ප්‍රසංගයක් දැක්කා, දක්ෂ ලෙස නර්තනයේ ගායනයේ නිරත වෙන අයුරු දැකලා ආසවෙන්න පටන් ගත්තා. ඒ නිසා කොරියන් සිංදු වලට සවන් දී තේරුම් ගන්නට ආස නිසා කොරියන් භාෂාව ඉගෙන ගන්න පටන් ගත්තා.

   ① 지금 고향에 있습니다.　② 한국 노래를 좋아합니다.
   ③ 한국어를 할 수 없습니다.　④ 한국 노래를 자주 안 듣습니다.

3. 한국의 수출에 대한 설명으로 맞는 것을 고르십시오.
   කොරියාවේ අපනයනය හා සම්බන්ධ නිවැරදි පිළිතුර තෝරන්න.

   한국의 경제는 수출 중심입니다. 1980년대 이전에는 단순한 조립 제품을 수출했지만 1990년대 이후 자동차와 기계 등을 수출했고 2000년대부터는 휴대전화나 컴퓨터와 같은 전자제품의 수출이 늘었습니다.

   කොරියාවේ ආර්ථිකය අපනයන අභිමුඛ වේ. 1980 වර්ෂයට පෙර ඉතා සුළු පරිමානයේ වාහන කොටස් නිෂ්පාදන අපනයන කලත් 1990 වර්ෂයෙන් පසුව වාහන සහ යන්ත්‍ර ආදිය අපනයනය කරලා 2000 වර්ෂයේ සිට ජංගම දුරකථන සහ පරිගණක ආදී ඉලෙක්ට්‍රොනික් නිෂ්පාදන අපනයනය වැඩිවිය.

   ① 한국은 수입을 많이 합니다.
   ② 1980년대에는 수출을 전혀 안 했습니다.
   ③ 1990년대에 조립 제품을 많이 수출했습니다.
   ④ 2000년대의 대표적인 수출품은 휴대전화입니다.



පහත දැක්වෙන ඕදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



[4~5] 다음 글을 읽고 물음에 답하십시오. පහත ඡේදය කියවා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1990년대부터 중국과 동남아를 중심으로 인기를 얻기 시작한 한국의 대중문화를 한류라고 합니다. 최근에는 아이돌을 중심으로 한 K-pop이 아시아는 물론 유럽과 미국에서까지 큰 인기를 얻고 있고 배우들과 가수들이 외국에 나가서 활동하는 경우도 늘고 있습니다. 한류로 인해 한국의 음식이나 한국어에 대한 관심도 같이 높아져서 관광 수입도 크게 늘어나고 있습니다.

1990 වර්ෂයේ සිට චීනය සහ ගිනිකොණදිග ආසියාවේ අවට ප්‍රසිද්ධ වීමට ආරම්භ වූ කොරියාවේ ජනප්‍රිය සංස්කෘතිය 한류 ලෙස හඳුන්වයි. වර්තමානයේ ගායකයන් මූලිකව ප්‍රසිද්ධියට පත් වූ කොරියන් පොප් සංගීත කාලාව ආසියාවේ පමණක් නොව යුරෝපය සහ ඇමරිකාව තුළත් විශාල ජනප්‍රියත්වයක් හිමිකරගනිමින් සිටින අතර කොරියාවේ ජනප්‍රිය නලුවන් සහ ගායකයන් විදේශ රටවල සංචාරයේ යෙදෙමින් රසිකයින් සඳහා වැඩසටහන් පවත්වන අවස්ථාත් වැඩි වෙමින් පවතී. කොරියාවේ ජනප්‍රිය සංස්කෘතිය හේතුවෙන් කොරියාවේ කෑම සහ කොරියාව පිළිබඳ උනන්දුව වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස සංචාර කර්මාන්තය ආශ්‍රිතව උපයන ආදායම විශාල වශයෙන් ඉහළ යමින් පවතී.

4. 한류에 대한 설명으로 맞는 것을 고르십시오.
කොරියාවේ ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ විස්තර කරන නිවැරදි පිළිතුර තෝරන්න.

① 최근에 시작되었다. ② 동남아의 대중문화이다.
③ 유럽과 미국에서도 인기가 있다. ④ 외국에서 활동하는 배우는 전혀 없다.

5. 한류의 영향으로 맞는 것은 무엇입니까?
කොරියාවේ ජනප්‍රිය සංස්කෘතියේ බලපෑම පිළිබඳ විස්තර කරන නිවැරදි පිළිතුර කුමක්ද?

① 한국어를 배우는 사람이 없다. ② 음악보다 드라마가 인기가 있다.
③ 한국 음식에 대한 관심이 많아졌다. ④ 한국으로 여행 오는 사람은 많지 않다.

정답 1. ④ 2. ② 3. ④ 4. ③ 5. ③

확장 연습 වැඩිදුර අභ්‍යාස

[1~2] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. 제 동료는 한국어를 ________ 잘해서 한국 사람 같습니다. 저도 열심히 공부해서 제 동료처럼 한국어를 잘하고 싶습니다.

මගේ සගයින් කොරියානු භාෂාව ගොඩක් හොඳින් දන්නා නිසා කොරියනු ජාතිකයන් වගෙමයි. මමත් මගේ සගයන් මෙන් කොරියානු භාෂාව හොඳින් ඉගෙනගෙන කොරියන් භාෂාව ප්‍රගුණ කරන්න කැමතියි.

① 아주 ② 가끔 ③ 별로 ④ 전혀

2. 한국 드라마가 여러 나라에서 인기를 얻고 있습니다. 한국에 대한 관심이 높아지면서 매년 한국에 오는 관광객도 ________ 있습니다.

කොරියානු ටෙලිනාට්‍යය බොහෝ රටවල ජනප්‍රිය වෙමින් පවතී. කොරියාව පිළිබඳ උනන්දුව වැඩිවීමත් සමඟ සෑම වසරකම කොරියාවට පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාවත් ඉහළ යමින් පවතී.

① 늘어나고 ② 사라지고 ③ 방문하고 ④ 신청하고

정답 1. ① 2. ①



단정한 모습이 좋아 보여요


පිළිවෙලකට ඇඳලා ඉන්නකොට පෙනුම හොඳය

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

- ▫ අධ්‍යයන අරමුණු — ඇඳුම පිළිබඳ විස්තර කිරීම / උපදෙස් දීම
- ▫ ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස් — -아/어 보이다, -게
- ▫ වචන භාවිතය සඳහා උපදෙස් — ඇඳුම / ආකල්ප
- ▫ සංස්කෘතික තොරතුරු — වැඩකරන ස්ථානයේදී අඳින ඇඳුම



대화 1 සංවාදය 1





තුඅන් හා රිහන් වැඩට අඳින ඇඳුම් ගැන කතාකරමින් සිටි, මුලින්ම සංවාදයට දෙවරක් සවන් දී අනුගමනය කරන්න.

투안 리한 씨, 새 작업복이 잘 어울리네요.
රිහන් මහතා, අලුත් කාර්යාල ඇඳුම හොඳට ගැළපෙනවා.

리한 그래요? 저는 지퍼를 목까지 올려야 해서 좀 불편한데, 투안 씨는 괜찮아요?
ඇත්තද? මට නම් සිප් එක බෙල්ල ළඟටම වහන්න වෙන හින්ද ටිකක් අපහසුයි. තුඅන් මහතාට අපහසු නැද්ද?

투안 좀 그렇기는 한데, 이렇게 해야 작업할 때 안전하니까요.
ඔව්, ටිකක් එහෙම නම් තමයි ඒත් මෙහෙම ඇන්දොත් වැඩකරනකොට ආරක්ෂිත නිසා කමක් නැහැ.

반장 투안 씨 말이 맞아요. 그리고 지금 두 사람 단정한 모습이 좋아 보여요. 처음이라 좀 불편하겠지만 익숙해지면 괜찮을 거예요.
තුඅන් මහතාගේ කතාව ඇත්ත. ඒ වගේම දෙදෙනා පිළිවෙලකට ඇඳල ඉන්නකොට පෙනුම හොඳයි, මුලින්ම අඳින නිසා ටිකක් අපහසු වෙන්න පුළුවන් වුනත් පුරුදු වුනහම ප්‍රශ්නයක් නැතිවෙයි.

> **그렇기는 한데** එහෙම උනත්
> මුල් අන්තර්ගතය හා එකඟ වෙන නමුත් වෙනත් අදහසක් ඇතිවිට භාවිතා කරයි
> · 가: 운동화가 정말 예뻐요.
> මේ සපත්තු දෙක හරිම ලස්සනයි.
> 나: 그렇긴 한데, 너무 비싸서 못 사요.
> එහෙම වුනත්, ගොඩක් මිල අධික නිසා මිලදී ගන්න බැහැ.

> **-아/어지다**
> විශේෂණ පදයක් සමඟ සම්බන්ධ වී වෙනස්වුන ස්වභාවයක් පෙන්වයි
> · 친구들을 만나서 기분이 좋아졌어요.
> යහළුවන් හමුවුණු නිසා හිතට සතුටු හිතුණා.
> · 날씨가 점점 추워지니까 감기 조심하세요.
> කාලගුණය ටික ටික සීතල වීගෙන එන නිසා සෙම්ප්‍රතිශ්‍යාවෙන් ප්‍රවේශම් වෙන්න.



හොඳින් සවන් දී අනුගමනය කළා ද? එසේ නම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 투안 씨와 리한 씨는 무슨 옷을 입고 있어요?
   තුඅන් හා රිහන් කුමන ඇඳුමක් ද ඇඳගෙන සිටින්නේ?
2. 리한 씨는 왜 새 작업복을 불편해 해요?
   රිහන් ඇයි අලුත් කාර්යාල ඇඳුම අපහසුයි කියා පවසන්නේ?

정답 1. 두 사람은 새 작업복을 입고 있어요. 2. 지퍼를 목까지 올려야 해서요.



어휘 1 වචන මාලාව 1 　 복장 ඇඳුම



සමාගමේදී කුමන ඇඳුමක් ඇඳිය යුතු ද? ඇඳුම් සම්බන්ධ යෙදුම් විමසා බලමු ද?



작업복
වැඩට අඳින ඇඳුම




유니폼
නිල ඇඳුම

단정하다
පිළිවෙලයි



깔끔하다
පිළිවෙලයි / පිරිසිඳුයි

- 작업장에서는 **작업복**을 입어야 해요.
  වැඩ කරන ස්ථානයේදී වැඩට අඳින ඇඳුම ඇඳිය යුතුයි.
- **유니폼**을 입으니까 단정해 보여요.
  නිල ඇඳුම ඇන්ද නිසා පිළිවෙලයි.
- 직장에서는 **단정하고 깔끔한** 옷차림을 해야 해요.
  කාර්යාලයේදී පිළිවෙලට සහ පිරිසිඳුවට ඇඳිය යුතුයි.



단추를 잠그다
බොත්තම් දමනවා



단추를 풀다
බොත්තම් ගලවනවා



지퍼를 올리다
සිප් එක දමනවා



지퍼를 내리다
සිප් එක ගලවනවා



넥타이를 매다
ටයි එක දමනවා



넥타이를 풀다
ටයි එක ගලවනවා



ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ගැටළුව විසඳීමට උත්සහ කරන්න.

1. 그림을 보고 알맞은 말을 연결하세요. පින්තූරය බලා ගැළපෙන වචනය යා කරන්න.

①  ②  ③  ④  ⑤ 

㉠ 넥타이를 풀다 ㉡ 지퍼를 내리다 ㉢ 넥타이를 매다 ㉣ 단추를 풀다 ㉤ 단추를 잠그다

정답 ①㉣ ②㉢ ③㉡ ④㉤ ⑤㉠

문법 1 සංවාදය 1 -아/어 보이다



විශේෂණ පදයකට සම්බන්ධ කොට යම්කිසි පුද්ගලයෙකු හෝ වස්තුවක් පිළිබඳ තක්සේරු කිරීමකදී හෝ අනුමාන කිරීමකදී භාවිතා වේ.

ㅏ, ㅗ → **-아 보이다**	ㅓ, ㅜ, ㅣ ආදී → **-어 보이다**	하다 → **해 보이다**
작다 → 작**아 보이다**	맛있다 → 맛있**어 보이다**	불편하다 → 불편**해 보이다**

· 가: 아상카 씨, 아주 **바빠 보여요.** අසංක මහතා, ගොඩක් කාර්ය බහුලයි වගේ පේන්නේ.
  나: 네, 오늘 일 좀 많아요. ඔව්. අද වැඩ ටිකක් වැඩියි.
· 가: 이 빵 좀 드셔 보세요. 제가 만들었어요. මේ පාන් ටිකක් කාලා බලන්න. මම හැදුවේ.
  나: 정말 **맛있어 보여요.** ගොඩක් රසයි වගේ පේන්නෙ.
· 가: 좀 **불편해 보이는데** 괜찮아요? ටිකක් අපහසුයි වගේ පේනවා. ඔයා හොඳින්ද?
  나: 넥타이를 풀어야겠어요. ටයි එක ලෙහන්න ඕනේ.

※ සමහර විශේෂණ පදවල අගට, '-게 보이다' යොදා මුල් අර්ථයෙන් විශාල වෙනසක් නොමැතිව භාවිතා කළ හැකිය.

· 그 옷을 입으니까 **날씬해 보여요.** ඒ ඇඳුම ඇන්ද නිසා කෙට්ටුවට පේන්නේ.
  (= 그 옷을 입으니까 **날씬하게 보여요.**) (ඒ ඇඳුම ඇන්ද නිසා කෙට්ටුවට පේන්නේ.)




대조적 정보 වෙනත් තොරතුරු

මාතෘකාවට ලක්වන වස්තුව පිළිබඳ පෞද්ගලික අදහසක් හෝ හැඟීමක් ප්‍රකාශ කිරීමකදී සිංහල භාෂාවේ 'ඇඳුම උණුසුම් වගෙයි' වැනි අනුමණාර්ථය හැඟවෙන ප්‍රකාශනයන් යොදාගනු ලැබුවත් කොරියානු භාෂාවෙන් මෙය විශේෂණ පදය අගට '-아/어 보이다' යන්න එකතු කර ප්‍රකාශ කරනු ලැබේ.

· 이 옷은 따뜻**해 보여요.** මේ ඇඳුම නම් උන්සුම් වගෙයි.



'-아/어 보이다' හොඳින් අවබෝධ වුනාද? එසේනම් ඉහත යෙදුම් භාවිතාකර දෙබස සම්පූර්ණ කරන්න.

2. '-아/어 보이다'를 사용해서 대화를 완성하세요. '-아/어 보이다' භාවිතා කර දෙබස සම්පූර්ණ කරන්න.

1) 가: 리한 씨, 단추를 좀 푸는 게 어때요? ______________. [답답하다]
   රිහන් මහත්මයා බොත්තම් ටිකක් ගලවල බලන එක කොහොමද? අපහසුවෙන් ඉන්නවා වගේ පේන්නේ, [අපහසුයි / වාතාශ්‍රය අඩුයි]
   나: 그래요? 전 별로 불편하지 않아요. 괜찮아요.
   එහෙමද? මට පොඩ්ඩක්වත් අපහසු නැහැ, කිසි ප්‍රශ්නයක් නැහැ.

2) 가: 넥타이를 매니까 아주 ______________. [단정하다]
   ටයි එක දාලා නිසා ගොඩක් පිළිවෙලට පේනවා. [පිළිවෙලයි]
   나: 그래요? 감사합니다. ඇත්තද? ස්තුතියි.

3) 가: 지훈 씨가 오늘 ______________. [피곤하다]
   ජිහුන් මහතා අද මහන්සි පාටයි, [මහන්සියි]
   나: 어제 늦게까지 일을 해서 그런 것 같아요. ඊයේ හවස් වෙනකල් වැඩකල නිසා එහෙම පේනවා ඇති.

정답 1) 답답해 보여요 2) 단정해 보여요 3) 피곤해 보여요



대화 2 සංවාදය 2

Track 113



කර්මාන්ත ශාලාවේ කළමනාකරු රිහන්ගේ ක්‍රියකාරකම් ගැන උපදෙස් දෙමින් ඉන්නවා, කර්මාන්ත ශාලා කළමනාකරු රිහන්ට මොනවද කියන්නේ? මුලින්ම දෙබස දෙවරක් සවන් දෙන්න.

공장장 리한 씨, 잠깐 나 좀 봐요.
රිහන් මහත්මයා, මාව ටිකකට හමුවෙන්න.

리 한 네? 무슨 일이신데요?
මොකක්ද ප්‍රශ්නය?

공장장 리한 씨, 요즘 일이 많아서 힘든 건 알겠어요. **그래도** 기계를 발로 툭툭 차고, 작업장에서 **크게** 떠드는 건 정말 예의가 없는 행동이**잖아요**.
රිහන් මහත්මයා මේ දිනවල වැඩ වැඩි නිසා ටිකක් මහන්සියි කියලා දන්නවා, නමුත් උපකරණ වලට පයින් ගසා කර්මාන්ත ශාලාව තුල හයියෙන් කෑ ගහන එක එතරම් සුදුසු නැහැ.

리 한 죄송해요. 저도 모르게 짜증이 나서 그랬어요.
සමාවෙන්න. මටත් වැටහෙන්නේ නැතුව තරහ ගියහම එහෙම වෙනවා.

공장장 요즘 다들 그럴 거예요. 서로 조금씩만 배려합시다.
මේ දිනවල හැමෝම එහෙමයි, අනිත් අය ගැනත් ටිකක් හිතන්න.

그래도 නමුත්
- 이 책은 너무 비싸요. 그래도 한국어 공부를 하려면 꼭 필요한 책이에요.
මේ පොත ගොඩක් මිල අධිකයි, නමුත් කොරියන් භාෂාව ඉගෙන ගන්නවා නම් අනිවාර්යයෙන්ම තිබිය යුතු පොතක්,
- 피곤하고 힘들어요. 그래도 오늘까지 일을 끝내야 해요.
මහන්සියි සහ අමාරුයි, නමුත් අද දවස ඇතුළත දී වැඩ ඉවරකරන්න් ඕනේ

-잖아요
දෙදෙනාම දන්නා දෙයක් නැවත සනාථ කරන විට හෝ නිවැරදි කරන විට භාවිතා කරයි.
- 가: 리한 씨는 언제 고향에서 돌아와요?
රිහන් මහතා කවදද ගමෙන් එන්නේ?
나: 내일 오잖아요.
හෙටනේ එනනේ.
- 가: 왜 이렇게 길이 복잡해요?
ඇයි මෙච්චර පාරේ වාහන?
나: 지금 퇴근 시간이잖아요.
දැන් වැඩ ඇරෙන වෙලාවනේ.



මෙවර කර්මාන්ත ශාලා කළමනාකාරතුමා සහ රිහාන් ලෙස දෙබස නැවත කියවන්න, හොඳින් සවන් දී අනුගමනය කළා ද? එසේ නම් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. 리한 씨는 무슨 행동을 했어요? රිහන් මහත්මයා. මාව ටිකකට හමුවෙන්න?
2. 리한 씨는 왜 이런 행동을 했어요? මොකක්ද ප්‍රශ්නය?

정답 1. 기계를 발로 툭툭 차고, 작업장에서 크게 떠들었어요. 2. 짜증이 나서 그랬어요.



어휘 1 වචන මාලාව 1

태도 ආකල්ප / ගති පැවතුම්

කර්මාන්තශාලාවේදී හෝ පොදු ස්ථානවලදී වෙනත් අයකු සමඟ කටයුතු කළ යුත්තේ කෙසේද? ආකල්ප / ගති පැවතුම් හා සම්බන්ධ වචන මොනවා දැයි ඉගෙන ගනිමු ද?



예의가 있다
හැදියාවක් ඇත



예의가 없다
හැදියාවක් නැත




반말을 하다
පහත්කොට කතා කරනවා / ගරු නොකර කතා කරනවා



존댓말을 하다
ගරුකොට කතා කරනවා





존중하다
ගරුකරනවා



배려하다
අන් අය ගැන සිතා බැලීම



칭찬하다
ප්‍රශංසා කරනවා



함부로 하다
නොසැලකිලිමත්ව කරනවා



피해를 주다
අපහසුතාවයට පත් කරනවා



불쾌하다
අපහසුතාවයට පත් කරනවා / අප්‍රසන්නයි



무시하다
ගණන් ගන්නේ නැහැ



ඉහත ඉගෙන ගත් වචන නැවත මතක් කර ප්‍රශ්නවලට පිළිතුරු සපයා බලමු

1. 빈칸에 맞는 표현을 〈보기〉에서 골라 문장을 완성하세요.
හිස්තැනට ගැළපෙන වචනය උදාහරණ වලින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.


[직장에서 지켜야 할 것]

1) 직장에서 일이 많을 때는 서로 ________________ 주세요.
2) 신입 사원에게도 반말 말고 ________________ 주세요.
3) 동료의 의견을 ________________ 주세요.
4) 일을 할 때는 옆 사람에게 ________________ 마세요.
5) 다른 사람의 물건을 ________________ 안 돼요.

보기 존중하다 피해를 주다 함부로 하다 존댓말을 하다 배려하다

정답 1) 배려해 2) 존댓말을 해 3) 존중해 4) 피해를 주지 5) 함부로 하면

문법 2 සංවාදය 2 -게



විශේෂණ ප්‍රකෘතිය අවසානයේ යෙදී ක්‍රියාපදය විස්තර කරන ක්‍රියා විශේෂණයක් බවට පත් වේ.

· 가: **불쾌하게** 해서 미안해요. අපහසුතාවයට පත් කලාට සමාවෙන්න.
  나: 괜찮아요. 신경 쓰지 마세요. ඒකට කමක් නැහැ. ඒ ගැන එච්චර හිතන්න එපා.
· 초대해 줘서 고마워요. **맛있게** 잘 먹었어요. ආරාධනා කළාට ස්තුතියි. රසට කෑවා.
· 직장에서는 예의 **있게** 행동해야 해요. රැකියා ස්ථානයේදී ආචාරශීලී ලෙස කටයුතු කළ යුතුයි.
· 여기는 공공장소니까 그렇게 **크게** 떠들면 안 돼요.
  මෙතන පොදු ස්ථානයක් නිසා එහෙම හයියෙන් කතා නොකළ යුතුයි.

※ සමහර අවස්ථාවලදී විශේෂණ පද + '-게' ස්වරූපය භාවිතා නොවී කෙලින්ම ක්‍රියා විශේෂණ පද යොදාගනු ඇත. එවැනි ක්‍රියා විශේෂණ පද සමහරක් පහත දැක්වේ.

ගොඩක් '많이 (ගොඩක්)', '멀리 (ඈත)', '일찍 (කලින්)', '조금 (ටිකක්)', '빨리 (ඉක්මනින්)', '천천히 (හිමින්)', '높이 (ඉහළින්)'



'-게' හොඳින් අවබෝධ වුනා ද? සංවාදයේ හිස්තැනට ගැළපෙන යෙදුම තෝරන්න.

2. 대화를 읽고 맞는 대답을 고르세요. දෙබස කියවා ගැළපෙන වචනය තෝරන්න.

1) 가: 나이가 같은 사람한테 반말을 하면 안 돼요?
   එකම වයසේ අයට පහත්කොට කතා කරන භාෂාව භාවිතා කළාට කමක් නැද්ද?
   나: 아직 친하지 않으면 다른 사람을 ________ 할 수 있어요.
   ඒ පුද්ගලයා සමග එතරම් සමීප සම්බන්ධතාවක් නැත්නම් (අපහසුතාවයකට) පත්වෙන්න පුළුවන්.

① 불편하고　　② 불편하게

2) 가: 직장에서 ________ 생활하려면 서로 배려하는 게 좋아요.
   වැඩ බිමේදී (සතුටින්) වැඩ කිරීමට නම් එකිනෙකා පිළිබඳ සිතා කටයුතු කරන එක හොඳයි.
   나: 맞아요. 피해를 주면 안 돼요. ඇත්ත, අපහසු තත්වයකට පත් කරන්න හොඳ නැහැ.

① 즐겁게　　② 즐겁고

3) 가: 이게 더 ________ 의자니까 여기에 앉으세요.
   මේක (සැප පහසු) පුටුවක් නිසා මෙතන ඉඳගන්න.
   나: 네, 고마워요. හරි, ස්තුතියි.

① 편한　　② 편하게

정답 1) ② 2) ① 3) ①



유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

한잔할까요? බොන්න යමුද?

가: 오늘 저녁에 **한잔할까요**? අද හවසට **බොන්න යමුද**?
나: 좋아요. 어디에서 만날까요? හොඳයි, කොහෙදිද මුණගැහෙන්නේ?



활동 ක්‍රියාකාරකම්

직장 예절에 관한 O, X 퀴즈입니다. 잘 읽고 질문에 답하세요.
පහත දැක්වෙන්නේ වැඩ කරන ස්ථානය හා සම්බන්ධ ආචාරධර්ම පිළිබඳ හරි ○, වැරදි × ලකුණු කරන ප්‍රශ්න වේ, හොඳින් අසා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 맞으면 O, 틀리면 X에 표시하세요. නිවැරදි නම් ○ හා වැරදි × නම් යොදන්න.

1. 직장에서는 단정하고 깔끔하게 옷을 입어야 합니다. වැඩපොළේදී පිළිවලට පිරිසිදුවට ඇඳුම් අඳින්න ඕනේ.	○	×
2. 작업을 할 때는 작업복의 단추를 풀어야 합니다. වැඩ කරන විට අඳින ඇඳුමේ බොත්තම් ගැලවිය යුතුයි.	○	×
3. 작업장에서는 신발끈을 묶었는지 확인하는 것이 좋습니다. වැඩපොළේදී සපත්තු ලේස් ගැට ගසා ඇත්දැයි බැලීම සුදුසුයි.	○	×
4. 예의가 있다는 것은 다른 사람을 배려하는 것입니다. හැදියාවක් තිබීම යනු අන් අය පිළිබඳවත් සිතා බැලීම වේ.	○	×
5. 일할 때는 다른 사람을 무시하는 것이 좋습니다. වැඩ කරන විට අන් අයව ගණන් නොගෙන සිටීම හොඳයි.	○	×
6. 윗사람에게는 존댓말을 해야 합니다. ඉහළ නිලධාරීන්ට ගෞරවයෙන් කතා කළ යුතුයි.	○	×
7. 친한 동료와는 반말을 해도 됩니다. සමීප අය සමඟ ගෞරවනීය නොවන භාෂාවෙන් කතා කලාට ගැටලුක් නැත.	○	×
8. 아랫사람에게도 예의있게 행동해야 합니다. තමාට වඩා පහත් අය සමඟ වුනත් හැදියාවක් ඇතිව හැසිරිය යුතුයි.	○	×
9. 친한 동료에게 함부로 해도 됩니다. අඳුනන අයත් සමඟ නොසැලකිලිමත් ලෙස හැසිරුන ද ගැටලුවක් නැත.	○	×
10. 다른 사람을 불쾌하게 하는 행동은 하지 말아야 합니다. අනිත් අයව අපහසුතාවයට පත්කරවන වැඩ නොකළ යුතුයි.	○	×

정답 1. ○ 2. × 3. ○ 4. ○ 5. × 6. ○ 7. ○ 8. ○ 9. × 10. ○

2. 정답을 보고, 여러분의 점수를 계산해 보세요. 문제 당 1점이에요.
පිළිතුරු දෙස බලා ඔබගේ ලකුණු ගණනය කර බලන්න, එක ප්‍රශ්නයකට එක ලකුණයි.

나의 점수 මගේ ලකුණු	

3. 여러분은 어떤 사람이에요? 알아보세요. ඔයාලා මොනවගේද? සොයා බලන්න.

8점 이상 ලකුණු 8 ට වඩා වැඩි		직장에서의 예절을 잘 알고 있군요! වැඩපොළේ හැසිරිය යුතු ආකාරය හොඳින් දන්නවා!
4-7점 4 ත් 7 ත් අතර		직장 예절에 대해 조금 더 생각해 보세요. වැඩපොළේ හැසිරිය යුතු ආකාරය ගැන තව ටිකක් සිතා බලන්න.
3점 이하 3 ට අඩු		직장 예절에 대해 다시 공부하세요. වැඩපොළේ හැසිරිය යුතු ආකාරය පිළිබඳව නැවත ඉගෙන ගන්න.



정보 තොරතුරු

작업 현장의 복장

වැඩපොළේ අඳින ඇඳුම්



농업
ගොවිතැන



어업
ධීවර කර්මාන්තය




제조업(용접)
නිෂ්පාදන කර්මාන්ත
(යකඩ)



제조업(밀링 작업)
නිෂ්පාදන කර්මාන්ත
(කැනීම්)



건설업
ගොඩනැගිලි ඉදිකිරීමේ
කර්මාන්තය



유통업(제품 포장)
බෙදාහැරීමේ කර්මාන්තය
(භාණ්ඩ ඇසුරුම්)









ශ්‍රවණය **EPS-TOPIK**



අංක 1 සිට 2 දක්වා දැක්වෙන්නේ පින්තූරය දෙස බලා ගැළපෙන යෙදුම තෝරන ප්‍රශ්න වේ.

[1~2] 다음 그림을 보고 알맞은 대답을 고르십시오.
පහත පින්තූර දෙස බලා ගැළපෙන පිළිතුර තෝරන්න.

Track 114

1. ① ② ③ ④

2 ① ② ③ ④



අංක 3 සිට 4 දක්වා ඇත්තේ ගැළපෙන යෙදුම තෝරන ප්‍රශ්න වේ. 5 වන ප්‍රශ්නය දෙබස අවසන් වූවිට පිරිමි පුද්ගලයා විසින් කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාකාරකම තෝරන ප්‍රශ්නය වේ. දෙබසට සවන්දීමට පෙර ප්‍රශ්න හොඳින් කියවා බලන්න.

[3~4] 질문을 듣고 알맞은 대답을 고르십시오. ප්‍රශ්නයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන්න.


3. ① 얼른 지퍼를 올릴게요. ② 빨리 옷을 가져올게요.
③ 금방 작업복을 입을게요. ④ 제가 신발을 빌려줄게요.

4. ① 제가 하겠습니다. ② 나중에 다시 올게요.
③ 앞으로는 조심할게요. ④ 그럼, 다음에 뵙겠습니다.

5. 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오. කතාවට සවන්දී ගැළපෙන පිළිතුර තෝරන්න.

남자가 이어서 할 행동으로 맞는 것을 고르십시오.
පිරිමි පුද්ගලයා මීළඟට කරන ක්‍රියාකාරකමට සමාන පිළිතුර තෝරන්න.

① 작업복을 산다.
② 작업복을 벗는다.
③ 작업복 단추를 푼다.
④ 작업복 단추를 잠근다.



듣기 대본 ශ්‍රවණ පිටපත

1. ① 여: 작업복을 입었네요. වැඩපොළට අඳින ඇඳුම ඇඳලානේ.
   ② 여: 작업을 시작했네요. වැඩ පටන්ගත්තානේ.
   ③ 여: 작업을 하고 있네요. වැඩ කරනගමන්නේ.
   ④ 여: 작업장에 들어갔네요. වැඩපොළට ගියානේ.
2. ① 남: 단추를 잠그고 있어요. බොත්තම් දමමින් ඉන්නවා.
   ② 남: 지퍼를 올리고 있어요. සිප් එක වසමින් ඉන්නවා.
   ③ 남: 유니폼을 입고 있어요. නිල ඇඳුම ඇඳගෙන ඉන්නවා.
   ④ 남: 넥타이를 매고 있어요. ටයි එක ඇඳගෙන ඉන්නවා.
3. 여: 잠깐만요. 작업을 할 때는 작업복의 지퍼를 꼭 올려야 해요.
   පොඩ්ඩක් ඉන්න. වැඩ කරන විට වැඩට අඳින ඇඳුමේ සිප් එක අනිවාර්යයෙන්ම දමන්න.
4. 남: 그렇게 크게 이야기하면 다른 사람들에게 피해를 줄 수 있어요.
   ඔහොම හයියෙන් කෑ ගැහුවොත් අනිත් අයට බාධා වෙනවා.
5. 여: 투안 씨, 왜 작업복 단추를 안 잠갔어요?
   තුඅන් මහතා, ඇයි වැඩට අඳින ඇඳුමේ බොත්තම් දමන්නේ නැත්තේ?
   남: 너무 더워서 좀 풀었어요. ගොඩක් රස්නේ නිසා ටිකක් ගැලෙව්වා.
   여: 더워도 작업복 단추를 풀면 안 돼요. 그러면 위험하니까 얼른 잠그세요.
   රස්නේ වුනත් වැඩට අඳින ඇඳුමේ බොත්තම් ගලවන්න එපා, එහෙම කළොත් අනතුරු වෙන්න පුළුවන් නිසා ඉක්මනට බොත්තම් දාගන්න.

정답 1. ① 2. ④ 3. ① 4. ③ 5. ④

확장 연습 වැඩිදුර අභ්‍යාස

L-36

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු තෝරන්න.

   다음 중 들은 내용과 같은 것은 무엇입니까? පහත ඒවා අතරින් අන්තර්ගතයට සමාන පිළිතුර කුමක්ද?

   ① 남자는 새 작업복이 불편합니다.
   ② 남자는 작업복 사이즈가 맞지 않습니다.
   ③ 여자의 작업복에는 지퍼가 달려 있습니다.
   ④ 여자는 작업복을 입지 않고 일하고 있습니다.

확장 연습 듣기 대본 වැඩිදුර අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 남: 흐엉 씨, 새 작업복이 잘 어울리네요. හඔං මහත්මිය, නව නිල ඇඳුම හොඳට ගැළපෙනවානේ.
   여: 그래요? 리한 씨도 잘 어울려요. 그런데 이번 작업복은 지퍼를 목까지 올려야 해서 저는 좀 불편해요.
   ඇත්තද? රිහාන් මහතාටත් හොඳට ගැළපෙනවා. නමුත් මෙවර නිල ඇඳුමේ සිප් එක බෙල්ල දක්වා ඉහලට දැමිය යුතු නිසා ටිකක් අපහසුයි.
   남: 혹시 흐엉 씨한테 작은 거 아니에요? 더 큰 걸로 바꿔서 입어 보세요.
   හඔං මහත්මිය, ඔය නිළ ඇඳුම පොඩි වැඩි නැද්ද? තව ලොකු එකකට මාරු කර ඇඳලා බලන්න.

정답 1. ③




EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සිට 2 දක්වා දැක්වෙන්නේ පින්තූරය දෙස බලා පින්තූරයට අදාල වාක්‍ය තෝරන ප්‍රශ්න වේ. ඉහත ඉගෙනගත් වචන මතක් කර ගනිමින් පිළිතුරු සපයන්න.

[1~2] 다음 그림을 보고 맞는 문장을 고르십시오. පහත පින්තූර බලා ගැළපෙන වාක්‍යය තෝරන්න.

1\. ① 단추를 풀고 있습니다. ② 넥타이를 풀고 있습니다.
③ 신발끈을 묶고 있습니다. ④ 지퍼를 내리고 있습니다.



2\. ① 반말을 합니다. ② 크게 말합니다.
③ 천천히 말합니다. ④ 존댓말을 합니다.



පහත දැක්වෙන්නේ වැඩ කරන ස්ථානයේදී අඳින ඇඳුම් පිළිබඳ ප්‍රශ්න වේ, ඉගෙනගත් දේවල් නැවත මතක් කර ගනිමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

[3~4] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

3\. 직장에서는 항상 ____________ 옷을 입어야 합니다.
වැඩ කරන ස්ථානයේදී සැම විටම (පිළිවෙලට) ඇඳුම් ඇඳිය යුතුය.

① 단정하게 ② 불쾌하게 ③ 조용하게 ④ 재미있게

4\. 작업복을 입을 때는 지퍼를 목까지 ____________ 합니다.
වැඩ ඇඳුම අඳින විට සිප් එක ගෙල දක්වා (එසවිය) යුතුය.

① 묶어야 ② 올려야 ③ 입어야 ④ 풀어야

5\. 다음 글을 읽고 물음에 답하십시오. පහත ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

직장 생활을 할 때는 단정한 옷차림을 해야 합니다. 사무직은 양복이나 정장을 입고 넥타이를 맵니다. 생산직에서도 근무복이나 작업복을 입고 점퍼의 지퍼는 꼭 올립니다. 단정하고 깔끔한 옷차림은 가장 기본적인 직장 예절입니다.

වැඩකරන විට පිළිවෙලට ඇඳුම් ඇඳිය යුතුය, කාර්යාලයේ වැඩකරන පුද්ගලයන් කාර්යාල ඇඳුම් ඇඳ ටයිපටිය පැළඳිය යුතුය, නිෂ්පාදන කම්කරුවන් වැඩට අඳින කම්කරු ඇඳුම ඇඳ අනිවාර්යයෙන්ම සිප් එක දැමිය යුතුය. පිළිවෙලට පිරිසුදුවට ඇඳුම් අඳින එක වැඩපොළේදී රැකිය යුතු මූලික ආචාර්යධර්මයක් වේ.

글의 내용과 맞지 않는 것은 무엇입니까? ලිපියේ අන්තර්ගතය හා නොගැළපෙන යෙදුම කුමක්ද?

① 옷차림은 직장 예절입니다. ② 단정한 옷차림을 해야 합니다.
③ 생산직 직원은 정장을 주로 입습니다. ④ 사무직 직원은 양복을 입고 넥타이를 맵니다.

정답 1. ② 2. ④ 3. ① 4. ② 5. ③



확장 연습 වැඩිදුර අභ්‍යාස

1. 다음 표지를 맞게 설명한 것을 고르십시오.
   1 පහත සඳහන් රූපය වඩාත් හොඳින් විස්තර කරන පිළිතුර තෝරන්න.



① 손으로 만지면 안 됩니다.
② 쓰레기를 버리면 안 됩니다.
③ 손을 깨끗이 씻어야 합니다.
④ 안전장갑을 착용해야 합니다.

[2~3] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

2.

근무 시간에 외출을 해야 하는 경우가 있습니다. 그럴 때는 반드시 상사에게 허락을 받고 __________ 합니다.

වැඩ කරන වේලාව තුළදී පිටතට යාමට අවශ්‍ය විය හැකියි. එවැනි අවස්ථාකදී, ප්‍රධානියාගෙන් අවසර ලබාගෙන පිටතට යා යුතුයි.

① 보내야　　② 나가야
③ 들어와야　　④ 기다려야

3.


단정하고 깔끔한 옷차림은 직장 예절의 기본입니다. 공장에서는 작업복을 __________ 점퍼의 지퍼는 꼭 올려야 합니다.

පිළිවෙලට හා පිරිසිදුවට තිබෙන ඇඳුම් ඇඳීම රැකියා ස්ථානයේදී පිළිපැදිය යුතු මූලිකම ආචාරධර්මයයි. කර්මාන්තශාලාවේදී, නිල ඇඳුම් ඇඳ ජැකට් එකේ සිප් එක දැමිය යුතුය.

① 사고　　② 들고
③ 입고　　④ 보고

정답 1. ④ 2. ② 3. ③



발음 උච්චාරණය 

හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.

හල්කිරීම් ලෙස ව්‍යඤ්ජන දෙකක් යෙදෙන අවස්ථාවලදී පිටුපසින් ස්වරයක් යෙදෙනවා නම් ව්‍යඤ්ජන දෙක අතරින් ඉදිරිපස ව්‍යඤ්ජනය එලෙසින්ම ඉදිරිපස අක්ෂරයේ අවසාන ව්‍යඤ්ජන අක්ෂරය ලෙස උච්චාරණය කර, පසුපස ව්‍යඤ්ජනය පසුපස අක්ෂරයෙහි මුල කොටසට ඈඳා උච්චාරණය කරයි.

(1) 앉아요, 닭에, 값이　　(2) 짧아서, 읽어요, 넓어요
(3) 시장은 물건 값이 싸요.　　(4) 한국어 책을 읽어요.



출입문을 꼭 닫읍시다

ඇතුල් වීමේ / පිටවීමේ දොරටුව අනිවාර්යයෙන්ම වහමු

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

- අධ්‍යයන අරමුණු — නේවාසිකාගාරයේ දී අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳ දැන්වීම
- ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස් — -(으)ㅂ시다, -는 동안
- වචන භාවිතය සඳහා උපදෙස් — නේවාසිකාගාරය, වායු සමීකරණ
- සංස්කෘතික තොරතුරු — කොරියාවේ වාසස්ථාන ප්‍රභේද



대화 1 සංවාදය 1





පහත දැක්වෙන්නේ නේවාසිකාගාරයේ ජීවත් වන විට පිළිපැදිය යුතු නීතිරීති වේ. මුලින්ම අන්තර්ගතයට දෙවරක් සවන්දී ඉන්පසුව අනුගමනය කරමින් කියවන්න.

〈기숙사 생활 규칙〉
නේවාසිකාගාරයේ ජීවත් වන විට පිළිපැදිය යුතු නීතිරීති

다음 기숙사 규칙을 잘 지켜 주세요.
පහත නේවාසිකාගාර නීති හොඳින් පිළිපදින්න.

1. 방을 깨끗하게 청소합시다.
   කාමරය පිරිසිදුව පිරිසිදු කරමු.
2. 복도나 계단을 깨끗하게 사용합시다.
   කොරිඩෝව හෝ පඩිපෙළ පිරිසිදුව භාවිතා කරමු.
3. 세탁실과 샤워실을 사용한 후에는 잘 정리합시다.
   රෙදි සෝදන කාමරය හා නාන කාමරය භාවිතා කිරීමෙන් පසු පිළිවෙලට තබමු.
4. 큰 소리로 떠들지 맙시다.
   උස් හඬින් කතා නොකරමු.
5. 기숙사에 외부인을 데리고 오지 맙시다.
   නේවාසිකාගාරයට පිටස්තර අයව රැගෙන ඒමෙන් වැළකෙමු.
6. 방에서 조리 기구를 사용하지 맙시다.
   කාමරයේදී ආහාර පිසීම සඳහා භාවිතා කරන උපකරණ භාවිතා නොකරමු.
7. 외출할 때는 출입문을 꼭 닫읍시다.
   පිටතට යන විට පිටව යන දොරටුව අනිවාර්යයෙන්ම වහමු.
8. 기숙사 시설물이 파손되면 즉시 관리인에게 보고합시다.
   නේවාසිකාගාර භාණ්ඩ වලට අලාභානි සිදු වුවහොත් ඉක්මනින්ම එය භාරව කටයුතු කරන පුද්ගලයාව දැනුවත් කරමු.

데리고 오다 / 데려오다
කැටුව එනවා (සමඟ එනවා) / රැගෙන එනවා
- 내일 생일 파티에 친구를 데리고 와도 돼요?
  හෙට උපන්දින සාදයට යහළුවා සමඟ පැමිණියාට කමක් නැද්ද?
- 교실에 강아지를 데리고 오면 안 돼요.
  පන්ති කාමරයට බලු පැටියාව රැගෙන එන්න එපා.

즉시 ඉක්මනින්
යම් දෙයක් ඇතිවූ වහාම/ ඒ වෙලාවේම
- 공항에 도착하면 즉시 저한테 연락해 주세요.
  ගුවන් තොටුපොලට ළඟා වුවහොත් ඉක්මනින්ම මට ඇමතුමක් දෙන්න.



හොඳින් සවන් දී අනුගමනය කළා ද? එසේ නම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 기숙사에 외부인을 데리고 와도 돼요?
   නේවාසිකාගාරයට පිටස්තර අය එක්කරගෙන ආවාට කමක් නැද්ද?
2. 기숙사 시설물이 파손되면 누구에게 보고해요?
   නේවාසිකාගාර භාණ්ඩවලට අලාභහානි වුවහොත් කාටද වාර්තා කරන්නේ?


정답 1. 아니요, 외부인을 데리고 오면 안 돼요. 2. 관리인에게 보고해요.




어휘 1 වචන මාලාව 1 기숙사 නේවාසිකාගාරය




නේවාසිකාගාරයේ මොනවගේ දේවල්ද තියෙන්නේ කියලා බලමු ද?



방
කාමරය



복도
බැල්කනිය



계단
පඩිපෙළ



출입문
පිටවීමේ දොරටුව

- 기숙사 **방** 안에는 침대와 책상이 있어요. නේවාසිකාගාර කාමරය ඇතුළේ ඇඳ හා මේසය තියෙනවා.
- **복도**에서 큰 소리로 떠들면 안 돼요. බැල්කනි එකේ උස් හඬින් කතා කරන්න එපා.



세탁실
රෙදි සෝදන කාමරය



샤워실
නාන කාමරය



룸메이트
කාමර සගයා




관리인
යම් දෙයක් භාරව කටයුතු කරන පුද්ගලයා

- **세탁실**에서 옷을 빨 수 있어요. රෙදි සෝදන කාමරයේ දී රෙදි සෝදන්න පුළුවන්.
- **샤워실**을 깨끗하게 사용하세요. නාන කාමරය පිරිසිදුව භාවිතා කරන්න.



ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න උත්සාහ කරන්න.


1. 그림에 맞는 표현을 〈보기〉에서 골라 넣으세요.
පින්තූරයට ගැළපෙන ප්‍රකාශය කොටුවෙන් තෝරා ලියන්න.



보기
방
복도
계단
출입문
세탁실
샤워실

정답 1) 방 2) 세탁실 3) 계단 4) 출입문 5) 복도 6) 샤워실

문법 1 සංවාදය 1 -(으)ㅂ시다



ක්‍රියා පදයකට සම්බන්ධ කොට තමාට වඩා තරාතිරමින් අඩු අයෙකුට හෝ සමාන තත්ත්වයේ සිටින පාර්ශවයක් සමග යම්කිසි ක්‍රියාවක් එකට කිරීමට යෝජනා කරද්දී යොදාගත හැක. තමාට වඩා තරාතිරමින් වැඩි අයෙකුට එසේ ආමන්ත්‍රණය කිරීම ආචාරශීලී නොවන නිසා ප්‍රවේශම් විය යුතුය.

자음 (ව්‍යඤ්ජන) → **-읍시다**	모음 (ස්වර), 자음 'ㄹ' (ව්‍යඤ්ජනය-ㄹ) → **-ㅂ시다**
먹다 → 먹**읍시다** 닫다 → 닫**읍시다**	하다 → **합시다** 가다 → **갑시다** 만들다 → **만듭시다**

· 가: 버스가 안 오네요. 택시를 탈까요? බස් එක එන්නේ නැහේ. ටැක්සියකට නගිමුද?
  나: 아니요, 조금 더 **기다립시다**. නැහැ. තව ටිකක් බලමු.
· 가: 기숙사 대청소 언제 할까요? නේවාසිකාගාරයේ මහා ශ්‍රමදානය කවද්ද කරන්නේ?
  나: 이번 주말에 쉬니까 이번 주에 **합시다**. මේ පාර සති අන්තයේ නිවාඩු නිසා මේ සතියේ කරමු.
· 외출할 때는 출입문을 꼭 **닫읍시다**. එළියට යන විට අනිවාර්යයෙන් දොර වහමු.




대조적 정보 වෙනත් තොරතුරු

සිංහල භාෂාවෙන් යෝජනාවක් කිරීමකදී වාක්‍ය අවසානයේ '-කරමු' සම්බන්ධ කරන නමුත් කොරියානු භාෂාවේ ක්‍රියාප්‍රකෘතියේ අගට '-(으)ㅂ시다' සම්බන්ධ කර යෝජනා කිරීමක් කරනු ලැබේ.

· 작업이 끝난 후에는 작업장을 청소**합시다**. වැඩ ඉවර වුන පසු වැඩපළ පිරිසිදු කරමු.



'-(으)ㅂ시다' හොඳින් අවබෝධ වුනා ද? පහත වාක්‍ය කියවා නිවැරදි ද වැරදි ද යන්න තෝරන්න.

2. 문장을 읽고 맞으면 ㅇ, 틀리면 ×에 표시하세요.
වාක්‍ය කියවා නිවැරදි නම් ◯ ද වැරදි නම් × ද යොදන්න.

1) 복도에 물건을 두지 맙시다. ㅇ ×

2) 오늘 계단을 청소하려고 합시다. ㅇ ×

3) 제가 먼저 샤워실을 사용합시다. ㅇ ×


4) 기숙사에 친구를 데리고 오지 맙시다. ㅇ ×

5) 시설물이 파손되면 관리인에게 이야기합시다. ㅇ ×

정답 1) O 2) X 3) X 4) O 5) O



대화 2 සංවාදය 2





රිහාන් මහත්මා භාරව කටයුතු කරන පුද්ගලයාගෙන් විදුලි හීටරය භාවිතා කරන්න පුළුවන් ද විමසමින් ඉන්නවා. ප්‍රථමයෙන්ම දෙබසට දෙවරක් සවන් දෙන්න.

리 한 아저씨, 휴게실이 좀 추운데 전기난로를 켜도 돼요?
මහත්මයා විවේකාගාරය ටිකක් සීතල නිසා විදුලි හීටරය ක්‍රියාත්මක කළාට කමක් නැද්ද?

관리인 그럼요. 켜도 되죠. 휴게실에 있는 동안 잘 사용하고 나갈 때는 꼭 스위치를 끄고 플러그도 뽑아 놓으세요.
නැතුව. ක්‍රියාත්මක කළාට කමක් නැහැ. විවේකාගාරයේ ඉන්න කාලය පුරා හොඳින් භාවිතා කර පිටවෙන කොට අනිවාර්යෙන් ම ස්විච් එක නිවා ප්ලග් එක ගලවා දමන්න.

리 한 네, 그럴게요.
ඔව්, එහෙම කරන්නම්.

관리인 지난번에는 아무도 없는데 난로가 켜 있어서 깜짝 놀랐어요.
පසුගිය දිනක කවුරුත් හිටියේ නැති වුනත් හීටරය ක්‍රියාත්මක වෙලා තිබුණ නිසා ගොඩක් පුදුම වුණා.

리 한 그래요? 큰일 날 뻔했네요. 제가 다른 친구들한테도 신경 쓰라고 얘기할게요.
එහෙමද? විශාල අනතුරක් වෙන්න තිබුනා නේ. මම අනෙක් යහළුවන්ටත් අවධානය යොමු කරන්න කියලා කියන්නම්.

-(으)ㄹ 뻔했다

මුලින් දක්වන අවස්ථාව සිදුවෙන්න ගිය නමුත් එය ඇති නොවීම දක්වන යෙදුමයි.

- 늦잠을 자서 회사에 지각할 뻔했어요.
  පරක්කු වෙනකම් නින්ද ගිය නිසා සමාගමට යන්න (තව ටිකෙන්) පරක්කු වෙනවා.
- 아침에 버스를 놓칠 뻔했어요.
  උදේ බස් එක අතපසු වෙන්න ගියා.

신경(을) 쓰다

පොඩිදු දේ සිට අවධානය යොමු කරනවා.

- 가: 외출할 때는 전기난로를 꼭 끄세요.
  පිටත් වන විට විදුලි හීටරය අනිවාර්යයෙන්ම නිවා දමන්න.
  나: 네, 신경 쓸게요.
  හරි, අවධානයෙන් සිටින්නම්.
- 면접을 볼 때는 옷차림에 신경 써야 해요.
  සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන විට ඇඳුම ගැන අවධානය යොමු කරන්න.



මෙවර රිහාන් මහත්මා සහ භාරව කටයුතු කරන පුද්ගලයා ලෙස දෙබස නැවත කියවන්න. හොඳින් සවන් දී අනුගමනය කළා ද? එහෙම නම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 휴게실 전기난로를 켜도 돼요?
   නේවාසිකාගාරයේ විදුලි හීටරය ක්‍රියාත්මක කළාට කමක් නැද්ද?
2. 휴게실에서 나갈 때는 전기난로를 어떻게 해야 해요?
   විවේකාගාරයෙන් පිටතට යනකොට විදුලි හීටරයට කුමක් කළ යුතු ද?

정답 1. 네, 켜도 돼요. 2. 스위치를 끄고 플러그를 뽑아 놓아야 해요.



어휘 2 වචන මාලාව 2 냉난방기 සිසිලකය/වායු සමීකරණය හා තාපකය

කුමන වර්ගයේ වායු සමීකරණය හා තාපක වර්ග තිබේදැයි සොයා බලමු ද?



냉방
සිසිලකය



에어컨
වායුසමීකරණය




선풍기
විදුලි පංකාව



난방
තාපකය/උණුසුම්කාරකය




전기난로
විදුලි උඳුන




전기장판
විදුලි මෙට්ටය /පොරෝනය



스위치를 켜다
ස්විච් එක ක්‍රියාත්මක කරනවා



스위치를 끄다
ස්විච් එක ක්‍රියා විරහිත කරනවා



플러그를 꽂다
ප්ලග් එක සවි කරනවා



플러그를 뽑다
ප්ලග් එක ගලවනවා



ඉහත ඉගෙන ගත් වචන නැවත මතක් කර ප්‍රශ්නවලට පිළිතුරු සපයා බලමු ද?

1. 그림에 맞는 표현을 〈보기〉에서 골라 넣으세요.
පින්තූරයට ගැළපෙන ප්‍රකාශය උදාහරණ කොටසින් තෝරා ලියන්න.



정답 1) 에어컨 2) 스위치 3) 플러그 4) 선풍기 5) 전기난로

문법 2 සංවාදය 2 -는 동안



ක්‍රියා පදයකට සම්බන්ධ කර යම්කිසි ක්‍රියාවක් හෝ සිදුවීමක් සිදුවන කාලය හඟවයි. එවගේම අගට '-에' එකතු කර '-는 동안에' ද යොදා ගැනේ. මුල සහ අග වාක්‍ය දෙකේ කර්තෘ වෙනස් වුවද භාවිතා කළ හැක. තවද වෙලාව හඟවන නාම පද සමග ද '동안' යෙදිය හැක.

· 가: 아상카 씨를 **기다리는 동안** 같이 커피를 마실까요?
  අසංක මහතා එනකල් බලන් ඉන්න අතර එකට කෝපි බොමුද?
  나: 그럽시다. එහෙම කරමු.
· 가: 냉방을 **하는 동안** 창문을 열면 안 돼요.
  වායු සමීකරණය පාවිච්චි කරන අතරතුර ජනේලය විවෘත කිරීම නොකළ යුතුයි.
  나: 지금 창문을 닫을게요. දැන් ජනේලය වහන්නම්.
· 가: 밖에 나가 **있는 동안에** 전기장판을 꼭 끄세요.
  එළියට යන අතරේ විදුලියෙන් ක්‍රියාත්මක වන උණුසුම් මෙට්ටය ක්‍රියා විරහිත කරන්න.
  나: 네, 알겠습니다. හොඳයි වැටහුණා.



비교해 보세요 සංසන්දනය කර බලන්න

✔ **'-는 동안' හා '-(으)ㄹ 때'**

'-는 동안' හා '-(으)ㄹ 때' වාක්‍යයේ ඉදිරිපස කොටසේ කර්තෘ යම් ක්‍රියාවක් කරන අතරතුර වෙලාවේ එම වාක්‍යයේ පිටුපස කොටසින් වෙනත් ක්‍රියාවක් සිදු වීම දැක්වේ. '-는 동안' විශේෂණ පද සමඟ එකතු නොවන අතර '-(으)ㄹ 때' විශේෂණ පද සමඟ එකතු වේ. ඒ ලෙසම '-는 동안' යම් ක්‍රියාවක් සිදු වන සම්පූර්ණ කාලය පමණක් පිළිබිඹු කිරීම අර්ථවත් කළත් '-(으)ㄹ 때' යම් ක්‍රියාවක් සිදු වන එක් විශේෂ කාල පරාසයක් හෙවත් කාල සීමාවක් දැක්වීමේ දී භාවිතා කළ හැකි ය.

· 힘드는 동안에는 쉬세요. (X)
· **힘들 때는** 쉬세요. (O)



'-는 동안' හොඳින් අවබෝධ වුනා ද? දෙබස කියවා ගැළපෙන වචනය තෝරන්න.

2. 대화를 읽고 맞는 대답을 고르세요. දෙබස කියවා ගැළපෙන පිළිතුර තෝරන්න.

1) 가: 선풍기를 켜고 자면 안 돼요. විදුලි පංකාව දල්වා නිදා ගන්න එපා.
나: ______________________.

① 네, 다 사용하면 스위치를 꼭 끄세요　② 네, 자는 동안에는 사용하지 않을게요

2) 가: 전기장판 좀 빌려줄 수 있어요? විදුලි බ්ලැන්කට්ටුව ටිකක් දෙන්න පුළුවන් ද?
나: ______________________.

① 그럼요. 제가 고향에 있는 동안 빌려줬어요　② 그럼요. 제가 고향에 가 있는 동안 사용하세요

정답 1) ② 2) ②



활동 ක්‍රියාකාරකම්

휴게실에 있는 공지문입니다. 잘 읽고 질문에 답하세요.
විවේකාගාරයේ තියෙන දැන්වීමක් වේ. හොඳට කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

〈휴게실을 사용하는 동안 꼭 지켜주세요.〉
විවේකාගාරය භාවිතා කරන කාලය තුළ අනිවාර්යයෙන් ම පිළිපදින්න.

1. 휴게실은 공공장소입니다. 다른 사람을 배려합시다.
   විවේකාගාරය පොදු ස්ථානයක් වේ. අනෙක් අය පිළිබඳවත් සළකා බලමු.
2. 휴게실은 금연 구역입니다. 담배는 흡연실에서 피웁시다.
   විවේකාගාරය දුම් නොබොන ස්ථානයකි. දුම් බීම, දුම් බොන ස්ථානයේදී කරමු.
3. 휴게실은 식당이 아닙니다. 냄새나는 음식물은 식당에서 드세요.
   විවේකාගාරය ආපන ශාලාවක් නොවේ. දුර්ගන්ධය හමන කෑම ආපන ශාලාවේදී කන්න.
4. 휴게실에서 나갈 때 아무도 없으면 플러그를 뽑고 나갑시다.
   විවේකාගාරයෙන් පිටවීමේ දී කවුරුත් ම නැතිනම් ප්ලග් ඉවත් කර යමු.

이용 시간 : 오전 10시 ~ 오후 10시
භාවිතා කළ හැකි වෙලාව : උදේ 10.00- සවස 10.00

1. 휴게실의 규칙을 잘 지킨 사람을 모두 고르십시오.
   විවේකාගාරයේ නීති හොඳින් ආරක්ෂා කරන අය සියලු ම දෙනා තෝරමු.





② 

③ 

④ 

정답 1. ②, ③



유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

한턱내세요. සංග්‍රහයක් ඕනේ .

가: 반장님, 승진 축하해요. **한턱내세요.** නායකතුමනි, උසස් වීමට සුභ පැතුම්.
나: 고마워요. 그럴게요. ස්තුතියි, එහෙම කරන්නම්.




정보 තොරතුරු

한국의 주거 형태

කොරියාවේ වාසස්ථාන ප්‍රභේද

아파트 මහල් නිවාස



한 건물 안에 여러 가구가 독립적으로 살 수 있도록 지은 빌딩형 공동 주택입니다.

එක් ගොඩන්ගිල්ලක් ඇතුළේ පවුල් රාශියක් ස්වාධීනව ජීවත්විය හැකි ලෙස සෑදූ ගොඩනැගිලි තට්ටු නිවාස ලෙස හඳුන්වයි.

주택 වාසස්ථාන



주택은 크게 단독 주택과 공동 주택이 있습니다. 단독 주택은 한 세대가 단독으로 사용하는 구조로 된 주택입니다. 공동주택은 각 세대가 하나의 건축물 안에서 생활을 할 수 있는 구조로 된 주택입니다.

කොරියාවේ වාසස්ථාන ප්‍රධාන ලෙස තනි නිවාස හා තට්ටු නිවාස ලෙස වේ. තනි නිවාස යනු එක් පරම්පාරාවක් තනිවම භාවිත කරන්න පුළුවන් වන ආකාරයෙන් ඉදිකරපු වාසස්ථාන වේ. තට්ටු නිවාස එක් එක් පරම්පරාවන් එක් ගොඩනැගිල්ලක් තුළ පිවත් වෙන්න හැකි ලෙස නිර්මාණය කළ වාසස්ථාන වේ.

원룸 වන්රූම් (තනි කාමර)



방 하나에 생활에 필요한 최소한의 설비를 갖춘 집입니다.

එක් කාමරයක පීවිත් වීමට අවශ්‍ය අඩුම ප්‍රමාණයේ පහසුකම්වලින් සමන්විත නිවාස වේ.

고시원 ගොශිවොන්



싸게 방을 얻어 생활할 수 있는 건물입니다. 화장실, 부엌 등을 공동으로 사용합니다.

ලාභයට කාමරයක් ලබා ගෙන පීවත් වෙන්න පුළුවන් ගොඩනැගිල්ලක් වේ. වැසිකිලිය, මුළුතැන්ගෙය ආදිය පොදුවේ භාවිතා කළ යුතු ය.



EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK





අංක 1 සිට 2 දක්වා හොඳින් සවන් දී සම්බන්ධතාවයක් ඇති පින්තූරය තෝරන ප්‍රශ්න වේ. සවන් දීමට ප්‍රථමයෙන් පින්තූරය හොඳින් නිරීක්ෂණය කරන්න.



[1~2] 잘 듣고 내용과 관계있는 그림을 고르십시오.
හොඳින් සවන් දී අන්තර්ගතය හා සම්බන්ධයක් ඇති පින්තූරය තෝරන්න.

Track 117

1. ①  ②  ③  ④ 

2. ① 

② 

③  ④ 



අංක 3 දෙබසට සවන් දී ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්නයකි. අංක 4 හා 5 නිවේදනය අසා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ. ශ්‍රවණයට පෙර ප්‍රශ්නයට සවන්දීමට පෙර පිළිතුර එක් වරක් කියවා බලන්න.

3. 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오.
කතාවට සවන් දී ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරන්න.

지금 무슨 문제가 있습니까? දැන් කුමන ප්‍රශ්නයක්ද තියෙන්නේ?

① 관리인과 싸웠습니다. ② 선풍기가 없어졌습니다.
③ 에어컨이 고장 났습니다. ④ 휴게실에 에어컨이 없습니다.

[4~5] 하나의 이야기를 듣고 두 개의 질문에 대답하십시오.
එකම කතාවට සවන්දී ප්‍රශ්ණ දෙකටම පිළිතුරු සපයන්න.

4. 이 기숙사의 휴게실은 몇 시까지 이용할 수 있습니까?
මේ නේවාසිකාගාරයේ විවේකාගාරය කීය දක්වා භාවිතා කළ හැකි ද?

① 밤 8시 ② 밤 10시
③ 밤 11시 ④ 밤 12시

5. 이 기숙사의 규칙을 지키지 않은 사람은 누구입니까?
මේ නේවාසිකාගාරයේ නීති රකින්නේ නැති අය කවුද?

① 흡연실에서 담배를 피운 지훈 ② 기숙사에 고향 친구를 초대한 건우
③ 기숙사 방에서 김밥을 먹은 투안 ④ 기숙사 휴게실에서 커피를 마신 모니카



듣기 대본 ශ්‍රවණ පිටපත

1. 남: 밤에는 큰 소리로 떠들지 마세요. රාත්‍රියට හයියෙන් කතා කරන්න එපා.
2. 여: 난로를 사용한 후에는 반드시 플러그를 뽑아야 합니다.
   හීටරය භාවිතා කිරීමෙන් පසු අනිවාර්යයෙන්ම ප්ලග් එක ගැලවිය යුතුය.
3. 남: 아유~ 더워. 휴게실 에어컨이 또 고장 났네요.
   අයියෝ රස්නෙයි. විවේකාගාරයේ වායු සමීකරණය ආයෙත් කැඩිලානේ?

   여: 그래요? 날씨가 많이 더워져서 냉방이 안 되면 힘든데…….
   එහෙමද? හෙටත් කාලගුණය රස්නෙ/උණුසුම් වන නිසා වායු සමීකරණය වැඩ කරන්නේ නැත්නම් අමාරුයි.

   남: 그러게 말이에요. 선풍기라도 가지고 올까요? එහෙම නම් විදුලි පංකාව හරි අරගෙන එමු ද?

   여: 네, 그럼 부탁해요. 저는 얼른 관리인 아저씨에게 이야기하고 올게요.
   ඔව්. එහෙම නම් රැගෙන එන්න. මම භාරව ඉන්න නිලධාරි මහත්මයාට කතා කරලා එන්නම්.

4-5.

남: 관리실에서 알려드립니다. 요즘 기숙사에 규칙을 지키지 않는 사람들이 많은데 모두 신경 써 주세요. 규칙을 다시 말씀 드릴 테니까 잘 듣고 꼭 지켜주세요. 먼저, 담배를 피울 때는 흡연실을 이용해 주시기 바랍니다. 또, 방에서 조리 기구를 사용하면 안 되고요. 외부인을 기숙사에 데리고 올 수 없습니다. 마지막으로 휴게실 이용 시간은 밤 10시까지니까 꼭 지켜주십시오.

නිවේදනයයි. මේ දවස් වල නේවාසිකාගාරයේ නීති පිළි නොපදින පුද්ගලයන් බහුල වන අතර සියලු දෙනාම ඒ පිළිබඳව අවධානය යොමු කරන්න. නීති නැවත මතක් කරලා දෙන නිසා හොඳින් අසා අනිවාර්යයෙන්ම පිළිපදින්න. මුලින්ම දුම් බීමේදී දුම් බොන කාමරය භාවිතා කරන ලෙස ඉල්ලා සිටිනවා. එමෙන් ම කාමරය තුල මුළුතැන්ගෙය හා සම්බන්ධ භාණ්ඩ භාවිතා නො කරන්න. පිටස්තර අය නේවාසිකාගාරයට රැගෙන එන්න එපා. අවසාන වශයෙන් විවේකාගාරය භාවිතා කරන වෙලාව රාත්‍රී 10 දක්වා නිසා එය පිළිපදින්න.

정답 1. ① 2. ③ 3. ③ 4. ② 5. ②

확장 연습 වැඩිදුර අභ්‍යාස

L-37

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු තෝරන්න.

   남자는 지금 무엇을 해야 합니까? පිරිමි පුද්ගලයා දැන් කුමක් කල යුතුද?

   ① 창문을 닫아야 합니다. ② 에어컨을 켜야 합니다.
   ③ 선풍기를 꺼야 합니다. ④ 플러그를 꽂아야 합니다.

확장 연습 듣기 대본 වැඩිදුර අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 여: 바트 씨, 창문 좀 닫아 줄래요? 지금 에어컨을 켰거든요.
   ජනේලය වහන්න පුළුවන් ද? දැන් වායුසමීකරණ යන්ත්‍රය ක්‍රියාත්මක කලා ඒකයි.

   남: 네, 알겠어요. 그럼 선풍기는 끌게요. ඔව්, තේරුණා. එහෙනම් විදුලි පංකාව වහන්නම්.

   여: 아니요, 지금 사무실이 너무 더우니까 선풍기도 같이 켜 놓는 게 좋을 것 같아요. 퇴근할 때 선풍기하고 에어컨 플러그 뽑는 거 잊으면 안 돼요.
   නැහැ, දැන් කාර්යාලය ගොඩක් රස්නේ නිසා විදුලි පංකාවත් එකටම ක්‍රියාත්මක කරන එක හොඳයි. ඔයා වැඩ ඇරිලා යනකොට, විදුලි පංකා සහ වායු සමීකරණ ප්ලග් ඉවත් කිරීමට අමතක කරන්න එපා.

정답 1. ①




EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK




අංක 1 සිට 2 දක්වා ඇත්තේ පින්තූරය බලා ගැළපෙන වචනය හෝ වාක්‍ය සොයන ප්‍රශ්න වේ. මුලින් ඉගෙනගත් ප්‍රකාශ මතක් කරමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

[1~2] 다음 그림을 보고 맞는 단어나 문장을 고르십시오.
පහත පින්තූර බලා ගැළපෙන වචනය හෝ වාක්‍යය තෝරන්න.

1. 

① 에어컨 ② 세탁기
③ 냉장고 ④ 선풍기

2. 

① 스위치를 켜고 있습니다.
② 스위치를 끄고 있습니다.
③ 플러그를 꽂고 있습니다.
④ 플러그를 뽑고 있습니다.



අංක 3 හා 4 දෙබසේ හිස්තැනට ගැළපෙන වචනය සොයන ප්‍රශ්න වේ. අංක 5 ඡේදය කියවා ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්නයකි. මුලින් ඉගෙන ගත් වචන හා ව්‍යාකරණ හොඳින් මතක් කරමින් පිළිතුරු සපයන්න.

[3~4] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

3.
가: 에어컨은 언제부터 사용할 수 있어요? වායු සමීකරණය කවදා සිට භාවිතා කළ හැකිද?
나: 에어컨 같은 ________ 시설은 6월 말부터 사용할 수 있어요.
වායුසමීකරණ වැනි (සිසිලකාරක) පහසුකම් ජූනි මාසයේ අවසානය දක්වා භාවිතා කළ හැකි ය.

① 난방 ② 냉방 ③ 선풍기 ④ 전기장판

4.
가: 주말에 같이 계단을 청소할까요? සති අන්තයේ පඩිපෙළ එකට පිරිසිදු කරමු ද?
나: 네, 그래요. 같이 ______________________. ඔව්, එහෙම නම් එකට (පිරිසිදු කරමු).

① 청소합니다 ② 청소합시다 ③ 청소했습니다 ④ 청소해야 합니다

5. 다음 글을 읽고 물음에 답하십시오. පහත ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

기숙사는 여러 사람이 함께 생활하는 곳입니다. 그러니까 서로 예의를 지키고 다른 사람에게 피해를 주지 않아야 합니다. 늦은 시간에 시끄럽게 떠들지 마십시오. 그리고 시설도 깨끗하게 사용해야 합니다. 샤워실과 세탁실은 항상 깨끗하게 관리합시다.

නේවාසිකාගාරය යනු විවිධ පුද්ගලයන් සමඟ ජීවත් වන ස්ථානයක් වන බැවින් අන්‍යොන්‍ය වශයෙන් ආචාර සම්පන්න විය යුතු අතර අන් අයව අපහසුතාවයට පත් නොකළ යුතුයි. රාත්‍රී කාලයේ ඝෝෂාකාරී ලෙස කතා කරන්න එපා. ඒ වගේ ම පහසුකම් ද පිරිසිදුව භාවිතා කළ යුතු යි. නාන කාමරය හා රෙදි සෝදන කාමරය නිතරම පිරිසිදුව පාවිච්චි කරන්න.

글의 내용과 맞지 <u>않는</u> 것은 무엇입니까? ඡේදයේ අන්තර්ගතය හා නොගැළපෙන දෙය මොකක්ද?

① 서로 배려해야 합니다. ② 시설을 아껴 써야 합니다.
③ 시끄럽게 떠들면 안 됩니다. ④ 샤워실은 관리인이 청소합니다.

정답 1. ① 2. ② 3. ② 4. ② 5. ④



확장 연습 වැඩිදුර අභ්‍යාස

[1~2] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

1. 휴게실은 공공장소이므로 휴게실에서는 다른 사람을 배려해야 합니다. 담배를 ________ 냄새 나는 음식을 먹으면 안 됩니다.

   විවේක කාමරයක පොදු ස්ථානයක් නිසා අන් අය ගැන සැලකිලිමත් විය යුතුයි. දුම් පානය කිරීම හෝ දුර්ගන්ධය හමන ආහාර ගැනීම නොකළ යුතුයි.

   ① 피워야　② 피워서
   ③ 피우거나　④ 피우지만

2. 지하철 안에서는 작은 소리로 말해야 합니다. 시끄럽게 _______ 다른 사람에게 피해를 줄 수 있습니다.

   උමං දුම්රිය මාර්ගයේ අඩු ශබ්දයෙන් කතා කල යුතුයි. උස් හඬින් කතා කලහොත් අන් අයට බාධා වෙන්න පුළුවන්.

   ① 자면　② 쉬면
   ③ 떠들면　④ 일하면

3. 다음 글을 읽고 무엇에 대한 글인지 고르십시오.

   පහත ඇති ඡේදය කියවා කුමක් සම්බන්ධව සඳහන් වී ඇත්ද යන්න තෝරන්න.

   제가 살고 있는 기숙사에는 세탁실, 샤워실, 식당, 휴게실, 체력 단련실 등이 있습니다. 방에는 침대와 옷장, 책상밖에 없지만 이런 공간이 있어서 기숙사 생활이 편리합니다.

   මම ජීවත් වන නේවාසිකාගාරයේ, රෙදි සෝදන කාමරය, නාන කාමරයක්, කෑම කාමරයක්, පොදු කාමරයක්, සහ යෝග්‍යතා කාමරයක් යන දෑ තිබේ.කාමරයේ ඇඳක්, අල්මාරියක් සහ මේසයක් පමණක් තිබුණත් මෙවැනි යටිතල පහසුකම් තියෙන ස්ථාන නිසා නේවාසික ජීවිතය ඉතා පහසුයි.

   ① 기숙사 위치　② 기숙사 시설
   ③ 기숙사 예절　④ 기숙사 규칙

정답 1. ③ 2. ③ 3. ②



발음 උච්චාරණය  P-16

හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.

කොරියානු භාෂාවේ ව්‍යඤ්ජන දෙකක් එකලග පිළිවෙලින් යෙදෙනවිට විවිධ ශබ්ද වෙනස්කම් සිදු වේ. නමුත් පහත අවස්ථාවන්හිදී කිසිදු ශබ්ද වෙනස්කමක් සිදුවන්නේ නැත. 'ㄴ/ㅁ/ㅇ+ㄴ/ㅁ/ㅇ', 'ㄹ+ㄹ', 'ㄹ+ㄴ/ㅁ/ㅇ'.

(1) 언니, 엄마, 빨리　(2) 설마, 얼마, 설명
(3) 빨리 하세요.　(4) 오렌지가 얼마예요?



일할 맛이 나요


වැඩකරන්න ආසා හිතෙනවා

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

- අධ්‍යයන අරමුණු: වැඩපළේ පරිසරය / වටපිටාව හඳුන්වා දීම, සම සේවකයන් සමඟ ඇති වන ගැටුම් පැහැදිලි කර දීම
- ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස්: -는/(으)ㄴ 편이다, -다고 하다
- වචන භාවිතය සඳහා උපදෙස්: වැඩපළේ පරිසරය,, සම සේවකයන් සමඟ ඇති වන ගැටුම්
- සංස්කෘතික තොරතුරු: වැඩපළේ තනතුරු



대화 1 සංවාදය 1





පරූ සහ රිහාන් ආයතනයේ තත්වය (පරිසරය)පිළිබඳව කතාකරමින් සිටියි. පළමුව සංවාදයට දෙවරක් සවන් දී අනුගමනය කරන්න.

바루 리한 씨 회사는 분위기가 어때요?
රිහාන් මහත්මයාගේ ආයතනයේ පරිසරය කොහොමද?

리한 동료들끼리 서로 위해 주니까 항상 즐겁게 일하는 편이에요.
සම සේවකයන් එකිනෙකාට ගරු කරන නිසා නිතරම විනෝදයෙන් වැඩ කරනවා.

바루 회사 분위기도 자유로운 편이에요?
ආයතනයේ පරිසරය නිදහස් ද?

리한 글쎄요. 규율은 좀 엄격한데요, 윗사람들이 아랫사람을 많이 배려해 줘서 일하기는 편해요.
එහෙමයි. නීති ටිකක් දැඩියි. ජ්‍යෙෂ්ඨ අය කණිෂ්ඨ අයට ගොඩක් කාරුණික වන නිසා වැඩ කිරීම පහසුයි.

바루 정말 부러워요. 그러면 훨씬 일할 맛이 나겠어요.
ඇත්තටම ඊර්ෂ්‍යා හිතෙනවා. එහෙම නම් වැඩ කරන්න ගොඩක් ආසා හිතෙනවා ඇති.

리한 맞아요. 회사 오는 게 즐거우니까 일도 더 잘돼요.
නිවැරදියි. ආයතනයට එන එක විනෝද නිසා වැඩත් තව හොඳට කරනවා.

끼리 අතර (සමඟ)
- 오랜만에 고향 친구들끼리 노래방에 갔어요.
  බොහෝ කාලයකින් ගමේ මිතුරන් සමඟ කැරෝකේ එකට ගියා.

맛이 나다 කරන්න ආසා හිතෙනවා.
කුමන හෝ වැඩක් කැමැත්තෙන් එසේත් නැත්නම් විනෝදයෙන් කරනවා.
- 수업 분위기가 좋으니까 요즘 공부할 맛이 나요.
  පන්ති කාමරයේ පරිසරය හොඳ නිසා මේ දිනවල හොඳට ඉගෙන ගන්න හිතෙනවා.
- 가족들이 맛있게 먹어 주니까 요즘은 요리할 맛이 나네요.
  පවුලේ අය රසකර කන නිසා මේ දවස් වල හොඳට උයන්න ආසා හිතෙනවා.



හොඳින් අසා නැවත කියෙව්වා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 리한 씨의 회사 분위기가 어때요?
   රිහාන් මහත්මයාගේ ආයතනයේ පරිසරය කොහොමද?
2. 바루 씨는 왜 리한 씨를 부러워해요? පරූ මහත්මයා ඇයි රිහාන් මහත්මයට ඊර්ෂ්‍යා කරන්නේ?

정답 1. 동료들끼리 서로 위해 주니까 즐겁게 일하는 편이에요. 2. 리한 씨의 회사 분위기가 좋아서요.



어휘 1 වචන මාලාව 1 직장의 분위기 රැකියා ස්ථානයේ පරිසරය/වටපිටාව



කුමන පරිසරයක් සහිත රැකියා ස්ථානයක ද වැඩ කරන්න කැමති? රැකියා ස්ථානයේ පරිසරය / වටපිටාව හා සබැඳි විවිධ වචන හා ප්‍රකාශයන් විමසා බලමු ද?



동료
සම සේවකයන්




상사
ජ්‍යෙෂ්ඨයා



부하
කණිෂ්ඨයා



사이가 좋다
මිතුදම හොඳයි



사이가 나쁘다
මිතුදම නරකයි



격려하다
උනන්දු කරනවා



서로 위해주다
එකිනෙකාට ගරු කරනවා



분위기가 좋다
වැඩ කරන පරිසරය / වටපිටාව හොඳයි



분위기가 나쁘다
වැඩ කරන පරිසරය / වටපිටාව නරකයි



자유롭다
නිදහස්



규율이 엄격하다
නීති තදයි

- 사장님은 직원들을 **격려해** 주세요. ආයතන ප්‍රධානියා වැඩකරන පුද්ගලයින් දිරි ගන්වන්න.
- 동료들이 **서로 위해 주니까** 분위기가 좋아요. සම සේවකයන් එකිනෙකාට උදවු කරදීම නිසා වටපිටාව හොඳයි.
- 회사 **규율이 엄격해서** 넥타이를 매야 해요. ආයතනයේ විනය ඉතා දැඩි බැවින් ටයි පටිය පැළඳිය යුතුය.



ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ගැටළුව විසඳීමට උත්සාහ කරන්න.

1. 빈칸에 맞는 표현을 골라 대화를 완성하세요. හිස්තැනට ගැළපෙන ප්‍රකාශය තෝරා සංවාදය සම්පූර්ණ කරන්න.

1) 가: 리한 씨는 투안 씨랑 안 친한 것 같아요. රිහාන් මහතා තුවාන් මහතා සමග සමීප නැහැ වගෙයි.
나: 네, 지난번에 말다툼을 한 이후로 ____________.
ඔව්. ගිය වතාවේ කලහ කරගත්ත වෙලාවේ ඉඳලා (මිතුදම හොඳ නැති වෙලා).

① 사이가 좋아졌어요 ② 사이가 별로 안 좋아졌어요

2) 가: 신입사원이 들어왔는데 일이 너무 느려서 답답해요.
අලුත් සේවකයන් ආපු නිසා වැඩ ගොඩක් හිමිහිට වෙන නිසා හිතට බරයි.
나: 많이 가르쳐 주세요. 아직 일을 잘 모르는 ________(이)잖아요.
ගොඩක් කියලා දෙන්න. තාමත් වැඩ හොඳටම දන්නේ නැති කනිෂ්ඨ සේවකයන් නිසා.

① 상사 ② 부하 직원

정답 1) ② 2) ②

문법 1 සංවාදය 1 -는/(으)ㄴ 편이다



ක්‍රියාපදයකට හෝ විශේෂණ පදයකට සම්බන්ධ කර නිසැක ලෙස කථා කිරීමට වඩා දළ වශයෙන් යම් පැත්තකට ආසන්න බව හෝ ඇතුළත් වන බව අදහස් කිරීමට යොදා ගැනේ.

동사 (ක්‍රියාපදය)	형용사 (විශේෂණ පදය)	
-는 편이다	자음 (ව්‍යඤ්ජනය) → **-은 편이다**	모음 (ස්වර), 자음 'ㄹ' (ව්‍යඤ්ජනය-ㄹ) → **-ㄴ 편이다**
많이 먹다 → 많이 먹**는 편이다** 자주 가다 → 자주 가**는 편이다** 잘 만들다 → 잘 만드**는 편이다**	좋다 → 좋**은 편이다**	크다 → **큰 편이다** 멀다 → **먼 편이다**

ක්‍රියා පදයකට ඉදිරියෙන් '잘, 잘못, 많이, 자주' වැනි ප්‍රමාණයක් හෝ වාර ගණන හඟවන ක්‍රියා විශේෂණ යොදා ගනී.


- 가: 비빔밥을 좋아하세요? පිපිම්පප්වලට කැමතිද?
  나: 네, 자주 **먹는 편이에요**. ඔව් නිතරම කනවා.
- 가: 지훈 씨 일하는 곳은 어때요? ජිහුන් මහතා කොහොමද වැඩ?
  나: 분위기가 **좋은 편이에요**. හොඳින් කෙරෙන පාටයි.
- 한국의 여름 날씨는 비가 오고 **더운 편이에요**. කොරියාවේ සරත් සෘතු කාලගුණය වැසි වහින අතර රස්නෙයි.



'-는/(으)ㄴ 편이다' තේරුම් ගත්තා ද? උදාහරණයේ දැක්වෙන අන්දමට දෙබස සම්පූර්ණ කරන්න.

2. '-는/(으)ㄴ 편이다'를 사용해서 〈보기〉처럼 대화를 완성하세요

'-는/(으)ㄴ 편이다' භාවිතා කරමින් උදාහරණය ලෙස සංවාදය සම්පූර්ණ කරන්න.





가: 직장 분위기가 어때요?
　රැකියා ස්ථානයේ පරිසරය / වටපිටාව කොහොමද?

나: <u>자유로운</u> 편이에요. (ගොඩක්) නිදහස්.

1) 

2) 

3) 

4) 


정답 1) 분위기가 나쁜 2) 서로 위해주는 3) 규율이 엄격한 4) 분위기가 좋은

유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

손발이 잘 맞아요. එකිනෙකා හොඳින් ගැලපෙනවා

가: 투안 씨 팀은 항상 분위기가 좋은 것 같아요. තුවාන් මහත්මයගේ කණ්ඩායමේ පරිසරය නිතරම හොඳයි වගෙයි.
나: 네, 팀원들끼리 **손발이 잘 맞아요**. ඔව්. **කණ්ඩායම් සාමාජිකයන් එකිනෙකා හොඳින් ගැලපෙනවා.**

대화 2 සංවාදය 2





ජීහුන්, තුවාන් ගෙන් පරු සමඟ රණ්ඩු කිරීම පිළිබඳ විමසමින් සිටියි. මුලින්ම දෙබස දෙවරක් අසා අනුගමනය කරන්න.

지 훈 투안 씨, 조금 전에 바루 씨하고 왜 싸운 거예요?
තුවාන් මහත්මයා, ටිකකට කලින් පරු මහත්මයා සමඟ රණ්ඩු වුණේ ඇයි?

투 안 별일 아니에요. 바루 씨가 제 말에 대답을 하도 안 해서 저를 무시하는 줄 알았어요. 그런데 기계 소리 때문에 못 들었다고 하더라고요.
විශේෂ දෙයක් නෙවෙයි. පරු මහත්මයා මගේ එක වචනයකටවත් උත්තර දෙන්නෙත් නැති නිසා මාව නොසළකා හරින බව දැණුනා. ඒ උනත් මැෂින් එකේ ශබ්දය නිසා ඇහුනේ නැහැ කියලා කියනවා.

> **하도** ගොඩක් / බොහෝ
> ගොඩක් බැරෑරුම් හෝ ගොඩක් විශාල යන්න අවධාරණය කරන විට
> · 하도 바빠서 밥 먹을 시간도 없다.
> ගොඩක් වැඩ වැඩි නිසා ආහාර ගන්නත් වේලාවක් නැහැ.

> **-더라고요**
> අතීතයේ ලද අත්දැකීමකින් අළුතෙන් දැනගත් දෙයක් වර්තමානයේදී යමෙකුට ප්‍රකාශ කිරීමේදී භාවිතා කරන ප්‍රකාශයකි.
> · 한국 음식이 참 맛있다고 하더라고요.
> කොරියානු ආහාර ගොඩාක් රසයි.

지 훈 아, 그럼 서로 오해한 거네요. 이젠 화해했지요?
ආ, එහෙනම් වැරදි වැටහීමක්නේ. දැන් මිත්‍ර වුනා ද?

투 안 그럼요. 저도 사과했고, 바루 씨도 미안하다고 했어요.
එහෙමයි. මමත් සමාව ගත්තා. පරු මහත්මයත් සමා වෙන්න කියලා කිව්වා.

지 훈 잘했어요. 동료끼리 잘 지내야지요.
හොඳයි. එකට වැඩ කරන අය හොඳින් ඉන්න ඕනේ.



හොඳින් අසා නැවත කියෙව්වා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 바루는 왜 투안의 말을 못 들었어요? පරුට ඇයි තුවාන්ගේ වචන ඇහුනේ නැත්තේ?
2. 투안과 바루는 서로 화해했어요? තුවාන් සහ පරු එකිනෙකා සමඟ මිත්‍ර වුනා ද?

정답 1. 기계 소리 때문에 못 들었어요. 2. 네, 두 사람은 서로 화해했어요.

Tip 간접화법 වක්‍ර කථනය

간접화법은 다른 사람의 말을 옮겨 말할 때 사용하는 화법으로 문장의 종결 유형에 따라서 다르게 실현된다. 옮겨 말하는 문장이 평서문일 때는 '-다고 하다'를, 명령문일 때는 '-(으)라고 하다'를, 의문문일 때는 '-냐고 하다'를, 청유문일 때는 '-자고 하다'를 사용한다.

වක්‍ර කථනය යනු වෙනත් පුද්ගලයෙකුගේ ප්‍රකාශයක් නැවත ප්‍රකාශ කරන විට භාවිතා කරන කථන ක්‍රමයකි. වක්‍යයේ ස්වභාවය අනුව කථන ක්‍රමය වෙනස්වේ. සාමාන්‍ය වාක්‍ය වලදී '-다고 하다' විධාන කරන විට '-(으)라고' ප්‍රශ්ණවාචී ප්‍රකාශ වලදී '-냐고 하다' යමක් යෝජනා කරන විට '-자고 하다' භාවිතා කරයි.



어휘 2 වචන මාලාව 2 동료와의 갈등 එකට වැඩ කරන සේවකයන් අතර ගැටළු

එකට වැඩ කරන සේවකයන් අතර ගැටළු හා සම්බන්ධ කුමන ප්‍රකාශණ තිබේදැයි විමසා බලමු ද?



때리다
ගහනවා



맞다
පහර ලබනවා



욕을 하다
නරක වචන කියනවා



짜증을 내다
අවුස්සනවා / කෝප කරනවා



화가 나다
තරහ ගන්නවා



화를 내다
බනිනවා



싸움을 하다
රණ්ඩු වෙනවා



말다툼을 하다
බැන ගන්නවා

- 장난이 심한 동생 때문에 **화가 났어요.** 그래서 동생에게 **화를 냈어요.**
  සීමාව ඉක්මවා විහිලු කරන මල්ලි නිසා කේන්ති ගියා. ඒ නිසා මල්ලීට බැන්නා.
- 친구끼리 서로 **싸움을 하면** 안 돼요.
  යහළුවන් අතර රණ්ඩු වෙන්න එපා.
- 사소한 일 때문에 **말다툼을 했어요.**
  පොඩි දෙයකට බැන ගත්තා.



오해하다
වරදවා තේරුම් ගන්නවා



오해를 풀다
වරදවා තේරුම් ගැනීම නැති වෙනවා

사과하다
සමාව ගන්නවා



화해하다
මිත්‍ර වෙනවා

- 엄마는 내가 꽃병을 깼다고 **오해했지만** 곧 **오해를 풀었어요.**
  අම්මා මම මල් පෝච්චිය කැඩුව බවට වරදවා වටහා ගත් නමුත් ඉක්මනින් වැරදි වැටහීම නැති කර ගත්තා.
- 친구에게 미안하다고 **사과하고** 우리는 서로 **화해했어요.**
  යහළුවාගෙන් සමාව ගෙන අපි නැවත මිත්‍රවුණා.



ඉහත ඉගෙන ගත් වචන නැවත මතක් කර ප්‍රශ්නවලට පිළිතුරු සපයා බලමු ද?

1. 빈칸에 맞는 표현을 골라 대화를 완성하세요. හිස්තැනට ගැළපෙන ප්‍රකාශය තෝරා සංවාදය සම්පූර්ණ කරන්න.

1)
가: 둘이 왜 싸운 거예요? දෙදෙනා ඇයි රණ්ඩු වෙන්නේ?
나: 제 잘못이에요. 제가 바루 씨 말을 ______________.
මගේ වැරැද්ද. මම පරු මහත්මයව (වරදවා වටහා ගත්තා).

① 오해했어요 ② 오해를 풀었어요

2)
가: 지훈 씨하고 싸웠어요? ජිහුන් මහත්මයා සමග රණ්ඩු වුණා ද?
나: 자꾸 저를 무시하는 것 같아서 참다가 ______________.
නිතරම මාව නොසළකා හරිනවා වගේ නිසා ඉවසීමට නොහැකිව (බැන්නා).

① 화를 냈어요 ② 화해했어요

정답 1) ① 2) ①

문법 2 සංවාදය 2 -다고 하다



කථකයා වෙනත් පුද්ගලයකු පැවසූ දේ නැවත පැවසීමේදී යොදාගනී. නැවත පවසන වාක්‍යය ප්‍රකාශනාර්ථය හඟවන වාක්‍යයක් වනවිට අනෙක් පාර්ශවය වෙත '-다고 하다' යොදා ගනිමින් ප්‍රකාශ කෙරේ. අතීත කාලය හැඟවීමේදී 'A/V -았/었다고 하다' ද අනාගත කාලය සඳහා 'A/V- (으)ㄹ 거라고 하다' යොදාගනී.

동사 (ක්‍රියාපදය)	형용사 (විශේෂණ පදය)	명사 (නාම පදය)	
-ㄴ/는다고 하다	**-다고 하다**	자음 (ව්‍යඤ්ජනය) → **이라고 하다**	모음 (ස්වරය) → **라고 하다**
가다 → 간**다고 하다** 먹다 → 먹**는다고 하다**	바쁘다 → 바쁘**다고 하다** 많다 → 많**다고 하다**	학생 → 학생**이라고 하다** 가수 → 가수**라고 하다**	

- 이 사람이 한국에서 가장 인기 있는 **가수라고 해요**.
  මේ පුද්ගලයා කොරියාවේ ඉතා ප්‍රසිද්ධ ගායකයෙකු කියලා කියනවා.
- 가: 아상카 씨는 이제 고향에 돌아가는 거예요? අසංක මහත්තයා ගමට යනවද?
  나: 네, 다음 달에 고향으로 **간다고 해요**. ඔව්, ලබන මාසේ ගමට යනවා කියලා කියනවා.
- 가: 요즘 공장이 좀 바빠진 것 같아요. මේ දවස්වල කර්මාන්තශාලාව ටිකක් කාර්යබහුල වෙලා වගේ.
  나: 네, 주문이 늘어서 일이 좀 **많다고 해요**. ඔව්. ඇණවුම් වැඩි වෙලා වැඩ ටිකක් වැඩියි කියලා කියනවා.



'-다고 하다' ඔබ තේරුම් ගත්තා ද? එහෙ මනම් උදාහරණයේ දැක්වෙන ආකාරයට සංවාදය සම්පූර්ණ කරන්න.

2. '-다고 하다'를 사용해서 <보기>처럼 대화를 완성하세요.
'-다고 하다' භාවිතා කරමින් සංවාදය සම්පූර්ණ කරන්න.





투안 씨가 수피카 씨하고 말다툼을 하다.
තුවාන් මහත්මයා සුපිකා මහත්මිය සමඟ බැන ගන්නවා.

투안 씨가 수피카 씨하고 말다툼을 했다고 해요.
තුවාන් මහත්මයා සුපිකා මහත්මිය සමඟ බැන ගත්තා යැයි කියනවා.

1) 투안 씨가 이반 씨하고 화해하다
____
____

2) 수피카 씨가 투안 씨를 때리다



____
____

3) 이반 씨가 수피카 씨에게 사과하다



____
____

4) 투안 씨가 이반 씨하고 싸움을 하다
____
____

정답 1) 투안 씨가 이반 씨하고 화해했다고 해요. 2) 수피카 씨가 투안 씨를 때렸다고 해요. 3) 이반 씨가 수피카 씨에게 사과했다고 해요. 4) 투안 씨가 이반 씨하고 싸움을 했다고 해요.



활동 ක්‍රියාකාරකම්


직장 분위기에 대한 글입니다. 잘 읽고 질문에 답하세요.

වැඩ කරන ස්ථානයේ පරිසරය පිළිබඳ ඡේදයකි. හොඳින් කියවා ප්‍රශ්ණ වලට පිළිතුරු ලබා දෙන්න.

NEWS TIMES

신바람 나는 직장 분위기 만들기

인주시가 활기찬 직장 분위기를 만들기 위해 직원들을 대상으로 다양한 행사를 마련하여 주위의 관심을 모으고 있다. 인주시는 '생일 케이크 선물하기', '동료와 함께 커피 한 잔'과 같은 행사를 통해 직원들이 출근하고 싶은 직장이 되도록 노력하고 있다. 가을에는 '야구장 가기', '영화 보기' 등과 같이 많은 직원들이 함께 할 수 있는 행사를 준비하고 있다. 인주시의 김민수 시장은 직장 분위기도 이제는 윗사람이 주도하던 엄격한 분위기에서 직원들이 행복해 할 수 있는 분위기로 바뀌어야 한다고 말했다.




හොඳ වැඩ පරිසරයක් සෑදීම

ඉජුන්සි උනදුවෙන් වැඩ කරන පරිසරයක් සෑදීමට සේවකයන් ඉලක්ක කරගත් විවිධ අංග සූදානම් කොට වටපිටාවේ සියලු දෙනාගේ අවධානය ලබමින් සිටියි. ඉජුන්සි උපන්දින කේක් තෑගි කිරීම, සේවකයින් සමග එකට කෝපි වීදුරුවක් පානය කිරීම වැනි දේවල් මගින් සේවකයන් රැකියාවට යාමට කැමති වැඩපොළක් තැනීමට මහන්සි වේ. බේස්බෝල් පිට්ටනියට යෑම,චිත්‍රපට බැලීම වැනි බොහෝ සේවකයන් ඒකරාශී කරන්න පුළුවන් වැඩසටහන් පිළියෙල කරමින් සිටියි. ඉන්ජුයි වල කිම්මින්සු නගරාධිපති තුමා අද ඉහළ නිලධාරියා නායකත්වය දුන් ක්‍රමයෙන් මිදී සේවකයන්ට සතුටු වියහැකි පරිසරයක් සෑදිය යුතුයැයි පැවසුවා.

1. 다음 중 인주시의 신바람 나는 직장 문화 이벤트가 아닌 것은 무엇입니까?

පහත ඒවා අතරින් ඉන්ජුසිගේ ප්‍රසන්න වැඩ පරිසරයේ සංස්කෘතික අංගයක් නොවන්නේ කුමක්ද?

② 

④ 

정답 1. ③



정보 තොරතුරු

직장 내에서의 호칭

වැඩපළේ පුද්ගලයන්ගේ තනතුරු නාම / ආමන්ත්‍රණ



회사에서는 사람들을 부를 때 직책에 '-님'을 붙이세요. 예를 들면 사장님, 부장님, 과장님, 대리님, 주임님, 반장님 이렇게 부르면 됩니다.

වැඩපළේදී පුද්ගලයින්ට කතා කරන විට තනතුරු නාමයට '-님' එක් කල යුතුයි. උදාහරණ ලෙස පැවසුවොත් '사장님, 부장님, 과장님, 대리님, 주임님, 반장님' ආදී ලෙස ඇමතිය යුතුයි.



동료나 비슷한 직급의 사람 부를 때 이름에 '-씨'를 붙이세요. 예를 들면 '투안 씨', '지훈 씨' 이렇게 부르면 됩니다. '씨'를 붙일 때는 성을 붙이지 않아도 됩니다.

එකට වැඩ කරන අය හා සමාන තනතුරු දරන පුද්ගලයින්ට ආමන්ත්‍රණය කරන විට නමට පසුව '-씨' යොදන්න. උදාහරණ ලෙස පැවසුවොත් '투안 씨, 지훈 씨' යනුවෙන් පැවසිය හැකියි. '-씨' යන්න එකතු කර පැවසීමේදී වාසගම භාවිතා නොකලත් කම් නැත.



그러나 직장 밖에서는 개인적으로 친한 사람에게는 '형', '누나'와 같은 호칭을 사용하여 친근함을 표기하기도 합니다.


එසේම වැඩපළෙන් පිටතදී තමාට සමීප මිත්‍ර පුද්ගලයින්ට '형', '누나' වැනි ආමන්ත්‍රණ භාවිතා කොට මිත්‍රකම් ප්‍රදර්ශණය කරයි.

갈등 해결 방법 ගැටුම් විසඳන ආකාරය



서로 다르다는 것을 인정하세요. '상대가 틀려서'가 아니라 '서로 다르기 때문'이에요.

එකිනෙකා වෙනස් බව පිළිගන්න. විරුද්ධ පාර්ශවය වැරදි නිසා නොව එකිනෙකා වෙනස් නිසයි.



이야기를 잘 들어 주세요. 상대방의 생각, 감정, 상황 등에 대해 정확히 이해하면 갈등의 원인을 찾을 수 있어요.

කියන දේට හොඳින් ඇහුම්කන් දෙන්න. මිතුරාගේ සිතිවිලි ,හැඟීම් ,සබඳතා ආදිය පිළිබඳ නිවැරදිව තේරුම් ගත් විට ගැටුම් වලට හේතු සොයන්න පුලුවන්.



자신의 입장 상황, 가치관 등에 대해 상대에게 적극적으로 공개하고 정확히 알리기 위해 노력하세요.

තමාගේ තත්වය, වටිනාකම ආදිය ගැන කෙලින් (ක්‍රියාශීලීව) ප්‍රසිද්ධියේ ප්‍රකාශකර, නිවැරදිව දැනුම්දීමට උත්සාහ කරන්න.



부탁이나 거절을 할 때는 '미안합니다만~', '죄송합니다만~' 등의 용어로 시작하는 것이 좋아요.

ඉල්ලීමක් කරන විට හෝ ප්‍රතික්ෂේප කරන විට '미안합니다만~', '죄송합니다만~' ආදී වචන වලින් පටන් ගන්න එක හොඳයි.



화가 나면 숫자를 1부터 10까지 세어 보세요. 화를 참지 못하면 나중에 후회하는 일이 생길 거예요.

තරහා ගිය විට 1 සිට 10 දක්වා ගණන් කර බලන්න, තරහා ඉවසන්නම බැරිනම් පසුව පසුතැවිලිවෙන්න වෙන දේවල් ගැන හිතන්න.



EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK



අංක1 සිට අංක 2 දක්වා පින්තූරය බලා ප්‍රශ්ණයට ගැළපෙන පිළිතුර තේරීමේ ප්‍රශ්ණයකි. සවන් දීමට පෙර උදාහරණයේ අන්තර්ගතය විමසා බලන්න.

[1~2] 다음 그림을 보고 알맞은 대답을 고르십시오.
පහත පින්තූර දෙස බලා ගැලපෙන පිළිතුර තෝරන්න.



1. 

이 사람은 누구입니까? මෙම පුද්ගලයා කවුද?

① ② ③ ④

2. 

이 사람은 지금 무엇을 하고 있습니까?
මෙම පුද්ගලයා දැන් කුමක් කරමින්ද සිටින්නේ?

① ② ③ ④



අංක 3 සහ අංක 4 පහත දැක්වෙන ප්‍රශ්ණ වලින් ගැලපෙන දේ තෝරන ප්‍රශ්ණයකි. අංක 5 සංවාදයට සවන් දී ප්‍රශ්නයට ගැලපෙන පින්තූරය තෝරන ප්‍රශ්නය වේ. සංවාදයට සවන් දීමට පෙර පිළිතුරෙහි අන්තර්ගතය එක් වරක් විමසා බලන්න.

[3~4] 질문을 듣고 알맞은 대답을 고르십시오.
ප්‍රශ්නයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන්න.

3. ① 그건 오해예요. ② 벌써 화해했어요.
③ 오해가 풀려서 다행이에요. ④ 빨리 화해했으면 좋겠어요.

4. ① 네, 규율이 좀 엄격해요. ② 네, 서로 위해 주는 편이에요.
③ 상사가 좀 무서운 편이에요. ④ 분위기가 자유로운 편은 아니에요.

5. 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오.
සංවාදය සවන් දී ප්‍රශ්ණ වලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

남자의 회사의 분위기는 어떻습니까?
පිරිමි පුද්ගලයාගේ වැඩපොළේ වටපිටාව කොහොමද?

① 
② 
③ 
④ 



듣기 대본 ශ්‍රවණ පිටපත

1. ① 남: 상사입니다. ජ්‍යෙෂ්ඨයා වේ.
   ② 남: 동료입니다. සහයකයන් වේ.
   ③ 남: 윗사람입니다. උසස් අය වේ.
   ④ 남: 부하 직원입니다. කනිෂ්ඨ අය වේ.
2. ① 여: 때리고 있습니다. ගසමින් ඉන්නවා.
   ② 여: 화를 내고 있습니다. තරහ ගස්සවමින් ඉන්නවා.
   ③ 여: 사과를 하고 있습니다. බනිමින් ඉන්නවා.
   ④ 여: 싸움을 하고 있습니다. ගහගනිමින් ඉන්නවා.
3. 남: 죄송해요. 제가 오해를 했어요. සමාවෙන්න. මම වැරදි වැටහීමකයි හිටියේ.
4. 여: 직장 분위기가 좋은 편인 것 같아요. හොඳ සේවා පරිසරයක් තියනවා වගේ?
5. 남: 수피카 씨 회사는 어때요? සුපිකා මහත්මියගේ ආයතනය කොහොමද?
   여: 동료들이 너무 좋아요. 서로 위해 주고, 배려해 주는 편이에요.
   සේවකයන් ගොඩක් හොඳයි. එකිනෙකාට ගෞරව කරනවා.
   남: 정말 부럽네요. ඇත්තටම ඊරිසියා හිතෙනවා.

정답 1. ② 2. ② 3. ③ 4. ② 5. ①

확장 연습 වැඩිදුර අභ්‍යාස

 L-38

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදය හොඳින් සවන්දී ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

   남자의 회사는 분위기가 어떻습니까? පිරිමි පුද්ගලයාගේ ආයතනය කෙසේද?

   ① 상사가 엄격합니다.
   ② 일이 많지 않습니다.
   ③ 동료들끼리 잘 지냅니다.
   ④ 규율이 아주 엄격합니다.

확장 연습 듣기 대본 වැඩිදුර අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 여: 바트 씨 회사는 분위기가 어때요? පීටර් මහතා, ආයතන පරිසරය කෙසේද?
   남: 좋아요. 동료들끼리 사이도 좋고 상사들도 많이 배려해 줘요. 그래서 일이 많아도 모두들 즐겁게 일해요.
   හොඳයි මිතුරන් සමාගමත් හොඳ වන අතර ප්‍රධානී තුමත් ගොඩක් සලකනවා එම නිසා වැඩ වැඩි වුවත් සෑම දෙනාම සතුටින් වැඩ කරනවා.
   여: 정말 부러워요. 우리 회사는 규율이 엄격해서 회사 분위기가 딱딱하거든요.
   ඇත්තටම ඉරිසියයි. අපේ සමාගම දැඩි විනයකින් යුතුව ඇති අතර සමාගමේ වාතාවරණය අපහසු වේ.

정답 1. ③



EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සහ අංක 2 පින්තූර බලා නිවැරදි පිළිතුර තෝරන ගැටළුවයි. ඉගෙන ගත් දේ මතක් කරමින් ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

[1~2] 다음 그림을 보고 맞는 단어나 문장을 고르십시오.
පහත පින්තූර බලා ගැළපෙන වචනය හෝ වාක්‍යය තෝරන්න.

1. 

① 상사 ② 부하
③ 동료 ④ 친구

2. 

① 때리고 있습니다.
② 사과를 하고 있습니다.
③ 말다툼을 하고 있습니다.
④ 다른 사람에게 맞고 있습니다.



අංක 3 සහ අංක 4 නිවැරදි පිළිතුර තෝරන ගැටළුව වන අතර අංක 5 ඡේදය කියවා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන ගැටළුවයි.

[3~4] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오.
හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

3.
여: 아직도 수미 씨에게 화가 났어요? තවමත් සුමී මහත්මියත් සමග තරහෙන්ද ඉන්නේ?
남: 아니요, 벌써 _______________. නැහැ, දැනටමත් මිත්‍ර වුණා.

① 오해했어요 ② 화해했어요 ③ 짜증을 냈어요 ④ 싸움을 했어요

4.
남: 수미 씨 직장은 규율이 엄격한 편이에요? සුමී මහත්මියගේ වැඩ බිමේ නීති රීති තදයි ද?
여: 아니요, 좀 _______________. 그래서 출퇴근 시간이 따로 없어요.
නැහැ ටිකක් නිදහස්. එමනිසා වැඩට යන එන වේලාවක් වෙනම නැහැ.

① 나빠요 ② 엄격해요 ③ 위해줘요 ④ 자유로워요

5. 다음 질문에 답하십시오. මීලඟ ගැටළුවට පිළිතුරු සපයන්න.

좋은 직장 분위기를 만들기 위해서는 모든 사람의 노력이 필요합니다. 직장에서는 서로에게 웃는 얼굴로 이야기하는 게 좋습니다. 그리고 서로를 배려하는 마음을 갖는다면 화내는 일이 없어질 것입니다. ㉠ _______________ 전에 상대방의 마음을 한 번 더 생각하는 것도 즐거운 직장을 만드는 방법입니다.

හොඳ වැඩ පරිසරයක් සාදා ගැනීමට නම් සියලුම පුද්ගලයන්ගේ උත්සාහය අවශ්‍යයි. වැඩපොළේදී එකිනෙකා සිනහා මුහුණින් කතා කරන එක හොඳයි. ඒ වගේම එකිනෙකා ගැන සිතා බලනවා නම් කේන්ති යන අවස්ථාවන් නැති වී යනු ඇත. ㉠ බැනීමට පෙර විරුද්ධ පාර්ශවයේ සිතිවිලි/අදහස් එක් වරක් හොඳින් සිතා බැලීම විනෝදජනක සේවා ස්ථානයක් නිර්මාණය කිරීමේ එක් ක්‍රමයකි.

㉠에 들어갈 알맞은 말을 고르십시오. ㉠ හිස්තැනට ගැලපෙන වඩාත් නිවැරදි පිළිතුරු තෝරන්න.

① 웃기 ② 화내기 ③ 배려하기 ④ 오해하기

정답 1. ① 2. ③ 3. ② 4. ④ 5. ②



확장 연습 වැඩිදුර අභ්‍යාස

[1~3] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

1. 저는 고향에 있는 가족이 생각날 때 ________ 을/를 봅니다. 가족들 얼굴을 보면 기분이 좀 좋아집니다.

   මම ගමේ ඉන්න මගේ පවුලේ අය මතක් වෙන විට (ඡායාරූපය) බලනවා. පවුලේ අයගේ මුහුනු දැක්කම හිතට ලොකු සතුටක් දැනෙනවා.

   ① 신문 ② 사진
   ③ 영화 ④ 통장

2. 우리 회사는 분위기가 아주 좋습니다. 동료들끼리 ________ 위해 주고 항상 웃으면서 이야기를 나눕니다.

   අපේ සමාගමේ වාතවරණය බොහොම හොඳයි. එකට වැඩ කරන අය (එකිනෙකාව) හොඳින් තේරුම් ගනිමින් එකිනෙකා සමග සිනහ වෙමින් කතාබහ කරනවා.

   ① 서로 ② 벌써
   ③ 전혀 ④ 아직


3. 직장에서 즐겁게 ________ 동료들과 잘 지내는 것이 중요합니다. 서로 배려하고 웃으면서 이야기하는 것이 좋습니다.

   වැඩබිමේදී සතුටින් (ජීවත් වෙමින්) ඔබගේ සගයන් සමඟ සතුටින් වැඩ කටයුතු කිරීම වැදගත් වේ.

   ① 정리하니까 ② 정리하려면
   ③ 생활하니까 ④ 생활하려면

정답 1. ② 2. ① 3. ④



발음 උච්චාරණය  P-17

හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.

කොරියානු භාෂාවේ ව්‍යඤ්ජන දෙකක් පිළිවෙලින් යෙදේ නම් විවිධ ශබ්ද වෙනස්කම් ඇති වේ. නමුත් 'ㄹ+ㄱ(ㄲ)/ㄷ(ㅌ,ㄸ)/ㅂ(ㅍ,ㅃ)/ㅅ(ㅆ)/ㅈ(ㅊ,ㅉ)/ㅎ' වැනි අවස්ථා වලදී කිසිදු ශබ්ද වෙනස්කමක් සිදුවන්නේ නැත.

(1) 딸기, 얼굴, 날개, 갈비
(2) 슬기, 즐기다, 질기다
(3) 딸기가 맛있어요.
(4) 즐거운 방학이에요.



오늘 회식을 하자고 해요


අද භෝජන සංග්‍රහයක් පවත්වන්න අදහස් කරනවා

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

- අධ්‍යයන අරමුණු: භෝජන සංග්‍රහ කාලසටහන නිවේදනය කිරීම, නව සේවකයන් හඳුන්වා දීම
- ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස්: –자고 하다, –(으)라고 하다
- වචන භාවිතය සඳහා උපදෙස්: භෝජන සංග්‍රහය/වැඩපළෙහි රැස්වීම
- සංස්කෘතික තොරතුරු: කොරියානු ආහාර සංස්කෘතිය



대화 1 සංවාදය 1





රැස්වීම් කාලසටහන ගැන කම්හලේ කළමනාකාරතුමා කාර්ය මණ්ඩලය දැනුවත් කරමින් සිටී. පළමුව සංවාදයට සවන් දෙන්න.

공장장 여러분, 이번 주 금요일 저녁에 회식하자고 한 거 모두 기억하시지요? 한 명도 빠짐없이 참석하는 겁니다!
සවන්දෙන්න, මෙම සතියේ සිකුරාදා භෝජන සංග්‍රහය පැවැත්වීමට තීරණය කරගත් එක සැම දෙනාටම මතකයි නේද? කවුරුවත් නැතිව ඉන්නේ නැතිව හැමෝම එන්න ඕනේ.

모니카 설마 오늘도 삼겹살은 아니지요?
ඇත්තටම අදත් සම්ග්යෝබ්සල් නෙවෙයි නේද?

공장장 다들 좋아하는 것 같아서 이번에도 삼겹살집으로 정했는데, 별로예요?
හැමෝම කැමතියි වගේ නිසා මෙවරත් සම්ග්යෝබ්සල් ආපනශාලාව සූදානම් කළාට අකමැති ද?

모니카 아니요, 그런 건 아니에요. 대신 2차는 치킨 먹으러 가요. 날도 더운데 시원한 맥주에 치킨 좋잖아요.
නැහැ, එහෙම නෙවෙයි. ඒ වෙනුවට දෙවන වටයට කුකුල් මස් කන්න යමු. අද දවසත් රස්නේ නිසා සිතල බියර් සමග කුකුල් මස් හොඳයිනේ.

공장장 당연하지요. 좋습니다. 그럼 1차는 삼겹살, 2차는 치맥입니다. 오늘 배 터지게 먹어 봅시다.
ඇත්ත වශයෙන්ම. හොඳයි. එහෙනම් පළමු වටයට සම්ග්යෝබ්සල්, දෙවන වටයට කුකුල් මස් හා බියර්. අද නම් බඩ පැලෙන්නම කාලා බලමු.

모니카 네, 모처럼 포식하겠네요.
ඔව්.ගොඩාක් කාලෙකින් බඩ පිරෙනකන්ම කන්න යනවා නේ.

> **빠짐없이** අඩුවක් නැතිව/හැමදේම
> · 여행에 가져갈 준비물을 빠짐없이 챙겼다.
> චාරිකාවට රැගෙන යන දේවල් අඩුවක් නැතිව සූදානම් කරගත්තා.

> **모처럼** ගොඩාක් කාලෙකින්, වෙනසකට වගේ
> · 모처럼 가족과 외식을 하려고 해요.
> ගොඩාක් කාලෙකින් පවුලේ අය සමග භෝජන සංග්‍රහයකට යන්න හිතාගෙන ඉන්නවා.

> **배 터지게 먹다** බඩ පැලෙන්න කනවා



හොඳින් අසා නැවත කියෙව්වා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 이번 주 금요일에 어디에서 회식을 해요? මෙම සිකුරාදා ඔබට භෝජන සංග්‍රහයක් තිබේ ද?
2. 회식 2차는 무엇을 먹으러 가요? ,දෙවෙනියට අනුභව කරන්න යන්නේ මොනවාද?

정답 1. 삼겹살집에서 회식을 해요. 2. 맥주에 치킨을 먹으러 가요.



어휘 1 වචන මාලාව 1 — 회식 භෝජන සංග්‍රහය (ආයතනයේ අය සමඟ ගන්නා ආහාර වේල)



භෝජන සංග්‍රහයක් යනු වැඩපොළේ මිතුරන් සමග කෑම බිම ගන්නා අවස්ථාවකි. එහෙනම් භෝජන සංග්‍රහය හා සම්බන්ධ වචන සොයා බලමු ද?



회식을 하다
භෝජන සංග්‍රහයකට යනවා



참석하다
සහභාගී වෙනවා/පැමිණෙනවා



빠지다
නොපැමිණෙනවා/මග හරිනවා



한턱내다
සංග්‍රහ කරනවා (පිරිසක් සමඟ ආහාර ගෙන තමන් විසින් මුදල් ගෙවන විට)



한잔하다
මත්පැන් ගන්නවා/බොනවා



2차에 가다
දෙවන වටයට යනවා



술을 받다
මත්පැන් ලබාගන්නවා




건배하다
සව්දිය පුරනවා/ චියර්ස් කරනවා



ඉහත සදහන් වචන මාලාව දෙස නොබලා ගැටළුව විසදීමට උත්සාහ කරන්න.

1. 대화를 읽고 맞는 그림을 〈보기〉에서 고르세요.
දෙබස කියවා ගැළපෙන පින්තූරය උදාහරණ වලින් තෝරන්න.



가: 리한 씨, 오늘 보너스 받았다면서요?
රිහාන් මහතා අද බෝනස් ලැබුණාලු නේද?
나: 네, 갑자기 부자가 된 것 같아요. 제가 오늘은 한턱낼게요.
ඔව් එකවරම ධනවතෙක් වුණා වගේ. අද මම සංග්‍රහ කරන්නම්.



그림 ①

1) 가: 오늘 승진하신 김 부장님 축하드립니다.
나: 감사합니다. 자, 우리 다 같이 건배합시다.
그림 ( )

2) 가: 리한 씨, 제 술 한 잔 받으세요.
나: 어이쿠, 감사합니다.
그림 ( )

보기

① 

② 


③ 

④ 

정답 1) ② 2) ③



문법 1 සංවාදය 1 -자고 하다



කථකයා වෙනත් කෙනෙකු පැවසූ දෙය නැවත පැවසීමකදී යොදාගැනේ. නැවත පවසනු ලබන වාක්‍යය ඉල්ලීමක් නම් '-자고 하다' යොදාගනී. ක්‍රියා පදයෙහි අවසානය හල් කිරීමක්ද යන්න පිළිබඳව අදාළවත්වයක් නොමැතිව '-자고 하다' යොදා ගැනේ.

- 가: 지훈 씨가 뭐라고 해요? ජිහුන් මහත්තයා මොකද කියන්නේ?
  나: 오늘 같이 **운동하자고 해요**. අද එකට ක්‍රීඩා කරමු කියලා කියනවා.
- 가: 이번 주말에 어디로 갈까요? මේ පාර සති අන්තයේ කොහෙටද යන්නේ?
  나: 날씨가 좋으니까 같이 등산을 **가자고 하는데요**. කාලගුණය හොඳ නිසා එකට කඳු නගිමු කියලා කියනවා.
- 가: 오늘 퇴근하고 약속 있어요? අද වැඩ ඉවර වෙලා පොරොන්දුවක් තියෙනවද?
  나: 아상카 씨가 영화를 **보자고 하는데** 같이 갈래요?
  අසංක මහතා චිත්‍රපටියක් බලමු කියලා කියනවා. එකට යමුද?



'-자고 하다' අවබෝධ වුණා ද? එසේ නම් උදාහරණයේ දැක්වෙන ආකාරයට වාක්‍යය වෙනස්කර ලියන්න.

1. '-자고 하다'를 사용해서 〈보기〉처럼 문장을 완성하세요.
'-자고 하다' භාවිතා කර උදාහරණයේ ආකාරයට වාක්‍යය සම්පූර්ණ කරන්න.





지훈 씨가 이따가 만나자고 해요.
ජිහුන් මහතා තව ටිකකින් හමුවෙමු කියල කියනවා.

1) 술을 마셔요.
지훈 씨가 ______________.

2)


지훈 씨가 ______________.

3)


지훈 씨가 ______________.

4)


지훈 씨가 ______________.

정답 1) 술을 마시자고 해요 2) 같이 저녁을 먹자고 해요 3) 다음 주에 회식을 하자고 해요 4) 2차로 노래방에 가자고 해요


유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

바람 좀 쐬고 올게요. පොඩ්ඩක් එළියට ගිහිල්ල එන්නම්.

가: 어디 가요? කොහේද යන්නේ?
나: **바람 좀 쐬고 올게요.** 머리가 아파서요.
ටිකක් සුළං වැදිලා (ටිකක් එළියට ගිහිල්ලා) එන්නම්. ඔළුව රිදෙනවා.



대화 2 සංවාදය 2





කම්හලේ කළමනාකාරතුමා නව සේවකයන්ව කාර්ය මණ්ඩලය වෙත හඳුන්වා දෙයි. පළමුව සංවාදයට සවන් දෙන්න.

자, 여기 좀 잠깐 보세요. 소개할 사람이 있는데, 타타 씨예요. 다음 달부터 같이 일하게 됐어요.
මෙහෙ ටිකකට බලන්න. හඳුන්වාදීමට අයෙක් ඉන්නවා. ටාටා මහතා. ලබන මාසයේ සිට එකට වැඩ කරනවා.

안녕하세요. 타타 이스모노입니다. 타타**라고 불러** 주세요.
ආයුබෝවන්. මම ටාටා ඉස්මොනෝ. ටාටා කියල කියන්න.

타타 씨, 환영합니다. 공장장님, 새 식구도 **생기고**, 요즘 날씨도 좋은데 단합 대회라도 한번 하**는 게 어떨까요?**
ටාටා මහතා සතුටින් පිළිගන්නවා. කම්හලේ කළමනාකාරතුමා, අළුතින් සේවකයනුත් ඇවිත් මේ දිනවල කාලගුණයත් හොඳ නිසා එකමුතු කම ශක්තිමත් කිරීමට රැලියක්(තරඟයක්) එක් වරක් පවත්වන එක කොහොමද?

그럴까요? 좋아요. 다른 분들은 어떠세요?
එහෙම කරමු ද? හොඳයි. අනිත් අය මොකද කියන්නේ?

좋습니다.
හොඳයි.

그럼, 다음 주에 일 끝나면 오랜만에 한번 뭉칩시다.
එහෙමනම්, ඊලඟ සතියේ වැඩ අවසන්වී ගොඩ කාලයකින් සැමදෙනාම එක් සැරයක් එක්වෙමු

-는 게 어떨까요? කරන එක කොහොමද?
යමක් යෝජනා කරනවිට භාවිතා කරයි.
· 주말에 날씨가 좋으면 가까운 곳으로 여행을 가는 게 어떨까요?
සති අන්තවල කාලගුණය හොඳ නම් ළඟ ස්ථානයකට චාරිකාවක් යන එක කොහොමද?

생기다 සිදුවෙනවා/ ලැබෙනවා/ සෑදෙනවා/ ආරම්භ කරනවා
කලින් නොතිබූ දෙයක් අලුතින් ඇතිවෙනවා
· 회사 앞에 치킨집이 새로 생겼어요.
සමාගම ඉදිරිපිට අලුත් කුකුල්මස් ආපනශාලාවක් ආරම්භ කරලා.



හොඳින් අසා නැවත කියෙව්වා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 공장장이 소개하는 사람은 누구예요?
   කර්මාන්තශාලා කළමනාකරු හඳුන්වා දුන්නේ කාවද?
2. 언제 단합 대회를 해요? තරඟය/රැලිය කරන්නේ කවදාද?

정답 1. 다음 달부터 같이 일하게 될 새 직원이에요. 2. 다음 주에 일이 끝나면 해요.

Tip -아/어 달라고 하다, -아/어 주라고 하다 කරලා දෙන්න කියල ඉල්ලනවා

동사 '주다'는 목적어를 받는 대상에 따라 간접화법에서 사용되는 동사가 달라진다. 목적어를 받는 대상이 화자 자신인 경우 '-아/어 달라고 하다'를 사용한다.

'주다' යන ක්‍රියාපදය, කර්මය ලබන පුද්ගලයා අනුව භාවිතාකරන ක්‍රියාපදය වෙනස් වේ. කර්මය ලැබුණු පුද්ගලයා කථිකයාම වේ නම් '아/어 달라고 하다' ලෙස භාවිතා කරයි.

1) 영수: 점심 좀 사주세요. දහවල් කෑම අරන් දෙන්න.(මිළදී ගෙන දෙන්න)
   민수: 뭐라고 했어요? මොකක් කියලද කිව්වේ?
   영수: 점심 좀 사달라고 했어요. දවල් කෑම අරන් දෙන්න කියල කිවේ.
2) 수지: 사장님이 이거 민수 씨에게 가져다주라고 하셨어요. ප්‍රධානියා මෙය මින්සු මහතාට දෙන්න කියල කිවුවා.
   민수: 네, 고마워요. ඔව්, ස්තුතියි.



어휘 2 වචන මාලාව 2 직장에서의 모임 වැඩපොළේ රැස්වීම්

රැකියා ස්ථානයේදී කුමන ආකාරයේ රැස්වීම් තිබේ ද? රැකියා ස්ථානයේ රැස්වීම්වලට සම්බන්ධ වචන දෙස බලමු ද?



환영하다
සාදරයෙන් පිළිග න්නවා(ආයුබෝවන්)




환송하다
සමු ගැනීම/සමු දීම



축하하다
සුභ පතනවා



친해지다
මිතුරු වෙනවා



단합대회
රැලියක් /තරඟයක්



등반 대회
කඳු නැඟීමේ තරඟයක්



야유회
විනෝද චාරිකාවක්



체육대회
මලල ක්‍රීඩා

- 신입사원을 **환영하는** 파티가 있어요. නව සේවකයින් පිළිගැනීමට පාටියක් තිබේ.
- 카림 씨를 **환송하려고** 공항에 갔어요. කරීම් මහතාට සමුදීමට/ආපසු ගුවන්තොටුපලට ඇරලීමට ගියේය.
- 김 부장님, 승진을 **축하합니다.** කිම් අංශ ප්‍රධානිතුමා, ඔබේ උසස්වීම සඳහා සුභ පතනවා.
- 우리는 회식 자리에서 **친해지게** 되었어요. භෝජන සංග්‍රහයේදී අපි මිතුරු වුණා.



ඉහත ඉගෙන ගත් වචන නැවත මතක් කර ප්‍රශ්නවලට පිළිතුරු සපයා බලමු ද?

1. 그림을 보고 대화를 완성하세요. පින්තූරය බලා සංවාදය සම්පූර්ණ කරන්න.

1) 

가: 리한 씨, 승진 ______________. රිහාන් මහතා, උසස්වීමට (සුභ පැතුම්).
나: 네, 감사합니다. ඔව්, ස්තූතියි.

2) 


가: 오늘 저녁에 회식이 있어요? අද රාත්‍රියේ භෝජන සංග්‍රහයක් තිබේ ද?
나: 네, 새로 온 리한 씨를 ______________ 자리예요.
ඔව් අළුතින් එන ලිහාන් මහතා (පිළිගන්න) අවස්ථාවයි.

3) 

가: 어제 단합 대회 재미있었어요? ඊයේ තරඟය විනෝදජනක ද?
나: 네, 회사 사람들하고 회사가 아닌 곳에서 만나니까 더 __________ 것 같아요.
ඔව්. ආයතනයේ අය සමඟ ආයතනය නොවන තැනකදී මුණගැසීම නිසා ගොඩක් මිතුරු වුණා වගේ.

정답 1) 축하해요 2) 환영하는 3) 친해진

문법 2 සංවාදය 2 -(으)라고 하다



කථකයා වෙනත් කෙනෙකු පැවසූ දෙය නැවත පැවසීමකදී යොදාගැනේ. නැවත පවසනු ලබන වාක්‍යය විධානයක් නම් '-(으)라고 하다' යොදාගනී.

자음 (ව්‍යඤ්ජන) → **-으라고 하다**	모음 (ස්වර), 자음 'ㄹ' (ව්‍යඤ්ජනය -ㄹ) → **-라고 하다**
읽다 → 읽**으라고 한다**	사다 → 사**라고 한다** 만들다 → 만들**라고 한다**

· 가: 공장장님이 뭐라고 하세요? කර්මාන්තශාලා ප්‍රධානියා මොකද කියන්නේ?
  나: 오늘 모두 회식에 **참석하라고 하세요.** අද හැමෝම කෑමකට යමු කියලා කියනවා.
· 가: 사장님께서 아직 안 오셨네요. ආයතන ප්‍රධානියා තාම ආවේ නෑ.
  나: 네, 조금 늦으실 것 같아요. 우리 먼저 **먹으라고 하세요.**
  ඔව් ටිකක් පරක්කු වෙයි වගේ. අපිට මුලින් කන්න කියලා කියනවා.
· 가: 어렵지 않았어요? අමාරු වුනේ නැද්ද?
  나: 조금 어려워서 한국인 친구한테 **도와 달라고 했어요.**
  ටිකක් අමාරු නිසා කොරියානු ජාතික යාළුවෙක්ට උදව් කරන්න කියලා කිව්වා.




'-(으)라고 하다' තේරුම් ගත්තා ද? එසේනම් උදාහරණයේ දැක්වෙන ආකාරයට වක්‍ර ආකාරයෙන් වෙනස්කර කර බලන්න.

2. '-(으)라고 하다'를 사용해서 〈보기〉처럼 문장을 완성하세요.
'-(으)라고 하다' භාවිතා කර උදාහරණයේ දැක්වෙන ආකාරයට වාක්‍ය සම්පූර්ණ කරන්න.

보기




지훈 씨가 이따 전화하라고 했어요.
ජිහුන් මහතා ටිකකින් කතා කරන්න (දුරකතන ඇමතුමක් දෙන්න) කියල කිවුවා.


1) 

지훈 씨가 ______________.

2) 늦지 마세요.
지훈 씨가 ______________.

3) 

지훈 씨가 ______________.

4) 

지훈 씨가 ______________.

정답 1) 먼저 가라고 해요 2) 늦지 말라고 해요 3) 두꺼운 옷을 입으라고 해요 4) 여기에 담으라고 해요

유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

손 좀 봐야 할 것 같아요. හදන්න වෙනවා වගෙයි.

가: 에어컨을 켜도 별로 시원하지 않네요. ඒ සී එක (වායු සමීකරණය) දැම්මත් එතරම් සිතල නැහැ.
나: 네, **손을 좀 봐야 할 것 같아요.** ඔව්, හදන්න වෙනවා වගෙයි.



활동 ක්‍රියාකාරකම්

회식을 알리는 글입니다. 잘 읽고 질문에 답하세요.

භෝජන සංග්‍රහය දැනුම් දෙන නිවේදනයයි .හොඳින් කියවා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

〈한국 상사 회식 안내〉

කොරියානු සමාගමක භෝජන සංග්‍රහ දැන්වීම

김민수 씨 승진 축하 겸 단합대회입니다.
한 사람도 빠지지 말고 참석해 주세요.

කිම්මින්සු මහතාගේ උසස්වීම සමරන උත්සවයයි. එක් අයෙකුවත් මග නොහැර/සැමදෙනාම සහභාගී වන්න.

장소: 한국 식당
කොරියානු ආපන ශාලාව

시간: 3월 25일 (목) 오후 6시
වේලාව : මාර්තු 25 බ්‍රහස්පතින්දා සවස 6 ට

전화번호: 02-400-5000
දුරකථන: 02-400-5000

1. 동료에게 회식을 안내하는 문자를 고르세요.

භෝජන සංග්‍රහය යහළුවන්ට දැනුම් දෙන කෙටි පණිවිඩයක් යවන්න.

① 10:25 OnLine
민수 씨, 이따 한 잔 하지 않을래요? 6시에 한국 식당 앞에서 만나요.

② 10:25 OnLine
민수 씨, 저는 오늘 저녁에 회식이 있어서 생일 파티에 못 가요. 수루 씨에게 생일 축하한다고 전해주세요.

③ 10:25 OnLine
오늘 저녁에 회식이 있어요. 한국 식당에서 6시에 만나요. 꼭 참석하세요.

④ 10:25 OnLine
민수 씨, 승진 축하해요. 언제 술 한잔해요. 승진 턱 내세요.

정답 1. ③

한국의 회식 문화

කොරියානු ආහාර සංස්කෘතිය



회식 භෝජන සංග්‍රහය

한국의 회식 문화는 단순히 동료들과 함께 술과 음식을 즐기는 것을 넘어 직장생활의 연장선상으로 인식되는 특별한 자리입니다.

කොරියානු ආහාර සංස්කෘතිය සමාගමේ සගයන් සමග මත්පැන් සහ ආහාර භුක්ති විඳීමෙන් ඔබ්බට ගොස් වැඩ කරන ජීවිතයේ තවත් කොටසක් ලෙස හැඳින්විය හැකි විශේෂ ස්ථානයකි.

회식은 한국 특유의 조직 문화로, 회사 조직원들의 관계에 긍정적인 영향을 끼치는 요소로 여겨지고 있습니다.

එය කොරියාවේ අද්විතීය ආයතනික සංස්කෘතියක් වන අතර සමාගම් සාමාජිකයින්ගේ සබඳතාවන්ට ධනාත්මක බලපෑමක් ඇති කරන මූලධර්මයක් ලෙස සැලකේ.

술자리 예절 මත්පැන් පානය කරන විට පිළිපැදිය යුතු දේ

회식에 가면 보통 식사만 하는 것이 아니라 술자리도 마련됩니다. 마시는 술의 종류는 보통 소주, 맥주 혹은 한국 고유의 술인 막걸리입니다. 종교적인 문제로 술을 마시지 않는다면 이를 미리 사람들에게 알려 양해를 구하는 것이 좋습니다. 혹시 술을 마시지 않는데 잔에 받았을 경우, 그냥 내려놓지 말고 가볍게 입에 댄 후 테이블에 내려놓으면 됩니다.

භෝජන සංග්‍රහයට ගියවිට සාමාන්‍යයෙන් කෑම පමණක් නොව අනිවාර්යයෙන්ම මත්පැන් පානය කරනවා. පානය කරන මත්පැන් වර්ගය බොහෝවිට සොජු, බියර් නැතිනම් කොරියානු සම්ප්‍රදායික මත්පැන් මක්කොල්ලි වේ. ආගමික හේතුමත මත්පැන් පානය නොකරන්නේ නම් කලින්ම පැවසීම වැදගත්! මත්පැන් පානය නොකරන නමුත් මත්පැන් ලබා දුන්නේ නම් මත්පැන් බොන ලෙස අඟවා වීදුරුව මේසය මතින් තබන්න.

술을 받거나 따를 때 다음과 같이 하세요.

ඔබ මත්පැන් ලැබීම හෝ දීමේදී පහත සඳහන් දේ කරන්න.

상사에게 술을 따를 때

ඉහළ නිලධාරියෙකුට මත්පැන් ලබා දෙද්දී



두 손으로 따릅니다.

දෑත් දෙකෙන්ම අල්ලා වත්කරන්න.

상사에게 술을 받을 때

ඉහළ නිලධාරියෙකුගෙන් මත්පැන් ලබාගනිද්දී



두 손으로 받습니다.

අත් දෙකෙන්ම වීදුරුව අල්ලා ලබාගන්න.

상사 앞에서 술을 마실 때

ඉහළ නිලධාරියෙක් ඉදිරිපිට මත්පැන් පානය කරද්දී



고개를 상사 반대쪽으로 돌립니다.

හිස ප්‍රධානියාට විරුද්ධ පැත්තට හරවන්න.



EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK



අංක 1 සිට 2 දක්වා පින්තූරය බලා ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්නය වේ. දෙබසට සවන්දීමට පෙර ප්‍රශ්න හා පින්තූර හොඳින් බලන්න.

[1~2] 다음 그림을 보고 알맞은 대답을 고르십시오.
පහත රූපය බලා ගැළපෙන පිළිතුර තෝරන්න.



1. 오늘 뭐 해요? අද ඔබ කරන්නේ කුමක්ද?

① ② ③ ④

2. 

이 사람은 지금 무엇을 하고 있습니까?
දැන් මේ පුද්ගලයා කරන්නේ කුමක්ද?

① ② ③ ④



අංක 3 හා 4 ගැළපෙන වචන තෝරන ප්‍රශ්නය වේ. 5 වැන්න දෙබසට සවන්දී දෙබසට ගැළපෙන පින්තූරය තෝරන ප්‍රශ්නය වේ. ඇසීමට පෙර පිළිතුරු හා පින්තූර හොඳින් බලන්න.

[3~4] 질문을 듣고 알맞은 대답을 고르십시오.
ප්‍රශ්නය අසා ගැළපෙන පිළිතුර තෝරන්න.

3. ① 아니요, 모두 참석하라고 했어요. ② 네, 회식을 할 거라고 했어요.
③ 아니요, 이제 2차에 간다고 했어요. ④ 네, 민수 씨가 한턱낸다고 했어요.

4. ① 네, 그래서 오늘 환송회를 할 거예요. ② 네, 그래서 오늘 체육대회를 해요.
③ 네, 그래서 오늘 환영 파티를 할 거예요. ④ 네, 그래서 오늘 생일 파티를 해요.

5. 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오.
කතාව අසා ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

두 사람은 무엇에 대해서 이야기하고 있습니까? මිනිසුන් දෙදෙනා කුමක් ගැන කතා කරමින් සිටිනවා ද?

①


②


③


④




듣기 대본 ශ්‍රවණ පිටපත

1. ① 남: 등산을 해요. කඳු නගිනවා.
   ② 남: 2차에 가요. දෙවැනි වටයට යනවා.
   ③ 남: 회식을 해요. භෝජන සංග්‍රහයට යනවා.
   ④ 남: 수영을 해요. පිහිනනවා.
2. ① 여: 술을 마시고 있습니다. මත්පැන් පානය කරමින් ඉන්නවා.
   ② 여: 2차에 가고 있습니다. දෙවන වටයට යමින් ඉන්නවා.
   ③ 여: 건배를 하고 있습니다. සව්දිය පුරමින් ඉන්නවා.
   ④ 여: 노래를 부르고 있습니다. සින්දු කියමින් ඉන්නවා.
3. 남: 회식이 끝난 거예요? භෝජන සංග්‍රහය අවසන් ද?
4. 여: 오늘 새로운 직원이 왔다고 들었어요. අද අළුත් සේවකයෙක් ආවා කියලා ආරංචි වුණා.
5. 남: 어제 단합대회는 어땠어요? ඊයේ තරඟය කොහොමද?
   여: 좋았어요. 동료들하고 같이 얘기를 많이 했어요.
   හොඳයි. මම මගේ සගයන් සමඟ ගොඩාක් කතා කළා.
   남: 동료들하고 많이 친해졌을 것 같아요. මම මගේ සගයන් සමග හොඳට මිතුරු වුණා වගෙයි.

정답 1. ① 2. ③ 3. ③ 4. ③ 5. ④

확장 연습 වැඩිදුර අභ්‍යාස

L-39


1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදය හොඳින් සවන්දී ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

   남자는 내일 무엇을 하려고 합니까? පිරිමි පුද්ගලයා හෙට කුමක් කරන්නටදැයි සිටින්නේ?

   ① 한턱내려고 합니다.
   ② 야근을 하려고 합니다.
   ③ 작업을 끝내려고 합니다.
   ④ 동료를 축하해 주려고 합니다.

확장 연습 듣기 대본 වැඩිදුර අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 여: 바트 씨, 대리로 승진한 거 축하해요.
   බාර්ට් මහතා, නියෝජිතයකු ලෙස ඔබේ උසස්වීම ගැන සුබ පැතුම්. මගේ ගානේ හෙට සංග්‍රහයක් දෙන නිසා හැමෝම රස කෑම කන්නට යමු.
   남: 고마워요. 이게 모두 여러분이 도와준 덕분이에요. 내일 제가 한턱낼 테니까 다 같이 맛있는 거 먹으러 가요.
   ස්තුතියි, මේ සියල්ල ඔයාල උදව් කරපු නිසයි.
   여: 와, 정말요? 내일은 야근이 없으니까 작업 끝나면 바로 퇴근할 수 있어요.
   ෂා ඇත්තද? හෙට රාත්‍රී වැඩ මුරය නැති නිසා කිරීමට ඇති වැඩ ඉවර වූ වහාම යන්නට හැකිය.



정답 1. ①



EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සිට අංක 2 දක්වා පින්තූර බලා තේරුම කුමක්දැයි නිගමනය කරන ගැටළුවයි. පෙර ඉගෙනගත් වචන සිහි කරමින් ගැටළුව විසඳා බලන්න.

[1~2] 다음 그림을 보고 맞는 문장을 고르십시오.
පහත පින්තූර බලා ගැළපෙන වාක්‍යය තෝරන්න.

1.



① 회식입니다.
② 등산입니다.
③ 소풍입니다.
④ 체육대회입니다.

2.



① 환영하는 자리예요.
② 환송하는 자리예요.
③ 축하하는 자리예요.
④ 친해지는 자리예요.



අංක 3 සිට අංක 4 නිවැරදි වචනය තෝරන ගැටළුවයි. අංක 5 ඡේදයේ මාතෘකාව තෝරන ගැටළුවයි. ඉගෙනගත් වචන සහ ව්‍යාකරණ සිහි කරමින් ගැටළුව විසඳා බලන්න.

[3~4] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오.
හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

3.
가: 오늘 회식을 한다고 해요? අද කාර්යාලයේ භෝජන සංග්‍රහයකට යනවා කියල කියනවා ද?
나: 네, 한 사람도 빠짐없이 ________ 했어요.
ඔව්, එක් අයෙක්වත් අඩු වන්නේ නැතුව සහභාගී වෙන්න කියා කිව්වා.

① 빠지라고 ② 마시라고 ③ 참석하라고 ④ 축하하라고

4.
가: 리한 씨가 이제 고향으로 돌아간다고 해요. රිහාන් මහතා ළඟදී ගමට යනවා කියලා කියනවා.
나: 그래요? 그럼 곧 ________ 파티를 해야겠네요.
ඇත්තද?එහෙමනම් අනිවාර්යෙන්ම (සමුගැනීමේ) පාටියක් තියන්න ඕනනේ.

① 생일 ② 승진 ③ 환송 ④ 환영

5. 다음 질문에 답하십시오. මීලඟ ගැටළුවට පිළිතුරු සපයන්න.

보통 회식이라고 하면 삼겹살을 먹고, 술을 마시는 것을 생각하기 쉽습니다. 하지만 요즘은 술자리 대신 같이 공연을 관람하거나 운동을 하면서 단합을 도모하기도 합니다. 술이 없는 회식 문화가 더 많은 직원의 참여를 유도하고 있습니다.

සාමාන්‍යයෙන් කාර්යාලීය භෝජන සංග්‍රහයකට ගිය විට සම්ග්යොබ්සල් ආහාරයට ගෙන මත් පැන් පානය කිරනවා යැයි ලෙහෙසියෙන්ම සිතන්න පුලුවනි. නමුත් වර්ථමානයේ මත්පැන් ගැනීම වෙනුවට ප්‍රසංගයක් නැරඹීම හෝ ක්‍රීඩා කරමින්ද රැස්වීම් සංවිධානය කරනවා. මත්පැන් නොමැති කාර්යාලීය භෝජන සංග්‍රහ සංස්කෘතියට ගොඩාක් සේවකයින් යොමු වෙමින් ඉන්නවා.

글의 주제로 알맞은 것은 무엇입니까? ඡේදයේ මාතෘකාවට ගැළපෙන පිළිතුර කුමක්ද?

① 회식 문화가 바뀌고 있습니다.
② 보통 회식에서는 술을 마십니다.
③ 회식에서 공연을 보기도 합니다.
④ 회식에 모든 직원이 참여해야 합니다.

정답 1. ④ 2. ① 3. ③ 4. ③ 5. ①



확장 연습 වැඩිදුර අභ්‍යාස

[1~3] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

1. 우리 회사는 한 달에 한 번 ________을/를 합니다. 회사 동료들과 함께 밥을 먹으면서 친해질 수 있습니다.

   අප ආයතනයේ මසකට වරක් (එකට වැඩකරන මිතුරන් සමග කෑමට එළියට යෑම) කරයි. එකට වැඩකරන මිතුරන් එකට ආහාර ගනිමින් සමීප විය හැකියි.

   ① 승진　② 휴가
   ③ 구경　④ 회식

2. 주말에 백화점에 ________ 갔습니다. 백화점에서 부모님께 드릴 선물도 사고 친구 결혼식 때 입을 옷도 샀습니다.

   සති අන්තයේදී වෙළඳ සංකීර්ණය (ෂොපිං) වෙත ගියා. වෙළඳ සංකීර්න වෙළඳ සංකීර්ණයේදී දෙමව්පියන්ට දීමට තෑගිද මිලට ගෙන යහළුවගේ මංගල උත්සවය ට ඇඳීමට ඇඳුමක්ද ගත්තා.

   ① 선물하러　② 산책하러
   ③ 쇼핑하러　④ 운동하러

3. 퇴근 후에 모임이 있다고 하면 보통 회식을 떠올립니다. 하지만 요즘은 회식 대신에 같이 공연을 ________ 운동을 하기도 합니다.

   වැඩ නිමා වීමෙන් පසු පසු රැස්වීමක් තිබේ නම්, සාමාන්‍ය වැඩ කරන අය සමග ආහාර වේලක් තිබේ. නමුත් මේ දිනවල ආහාර වේලක් වෙනුවට, සැමදෙනාම සංදර්ශන බැලීම හෝ ක්‍රීඩා කිරීමත් කරයි.

   ① 보려고　② 보거나
   ③ 알리려고　④ 알리거나

정답 1. ④ 2. ③ 3. ②



발음 උච්චාරණය

 P-18

හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.

කොරියානු භාෂාවේ ව්‍යඤ්ජන දෙකක් පිළිවෙලින් යෙදේ නම් විවිධ ශබ්ද වෙනස්කම් ඇති වේ. නමුත් 'ㅁ/ㄴ/ㅇ+ㄱ(ㄲ)/ㄷ(ㅌ,ㄸ)/ㅂ(ㅍ,ㅃ)/ㅅ(ㅆ)/ㅈ(ㅊ,ㅉ)/ㅎ' වැනි අවස්ථා වලදී කිසිදු ශබ්ද වෙනස්කමක් සිදුවන්නේ නැත.

(1) 운동, 친구, 안개, 신부　(2) 감기, 침대, 금방, 냄비
(3) 강당, 공장, 공기, 당장　(4) 한국 친구가 많아요.
(5) 공장에서 일해요.　(6) 감기에 걸렸어요.



불쾌감을 느꼈다면 그건 성희롱이에요


අපහසුවක් දැනුනානම් එය ලිංගික හිංසනයක

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

▫ අධ්‍යයන අරමුණු	ලිංගික හිංසනය වැලැක්වීම සඳහා වන උපදෙස්/ ලිංගික හිංසනය පිළිබඳව පත්තිවලට සවන්දීම
▫ ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස්	-냐고 하다, 간접화법의 축약형
▫ වචන භාවිතය සඳහා උපදෙස්	ලිංගික හිංසනය/ ලිංගික හිංසනය පාලනය කරන ක්‍රම
▫ සංස්කෘතික තොරතුරු	ලිංගික හිංසනය අර්ථ දැක්වීම හා දක්ෂුවම්



대화 1 සංවාදය 1





මින්වූ, ඛාන්ගේ ක්‍රියාකාරකම් ගැන අවවාද කරමින් සිටියි. දෙදෙනා කුමන කතාවක් කරනවා ද යන්න මුලින් දෙවරක් අසා ඉන්පසුව අනුගමනය කරමින් කියවන්න.

민 우 칸, 아까 지은 씨 표정이 많이 안 좋더라.
ඛාන්, ටිකකට කලින් දැක්ක ජිඅන් මහත්මියගේ මූණ එතරම් හොඳ නැති පාටයි.

칸 **그러게** 말이야. 친하다고 생각해서 한 얘긴데 지은 씨가 화를 내서 나도 깜짝 놀랐어.
ඒක තමයි. යහළුවෙක් කියල හිතල කියපු දෙයට තරහා ගිය නිසා මටත් පුදුම හිතුනා.

민 우 그런데, 농담이라도 상대방이 불쾌감이나 수치심을 **느꼈다면** 성희롱이 될 수 있다고 들었어.
නමුත්, විහිළුවක් වුනත් අහන් ඉන්න කෙනා අපහසුතාවයට හෝ නින්දාවට පත්කරයි නම් ඒක ලිංගික හිංසනයක් ලෙස සලකන්න පුළුවන් කියලා මම අහලා තියනවා.

칸 정말? 그런 의도는 아니었는데…….
ඇත්තද? එහෙම අරමුණක්වත් තිබ්බේ නැහැ......

민 우 나는 칸을 잘 아니까 괜찮지만 다른 사람들은 오해할 수 있어. 성적 농담은 아주 예민한 문제잖아.
මම ඛාන්ව හොඳින් දන්නා නිසා කමක් නැහැ. නමුත් වෙන අය වැරදි විදිහට හිතන්න පුළුවන්, ලිංගිකත්වය ගැන කරන විහිලු ගොඩක් සංවේදී වෙන්න පුළුවන්.

칸 앞으로는 정말 조심해야겠다.
ඉස්සරහට ගොඩක් ප්‍රවේසම් වෙන්න.

> **그러게** ඒක තමයි (ඇත්ත තමයි)
> අනෙකා පවසන යමකට එකඟ වීමේදී භාවිතා කරන යෙදුමකි.
> · 가: 이 음식 맛이 좀 이상해
> මේ කෑම වල රස ටිකක් අමුතුයි.
> 나: 그러게. 날씨가 더워서 상한것 같아.
> එක තමයි, රස්නය නිසා නරක්වෙලා වගේ.

> **-다면** කරනවා නම්
> යම් දෙයක් හෝ සිදුවීමක් ගැන උපකල්පනය කරනවිට භාවිතා කරන යෙදුමකි.
> · 가: 내일 시험이 너무 걱정이에요.
> හෙට විභාගය ගැන ගොඩක් කරදර වෙනවා.
> 나: 열심히 공부했다면 좋은 결과가 있을 거예요.
> හොඳින් පාඩම් කලා නම් හොඳ ප්‍රතඵල ලැබේවි.



හොඳින් අසා අනුගමනය කළා ද? එසේ නම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 지은 씨는 왜 칸 씨에게 화를 냈어요? ජිඅන්, ඇයි ඛාන් සමග හිත් අමනාප වුණේ?

정답 1. 칸이 성적 농담을 했기 때문이에요.





어휘 1 වචන මාලාව 1 성희롱 ලිංගික හිංසනය



ලිංගික හිංසනය හා සම්බන්ධ වචන මොනවාදැයි දැන ගනිමුද?



불쾌감
අපහසුතාවය



수치심
ලැජ්ජාව



거부감
බය



성적 농담
ලිංගිකත්වය පිළිබඳ විහිලුව



신체 접촉
කායික හිංසනය



음담패설
කටකතා



음란물
ලිංගිකත්වය හා සම්බන්ධ දේවල්



동영상
වීඩියෝ පටි



ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


1. 그림을 보고 알맞은 말을 연결하세요.
පින්තූරය බලා ගැළපෙන වචනය යා කරන්න.



①  • — • ㉠ 신체 접촉



②  • — • ㉡ 음담패설

③  • — • ㉢ 음란물

정답 ①㉡ ②㉢ ③㉠

문법 1 සංවාදය 1 -냐고 하다



කථකයා වෙනත් කෙනෙකු පැවසූ දෙය නැවත පැවසීමකදී යොදාගැනේ. නැවත පවසනු ලබන වාක්‍යය ප්‍රශ්නාර්ථය හඟවන වාක්‍යයක් නම් '-냐고 하다' යොදාගනී.

동사 (ක්‍රියාපදය)	형용사 (විශේෂණ පදය)	명사 (නාම පදය)
-느냐고 하다	자음 (ව්‍යඤ්ජනය) → **-으냐고 하다** 모음 (ස්වරය) → **-냐고 하다**	자음 (ව්‍යඤ්ජනය) → **이냐고 하다** 모음 (ස්වරය) → **냐고 하다**
오다 → 오**느냐고 하다** 먹다 → 먹**느냐고 하다**	좋다 → 좋**으냐고 하다** 바쁘다 → 바쁘**냐고 하다**	학생 → 학생**이냐고 하다** 친구 → 친구**냐고 하다**

· 리한 씨가 나한테 몇 시에 회사에 **오느냐고 했어요**.
රිහාන් මහතා මගෙන් සමාගමට කීයටද එන්නේ කියලා ඇහුවා.

· 민우 씨가 칸 씨에게 왜 기분이 **좋으냐고 했어요**.
මිනු මහත්මිය කන් මහත්තයගෙන් මොකද සතුටින් කියලා ඇහුවා.

· 가: 회식은 재미있었어요? කාර්යය මණ්ඩලයත් සමඟ ආහාර ගත්ත එක හොඳද?
나: 네, 그런데 이반 씨 어디 **갔느냐고 하는** 사람들이 많았어요.
ඔව්, ඒ වුනාට අසංක මහත්තයා කොහෙද ගියේ කියලා ඇහුව අය ගොඩක් හිටියා.


· 가: 어제 회식 때 기분 나빴지요? ඊයේ කෑම වෙලාවේ හිත රිදුනා නේද?
나: 네, 그 일을 친구에게 이야기했는데, 성희롱이 **아니냐고 하던데요**.
ඔව්, ඒ ගැන යාලුවට කිව්වම ලිංගික හිරිහැරයක් නෙමේද කියලා ඇහුවා.

ප්‍රධාන වශයෙන් කථනයේදී '-느냐고' යන්න '-냐고' ලෙස ලියනු ලබයි.



'-냐고 하다' තේරුම් ගත්තා ද? එසේනම් උදාහරණයේ දැක්වෙන අන්දමට වක්‍ර කථන ස්වරූපයට මාරු කර බලන්න.

2. '-냐고 하다'를 사용해서 〈보기〉처럼 문장을 완성하세요.
'-냐고 하다' භාවිතාකර උදාහරණයේ දැක්වෙන අන්දමට වාක්‍ය සම්පූර්ණ කරන්න.





상담센터에서 거부감이 들었냐고 물어봤어요.
උපදේශන ආයතනයෙන් බයක් දැණුනා ද කියල විමසුවා.

1)

상담센터에서 ________________.

2)


상담센터에서 ________________.

3)


상담센터에서 ________________.

4)


상담센터에서 ________________.

정답 1) 불쾌감을 느꼈느냐고 물어봤어요 2) 음담패설을 자주 하느냐고 물어봤어요 3) 성적 농담을 했느냐고 물어봤어요 4) 사무실에서 음란물을 보느냐고 물어봤어요



대화 2 සංවාදය 2

Track 125



දේශකයා වැඩපොළ තුළදී ඇතිවන ලිංගික හිංසනය සහ ලිංගික අතවර පිළිබඳව කතාකරමින් සිටී. මුලින්ම දෙබසට දෙවරක් සවන්දී අනුගමනය කරන්න.

강연자 직장 내에는 발생하는 성희롱은 대부분 직장 동료를 가족처럼 대하는 태도에서 시작합니다. 이러한 관계 속에서 너무 편하게 이야기를 하거나 신체 접촉을 하게 되면, 이것이 성범죄로 이어지는 경우가 많죠. 그리고 상대방의 행동 때문에 불쾌한 감정이 생겼을 때는 이것을 분명하게 표현해야 합니다. 또한 성희롱이나 성폭력을 당했을 때는 사건을 정확하게 기록해 두고 증거를 확보하는 게 좋습니다. 우리 모두가 성범죄의 피해자도, 가해자도 될 수 있다는 사실, 반드시 기억하시기 바랍니다.

වැඩපොලේදී සිදුවන ලිංගික හිංසනයන් බොහෝවිට වැඩපොළේ එකට වැඩකරන අයව පවුලේ අය ලෙස සැලකීමෙන් පටන්ගනී. මෙවැනි සම්බන්ධයක් තුළදී ඉතා නිදහස්ව කතාකිරීම හෝ කායික හිංසනයක් සිදුවුණු විට ඒවා ලිංගික හිංසනයක් ලෙස සලකන අවස්ථා අධිකයි. ඒවගේම අනෙකා කරන යම් ක්‍රියාකාරකමක් නිසා අපහසුතවයක් දැනුනානම් එය අනිවාර්යයෙන්ම පැවසිය යුතුයි. තවද ලිංගික අතවරයකට හෝ ලිංගික හිංසාවකට ලක්වන විට එම සිදුවීම හොඳින් සටහන් කරගෙන වාර්තා කිරිම වැදගත්ය. අපි සියලුම දෙනා ලිංගික අතවරයක වැරදි කරු හෝ ගොදුරක් විය හැකි බව අනිවාර්යයෙන්ම මතක තබා ගන්න.

-거나 හෝ
ඉදිරියේදී පවසන දෙය හෝ ඊට පසු පවසන දෙය අතරින් එකක් පමණක් තෝරාගැනීමේදී භාවිතා කරන යෙදුමකි.
· 주말에 시간이 있으면 책을 읽거나 영화를 봅니다.
සති අන්තයේ වේලාව තිබෙනවා නම් පොතක් කියවීම හෝ චිත්‍රපටයක් නරඹනවා.

-기 바라다 යමක් කිරීම ඉක්මන් සිතා සිටින ආකාරයට හෝ බලාපොරොත්තු වන ආකාරයට යමක් සිදුවේවි යයි සිතා සිටින විට භාවිතා කරයි.
· 올해에는 꼭 취직하기를 바랍니다.
මේ අවුරුද්දේ නම් අනිවාර්යයෙන්ම රැකියාවක් ලැබේවි යයි සිතනවා.



හොඳින් අසා අනුගමනය කළා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 강연자는 무엇에 대해 이야기하고 있어요? නිවේදකයා කුමක් පිළිබඳව කතා කළේ ද?
2. 성희롱이나 성폭력을 당했을 때는 어떻게 하면 좋을까요?
   ලිංගික හිංසාවකට හෝ ලිංගික අතවරයකට ලක් වන විට කුමක් කළ යුතුද?

정답 1. 직장 내에서 발생하는 성범죄에 대해 이야기하고 있어요. 2. 사건을 정확하게 기록해 두고 증거를 확보하는 게 좋아요.



어휘 2 වචන මාලාව 2 성희롱 대처 방법 ලිංගික හිංසනය වලක්වන ආකාර



ලිංගික හිංසනය වලක්වන ආකාර හා සම්බන්ධ වචන විමසා බලමු ද?



성범죄
ලිංගික අපරාධය



가해자
වින්දිතකරු



피해자
පැමිණිලි කරු



증거
සාක්ෂි



증인
සාක්ෂි කරු



의사를 표현하다
අකමැති බව පෙන්වනවා



신고하다
පැමිණිලි කරනවා



강요하다
බලපෑම් කරනවා



요구하다
ඉල්ලා සිටිනවා



불이익을 주다
වන්දි ගෙවනවා

- 원하지 않는 일에는 분명하게 **의사를 표현하세요.**
  අනවශ්‍ය දෙයක්නම් අනිවාර්යයෙන්ම අකමැත්ත පෙන්වන්න.
- 집에 도둑이 들어서 112에 **신고했어요.**
  ගෙදරට සොරෙක් පැමිණිය විට 112ට පැමිණිලි කරන්න.
- 놀기만 좋아하는 아이에게 공부하라고 **강요해도** 소용없어요.
  විනෝද වීමට පමණක් කැමති ළමයෙකුට පාඩම් කරන්න කියල බලපෑම් කලත් වැඩක් නැහැ.
- 일하다가 사고를 당하면 회사에 보상금을 **요구할** 수 있어요.
  වැඩකරන ගමන් අනතුරකට පත් වුනොත් සමාගමෙන් වන්දි ලබාගන්න පුළුවනි.
- 승진할 때 외국인이라고 해서 **불이익을 주면** 안 돼요.
  උසස්වීම් දෙන විට විදේශිකයෙක් කියා අවාසියක් කිරීම සුදුසු නැත.



ඉහත ඉගෙන ගත් වචන නැවත මතක් කර ප්‍රශ්නවලට පිළිතුරු සපයා බලමු ද?

1. 그림을 보고 알맞은 말을 연결하세요. පින්තූරය බලා ගැලපෙන වචනය සම්බන්ධ කරන්න.

①

②


③


㉠ 강요하다 ㉡ 신고하다 ㉢ 의사를 표현하다

정답 ① ㉢ ② ㉡ ③ ㉠

문법 2 සංවාදය 2 간접화법의 축약형



වක්‍රව යමක් පැවසීමේදී '-다고 하다', '-(으)라고 하다', '-자고 하다', '-냐고 하다' යන්න එකින් එක '-대요', '-(으)래요', '-재요', '-냬요' ලෙස කෙටි කොට භාවිතා කරයි.

· 가: 오늘 저녁에 모두 다 **참석한대요**? අද හවසට හැමෝම සහභාගි වෙනවලුද?
  나: 김 과장님은 일이 있어서 못 **오신대요**. කිම් කළමනාකාරතුමාට වැඩක් තිබෙන නිසා එන්න වෙන්නෙ නැලු.
· 가: 수루 씨가 **뭐래요**? සුරු මහතා මොකක්ද කිව්වේ?
  나: 상담센터에 가서 상담을 받을 **거래요**. උපදේශන සේවා ස්ථානයට ගොස් උපදේශනය ලබා ගන්නවලු.
· 가: 과장님께서 뭐라고 말씀하셨어요? කළමනාකාරතුමා මොකද කිව්වේ?
  나: 이번 주말에 단합 대회를 **하재요**. මේ සති අන්තයේ කම්කරු රැළියක් පවත්වමුලු.
· 가: 상담센터에서 뭐라고 해요? උපදේශන සේවා ස්ථානයෙන් මොකද කියන්නේ?
  나: 증거나 증인이 **있냬요**. සාක්ෂි සහ සාක්ෂිකරුවන් ඉන්නවද කියලා ඇහුවා.



අවබෝධ වුනා ද? එසේනම් උදාහරණයේ දැක්වෙන ආකාරයට වාක්‍යය සම්පූර්ණ කරන්න.

2. 간접화법 축약형을 사용해서 〈보기〉처럼 문장을 완성하세요.
වක්‍ර භාෂාවේ කෙටි ආකෘතිය භාවිතාකර උදාහරණයේ දැක්වෙන අන්දමට වාක්‍ය සම්පූර්ණ කරන්න.

보기



지훈 씨가 <u>오늘 회식이 있대요.</u>
ජිහුන් මහතා අද සමාගමේ සිටිනවාලු.

1) (내일 휴가를 쓸 거예요.) 지훈 씨가 ______________.

2) (같이 저녁을 먹읍시다.) 지훈 씨가 ______________.

3) (내일 좀 일찍 나오세요.) 지훈 씨가 ______________.

4) (어디서 한국어를 배웠어요?) 지훈 씨가 ______________.

정답 1) 내일 휴가를 쓸 거래요 2) 같이 저녁을 먹재요
3) 내일 좀 일찍 나오래요 4) 어디에서 한국어를 배웠냬요

유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

곧 드릴게요. ඉක්මනට දෙන්නම්.

가: 여기요. 국수 아직 안 나왔어요. සමාවන්න. තාම කුශ්සු (කෑමකි) ලැබුනේ නැහැ.
나: 죄송합니다. **곧 드릴게요.** සමාවන්න. **ඉක්මනට දෙන්නම්.**

활동 ක්‍රියාකාරකම්

성희롱에 관한 O, X 퀴즈입니다. 잘 읽고 질문에 답하세요.
ලිංගික හිංසනය සම්බන්ධ ප්‍රශ්න වේ. හොඳින් කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 맞다고 생각하면 o, 틀리다고 생각하면 ×에 표시하세요.
නිවැරදි යැයි සිතෙනවා නම් ◯ ලකුණත් වැරදියි සිතෙනවා නම් X ලකුණත් යොදන්න.

1) 성희롱은 개인적인 문제이므로 개인적으로 해결해야 합니다. O ×
ලිංගික හිංසනය පෞද්ගලික දෙයක් නිසා තම තමන්ම විසඳා ගත යුතුයි.

2) 가해자가 성희롱을 할 생각이 있었는지가 중요한 기준입니다. O ×
චූදිතයාට ලිංගික හිංසනයක් කිරීමේ අරමුණක් තිබුණාද යන්න වැදගත් වේ.

3) 성희롱에는 남녀를 차별하는 말과 행동도 포함됩니다. O ×
ලිංගික හිංසනයේදී නම් පිරිමි ගැහැණු වෙන් කරන වචන හා ක්‍රියාකාරකම් පවා ඇතුලත් වෙනවා.

4) 피해자가 싫다고 이야기하지 않으면 성희롱이 아닙니다. O ×
පැමිණිලි කරු අකමැතියි පැවසුවේ නැත්නම් එය ලිංගික හිංසනයක් වෙන්නේ නැහැ.

2. 위의 퀴즈의 답과 이에 대한 설명을 확인해 보세요.
ඉහත ප්‍රශ්නවල පිළිතුරු වල විස්තර පරීක්ෂාකර බලන්න.

1) ×
성희롱은 단순한 성적 욕구에 기초한 행위가 아닙니다. 성희롱은 직장 내의 상하 관계와 관련된 행위로, 업무와 관련하여 성적인 언어나 행동 등으로 불이익을 주거나 성적 수치심을 유발하는 행위입니다. 따라서 성희롱은 더 이상 개인의 문제가 아닌 사회문제로 생각해야 합니다.
කායික හිංසනය, සාමාන්‍ය ලිංගික ආශාවන්ගෙන් සැදුම්ලත් ක්‍රියාවක් නොවෙයි. කායික හිංසනය වැඩපොළ තුල සැමවිටම සම්බන්ධිත හා බැඳී තිබෙන ක්‍රියාවක් වන අතර වැඩපොළේ වැඩ හා සම්බන්ධව අසභ්‍ය වචන හෝ ක්‍රියාවන් වලින් අපහසුතාවයක් ලබාදෙන හෝ ලැජ්ජාවට පත්කරන ක්‍රියාවන් වෙයි. එමනිසා තවදුරටත් කායික හිංසනය තම තමන්ගේ ප්‍රශ්නයක් ලෙස නොව සමාජයේ ප්‍රශ්නයක් ලෙස සැලකිය යුතුයි.

2) ×
성희롱인지 아닌지를 판단하는 기준 가운데 가장 중요한 것은 피해자가 어떤 영향을 받았는가 하는 것입니다. 성적인 농담이나 음담패설이 직장생활의 활력소라고 생각하고 행동이나 말을 하는 것이 상대방에게 성적 수치심이나 불쾌감을 줄 수 있습니다.
කායික හිංසනයක් ද නැද්ද යන්න තීරණය කරන නියමයන් අතර වඩාත්ම වැදගත් දෙය වන්නේ පැමිණිලිකරුවා කුමන ආකාරයේ බලපෑමක් ලැබුවාද යන්නයි. ලිංගිකත්වය සම්බන්ද විහිළු කිරීම හෝ කටකතා පැතිරවීම, වැඩපොළේ සාමාන්‍ය දෙයක් ලෙස සලකා කටයුතු කිරීම හෝ කතා කිරීම වෙනත් අයව අපහසුතාවයට පත් කිරීමට හෝ ලැජ්ජාවට පත්කිරීමට පුළුවන්.

3) O
남자와 여자를 차별하는 행동과 말이 상대방에게 불쾌감을 느끼게 했다면 그것도 성희롱입니다. 예를 들어 "여자들은 모를 거야." 라든가 "남자가 뭘 알겠어?" 등의 말을 듣고 상대방이 기분이 나빴다면 성희롱이 됩니다.
පිරිමි සහ ගැහැණු ලෙස වෙන වෙනම වෙනකොට කතාකිරීම මගින් අසා සිටින්නාට අපහසුතාවයක් දැනෙනවා නම් එයත් කායික පීඩනයකි. උදාහරණයක් ලෙස ගැහැණු අය මේ ගැන දන්නෙ නැහැv හෝ පිරිමි පුද්ගලයා මොනවද දන්නෙ?v වැනි වචන අසා සිටින අය අපහසුතාවයට පත් වෙනවා නම් එයත් කායික හිංසනයකි.

4) ×
피해자가 싫다고 정확하게 표현하지 않았어도 그것이 실제로 원하지 않는 행동이었다는 것을 피해자의 말이나 상황을 보고 판단할 수 있습니다. 따라서 명시적인 거부 의사 표현이 성희롱인지 아닌지를 판단하는 기준이 되지는 않습니다.
පැමිණිලිකරුවා අකමැති යැයි වචනයෙන් නොකීවත් එය ඇත්තටම බලාපොරොත්තු නොවූ ක්‍රියාවක් බව පැමිණිලිකරුගේ වචන හෝ ක්‍රියාව බලා නිගමනය කල හැකිය. එමනිසා වචනයෙක් අකමැත්ත ප්‍රකාශ කිරීම කායික හිංසනයක්ද නැද්ද යන්න නිගමනය කිරීමේදී නියමයක් නොවේ.



정보 තොරතුරු

කායික හිංසනය යන සංකල්පය සහ ප්‍රභේද.


직장 내 성희롱은 사업주, 상급자 또는 근로자가 직장 내 지위를 이용하거나 업무와 관련하여 다른 근로자에게 성적인 언동 등으로 성적 굴욕감 또는 혐오감을 느끼게 하거나 성적 언동 그 밖의 요구 등에 대한 불응을 이유로 불이익을 주는 것을 말합니다.(남녀고용평등법 제2조 제2항)

වැඩපොළ තුල කායික හිංසනය යනු සමාගමේ අයිතිකරු, ඉහල නිලධාරීන් හෝ කම්කරුවන් වැඩපොළ තුල තම පදවිය භාවිතා කර හෝ වැඩ සම්බන්ධයෙන් වෙනත් කම්කරුවන්ට අසභ්‍ය ලෙස කතා කිරීම මගින් අපහාසයට හෝ නින්දාවට පත්කිරීම හෝ වෙනත් ලිංගිකත්වය හා සම්බන්ධ බලපෑම් කිරීම යනාදිය නිසාවෙන් අසාධාරණයක් සිදුවීමක් ලෙස දක්වයි. (පිරිමි ගැහැණු සමාන අයිතිවාසිකම් පනත 2 වගන්තිය 2 ඡේදය)

직장 내 성희롱의 개념 වැඩපොළ තුල කායික හිංසනය පිළිබඳ සංකල්පය



성희롱 가해자의 처벌 ලිංගික හිංසනය කරන්නන්ට හිමිවන දඩුවම්



경고, 견책, 정직, 감봉, 해고 등 징계
අනතුරු ඇඟවීම, උද්ඝෝෂනය, පහරදීම, සේවයෙන් පහකිරීම වැනි දඩුවම්

행정적 책임(과태료 등), 민사 책임(손해배상) 발생
විධායක වගකීම(දඩුවම්), පුරවැසි වගකීම්

도덕적 비난과 명예 손상
සදාචාරාත්මක විවේචන හා කීර්තියට හානිවීම





අංක 1 සිට 3 දක්වා ඇත්තේ පින්තූරය දෙස බලා ප්‍රශ්නයට ගැලපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ. ඇසීමට පෙර ප්‍රශ්න කියවා බලන්න.

[1~3] 다음 그림을 보고 알맞은 대답을 고르십시오.
පහත පින්තූර දෙස බලා ගැලපෙන පිළිතුර තෝරන්න.

Track 126

1. 이 사람은 누구입니까? මෙම පුද්ගලයා කවුද?

① ② ③ ④

2. 이 사람은 지금 무엇을 하고 있습니까?
මෙම පුද්ගලයා දැන් මොනවද කරන්නේ?

① ② ③ ④

3. 이 사람은 지금 무엇을 하고 있습니까?
මෙම පුද්ගලයා දැන් මොනවද කරන්නේ?

① ② ③ ④

අංක 4 සහ 5 එකම කතාවකට සවන්දී ප්‍රශ්න වලට ගැලපෙන පිළිතුරු තෝරන ප්‍රශන වේ. ඇසීමට පෙර ප්‍රශ්න හා පිළිතුරුවල අන්තර්ගතය හොඳින් කියවා බලන්න.

[4~5] 하나의 이야기를 듣고 두 개의 질문에 대답하십시오.
එකම කතාවට සවන්දී ප්‍රශ්ණ දෙකටම පිළිතුරු සපයන්න.

4. 남자는 무엇에 대해서 이야기하고 있습니까? පිරිමි පුද්ගලයා කුමක් පිළිබඳ කතාකරමින් සිටීද?

① 성희롱의 종류 ② 성희롱의 처벌
③ 성희롱의 신고 방법 ④ 성희롱의 대처 방법

5. 남자가 증거로 이야기하지 않은 것은 무엇입니까?
පිරිමි පුද්ගලයා සාක්ෂියක් ලෙස නොපැවසූ දෙය කුමක්ද?

① 사진 ② 편지
③ 녹음 ④ 날짜



듣기 대본 ශ්‍රවණ පිටපත

1. ① 여: 증인입니다. සාක්ෂිකරු වේ.
   ② 여: 증거입니다. සාක්ෂි වේ.
   ③ 여: 피해자입니다. පැමිණිලිකරු වේ.
   ④ 여: 가해자입니다. විත්තිකරු වේ.
2. ① 남: 음란물을 보고 있습니다. අසභ්‍ය දේවල් බලමින් සිටි.
   ② 남: 동영상을 보고 있습니다. වීඩියෝ දර්ශන බලමින් සිටි.
   ③ 남: 성적 농담을 하고 있습니다. අසභ්‍ය විහිලු කරමින් සිටි.
   ④ 남: 신체 접촉을 하고 있습니다. ශරීරය ස්පර්ශකරමින් සිටි.
3. ① 여: 강요하고 있습니다. බලහත්කාරකමක් කරමින් සිටි.
   ② 여: 신고하고 있습니다. පැමිණිලි කරමින් සිටි.
   ③ 여: 요구하고 있습니다. බලහත්කාරකමක් කරමින් සිටි.
   ④ 여: 표현하고 있습니다. විස්තර කරමින් සිටි.

4-5. 남: 직장 안에서의 성희롱이 발생했을 때는 정확하게 자신의 생각을 표현해야 합니다. 만일 직접 말하기 어렵다면 편지를 쓰거나 다른 방법으로 자신의 의사를 표현하는 게 좋습니다. 그리고 상대방이 한 말이나 행동을 증명할 수 있는 증거를 모으십시오. 사진을 찍거나 녹음을 하시고, 날짜와 시간, 장소 등을 정확하게 써 놓아야 합니다.
වැඩපොළ තුල ලිංගික අතවරයක් ඇතිවන විට පැහැදිලිවම තමන්ගේ අදහස් ප්‍රකාශ කළ යුතුයි. යම් විටක කෙලින්ම වචනයෙන් පැවසීමට අපහසුනම් ලිපියක් ලිවීම හෝ වෙනත් ක්‍රමයකින් තමන්ගේ අරමුණ පැවසීම වඩාත් සුදුසුයි. තවද වෙනත් අය පවසන වචන හෝ ක්‍රියාවන් ඔප්පුකර පෙන්වීමට හැකි සාක්ෂි එකතු කරන්න. පින්තූර ගැනීම හෝ පටිගත කර දිනය,වේලාව ස්ථානය නිවැරදිව ලිවිය යුතුයි.

정답 1. ④ 2. ④ 3. ② 4. ④ 5. ②

확장 연습 වැඩිදුර අභ්‍යාස


L-40

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදය හොඳින් සවන්දී ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

   다음 중 들은 내용과 같은 것은 무엇입니까?
   පහත සඳහන් පිළිතුරු අතරින් අන්තර්ගතය හා සමාන පිළිතුර තෝරන්න.

   ① 여자는 센터를 방문한 적이 있습니다.
   ② 남자는 한국어를 배우고 싶어 합니다.
   ③ 한국어를 배우려면 이용자 카드가 필요합니다.
   ④ 한국어 수업을 신청하고 나서 상담을 받습니다.

확장 연습 듣기 대본 වැඩිදුර අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 남: 어서 오세요. 저희 센터는 처음이시죠? එන්න ඇතුලට, අපේ සෙන්ටර් එකට එන පළමුවතාව නේද?
   여: 네, 한국어 수업을 신청하고 싶은데 어떻게 해야 돼요?
   ඔව්, මට කොරියානු භාෂා පන්ති සඳහා අයදුම් කිරීමට අවශ්‍යයි කුමක් ද කළ යුත්තේ ?
   남: 먼저 이용자 카드를 만드셔야 해요. 그 후에 상담을 하고 수업을 신청하시면 돼요.
   මුලින්ම පරිශීලක කාඩ්පත සාදාගත යුතුයි ඊට පසු, අවශ්‍ය උපදෙස් ලබා ගෙන පන්ති සඳහා අයදුම් කළානම් හරි.


정답 1. ③



EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සිට 2 දක්වා ඇත්තේ පින්තූරය දෙස බලා ගැලපෙන යෙදුම තෝරන ප්‍රශ්න වේ, ඉහත ඉගෙනගත් වචන යලි මතක් කරගනිමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

[1~2] 다음 그림을 보고 맞는 문장을 고르십시오.
පහත පින්තූර බලා ගැළපෙන වාක්‍යය තෝරන්න.

1.



① 증인입니다.
② 증거입니다.
③ 가해자입니다.
④ 피해자입니다.

2.



① 경찰에 신고하고 있습니다.
② 성적 언동을 하고 있습니다.
③ 자신의 의사를 표현하고 있습니다.
④ 부하 직원에게 불이익을 주고 있습니다.



අංක 3 හා 4 දක්වා ඇත්තේ දෙබසට වඩාත්ම ගැළපෙන වචන තෝරන ප්‍රශ්න වේ. අංක 5න් දැක්වෙන ඡේදය කියවා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

[3~5] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට පිළිතුරු සපයන්න.

3. 빈칸에 알맞은 것은 무엇입니까? හිස්තැනට ගැලපෙන වචනය කුමක්ද?

가: 신체 접촉이나 성적 언동 등의 행동으로 상대방을 불쾌하게 하는 건 큰 잘못이지요?
ශරීරය ස්පර්ශ කිරීම හෝ අසභ්‍ය වචන වැනි ක්‍රියාකාරකම් මගින් අනෙකාව අපහසුතාවයට පත්කිරීම ඉතා ලොකු වරදක් නේද?
나: 그럼요, 그건 ___________에 해당하는 행동이에요.
ඔව්, එය ලිංගික හිංසනයට අදාලවන ක්‍රියාවක්.

① 성범죄　　② 경범죄　　③ 교통 위반　　④ 불법 체류

4. 빈칸에 알맞은 것은 무엇입니까? හිස්තැනට වඩාත්ම ගැළපෙන වචනය කුමක්ද?

가: 수루 씨, 제 옆에 앉으세요. සුරු මහත්මයා, මං ලඟින් වැඩිවෙන්න.
나: 민수 씨, 이런 거 ___________ 직장 내 성희롱에 해당하는 거 알지요?
මින්සු මහතා මෙවැනි බල කිරීම් වැඩපොළ තුල කායික හිංසනයට අදාලවන බව දන්නවා නේද?

① 강요하면　　② 신청하면　　③ 신고하면　　④ 표현하면



5. 다음 질문에 답하십시오. මීලඟ ගැටලුවට පිළිතුරු සපයන්න.

직장 내 성희롱은 직장 상사가 직장 내 지위를 이용하거나 업무와 관련하여 다른 근로자에게 성적 언동 등으로 수치심 또는 불쾌감을 느끼게 하는 것입니다. 그리고 성적 언동 등의 요구를 들어주지 않는다는 이유로 고용상 ㉠__________을/를 주는 것을 말합니다.

වැඩපොළ තුළ කායික හිංසනය යනු අයිතිකරු ,ඉහළ නිලධාරීන් හෝ කම්කරුවන් වැඩපොළ තුල තම පදවිය භාවිතාකර හෝ වැඩ සම්බන්ධයෙන් වෙනත් කම්කරුවන්ට අසභ්‍ය ලෙස කතා කිරීම මගින් අපහාසයට හෝ නින්දාවට පත්කිරීම හෝ වෙනත් ලිංගිකත්වය හා සම්බන්ධ බලපෑම් කිරීම යනාදිය නිසාවෙන් වන අසාධාරණයයි.

㉠에 들어갈 알맞은 말을 고르십시오. ㉠ට ගැළපෙන වචනය තෝරන්න.

① 책임　　② 증거　　③ 불이익　　④ 불쾌감

정답 1. ② 2. ③ 3. ① 4. ① 5. ③

확장 연습 වැඩිදුර අභ්‍යාස

[1~2] 다음 글을 읽고 무엇에 대한 글인지 고르십시오.
පහත ඇති ඡේදය කියවා කුමක් සම්බන්ධව සඳහන් වී ඇත්ද යන්න තෝරන්න.

1. 저는 한국어 수업을 듣기 전에 집에서 혼자 공부합니다. 문법과 단어를 미리 공부하고 수업을 들으면 선생님 말씀을 잘 이해할 수 있습니다.
මම කොරියානු පංතිවලට සහභාගි වීමට පෙර තනිවම ඉගෙන ගත්තේ. ව්‍යාකරණ සහ වාග් මාලාව කලින් පාඩම් කරලා පන්තියට ගිහාම ගුරුතුමිය කියලා දෙන දේවල් හොඳින් තේරුම්ගන්න පුළුවන්.

① 숙제　　② 예약　　③ 복습　　④ 예습

2. 점심시간에 동료와 함께 식당에 갔습니다. 저는 김치찌개를 시키고 동료는 된장찌개를 시켜 먹었습니다.
දිවා ආහාර කාලයේ සගයින් සමග අවන්හලකට ගියා. මම කිම්චිපිගේ ඇණවුම් කළ අතර සගයන් ත්වෙන්ජන්චිගේ ඇණවුම් කර කෑවා.

① 식당 예약　　② 음식 주문　　③ 식당 위치　　④ 음식 소개


정답 1. ④ 2. ②



발음 උච්චාරණය  P-19

හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.

කොරියානු භාෂාවේ ව්‍යඤ්ජන දෙකක් අනුපිළිවෙලින් යෙදීමේදී විවිධ ශබ්ද වෙනස්කම් සිදුවේ. ශබ්දය නැගීමට බාධා කරන ව්‍යංජන සමඟ නාසික්‍ය ශබ්දයක් යෙදෙන විට නාසික්‍ය ශබ්දයක් ලෙස උච්චාරණය කරයි. මෙවිට උච්චාරණ ස්ථානය වෙනස් නොවේ.

(1) 막내, 국민, 국물, 밥맛
(2) 꽃만, 있는, 먹는, 닫는
(3) 작년에 무엇을 했어요?
(4) 운동 후에는 밥맛이 좋아요.




드라이버로 해 보세요
ඉස්කුරුප්පු නියනින් කරලා බලන්න

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

▫ අධ්‍යයන අරමුණු	වැඩට භාවිතා කරන උපකරණ යෝජනා කිරීම, වැඩ විස්තර කිරීම
▫ ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස්	(으)로, -고 있다
▫ වචන භාවිතය සඳහා උපදෙස්	නිෂ්පාදන කර්මාන්තයේ දී භාවිත කරන අත් උපකරණ, නිෂ්පාදන කර්මාන්තයේ දී භාවිත කරන යන්ත්‍ර සූත්‍ර
▫ සංස්කෘතික තොරතුරු	කාර්යයන් සඳහා අවශ්‍ය වන උපකරණ



대화 1 සංවාදය 1





පරූ මහත්මා හා මින්සු මහත්මා කතා කරමින් සිටියි. මුලින්ම සංවාදය දෙවරක් සවන්දී අනුගමනය කරන්න.

바루 망치가 아무리 찾아도 없네. 민수 씨, 망치 못 봤어요?
මිටිය හැම තැනම හෙව්වත් නැහැ නේ. මින්සු මහත්මා මිටිය දැක්කේ නැද්ද?

민수 공구함에 있을 거예요. 찾아보세요.
භාණ්ඩ දමන පෙට්ටියේ ඇති. හොයලා බලන්න.

바루 공구함에 없어서요. 못을 좀 박아야 하는데…….
භාණ්ඩ දමන පෙට්ටියේ නැහැ. ඇණයක් ගලවන්න තියෙනවා......

민수 어디 좀 봐요. 그거 나사못이네요. 나사못이라면 드라이버로 해 보세요. 그게 더 편할 거예요. 자, 여기요.
ඉන්න බලන්න. මේක ඉස්කුරුප්පු ඇණයක් නේ. ඉස්කුරුප්පු ඇණයක් නම් ඉස්කුරුප්පු නියනින් කරලා බලන්න. ඒක තවත් පහසුයි නේ. ආහ් මෙන්න.

바루 어, 고마워요.
ආහ් ස්තුතියි.

민수 다 쓰면 공구함에 잘 넣으세요.
භාවිතා කරලා අවසන් වූ පසු භාණ්ඩ දමන පෙට්ටියට දමන්න.

> **아무리** කොතරම්
> · 아무리 전화해도 전화를 안 받아요.
> කොතරම් ඇමතුම් ගත්තත් ඇමතුම ගන්නේ නැහැ.
> · 아무리 피곤해도 오늘 이 보고서를 다 쓰고 자려고 해요.
> කොතරම් මහන්සි වුවත් අද මේ වාර්තාව සම්පූර්ණයෙන් ම ලියලා ඉවර කරන්න ඕනේ.

> **-아서/어서요**
> හේතුවක් දක්වන සම්බන්ධිකාරක පද වන '-아서/어서' සමඟ '요' එකතු කර වාක්‍යය අවසානයේ දී භාවිත කරයි.
> · 이것 좀 같이 들어 주실래요? 너무 무거워서요.
> මේක ටිකක් ඔසවන්න උදව් වෙනවාද? ගොඩක් බර නිසයි.
> · 가: 왜 아이스크림을 안 먹어요?
> ඇයි අයිස්ක්‍රීම් කන්නේ නැත්තේ?
> 나: 배가 아파서요.
> බඩ රිදෙන නිසයි.



හොඳින් අසා අනුගමනය කළා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 바루 씨는 뭘 찾고 있어요? පරූ මහත්මා මොකක් ද හොයමින් ඉන්නේ?
2. 민수 씨는 바루 씨에게 무엇을 주었어요? මින්සු මහත්මා පරූ මහත්මාට මොකක් ද දුන්නේ?

정답 1. 망치를 찾고 있어요. 2. 드라이버를 주었어요.





어휘 1 වචන මාලාව 1 제조업 수공구 නිෂ්පාදන කර්මාන්තයේ දී භාවිත කරන අත් උපකරණ




නිෂ්පාදන කර්මාන්තයේ දී භාවිතා කරන අත් උපකරණයන් මොනවාදැයි දැන ගනිමුද?



펜치
ඩැහි අඬුව


니퍼
අඬුව


플라이어
ප්ලයියර් එක


드라이버
ඉස්කුරුප්පු නියන


끊다, 구부리다
කපනවා/ නමනවා


절단하다
මුදුනින් කපා දමනවා


구부리다, 펴다
නමනවා/ දිග හරිනවා


박다
ගලවනවා


전기 드릴
විදුලි ඩ්‍රිල් එක


톱
කියත


망치
මිටිය


스패너
ස්පැනරය



뚫다
හාරනවා


자르다
කපනවා


두드리다, 박다
ගලවනවා


조이다, 풀다
තද කරනවා/ බුරුල් කරනවා


못/나사못
ඇණය/ ඉස්කුරුප්පු ඇණය


볼트/너트
බෝල්ට් එක/ මුරිච්චිය



ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න උත්සාහ කරන්න.



1. 사진을 보고 알맞은 말을 연결하세요. පින්තූරය බලා ගැලපෙන වචනය තෝරන්න.

① ② ③ ④ ⑤

㉠ 드라이버 ㉡ 플라이어 ㉢ 톱 ㉣ 스패너 ㉤ 전기 드릴

ⓐ 펴다 ⓑ 조이다 ⓒ 자르다 ⓓ 뚫다 ⓔ 박다

정답 ① ㉢ ⓒ ② ㉣ ⓑ ③ ㉤ ⓓ ④ ㉡ ⓐ ⑤ ㉠ ⓔ



문법 1 සංවාදය 1 (으)로

G41-1

නාමපද සහ සම්බන්ධ වී යම්කිසි ක්‍රියාවක් කිරීමට යම් ක්‍රමයක් උපකරණයක් හෝ අමුද්‍රව්‍යයක් භාවිතා කරනවා යන්න දැක්වීමේදී භාවිතා වේ.

자음 (ව්‍යඤ්ජනය) + **으로**	모음 (ස්වරල), 자음 'ㄹ'(ව්‍යඤ්ජනය – ㄹ) + **로**
톱**으로**	망치**로**, 드릴**로**

· 이 책상은 **나무로** 만들었어요. මේ මේසය දැවයෙන් සෑදුවේ.
· **배로** 보내면 요금이 싸요. නැවෙන් එව්වොත් වියදම අඩුයි.
· 가: 그건 **톱으로** 자르면 안 돼요. ඒක පොරොවෙන් කපන්න බෑ.
  나: 그럼 **뭘로** 잘라요? එහෙනම් මොකෙන්ද කපන්නේ?



비교해 보세요 සංසන්දනය කර බලන්න

✔ උපකරණයක් භාවිතා කිරීමේ ද '(으)로' හා දිශාව දැක්වීමේ දී, ගමනාන්තය දැක්වීමේ දී '(으)로'

ස්ථානයක් දක්වන නාම පද සමග එකතු වී දිශාව හෝ ගමනාන්තය දැක්වීමේ දී භාවිත කරන අතර නාම පද සමග එකතු වී උපකරණයකින්, අමුද්‍රව්‍යකින් යම්කිසි දෙයක් කරන ක්‍රමය දක්වද්දී යොදනු ලැබේ.


· 일이 끝나면 식당**으로** 오세요.
· 숟가락**으로** 밥을 먹어요.



'(으)로' තේරුම් ගත්තා ද? ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරා දෙබස සම්පූර්ණ කරන්න.

2. 그림을 보고 맞는 대답을 고르세요. පහත පින්තූර දෙස බලා ගැළපෙන පිළිතුර තෝරන්න.

1)



가: 철사는 무엇으로 끊으면 될까요? වයර් එක කුමකින් ගැලෙව්වොත් හොඳ වෙයි ද?
나: ____________________


① 펜치로 끊으세요. ② 망치로 끊으세요.

2)



가: 전선은 니퍼로 자르면 돼요? වයර් එක අඬුවෙන් කැපුවට කමක් නැද්ද?
나: ____________________

① 네, 니퍼로 자르세요. ② 네, 톱으로 자르세요.





තව දුරටත් ඉගෙනගෙන බලමු ද? '(으)로' භාවිතා කර දෙබස සම්පූර්ණ කරන්න.

1. 가: 못을 박아야 하는데 뭘로 박으면 돼요? ඇණය ගලවන්න ඕනේ. මොකකින් ගලවනවා නම් හොඳයි ද?
   나: ____________________ 박으세요. මිටියෙන් ගලවන්න.

2. 가: 이 나무를 뭘로 자를까요? මේ ලීය මොකකින් කපමු ද?
   나: ____________________ 자르세요. කියතෙන් කපන්න.

정답 1. 망치로 2. 톱으로



대화 2 සංවාදය 2

Track 128



තුවාන් මහත්මා හා සමාගමේ අයිතිකරු කතා කරමින් සිටියි. කුමන කතාවක් කරමින් ඉන්නවාද කියා මුලින්ම දෙබසට දෙවරක් සවන් දී ඉන්පසුව අනුගමනය කරමින් කියවන්න.

투 안 공장장님, 일찍 오셨네요.
ප්‍රධානීතුමා ඉක්මනට ඇවිල්ලානේ.

   අද ඉගෙන ගන්නා වෙලාවේදී පසුගිය පාඩමට අදාලව වැඩකරන තැන පිළිවෙලට තබාගත යුත්තේ ඇයි කියා විස්තර කරනවා. මුලින්ම පිළිවෙලට තිබෙනවා නම් අනතුරුවලින් වැළකී සිටීමට හැකි අතරි භාණ්ඩ අපතේ යාම වළක්වාලීමට හැකිය. තවද භාණ්ඩ හොඳින් හසුරවන නිසා ප්‍රමිතියත් ඉහල යනවා. මොනවටත් වඩා උපකරණ දීර්ඝ කාලයක් භාවිත කරන්න පුළුවන්.

정답 1. ② 2. ③ 3. ③ 4. ① 5. ①

확장 연습 තවදුරටත් වන අභ්‍යාස

L-44

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු තෝරන්න.

   남자가 사무실에 가는 이유는 무엇입니까? පිරිමි පුද්ගලයා කාර්යාලයට යන හේතුව කුමක්ද?

   ① 마스크를 잊어버려서　　② 작업장에 먼지가 많아서
   ③ 사무실에서 일해야 해서　　④ 귀마개를 안 가지고 와서

확장 연습 듣기 대본 තවදුරටත් වන අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 여: 바트 씨, 귀마개하고 마스크 가지고 왔지요?
   බාත් මහතා, ආරක්ශිත කන් ආවරණය සහ මුහුණු ආවරණය රැගෙන ආවාද?
   남: 오늘 작업은 먼지가 많이 난다고 해서 마스크만 가지고 왔는데요.
   අද වැඩ වල දූවිලි ගොඩක් වදින නිසා මුහුනු ආවරණයක් පමණක් රැගෙන ආවා.
   여: 여기는 소음이 심해서 귀마개를 꼭 착용해야 해요.
   මෙතන අධික ශබ්දය නිසා ආරක්ශිත කන් ආවරණය පැළඳිය යුතුයි.
   남: 몰랐어요. 사무실에 가서 얼른 가지고 올게요.
   දැනන් හිටියේ නැහැ. කාර්යාලයට ගිහින් ඉක්මනට අරන් එන්නම්.

정답 1. ④



EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සිට 2 දක්වා ඇත්තේ පින්තූරය දෙස බලා ගැලපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ. ඉහත ඉගෙනගත් වචන මතක් කරගනිමින් පිළිතුරු සපයන්න.

[1~2] 다음 그림을 보고 맞는 문장을 고르십시오. පහත පින්තූර බලා ගැළපෙන වාක්‍යය තෝරන්න.

1\.



① 손수레입니다. ② 배설물입니다.
③ 일륜차입니다. ④ 비닐 끈입니다.

2\.



① 냄새가 심해요. ② 소음이 심해요.
③ 공기가 쾌적해요. ④ 정리가 되어 있어요.



අංක 3 සිට 5 දක්වා ඇත්තේ හිස්තැනට ගැලපෙන වචනය තෝරන ප්‍රශ්න වේ. ඉගෙනගත් වචන මතක් කරගනිමින් පිළිතුරු සපයන්න.

[3~5] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오.
හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

3\.
가: 오늘은 작업장이 아주 쾌적하네요. අද වැඩපොළ හරිම ප්‍රසන්නයි.
나: 그렇죠? 청소를 ____________. එහෙමනේද? පිරිසිදු කළානේ.

① 하지요 ② 했거든요 ③ 하고 싶어요 ④ 할 거예요

4\.
가: 며칠 전보다 분뇨가 ____________. දින කිහිපයකට පෙරට වඩා සත්ව අපද්‍රව්‍ය වැඩිවෙලා.
나: 그렇죠? 빨리 치워야겠어요. එහෙමද? ඉක්මනට ඉවත්කරන්න ඕනේ.

① 많아졌어요 ② 많으면 안 돼요
③ 많지 않을 거예요 ④ 많았으면 좋겠어요

5\.
공구함을 준비하여 종류와 크기별로 공구를 구별하여 ____________ 해야 합니다.
මෙවලම් පෙට්ටිය සූදානම් කර වර්ගය හා ප්‍රමාණය අනුව අසුරා තැබිය යුතුය.
이렇게 잘 넣어 두면 공구를 안전하고 쉽게 사용할 수 있습니다.
මෙලෙස හොඳින් අසුරා තැබූ විට ආරක්ෂා සහිතව පහසුවෙන් භාවිතා කරන්න පුළුවන්.

① 사용 ② 보관 ③ 준비 ④ 점검

정답 1. ① 2. ② 3. ② 4. ① 5. ②



확장 연습 තවදුරටත් වන අභ්‍යාස

[1~3] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

1. 새 작업 도구로 작업을 하니까 아주 편합니다. 전에 쓰던 것보다 ________ 작고 가벼워서 좋습니다.

   නව වැඩ මෙවලම් වලින් වැඩ කිරීම ඉතා පහසුයි . පෙර භාවිතා කළ දෙයට වඩා ගොඩාක් කුඩා හා සැහැල්ලු නිසා එය හොඳයි.

   ① 혹시　　② 계속
   ③ 가장　　④ 훨씬

2. 작업장의 기계가 낡아서 새 기계로 바꾸었습니다. 새 기계로 ________ 더 쉽고 편한 것 같습니다.

   වැඩ බිමේ යන්ත්‍රය පරණ නිසා නව යන්ත්‍රයකට මාරු කළා. නව යන්ත්‍රය සමඟ වැඩ කිරීම නිසා තවත් ලේසි සහ පහසු වේ.

   ① 작업하니까　　② 작업하든지
   ③ 작업하고자　　④ 작업하려고


3. 페인트 작업을 한 다음에는 바닥을 잘 닦아야 합니다. 그렇게 하지 않으면 사람들이 다니다가 ________.

   පින්තාරු කරන වැඩය කළ පසුව ඊලඟට හොඳින් බිම පිසදැමිය යුතුයි. එසේ නොකරන්නේ නම්, මිනිසුන් යන එන විට ලිස්සා යා පුළුවන්.

   ① 찔리면 됩니다　　② 찔릴 수 있습니다
   ③ 미끄러지면 됩니다　　④ 미끄러질 수 있습니다

정답 1. ④ 2. ① 3. ④



발음 උච්චාරණය  P-22

හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.

කොරියානු භාෂාවේ ව්‍යඤ්ජන දෙකක් පිළිවෙලින් යෙදෙන විට විවිධ ශබ්ද වෙනස්කම් සිදු වේ. නාසික්‍ය ශබ්ද 'ㄴ' සහ පුනර්වර්තී 'ㄹ' අක්ෂරය පිළිවෙලින් යෙදෙන අවස්ථාවේදී 'ㄴ + ㄹ', 'ㄹ + ㄴ' මේ දෙආකාරයෙන් කුමක් වුවත් වෙනසක් නොමැතිව [ㄹㄹ] ලෙස උච්චාරණය කෙරේ.

(1) 설날, 오늘날, 일 년　　(2) 신라, 한라산, 천 리
(3) 컴퓨터는 아주 편리해요.　　(4) 설날에는 떡국을 먹어요.




호미를 챙겼는데요
අත්මුල්ලුවනෙ රැගෙන ආවේ

학습 안내 අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

- අධ්‍යයන අරමුණු — වැඩ වෙනස්කිරීමට ඉල්ලීම, වැඩ ඉල්ලීම
- ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස් — -는데요, -기 전에
- වචන භාවිතය සඳහා උපදෙස් — කෘෂිකර්මය 1 කෘෂිකර්මය 2
- සංස්කෘතික තොරතුරු — කොරියාවේ ගොවිපොලවල්වල සෘතු හතර



대화 1 සංවාදය 1



Track 139



ලිලි මහත්මිය ගොවිපොළ අයිති නැන්දා සමග කතාකරමින් සිටි. මුලින්ම දෙබස දෙවරක් සවන්දී ඉන්පසුව අනුගමනය කරමින් කියවන්න.

주인 아주머니 리리 씨, 괭이 챙겼어요?
ලිලි මහත්මිය, උදැල්ල රැගෙන ආව ද?

리 리 괭이요? 오늘 고구마 캐는 일을 하신다고 해서 호미를 챙겼는데요.
උදැල්ලද? අද බතල ගලවනවා කියල කියපු නිසා අත්මුල්ලුවයි රැගෙන ආවේ.

주인 아주머니 오늘 일할 밭은 너무 딱딱해서 호미로 하기 힘들어요. 그리고 괭이로 고구마를 캘 때는 호미로 할 때보다 고구마에 상처가 나기 쉬우니까 조심해야 돼요.
අද වැඩ කරන පාත්තිය ගොඩක් තද නිසා අත් මුල්ලුවෙන් වැඩකරන්න අපසසුයි.
ඒ වගේම උදැල්ලෙන් බතල ගලවනවිට අත් මුල්ලුවෙන් ගලවනවට වඩා බතල වලට තුවාල වෙන්න පුළුවන් නිසා ප්‍රවේසම් විය යුතුයි.

리 리 그렇군요. 그럼 창고에 가서 얼른 가지고 올게요.
එහෙමද එහෙනම් ගබඩාවට ඉක්මනට ගිහිල්ල අරගෙන එන්නම්.

챙기다 සූදානම් කරනවා
- 시험을 보러 갈 때에는 신분증을 챙겨야 해요.
  විභාගයට යනවනම් හැඳුනුම්පත් සූදානම් කරගත යුතුය.
- 부모님이 집에 안 계시면 제가 동생들을 챙깁니다.
  දෙමාපියන් ගෙදර නැතිවිට මම මල්ලිව බලාගන්නවා.

얼른 ඉක්මනට
- 라면은 식기 전에 얼른 먹어야 맛있어요.
  රාමියොන් සීතල වීමට පෙර ආහාරයට ගන්නවානම් රසවත්.
- 시험을 볼 때에는 한국어가 얼른 생각이 나지 않아요.
  විභාගය ලියනවිට ඉක්මනට කොරියන් භාෂාව මතක් වෙන්නේ නැහැ.



හොඳින් අසා නැවත කියෙව්වා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 리리 씨는 오늘 무슨 일을 할 거예요? ලිලි මහත්මිය අද මොනවද කරන්නේ?
2. 리리 씨는 왜 창고에 가려고 해요? ලිලි මහත්මිය ඇයි ගබඩාවට යන්න හදන්නේ?

정답 1. 고구마 캐는 일을 할 거예요. 2. 괭이를 가지러 창고에 가려고 해요.



어휘 1 වචන මාලාව 1 농업 1 කෘෂිකර්මය 1

කෘෂිකර්මයට සම්බන්ධ කුමන යෙදුම් තිබේදැයි සොයා බලමු ද?

논	밭	농장	과수원	비닐하우스
කුඹුර	පාත්තිය	ගොවිපොළ	පළතුරු වත්ත	හරිතාගාර

낫	호미	괭이	곡괭이	삽
දෑකැත්ත	අත් මුල්ලුව	උදැල්ල	ගල්කටුව	සවල

모종삽	갈퀴	쇠스랑	호스	물뿌리개
අත් සවල	රේක්කය	මුල්ලුව	බටය	පැළ වලට වතුරදමන බාල්දිය

파종 상자	농약 분무기	경운기	콤바인
බීජ තැටිය	කෘෂි රසායනික ද්‍රව්‍ය ඉසිනය	අත් ට්‍රැක්ටරය	පැල සිටවන යන්ත්‍රය



ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ගැටලුව විසඳීමට උත්සහ කරන්න.




1. 사진을 보고 알맞은 말을 연결하세요. පින්තූර දෙස බලා වචන යාකරන්න.

① ② ③ ④ ⑤

㉠ 모종삽 ㉡ 쇠스랑 ㉢ 경운기 ㉣ 갈퀴 ㉤ 낫

정답 ① ㉤ ② ㉠ ③ ㉣ ④ ㉡ ⑤ ㉢

문법 1 සංවාදය 1 -는데요



ක්‍රියාපදය සමග සම්බන්ධ කොට පසුබිම හෝ අවස්ථාව පැහැදිලි කිරීමේදී යොදාගනී. ක්‍රියාප්‍රකෘතියේ හල් කිරීමක් තිබුණත් නොතිබුනත් '-는데요' හා සම්බන්ධ කර ලියනු ලැබේ.

동사 ක්‍රියාපදය	형용사 විශේෂණ පදය		명사 නාම පදය
-는데요	자음 (ව්‍යඤ්ජනය) → **-은데요**	모음 (ස්වරය) → **-ㄴ데요**	**인데요**
먹다 → 먹**는데요** 오다 → 오**는데요**	많다 → 많**은데요**	크다 → 큰**데요**	사람 → 사람**인데요** 친구 → 친구**인데요**

· 농약을 쳐야 **하는데요**. 농약 분무기가 어디에 있는지 모르겠어요.
කෘමිනාශක යෙදිය යුතුයි. කෘමිනාශක ඉසින යන්ත්‍රය කොහෙද තියෙන්නෙ කියලා දන්නෙ නෑ.

· 가: 사과 상자들을 트럭에 다 **실었는데요**. 좀 봐 주세요.
ඇපල් පෙට්ටි ට්‍රක් එකට පැටෙව්වා. පොඩ්ඩක් බලන්න.

나: 그래요. 잠깐만 기다리세요. හොඳයි ටිකක් ඉන්න.



비교해 보세요 සංසන්දනය කර බලන්න

✔ **'-는데요/(으)ㄴ데요/인데요'** සහ **'-는데/(으)ㄴ데'**

'-는데' වල '요' සහිත '-는데요' හා '-는데' අතර වෙනසක් නැත. '요' අඩංගු කළවිට ගෞරව කිරීමක් සිදුවන් අතර පසුව එන වාක්‍ය හා වෙන්වන අතර එසේ නොවන විට එක වාක්‍යයක් ලෙස සම්බන්ධ වේ.

· 밖에 비가 많이 **오는데요**. 창문을 닫을까요? එළියේ වැස්ස ගොඩක් වැටෙනවනේ. ජනේලය වහමුද?
· 모니카 씨, 날씨도 **좋은데** 우리 오늘 놀러 갈까요?
මොනිකා මහත්මිය අද කාලගුණයත් හොඳයි විනෝද වෙන්න යමුද?
· 이 음식이 **불고기인데요**. 정말 맛있어요. මේ කෑම බුල්ගොගි වේ. ඇත්තටම රසයි.



'-는데요' අවබෝධ වුනාද? එසේනම් හිස්තැනට ගැලපෙන වචන තෝරා දෙබස සම්පූර්ණ කරන්න.

2. '-는데요'를 사용해서 대화를 완성하세요. '-는데요' භාවිතා කර දෙබස් සම්පූර්ණ කරන්න.

1) 가: ____________ 괭이 어디 있어요? [고구마를 캐야 하다 බතල ගලවන්න ඕනේ]
나: 아까 제가 쓰고 창고에 뒀어요. ටිකකට කලින් භාවිතා කර ගබඩාවෙන් තැබුවා.

2) 가: ____________ 호스가 없네요. [물을 줘야 하다 වතුර දමන්න ඕනේ]
나: 제가 찾아 줄게요. මම සොයල දෙන්නම්.

3) 가: ____________ 같이 할 수 있어요?
[파종상자를 옮겨야 하다 බීජ තැටි වෙනත් තැනකින් තැබිය යුතුය]
나: 그럼요. 같이 해요. ඔව්. එකට කරමු.

정답 1) 고구마를 캐야 하는데요 2) 물을 줘야 하는데요 3) 파종상자를 옮겨야 하는데요



대화 2 සංවාදය 2

Track 140



ලිල මහත්මිය ගොවිපොළ අයිති නැන්දා සමග කතාකරමින් සිටී. මුලින්ම දෙබස දෙවරක් අසා නැවත කියන්න.

주인 아주머니 오늘 고생 많았어요. 내일은 밭에 비료를 뿌릴 거니까 준비 좀 해 줘요.
අද ගොඩක් මහන්සි වුනා. හෙට පාත්තිවලට පොහොර දමන්න සුදානම් කර තබන්න.

리 리 비료요? 모종은 다음 주에 심을 건데 벌써 비료를 뿌려요?
පොහොර ද? බීජ පැළ ලබන සතියේ සිටවනවා. ඒත් පොහොර දමනවා ද?

주인 아주머니 모종을 심기 전에 뿌려야 돼요. 비료를 먼저 뿌리고 일주일쯤 지난 후에 심어야 모종이 잘 자라거든요.
බීජ පැළ සිටවීමට පෙර පොහොර දැමිය යුතුය. මුලින් පොහොර දමා සතියක් පමණ ගිය පසු සිටවූ විට පැළ හොඳින් හැදෙනවා.

리 리 아, 그렇군요. 제가 들어가서 내일 쓸 비료 잘 챙겨 놓을게요.
ආ, එහෙමනේ. මම හෙට දමන පොහොර සුදානම් කර තබන්නම්.

벌써 මෙච්චර ඉක්මනට
- 벌써 금요일이에요.
  මෙච්චර ඉක්මනට සිකුරාදා වෙලානේ?
- 회의 준비를 벌써 다 했어요?
  සමිතියට සියල්ල සුදානම් කර අවසන්ද?

쯤 ටිකක් පමණ
- 일주일쯤 후에 다시 연락을 주세요.
  සතියකට පමණ පසු නැවත කතා කරන්නම්.
- 내일 2시쯤 만날까요?
  හෙට දෙකට විතර හමුවෙමුද?



හොඳින් අසා නැවත කියෙව්වා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 언제 비료를 뿌리려고 해요? කවදද පොහොර ඉසින්නේ?
2. 모종은 언제 심으려고 해요? කවදද පැළ සිටුවන්නේ?

정답 1. 내일 뿌리려고 해요. 2. 다음 주에 심으려고 해요.

Tip 곡류 ධාන්‍ය වර්ග


벼 වී


보리 බාර්ලි


밀 තිරිඟු



콩 සෝයා බෝංචි



어휘 2 වචන මාලාව 2 　농업 2 කෘෂිකර්මය 2



කෘෂිකර්මය හා සම්බන්ධ කුමන යෙදුම් තිබේද? එක්ව සොයා බලමුද?



키우다/기르다/재배하다
පැලකරනවා/වවනවා/වගාකරනවා



거두다/수확하다
ගොයම් කපනවා/අස්වනු නෙලනවා




따다
ගසෙන් කඩනවා



캐다
හාරනවා



비료를 뿌리다
පොහොර ඉසිනවා



씨앗을 뿌리다
බීජ ඉසිනවා



모종을 심다
පැළ සිටවනවා




물을 주다
වතුර දානවා



거름을 주다
පොහොර යොදනවා



잡초를 뽑다
වල් පැළෑටි ගලවනවා




벌레를 잡다
කෘමීන් අල්ලනවා



농약을 치다
කෘෂි රසායනික ද්‍රව්‍ය යොදනවා


ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ගැටලුව විසඳීමට උත්සාහ කරන්න.

1. 그림에 맞는 표현을 〈보기〉에서 골라 넣으세요.
පින්තූරයට ගැලපෙන ප්‍රකාශය උදාහරණ කොටසින් තෝරා ලියන්න.



보기: 씨앗을 뿌리다　거름을 주다　캐다　물을 주다　잡초를 뽑다

정답 1) 씨앗을 뿌리다 2) 물을 주다 3) 거름을 주다 4) 잡초를 뽑다 5) 캐다



문법 2 සංවාදය 2 -기 전에

G45-2

'-기 전에' යන්න ක්‍රියා පදයක් සමඟ සම්බන්ධ වී ඉදිරියේ තිබෙන ක්‍රියාවට වඩා පිටුපස ක්‍රියාව මුලින් සිදුවීම අදහස් කිරීමේදී භාවිතා වේ. ක්‍රියා පදයේ ක්‍රියාප්‍රකෘතියේ අග හල් කිරීමක් තිබුණත් නොතිබුනත් එකම ලෙස '-기 전에' හා සම්බන්ධ කර ලියනු ලැබේ.

· 비닐을 **덮기 전에** 거름을 먼저 주세요. ප්ලාස්ටික් උරවලින් ආවරණය කිරීමට පෙර පෝර මුලින් දෙන්න.
· 가: 한국에 **오기 전에** 인도네시아에서 무슨 일을 했어요?
  කොරියාවට එන්න කලින් ශ්‍රී ලංකාවේදී මොනවද කළේ?
  나: 무역 회사에 다녔어요. වෙළෙඳ සමාගමක වැඩ කලා.



비교해 보세요 සංසන්දනය කර බලන්න

✔ '-기 전에' හා '-(으)ㄴ 후에'


'-기 전에' පසුව පවසන දෙය ඉදිරියේ පවසන දෙයට කලින් සිදුවන විට භාවිතා කරයි '-(으)ㄴ 후에' මුලින් පවසන දෙය පසුව පවසන දෙයට කලින් සිදුවන විට භාවිතා කරයි.

· 모종을 **심기 전에** 비료를 뿌려요. පැළ සිටුවීමට පෙර පොහොර ඉසිනවා.
· 비료를 **뿌린 후에** 모종을 심어요. පොහොර ඉසීමෙන් පසුව පැළ සිටුවනවා.




'-기 전에' අවබෝධ වුනාද? එසේනම් හිස්තැනට ගැළපෙන යෙදුම ලියා දෙබස සම්පූර්ණ කරන්න.

2. 그림을 보고 '-기 전에'를 사용해서 대화를 완성하세요.
පින්තූරය දෙස බලා '-기 전에' භාවිතා කර දෙබස සම්පූර්ණ කරන්න.

1) 

가: 토마토를 딸까요? තක්කාලි කඩමුද?
나: 아니요, ______________________.

2) 

가: 물을 줄까요? වතුර දාමුද?
나: 아니요, ______________________.

정답 1) 토마토를 따기 전에 농약을 치세요 2) 물을 주기 전에 잡초를 뽑으세요

유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

익숙해졌어요. පුරුදු වුනා.

가: 한국에서 생활하는 게 힘들지요? කොරියාවේ ජීවත්වෙන එක අමාරුයි නේද?
나: 처음에는 힘들었는데 이제 **익숙해졌어요.** මුලින්ම අමාරු වුනත් පසුව **පුරුදු වුණා.**



활동 ක්‍රියාකාරකම්

작업을 요구할 때는 어떻게 이야기해야 할까요? 〈보기〉처럼 말해 보세요.

වැඩ ඉල්ලනවිට කෙසේ කලයුතුද? උදාහරණයේ දැක්වෙන ආකාරයට කතාකරන්න.

보기

잡초를 뽑아야 하는데요.
지금 할 수 있어요?
වල් පැලෑටි ගලවන්න ඕනෙ!
දැන් කරන්න පුලුවන්ද?

1) 벌레를 잡다

2) 물을 주다

3) 거름을 주다

4) 씨앗을 뿌리다

정답 1) 벌레를 잡아야 하는데요. 지금 할 수 있어요? 2) 물을 줘야 하는데요. 지금 할 수 있어요? 3) 거름을 줘야 하는데요. 지금 할 수 있어요? 4) 씨앗을 뿌려야 하는데요. 지금 할 수 있어요?



정보 තොරතුරු

한국 농촌의 사계절

කොරියාවේ ගොවිපොළවල් වල සෘතු හතර



봄 වසන්ත කාලය

농사를 지을 준비를 합니다. 비료를 뿌리고 밭을 갈아 씨를 뿌리거나 모종을 심을 준비를 합니다. 토마토, 가지, 오이, 호박, 고추 등을 심습니다.

ගොවිතැන් කරන්න සූදානම් වෙනවා. පොහොර ඉස පාත්ති සකසා බීජ වැපිරීම හෝ පැළ සිටුවීම සිදුකරයි. තක්කාලි, වම්බටු, රාබු, වට්ටක්කා මිරිස් වැනි එළවලු සිටවයි.

여름 ගිම්හාන කාලය

봄에 심은 채소 등을 수확합니다. 논에 농약을 뿌리고 잡초를 뽑는 작업을 계속 해야 합니다. 밭에 당근, 양파, 파 등을 심고 키웁니다. 또한 겨울철 김장에 필요한 배추도 심습니다.

ගිම්හාන කාලයට අස්වනු නෙලනවා. කුඹුරුවලට බෙහෙත් ඉසීම හා වල් පැළෑටි ගැලවීම දිගටම සිදුකල යුතුය. පාත්තිවල කැරට්, ළූණු,ලීක්ස් වැනි එළවළු වගා කරනවා. තවද කිම්චි සෑදීමට අවශ්‍ය ගෝවාත් සිටවනවා.

가을 සරත් කාලය



가을은 수확의 계절입니다. 여름철에 잘 키운 채소와 벼를 거둡니다.

සරත් කාලයට අස්වනු නෙලනවා. ගිම්හාන කාලයට සිටවූ එළවළුහා ගොයම් කපනවා.



겨울 සීත කාලය

1년 동안 사용한 농기구를 수리하고 다음 해 농사를 계획합니다. 겨울에도 비닐하우스에서 여러 가지 채소와 과일을 재배합니다.

වසරක් පුරාවට භාවිතා කළ ගොවි උපකරණ පිළිසකර කර අලුත් වසරට සැලසුම් කරනවා. සීත කාලයට හරිතාගාර තුළ එළවළු හා පළතුරු වගා කරනවා.





අංක 1 හා 2 පින්තූර දෙස බලා ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ. සවන්දීමට පෙර පින්තූර හොඳින් බලන්න.

[1~2] 다음 그림을 보고 알맞은 대답을 고르십시오.
පහත පින්තූර දෙස බලා ගැලපෙන පිළිතුර තෝරන්න.

Track 141

1. 이것은 무엇입니까? මේක මොකක්ද?

① ② ③ ④

2. 이 사람은 무엇을 합니까? මෙම පුද්ගලයා මෙනවාද කරන්නේ?

① ② ③ ④

අංක 3 දෙබසට සවන්දී ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්නයකි. අංක 4 හා 5 එකම දෙබසට සවන්දී ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ.

3. 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오.
කතාවට සවන්දී ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

여자는 이제 무엇을 할 것입니까? දැන් කාන්තාව කුමක් කිරීමටද සැරසෙන්නේ?

① 밭에 물을 줄 것입니다. ② 잡초를 뽑을 것입니다.
③ 호스를 가지고 올 것입니다. ④ 아주머니를 기다릴 것입니다.

[4~5] 하나의 이야기를 듣고 두 개의 질문에 대답하십시오.
එකම කතාවට සවන්දී ප්‍රශ්ණ දෙකටම පිළිතුරු සපයන්න.

4. 내일 남자가 작업해야 하는 장소는 어디입니까?
හෙට පිරිමි පුද්ගලයා වැඩ කලයුතු ස්ථානය කුමක්ද?

① 논 ② 밭 ③ 논과 밭 ④ 과수원

5. 내일 해야 할 작업이 아닌 것은 무엇입니까? හෙට නොකළයුතු වැඩය කුමක්ද?

① ② ③ ④



듣기 대본 ශ්‍රවණ පිටපත

1. ① 여: 경운기입니다. අත් ට්‍රැක්ටරයයි.
   ② 여: 손수레입니다. අත් කරත්තයයි.
   ③ 여: 콤바인입니다. පැළ සිටවන යන්ත්‍රයයි.
   ④ 여: 트랙터입니다. ට්‍රැක්ටරයයි.
2. ① 남: 거름을 주고 있습니다. පොහොර යොදමින් සිටි.
   ② 남: 농약을 치고 있습니다. කෘෂි රසායනික ද්‍රව්‍යය ඉසිමින් සිටි.
   ③ 남: 모종을 심고 있습니다. පැළ සිටුවමින් සිටි.
   ④ 남: 벌레를 잡고 있습니다. කෘමින් අල්ලමින් සිටි.
3. 여: 밭에 물을 좀 줘야 하는데요. 창고에 호스가 없네요.
   පාත්තියට වතුර පළතුරු දමන්න ඕනේ. ගබඩාවේ බටය නැහැනේ.
   남: 아, 조금 전에 아주머니가 과수원에 물을 주려고 가지고 갔어요.
   ටිකකට? කලින් නැන්දා වත්තට වතුර දාන්න කියල අරගෙන ගියා.
   여: 그래요? 그럼, 물 주기 전에 밭에 잡초 좀 뽑을게요.
   එහෙමද එහෙනම් වතුර දාන්න කලින් වල්පැලැටි ගලවන්නම්.

4-5. 남: 내일은 무슨 일을 해야 해요? හෙට මොනවද කරන්නේ.
   여: 논에 농약을 좀 쳐 주세요. කුඹුරට කෘෂි රසායන ද්‍රව්‍ය ටිකක් දමන්න.
   남: 네, 그럴게요. 그건 오전에 끝낼 수 있을 거 같은데, 오후에는 고구마 밭에 가서 거름을 좀 줄까요?
   ඔව්, එහෙම කරන්නම්. ඒක උදේට ඉවරකරන්න පුළුවන් වගේ නිසා, හවසට බතල පාත්තියට පොහොර ටිකක් දමන්නද?
   여: 며칠 전에 줬으니까 거름은 안 줘도 되고요, 대신 물을 좀 주세요. 그리고 요새 벌레가 많아진 거 같은데 벌레도 좀 잡아 주고요.
   ටික දවසකට කලින් පොහොර දුන්න නිසා නොදැම්මාට කමක් නැහැ. ඒ වෙනුවට වතුර ටිකක් දමන්න. ඒ වගේම මේ දවස්වල කෘමින් වැඩිවෙලා වගේ නිසා කෘමීන්ව අල්ලන්න.

정답 1. ③ 2. ③ 3. ② 4. ③ 5. ②

확장 연습 තවදුරටත් වන අභ්‍යාස L-45

1. 다음을 듣고 이어지는 말로 알맞은 것을 고르십시오.
   පහත සඳහන් දේවලට සවන් දී මීළඟට සිදුවිය හැකි නිවැරදි දේ තෝරා ගන්න.

   ① 고구마를 많이 심었어요. ② 어제 줬으니까 괜찮아요.
   ③ 고구마를 심도록 하세요. ④ 어제 거름을 많이 샀어요.

확장 연습 듣기 대본 තවදුරටත් වන අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 남: 고구마 밭에 거름을 좀 줄까요? බතල පාත්තියට පොහොර ටිකක් දාන්නද?

정답 1. ②



EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සිට අංක 2 දක්වා ඇත්තේ පින්තූර බලා තේරුම කුමක්දැයි නිගමනය කරන ප්‍රශ්න වේ. පෙර ඉගෙනගත් වචන සිහි කරමින් ගැටළුව විසඳා බලන්න.

[1~2] 다음 그림을 보고 맞는 단어나 문장을 고르십시오.
පහත පින්තූර බලා ගැළපෙන වචනය හෝ වාක්‍යය තෝරන්න.

1.

① 낫 ② 삽
③ 괭이 ④ 호미

2.



① 땅을 파고 있습니다. ② 물을 주고 있습니다.
③ 고구마를 캐고 있습니다. ④ 물건을 운반하고 있습니다.



අංක 3 සිට අංක 4 දක්වා ඇත්තේ දෙබසේ හිස්තැනට නිවැරදි වචනය තෝරන ප්‍රශ්න වේ. අංක 5 ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු තෝරන ප්‍රශ්න වේ. ඉගෙනගත් වචන සහ ව්‍යාකරණ සිහි කරමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

[3~4] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오.
හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

3.
가: 이 파종상자를 어디에 둘까요? මේ බීජ තැටිය කොහෙන්ද තියන්නේ?
나: 밭으로 가져갈 거니까 ____________에 실어 놓으세요.
පාත්තියට රැගෙන යන නිසා අත් ට්‍රැක්ටරයෙන් දාල තියන්න.

① 호스 ② 갈고리 ③ 경운기 ④ 물뿌리개

4.
가: 모종을 심기 전에 밭에 비료를 ____________ 돼요.
පැළ හිටවන්න කලින් පාත්තියට පොහොර (ඉසිය) යුතු වෙනවා.
나: 네, 알겠습니다. ඔව්, තේරෙනවා.

① 캐야 ② 따야 ③ 심어야 ④ 뿌려야



5. 다음 질문에 답하십시오. මීළඟට ගැටලුවට පිළිතුරු සපයන්න.

토마토는 보통 4월 말에 밭에 모종을 심습니다. 모종을 심기 전에 밭에 비료를 뿌리고 일주일 정도 기다린 후 모종을 심어야 합니다. 모종을 심고 난 후에는 물을 주고 거름도 줍니다. 토마토는 벌레가 많이 생기는 작물이라서 가끔 농약을 쳐야 합니다. 또 잡초가 생기면 잡초를 뽑아서 토마토가 잘 자랄 수 있게 해야 합니다.

තක්කාලි පාත්ති වල සාමාන්‍යයෙන් අප්‍රේල් මාසයේදී පැළ සිටුවනු ලබයි. පැළ සිටුවන්න කලින් පාත්තියට පොහොර ඉසලා සතියක් පමණ ගත වූවාට පසු පැළ සිටුවිය යුතුයි. පැළ සිටෙව්වාට පසු වතුර යොදා පොහොර පස් යොදනු ලැබේ. තක්කාලි යනු කෘමීන් ගොඩාක් ඇතිවන වගාවක් නිසා වරින් වර කෘෂි රසායන ඉසිය යුතුයි. තවද වල් පැළ ඇතිවෙනවා නම් වල් පැළ ගලවලා තක්කාලි හොඳින් වැවීම කළ යුතුයි.

토마토를 심을 때 가장 먼저 해야 하는 일은 무엇입니까?
තක්කාලි සිටුවන විට වඩාත් කලින් කළ යුතු වැඩය කුමක්ද?

① 거름을 줍니다. ② 모종을 심습니다.
③ 비료를 뿌립니다. ④ 잡초를 뽑습니다.

정답 1. ① 2. ① 3. ③ 4. ④ 5. ③

확장 연습 තවදුරටත් වන අභ්‍යාස

[1~3] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

1. 고향에 계신 어머니께 드리려고 옷을 샀습니다. 내일은 우체국에 가서 어머니께 ________ 를 보내려고 합니다.

ගමේ ඉන්න අම්මාට දීමට ඇඳුම් මිළදී ගත්තා. හෙට මම තැපැල් කාර්යාලයට ගොස් අම්මාට පාර්සලයක් ලෙස යවන්නයි ඉන්නේ.

① 우표 ② 편지 ③ 소포 ④ 엽서

2. 저는 버스로 회사에 다니는데 ________ 시간에는 차가 많이 막힙니다. 그래서 내일부터는 지하철로 다니려고 합니다.

මම බස්රථයෙන් ආයතනයට යන එන නිසා ගමන් කරන කාලයේ වාහන ගොඩක් අවහිර වෙනවා. ඒ නිසා හෙට සිට උමං දුම්රිය මාර්ගයෙන් ගමන් කරනවා.

① 방문 ② 교육 ③ 출퇴근 ④ 환송회

3. 저는 회사 ________에서 살고 있습니다. 많은 사람들이 함께 생활하기 때문에 규칙을 잘 지켜야 합니다.

මම ආයතන නේවාසිකාගාරයේ ජීවත් වනවා. බොහෝ අය සමඟ ජීවත්වන නිසා නීති රීති පිළිපැදිය යුතුය.

① 기숙사 ② 자료실 ③ 상담센터 ④ 고용센터

정답 1. ③ 2. ③ 3. ①



더 신경 쓰도록 하자


තව හොඳට අවධානය යොමු කරමු

학습 안내 අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

- ▫ අධ්‍යයන අරමුණු — ප්‍රශ්නයට හේතුව සෙවීම විසඳන ආකාරය පැවසීම
- ▫ ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස් — -도록 하다, -게 되다
- ▫ වචන භාවිතය සඳහා උපදෙස් — පශු සම්පත් කර්මාන්තය ධීවර කර්මාන්තය
- ▫ සංස්කෘතික තොරතුරු — පශු සම්පත් කර්මාන්තය හා ධීවර කර්මාන්තයෙදී කරන වැඩ



대화 1 සංවාදය 1





පහත දැක්වෙන්නේ සුපිකා මහත්මිය හා ගොවිපොළ අයිති වයසක මාමා අතර ඇතිවූ දෙබසකි. මුලින්ම සවන්දී ඉන්පසුව අනුගමනය කරමින් කියවන්න.

주인 아저씨 이걸 어쩌지. 수피카, 지난번에 바꾼 사료 말이야. 소한테 잘 안 맞는 것 같아.
මේකට මොකද කරන්නේ. සුපිකා, ගියවර මාරුකළ සත්ව කෑමනේ. ගවයින්ට ගැළපෙන්නේ නැහැ වගේ.

수피카 그래요? 농협중앙회에서 좋은 거 나왔다고 해서 바꾸신 거잖아요.
එහෙමද? ජාතික කෘෂිකර්ම සමුපකාර සමිතිය මගින් හොඳ සත්ව ආහාර වර්ගයක් ලැබුණා කියල කියපු නිසා මාරු කලේ.

주인 아저씨 추천하길래 믿고 한번 써 봤는데……. 오늘은 배까지 이렇게 불룩해지고 가스도 많이 찬 것 같아.
අනුමත කරපු නිසා එක්වරක් අරගෙන බැලුවත්……. අද මේ වගේ බඩත් පුරවල දාලා ගෑසුත් ගොඩාක් තියනවා වගේ.

수피카 그럼, 어떻게 하죠? එහෙනම් මොකද කරන්නේ?

주인 아저씨 우선 아무 것도 먹이지 말고 수의사부터 불러야겠어. 그리고 앞으로는 더 신경 쓰도록 하자. 소들이 고생을 많이 한 것 같아, 휴.
මුලින්ම කිසිම දෙයක් කන්න දෙන්නේ නැතුව තියලා පශු වෛද්‍යවරයාව කැඳවන්න ඕනේ. ඉදිරියේදී මීට වඩා අවදානයෙන් අවධානය යොමු කළාටු. ගවයින්ට ගොඩක් අමාරුයි වගේ.

> **맞다** ගැළපෙනවා
> **N이/가 N에/에게(한테) 맞다** යම්කිසි දෙයකට ගැළපෙනවා
> · 새로 산 신발이 발에 안 맞아서 다른 신발로 바꿨어요.
> අලුතින් ගත් පාවහන් කකුලට ගැලපෙන්නේ නැති නිසා වෙනත් පාවහන් වලට මාරු කලා.

> **신경(을) 쓰다** අවදානය යොමු කරනවා
> · 가: 이반 씨, 감기는 좀 어때요?
> ඉවාන්, මහතා හෙම්බිරිස්සාව අඩුද?
> 나: 많이 나았어요. 신경 써 줘서 고마워요.
> ගොඩක් අඩුයි. අවධානය යොමු කළාට ස්තුතියි.



හොඳින් අසා නැවත කියෙව්වා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 아저씨는 사료를 왜 바꿨어요? මාමා ඇයි සත්ව කෑම මාරු කළේ?
2. 왜 수의사를 부르려고 해요? පශු වෛද්‍යවරයාව කැඳවන්නේ?

정답 1. 농협중앙회에서 추천해서 바꿨어요. 2. 소에게 문제가 생겨서 수의사를 부르려고 해요.



어휘 1 වචන මාලාව 1 **축산업** පශු සම්පත් කර්මාන්තය



පහත දැක්වෙන්නේ පශු සම්පත් කර්මාන්තයට සම්බන්ධ විවිධ යෙදුම් වේ. කුමන යෙදුම් තිබේදැයි බලමු.





ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ගැටලුව විසඳීමට උත්සාහ කරන්න.

1. 그림에 맞는 표현을 〈보기〉에서 골라 넣으세요.
පින්තූරයට ගැලපෙන ප්‍රකාශය උදාහරණ කොටසින් තෝරා ලියන්න.



정답 1) 닭 2) 소 3) 축사 4) 돼지 5) 건초

-도록 하다



ක්‍රියා පදයකට සම්බන්ධ කර වෙනත් පුද්ගලයෙකුට යම් ක්‍රියාවක් කිරීමට සැලැස්වීම හෝ වැඩ කිරීමට නියම කරන අවස්ථා වලදී බෝහෝ විට භාවිතා වේ. එම විධානයට ප්‍රතිචාර දැක්වීම සඳහාත් මෙම ව්‍යාකරණය යොදා ගත හැකිය.

· 가: 먼저 먼지부터 **닦도록 하세요**. මුලින් දූවිලි වල ඉඳලා පිස දමන්න.
  나: 그럼 창문을 좀 열게요. එහෙනම් ජනේලය ටිකක් අරින්නම්.
· 가: 중요한 시험이니까 열심히 **준비하도록 하세요**. වැදගත් විභාගයක් නිසා මහන්සි වෙලා සූදානම් වෙන්න.
  나: 네, 최선을 **다하도록 할게요**. හොඳයි. මට හැකි උපරිමයෙන් කරන්නම්.



'-도록 하다' අවබෝධ වුනාද එහෙමනම් මෙම යෙදුම යොදා දෙබස සම්පූර්ණ කරන්න.

2. **'-도록 하다'를 사용해서 대화를 완성하세요.** '-도록 하다' යොදා දෙබස සම්පූර්ණ කරන්න.

1) 가: 사장님, 오늘 아침에는 어떤 일을 하면 돼요? ප්‍රධානී තුමා අද උදේ මොනවද කරන්න තියෙන්නේ?
   나: ______________________. [축사를 청소하다 සත්ව ගොවිපොළ පිරිසිදු කරනවා]

2) 가: 건초는 잘 챙겨 두었지요? පිදුරු අරන් තිබ්බාද?
   나: ______________________. [바로 확인하다 දැන්මම පරික්ෂා කරනවා]

3) 가: 축사에 가서 ______________________. [소 먹이를 주다 ගවයින්ට කෑම දෙනවා]
   나: 네, 창고에 가서 사료 가져올게요. ඔව්, ගබඩාවට ගිහිල්ල සත්ව කෑම අරගෙන එන්නම්.

정답 1) 축사를 청소하도록 하세요 2) 바로 확인하도록 하겠습니다 3) 소 먹이를 주도록 하세요



තව ටිකක් ඉගෙන ගෙන බලමුද? '-도록 하다' භාවිතා කර වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. 가: 내일 몇 시에 출발해요? හෙට කීයටද පිටත් වෙන්නේ?
   나: 6시에 출발하니까 ____________. හයට පිටත් වෙන නිසා ප්‍රමාද නොවන්න වග බලාගන්න.

2. 가: 부탁한 보고서는 어떻게 됐어요? ඉල්ලපු වාර්තාව ලැස්තිද?
   나: 지금 하고 있는데 저녁까지 ____________. දැන් කරගෙන යන ගමන් හවස් වෙද්දී ඉවර කරන්නම්.

3. 가: 올해는 담배를 ____________. මේ වසරේදී නම් දුම්වැටි පානය නවත් වන්න.
   나: 네, 꼭 끊을게요. ඔව් ඔව් අනිවාර්යයෙන්ම නවත්වනවා.

4. 가: 작업장이 좀 지저분한데 청소 좀 해 주세요. වැඩපොළ ටිකක් අපිළිවෙල නිසා පිරිසිදු කරන්න.
   나: 네, 이 일만 끝내고 ____________. මේ, වැඩය අවසන් වී පිරිසිදු කරන්නම්.

정답 1. 늦지 않도록 하세요 2. 끝내도록 할게요 3. 끊도록 하세요 4. 청소하도록 할게요



대화 2 සංවාදය 2

Track 143



බාත් හා කලීම් වැඩපොළේ වැඩකරමින් සිටියි. දෙදෙනා කුමක් පිළිබඳව කතා කරනවා ඇත්ද? මුලින්ම දෙබස දෙවරක් අසන්න.

카림 그물 좀 미리미리 정리해 놓으라니까 또 **그냥** 이렇게 됐네.
දැල කලින් සූදානම් කරන්න ගිහිල්ල මෙහෙම උනානේ.

바트 어디 좀 봐. 몇 번이나 말했는데 또 그런 거야? 카림 형, 이건 실수가 아니야. 이번엔 마문 씨 불러서 단단히 혼을 좀 내.
මොකද වුනේ කියල බලමු. කීප වතාවක්ම කීවත් ආයෙත මෙහෙම වුනාද? කලීම් අයියා, මේක අත් වැරැද්දක් නෙවෙයි. මෙවර මමුන් මහතාට හොඳටම බනින්න.


카림 한 번 쓴 그물은 다 엉켜서 다시 쓰기 어려우니까 꼭 풀어 놓으라고 했는데. 이것 때문에 오늘도 작업을 제때 못 **하게 됐잖아**.
එක වරක් භාවිතා කළ දැලක් ඇකිලිලා භාවිතා කරන්න අපහසු නිසා අනිවාර්යයෙන්ම ලිහා තබන්න කියලා කිවුවා. මේක නිසා අදත් වැඩ කරන්න වෙන්නේ නැහැ.

바트 집어등도 새로 안 갈았고, 양망기도 그대로야.
ඇමට දමන ලේවල් මාරු කරලත් නැහැ මාළු දැල් අදිනයත් එහෙම්මමයි.

카림 안되겠다. **당장** 마문 씨 좀 불러다가 얘기를 해야겠어.
මේ විදිහට කරන්න බැහැ. දැන්මම මමුන් මහතාට කතාකර කියන්න ඕනේ.

그냥 නිකං
① කිසිදු වෙනසක් සිදුනොවී ඒ ආකාරයෙන්ම පවතිනවිට
② කිසිඳු හේතුවක් හෝ තේරුමක් නොමැතිව

· 가: 여기 다 쓴 공구는 제가 정리할까요?
මෙතන භාවිතා කර අවසන් උපකරණ මම අරන් තියන්නද?
나: 그냥 두세요. 이따가 다시 쓸 거예요.
නිකං තියන්න තව ටිකකින් නැවත භාවිතා කරනවා.
· 가: 케이크는 왜 샀어요? 오늘 누구 생일이에요?
ඇයි කේක් ගත්තේ අද? කාගේහරි උපන්දිනයක්ද?
나: 아니요, 먹고 싶어서 그냥 샀어요.
නැහැ, කන්න කැමති හින්ද නිකං ගත්තා.



당장 දැන්මම
· 회의에 늦지 않으려면 지금 당장 출발해야 합니다.
රැස්වීමට ප්‍රමාද නොවී යාමටනම් දැන්මම පිටත්වෙන්න ඕනේ.



මෙවර කලීම් හා බාත් ලෙස දෙබස නැවත කියවන්න. හොඳින් අසා නැවත කියෙවුවාද ? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 두 사람은 뭘 하고 있어요? දෙදෙනා මොනවද කරන්නේ?
2. 두 사람은 왜 화가 났어요? දෙදෙනාට තරහා යාමට හේතුව කුමක්ද?

정답 1. 그물을 정리하고 있어요. 2. 동료가 일을 제대로 해 놓지 않아서 화가 났어요.

어휘 2 වචන මාලාව 2 어업 ධීවර කර්මාන්තය



ධීවර කර්මාන්තයට සම්බන්ධ කුමන වචන මොනවාදැයි දැන ගනිමුද?


그물
දැල


통발
උගුල


집어등
ඇමට භාවිතාකරන විදුලි බුබුළු


양망기
දැල් අදින යන්ත්‍ර


밧줄
ලණු


쇠사슬
දම්වැල


고리
කොක්ක


닻
නැංගුරම


도르래
කප්පිය


뜰채
ගොටුව


낚시 바늘
බිලී කොකු


부자/부표
බෝයාව


바늘대
දැල් වියන ඉදිකටු


수중 펌프
වතුර යට භාවිතා කළහැකි පොම්ප


수경
පිහිනුම් කන්නාඩිය



갈퀴
අත් රේක්කය


스티로폼 상자
සැජුෆෝර්ම් පෙට්ටි



ඉහත ඉගෙන ගත් වචන නැවත මතක් කර ප්‍රශ්නවලට පිළිතුරු සපයා බලමුද?

1. 사진을 보고 알맞은 말을 연결하세요. පින්තූරය දෙස බලා ගැලපෙන වචනය යාකරන්න.

① 
② 
③ 
④  
⑤ 

㉠ 닻 ㉡ 통발 ㉢ 부표 ㉣ 양망기 ㉤ 집어등

정답 ① ㉡ ② ㉢ ③ ㉤ ④ ㉠ ⑤ ㉣

-게 되다



ක්‍රියා පදයකට සම්බන්ධ කර බාහිරින් පැමිණෙන බලපෑමක් නිසාවෙන් යම් සිදුවීමක් සිදුවීම හෝ යම් දෙයක වෙනස් වීමක් දැක්වීම සඳහා භාවිතා කෙරේ.

- 가: 날씨 때문에 오늘도 작업을 못 **하게 되었어**. කාලගුණය නිසා අදත් වැඩේ කරගන්න බැරිවුනා.
  나: 큰일이다. 내일은 좋아질까? මාර වැඩේ. හෙට හොඳවෙයිද?
- 가: 아상카 씨는 한국 음식을 잘 먹네요. අසංක මහත්තයා කොරියන් කෑම හොඳට කනවනේ.
  나: 처음에는 못 먹었는데 몇 달 지나니까 잘 **먹게 되었어요**.
  මුලින් නම් කන්න බැරුව හිටියට මාස කිහිපයකට පස්සේ හොඳට කන්න පුළුවන් වුනා.



비교해 보세요 සංසන්දනය කර බලන්න

✔ '-게 되다' හා '-아지다/어지다'


'-게 되다' හා '-아지다/어지다' යන දෙකම වෙනසක් දක්වන නමුත් '-게 되다' යොදන විට වෙනස මගින් ඇතිවූ ප්‍රතිඵලයට ප්‍රමුඛත්වයක් දෙයි. '-아지다/어지다' වෙනස්වන ක්‍රියාවලියට ප්‍රමුඛත්වයක් දෙනවිට යෙදේ. '-게 되다' බහුලව ක්‍රියා පද සමඟ යෙදෙන අතර '-아지다/어지다' ක්‍රියා විශේෂණ සමඟ බහුලව යෙදේ.

- 날씨가 **추워졌어요**.
  날씨가 추워서 일을 못 **하게 되었어요**. (O)
- 날씨가 춥게 되었어요. (X)



'-게 되다' අවබෝධ වුනාද? එසේනම් මෙම යෙදුම භාවිතා කර වාක්‍ය සම්පූර්ණ කර බලන්න.

2. 그림을 보고 '-게 되다'를 사용해서 문장을 완성하세요.
තව ටිකක් ඉගෙන ගෙන බලමුද? '-게 되다' භාවිතාකර වාක්‍ය සම්පූර්ණ කරන්න.

1) 
낚시를 잘 못 했는데 ______________________.
මාළු ඇල්ලීම හොඳට කරන්න බැරිවුනත් නිතරම මාළු අල්ලන්න ගිහිල්ල දැන් හොඳට පුළුවන්.

2) 
날씨가 너무 안 좋아서 ______________________.
කාලගුණය හොඳ නැති නිසා බෝට්ටුවට නගින්න බැරි වුනා.

정답 1) 자주 해서 지금은 잘하게 됐어요 2) 배를 못 타게 됐어요



තව ටිකක් ඉගෙනගෙන බලමුද? '-게 되다' භාවිතාකර වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. 한국에 처음 왔을 때는 한국어를 잘 못했어요. 하지만 지금은 한국 사람과 자주 얘기해서 ______________________.
කොරියාවට මුලින්ම පැමිණෙන විට කොරියන් භාෂාව හොඳට කතාකරන්න බැහැ. නමුත් දැන් කොරියන් ජාතිකයන් සමග නිතර කතාකරන නිසා හොඳට කතාකරන තත්වයට පත් වුනා.
2. 고향에 살 때는 요리를 못했어요. 하지만 지금은 요리를 자주 해서 ______________________.
ගමේ ඉන්නා විටනම් කෑම පිසින්න බැහැ. නමුත් දැන් කෑම නිතරම උයන නිසා හොඳට උයන්න පුළුවන්.
3. 우리 회사가 이사를 했어요. 그래서 저도 회사 근처로 ______________________.
අපේ සමාගම වෙනත් තැනකට අරගෙන යනවා. එමනිසා මමත් සමාගම කිට්ටුවට ගෙවල් මාරු කළා.

정답 1. 잘하게 됐어요 2. 잘하게 됐어요 3. 이사하게 됐어요




활동 ක්‍රියාකාරකම්

문제가 생겼을 때는 어떻게 해결하면 좋을까요? 〈보기〉처럼 말해 보세요.

ප්‍රශ්නයක් ඇතිවන විට කෙසේ විසඳනවා නම් හොඳද? උදාහරණයේ දැක්වෙන අන්දමට කතා කරන්න.

보기 උදාහරණය





그물이 모두 엉켜 있으니까
어서 그물을 풀도록 하세요.
දැල හොඳටම අවුල්වෙලා හින්ද
ඉක්මනට දැල ලිහන්න.



그물이 엉키다, 그물을 풀다
දැල අවුල් වෙනවා,
දැල ලිහනවා


1)






돼지가 먹이를 기다리다, 사료를 주다
ඌරන් කෑම දෙනතුරු බලා සිටිනවා,
සත්වයින්ට කෑම දෙනවා

2)






축사가 더럽다, 분뇨를 치우다
සත්ව මඩුව අපිරිසිදුයි, ගොම ඉවත් කරන්න

3)





양망기가 고장나다, 수리하다
දැල් අදින යන්ත්‍රය කැඩෙනවා,
අලුත්වැඩියා කරනවා

정답 1) 돼지가 먹이를 기다리니까 사료를 주도록 하세요.
2) 축사가 더러우니까 분뇨를 치우도록 하세요.
3) 양망기가 고장이 났으니까 수리하도록 하세요.



정보 තොරතුරු

축산업과 어업 현장의 직업

පශු සම්පත් කර්මාන්ත හා ධීවර කර්මාන්ත වල සිදුකරන වැඩ

축산업 පශු සම්පත් කර්මාන්ත




사료 배합기 සත්ව ආහාර මිශ්‍ර කරන උපකරණය

사료 배합기에 사료를 투입합니다.
සත්ව ආහාර මිශ්‍ර කරන උපකරණයට සත්ව ආහාර එකතුකරන්න.



스키드로더 පැටවුම් යන්ත්‍රය

스키드로더로 폐기물을 치웁니다.
පැටවුම් යන්ත්‍රයෙන් අපද්‍රව්‍ය ඉවත් කරනවා.



축사 සත්ව මඩුව

축사 지붕을 점검하거나 수리합니다.
සත්ව මඩුවේ වහලය පරික්ෂාකර බලනවා හෝ අලුත් වැඩියා කරනවා.



분뇨 탱크 සත්ව අපද්‍රව්‍ය ටැංකිය

분뇨 탱크를 조작합니다.
සත්ව අපද්‍රව්‍ය ටැංකිය හසුරවනවා.

어업 ධීවර කර්මාන්තය



배를 타고 바다에 나가 물고기를 잡습니다.
බෝට්ටුවෙන් මුහුදට ගොස් මාළු අල්ලනවා.



갯벌에서 조개나 낙지, 굴 등을 캡니다.
මඩ සහිත බිම්වලින් බෙල්ලන් බුවල්ලන් සිප්පි වැනිදේ හාරා එළියට ගන්නවා.



양식장에서 물고기를 길러서 팝니다.
මාළු කොටු වල මාළුන් ඇතිකර විකුනනවා.



염전을 만들어 소금을 생산합니다.
ලුණු ලියදි වලින් ලුණු සාදනවා.



EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK



අංක එක සහ දෙක වාක්‍යයට සවන් දී ගැළපෙන පින්තූර තෝරන ප්‍රශ්නය වේx හොඳින. අසා ගැලපෙන පින්තතූරය තෝරන්න.

[1~2] 그림을 보고 알맞은 것을 고르십시오.
පින්තූරයට ගැලපෙන යෙදුම තෝරන්න.

Track 144

1. ① ② ③ ④

2. ① ② ③ ④



අංක 3 හා 4 ප්‍රශ්නයට සවන්දී ගැලපෙන පිළිතුර තෝරන ප්‍රශ්නය වේ. අංක 5 කතාවට සවන්දී ප්‍රශ්නයට ගැලපෙන පිළිතුර තෝරන ප්‍රශ්නය වේ. දෙබසට සවන්දීමට පෙර උදාහරණයේ අන්තර්ගතය.

[3~4] 질문을 듣고 알맞은 대답을 고르십시오. ප්‍රශ්නයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන්න.

3. ① 오리를 기르고 있어요. ② 토끼를 본 적이 있어요.
③ 오리 농장에 가 볼까요? ④ 토끼 먹이를 사러 왔어요.

4. ① 어제 갈았어요. ② 안 갈게 됐어요.
③ 내일 갈 거지요? ④ 빨리 갈도록 할게요.

5. 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오.
කතාවට සවන්දී ප්‍රශ්නයට ගැලපෙන පිළිතුර තෝරන්න.

남자는 무엇을 확인하려고 합니까? පිරිමි පුද්ගලයා කුමක් පරීක්ෂා කිරීමට සූදානම් වන්නේද?

① 그물 ② 통발 ③ 양망기 ④ 집어등



듣기 대본 ගවයන් ඇතිකරනවා

1. ① 여: 소를 길러요. ගවයන් ඇතිකරනවා. ② 여: 양을 길러요. බැටළුවන් ඇතිකරනවා.
   ③ 여: 닭을 길러요. කුකුළන් ඇතිකරනවා. ④ 여: 돼지를 길러요. ඌරන් ඇතිකරනවා.
2. ① 여: 어선을 준비해요. ධීවර බෝට්ටුව සූදානම් කරනවා.
   ② 여: 갈퀴를 준비해요. අත් රේක්කය සූදානම් කරනවා.
   ③ 여: 통발을 준비해요. උගුල් සූදානම් කරනවා.
   ④ 여: 그물을 준비해요. දැල සූදානම් කරනවා.
3. 남: 수피카 씨는 농장에서 어떤 일을 해요? සුපිකා මහත්මිය ගොවිපොළේදී කරන වැඩ මොනවද?
4. 남: 집어등이 좀 어두운 것 같네요. 갈아야겠어요.
   ඇමට භාවිත කරන විදුලි බුබුළු කළුවරයි වගේ. මාරුකරන්න ඕනේ.
5. 여: 어제 작업할 때 보니까 양망기가 잘 돌아가지 않던데…….
   ඊයේ වැඩ කරනවිට දැක්කේ දැල් අදින යන්ත්‍රය හොඳට වැඩ කලේ නැහැ...... .
   남: 안 그래도 수리 맡겼으니까 곧 고칠 거예요. 그리고 오늘은 멀리 안 나갈 거니까 괜찮아요.
   그물 엉킨 게 있는지만 좀 확인해 봅시다.
   එහෙම නොවුනත් හදන්න කියල දුන්න නිසා හදාවි. ඒ වගේම අද වැඩි ඈතකට යන්නේ නැති නිසා කමක් නැහැ. දැල් පැටලිලා තියනවද කියා පමණක් පරීක්ෂා කර බලමු.

정답 1. ① 2. ④ 3. ① 4. ④ 5. ①

확장 연습 වැඩිදුර අභ්‍යාස

L-46

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු තෝරන්න.

   여자가 창고에 가는 이유는 무엇입니까? කාන්තාව ගබඩාවට යන හේතුව කුමක්ද?

   ① 사료를 챙겨 오려고 ② 창고를 치워 놓으려고
   ③ 분뇨를 처리해 두려고 ④ 건초의 상태를 알아보려고

확장 연습 듣기 대본 වැඩිදුර අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 남: 리리 씨, 어제 축사 청소하고 퇴근했지요?
   ලිලී මහත්මිය, ඊයේ වැඩ නිම කලේ ගව මඩුව පිරිසිදු කරලා ඉවරවෙලා නේද?
   여: 네, 깨끗이 청소하고 분뇨도 다 처리했어요. 오늘은 무슨 일을 하면 돼요?
   ඔව්, පිරිසුදුව අස් පස් කර ගොම පොහොරද අයින් කළා. අද කුමන වැඩයද කළ යුත්තේ?
   남: 우선 소한테 먹이를 주세요. 참, 저번에 들여 온 건초는 잘 말랐는지 모르겠네요.
   පළමුව ගවයන්ට ආහාර දීම කරන්න. ආ, ගියවර ගෙනා පිදුරු හොඳින් වියළුණාද නම් දන්නේ නැහැ.
   여: 얼른 먹이부터 주고 나서 창고에 가서 건초를 확인해 볼게요.
   ඉක්මනට ගවයන්ට ආහාර සපයා දී, ගබඩා වලට ගිහින් පිදුරු පිරික්සන්නම්.

정답 1. ④



EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සිට අංක 2 පින්තූර බලා නිවැරදි වාක්‍යය තෝරන ප්‍රශ්න වේ. උදාහරණය හොඳින් කියවා පින්තූරයට ගැලපෙන නිවැරදි පිළිතුර තෝරන්න.

[1~2] 다음 그림을 보고 맞는 문장을 고르십시오. පහත පින්තූර බලා ගැළපෙන වාක්‍යය තෝරන්න.

1. 

① 부표예요. ② 어선이에요.
③ 수경이에요. ④ 바늘대예요.

2. 

① 사료를 주도록 하세요. ② 먹이를 버리도록 하세요.
③ 돼지를 기르도록 하세요. ④ 분뇨를 치우도록 하세요.



අංක 3 සිට අංක 4 දක්වා හිස්තැනට යෙදෙන නිවැරදි වචනය තෝරන ප්‍රශ්න වේ. හොඳින් කියවා ගැලපෙන පිළිතුර තෝරන්න.

[3~4] 빈칸에 들어갈 가장 알맞은 단어를 고르십시오. හිස්තැනට යෙදෙන වඩාත් නිවැරදි වචනය තෝරන්න.

3. 이 동네에는 소를 키우는 ____________ 농가가 많아요.
මේ අවට ගමේ හරක් ඇති කරන (හරක් කොටු) ගොවි නිවාස ගොඩක් තිබේ.

① 양돈 ② 양우 ③ 양계 ④ 양망

4. ____________은/는 조개를 캘 때 사용해요. (රේක්කය) සිප්පිකටු හාරන විට භාවිතා කරයි.

① 통발 ② 갈퀴 ③ 부표 ④ 밧줄



පහත දැක්වෙන්නේ ඡේදය කියවා ප්‍රශ්න වලට පිළිතුරු සපයන ප්‍රශ්න වේ. පෙර ඉගෙනගත් දෑ සිහි කරමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

5. 다음 질문에 답하십시오. මීළඟට ගැටලුවට පිළිතුරු සපයන්න.

축산 농가는 여름이 되면 신경 써야 할 일이 많아집니다. 가축들의 위생을 위해 아침저녁으로 축사 청소도 해야 하고, 사료의 상태도 자주 확인을 해야 합니다. 또한 가축들이 더운 여름을 건강하게 보낼 수 있도록 축사를 시원하게 유지하는 것도 중요합니다.
හරක් ගොවිපලවල් ග්‍රීස්ම සෘතුව ආවම බොහෝ අවධානයෙන් කළ යුතු වැඩ රාශියකි. ගෘහාශ්‍රිත සතුන් උදෙසා සවස ගව පිරිසිදු පිරිසිදු කොට තබා, සත්ව ආහාරවල තත්වයන්ද හොඳින් පරීක්ෂා කල යුතුයි. තවද ගෘහාශ්‍රිත සතුන්ට ග්‍රීස්මය සෞඛ්‍යමත්ව ගතකල හැකිවන පරිදි ගවමඩු සිසිල්ව තබන එකත් වැදගත් වේ.

축산 농가가 여름에 하는 일이 아닌 것을 고르십시오.
හරක් ගොවිපළවල් වල ග්‍රීස්ම සෘතුවේ කරන වැඩ අතුරින් නොවන එක තෝරන්න.

① 축사 청소를 자주 하는 것 ② 가축의 위생을 점검하는 것
③ 축사를 시원하게 유지하는 것 ④ 먹이 상태를 매일 확인하는 것

정답 1. ① 2. ④ 3. ② 4. ② 5. ②



확장 연습 වැඩිදුර අභ්‍යාස

[1~2] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරන්න.

1. 저는 ____________에서 일을 합니다. 아침에 제일 먼저 하는 일은 물고기에게 사료를 주는 일입니다.

   මම ගොවිපලක වැඩ කරනවා. උදෑසන සිදු කළ යුතු පළමු වැඩය වන්නේ මාළුන්ට කෑම දෙන එකයි.

   ① 과수원　② 공사장
   ③ 양계장　④ 양식장

2. 여름에는 가축들에게 더 신경을 ____________. 아침저녁으로 축사 청소도 하고 사료의 상태도 자주 점검하십시오.

   ගිම්හානයේ දී ගවයන්ට වැඩි අවධානයක් ලබා දිය යුතු ය. උදේ හා සවස ගව මඩුව පිරිසිදු කර නිතරම ආහාරයේ තත්වය පරීක්ෂා කරන්න.

   ① 꺼 봤습니다　② 꺼야 합니다
   ③ 써 봤습니다　④ 써야 합니다

3. 다음 글을 읽고 무엇에 대한 글인지 고르십시오.
   පහත ඇති ඡේදය කියවා කුමක් සම්බන්ධව සඳහන් වී ඇත්ද යන්න තෝරන්න.

   바다에서 일할 때 사용하는 도구는 여러 가지가 있습니다. 물고기를 잡을 때 쓰는 그물, 야간작업을 할 때 필요한 집어등, 그물을 끌어 올리는 양망기 등이 있습니다.

   මුහුදේ වැඩ කරන විට භාවිතා කරන බොහෝ උපකරණ තිබේ. මත්ස්‍යන් අල්ලා ගැනීමේදී භාවිතා කරන දැල, රාත්‍රී වැඩ සඳහා අවශ්‍ය වන විදුලි පහන, මාළු ඇල්ලීමේදී භාවිතා කරන දැල උඩට ඇද ගන්න භාවිතා කරන යන්ත්‍රය යන දෑ තිබේ.

   ① 농업 도구　② 건설업 도구
   ③ 어업 도구　④ 축산업 도구

정답 1. ④ 2. ④ 3. ③



발음 උච්චාරණය 

P-23

හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.

'වාතය පිට කිරීමේදී බාධාවකට ලක් වී නැගෙන ශබ්ද' දෙකක් එක ළඟ යෙදෙන විට පිටුපසින් තිබෙන ශබ්දය, උගුරට බර දී කරන ශබ්දයක් හෙවත් ද්විත්ව ව්‍යඤ්ජන ශබ්දයක් බවට පත් වේ.

(1) 식당, 속담, 꽃집　(2) 답장, 옆집, 국수, 꽃가게
(3) 교실에 책상이 있어요.　(4) 메일에 답장이 없어요.



재고를 파악하는 것이 중요해요


භාණ්ඩ ලේඛනය අවබෝධ කරගැනීම වැදගත්

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

- අධ්‍යයන අරමුණු — වැඩ කළමනාකරණය කිරීම අත් වැරදි පැවසීම
- ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස් — -는 것이 중요하다, -(으)ㄹ 것이다
- වචන භාවිතය සඳහා උපදෙස් — ගබඩා කළමණාකරණය, භාණ්ඩ නිෂ්පාදනය
- සංස්කෘතික තොරතුරු — වැඩ පොළ තුල හොඳ පුරුදු



대화 1 සංවාදය 1



Track 145



පහත දැක්වෙන්නේ කළමනාකාරතුමා සහ ඛාන් මහතා අතර ඇතිවූ දෙබසකි. මුලින්ම දෙබසට දෙවරක් සවන්දී නැවත කියන්න.

관리자 오늘 출고할 상품은 모두 준비됐지요?
අද නැව්ගත කිරීමට නියමිත භාණ්ඩ සියල්ලම සූදානම් කලාද?

칸 네, 이쪽에 있는 물건들이 오늘 나갈 상품입니다. 그리고 재고는 여기에 기록해 두었고요.
ඔව් මේ පැත්තේ තිබෙන භාණ්ඩ අද යවන භාණ්ඩ වේ. තවද භාණ්ඩ සියල්ලම ලේඛනගත කලා.

관리자 한번 봅시다. 음, 정리가 잘 되어 있어서 재고 파악이 쉽겠네요. 수고했어요.
පොඩ්ඩක් බලමු. හොඳට පිළිවෙලට තිබෙන නිසා භාණ්. සොයාගන්න පහසුයි. හොඳින් වැඩය කලා.

칸 아닙니다. 창고 정리는 재고를 파악하는 것이 중요하잖아요.
නැහැ ඉන්වෙන්ට්‍රිය සකස්කරන එක වැදගත් නේ.

관리자 그래요. 그럼 칸 씨가 창고 관리 좀 신경 써 주세요. 재고도 얼마나 되는지 계속 확인해 주시고요.
එහෙමයි. එහෙනම් ටිකක මහතා කළමනකරණයට ටිකක උදවු වෙන්න. ඉන්වෙන්ට්‍රිය කොපමණ ප්‍රමාණයක් තිබෙනවද කියලත් පරීක්ෂාකර බලන්න.

-고요 සහ
මුලින් පැවසූ දෙයට අදාලව තවත් යමක් පවසන විට භාවිතා කරයි. මුලින් පැවසූ දෙය නැවත නොපවසන විට යෙදේ.

- 가: 이 노트북 어때요? මෙම පරිඝනකය කොහොමද?
  나: 가벼워서 좋아요. 기능도 많고요. බර නැති නිසා හොඳයි. කළහැකි දේවල්ද බොහෝයි.
- 가: 기숙사가 어때요? නේවාසිකාගාරය කොහොමද?
  나: 조용해서 좋아요. 방도 넓고요. නිස්කලංක නිසා හොඳයි. කාමරයත් විශාලයි.

확인하다 පරීක්ෂා කරනවා

- 회의 내용을 제대로 정리했는지 확인해 주세요. සමිතියේ අන්තර්ගතය ලියා තිබෙනවාද කියා පරීක්ෂාකර බලන්න.
- 거래처에 보낼 물건을 잘 챙겼는지 확인해야 해요. ගනුදෙනු කරුවන්ට යවන භාණ්ඩ සූදානම් කරගත්තද කියා පරීක්ෂාකර බලන්න.



හොඳින් සවන්දී අනුගමනය කළා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 관리자는 무엇을 확인하고 있어요? කළමනාකාරතුමා පරීක්ෂා කරන්නේ කුමක්ද.
2. 칸 씨는 무슨 일을 해야 해요? ඛාන් මහතා කුමන වැඩක් කල යුතුද?

정답 1. 오늘 출고할 상품을 확인하고 있어요. 2. 창고 관리와 재고 확인을 해야 해요.






어휘 1 වචන මාලාව 1 창고 관리 ගබඩා කළමනාකරණය




පහත දැක්වෙන්නේ කළමනාකරණට සම්බන්ධ විවිධ වචන වේ. කුමන වචන තිබේදැයි බලමු.



물류 창고
සැපයුම් ගබඩාව



냉동 창고
ශීතකළ ගබඩාව




컨테이너
කන්ටේනරය




입고하다
ඇතුලට ගෙනෙනවා



출고하다
පිටතට ගෙනියනවා



보관하다
ආරක්ෂා කරනවා



저장하다
ප්‍රවේසම් කරනවා



덮개를 덮다
වහනවා



온도를 유지하다
උෂ්ණත්වය පාලනය කරනවා



재고를 파악하다
ඉන්වෙන්ට්‍රිය හඳුනා ගන්නවා




관리하다
කළමනාකරණය කරනවා



ඉහත සදහන් වචන මාලාව දෙස නොබලා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න උත්සාහ කරන්න.

1. 그림을 보고 알맞은 말을 연결하세요. පින්තූර දෙස බලා ගැලපෙන වචනය යා කරන්න.

① 
② 
③ 
④ 
⑤ 

㉠ 컨테이너 ㉡ 입고하다 ㉢ 덮개를 덮다 ㉣ 냉동 창고 ㉤ 관리하다

정답 ① ㉣ ② ㉠ ③ ㉡ ④ ㉤ ⑤ ㉢



문법 1 සංවාදය 1 –는 것이 중요하다

G47-1

ක්‍රියා පදයකට සම්බන්ධ කර යම්කිසි ක්‍රියාවක් කිරීම වැදගත් යන්න අවධාරණය කිරීමට යොදාගැනේ.

- 가: 식품 창고에서는 온도를 잘 **유지하는 것이 중요합니다.**
  ආහාර ගබඩාවෙහි උෂ්ණත්වය හොඳින් පවත්වා ගැනීම වැදගත්.
  나: 그럼 모든 식품을 같은 온도로 유지합니까?
  එහෙනම් සියලු ආහාර සමාන උෂ්ණත්වයෙන් පවත්වා ගන්නවද?
- 가: 밖에 있는 물건에 덮개를 덮어 뒀어요. පිටත තිබෙන භාණ්ඩ ආවරණය කර තැබුවා.
  나: 네, 잘했어요. 물건이 파손되지 않도록 **하는 게 중요해요.**
  හොඳයි. භාණ්ඩ වලට හානියක් නොවන පරිදි කිරීම වැදගත්.



'–는 것이 중요하다' අවබෝධ වුනාද? එසේනම් මෙම යෙදුම භාවිතා කර වාක්‍ය සම්පූර්ණ කරන්න.

2. 그림을 보고 '–는 것이 중요하다'를 사용해서 문장을 완성하세요.
පින්තූර දෙස බලා '–는 것이 중요하다' භාවිතාකර වාක්‍ය සම්පූර්ණ කරන්න.

1) 재고를 파악하다

창고 관리는 ______________________.
ගබඩා කළමනාකරණය (ඉන්වෙන්ට්‍රිය අවබෝධ කරගැනීම වැදගත්).

2)



온도를 유지하다

식품을 보관할 때는 ______________________.
කෑම වර්ග ගබඩා කරනවිට (උෂ්ණත්වය පාලනය කිරීම වැදගත්).

3)



덮개를 덮다

밖에 물건을 둘 때는 ______________________.
පිටත භාණ්ඩ තබනවිට ඒවා ඔතා තැබීම වැදගත්.


정답 1) 재고를 파악하는 것이 중요하다 2) 온도를 유지하는 것이 중요하다 3) 덮개를 덮는 것이 중요하다

유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

얼굴이 좋아 보여요. සතුටින් ඉන්නවා වාගෙයි.

가: **얼굴이 좋아 보여요.** 무슨 일 있어요? **සතුටින් ඉන්නවා වාගෙයි.** මොකක්ද සිදු වුනේ?
나: 승진했어요. 일도 재미있고요. උසස්වීමක් ලැබුවා. වැඩත් විනෝදයි.

대화 2 සංවාදය 2





පරු මහතා සහ ජිහුන් මහතා වැඩපොළේ වැඩ කරමින් සිටියි. දෙදෙනා කුමන කතාවක් කරමින් සිටීද මුලින්ම දෙබස දෙවරක් අසන්න.

바 루 아! 이런 어떡하지…….
ආ ...... මේකට මොකද කරන්නේ

지 훈 왜요? 무슨 일 있어요?
ඇයි මොකද වුනේ?

바 루 실수로 반대쪽에 구멍을 뚫었어요. 이 원목은 못 쓰게 됐는데 어떡하죠?
අත්වැරැද්දකින් විරුද්ධ පැත්තේ සිදුරක් ඇතිවුනා. මේ ලෑල්ල භාවිතා කරන්න බැරිවෙනවා මොකද කරන්නේ?

지 훈 일이 아직 손에 익지 않아서 그런 거 같네요. 너무 속상해하지 마세요. 그건 다른 거 만들 때 쓰면 되죠, 뭐.
තවම වැඩට පුරුදු නැති නිසා එහෙම වෙන්න ඇති. කලබල වෙන්න එපා. ඒක වෙනත් වැඩකට ගත්තහම හරි.

바 루 재단부터 다시 하려면 시간이 많이 걸릴 텐데…….
මුල ඉඳල අයෙ කරනවා නම් වෙලාව ගොඩක් ගත වෙනවා.

지 훈 같이 하면 금방 할 수 있을 거예요. 자, 다시 해 봅시다.
එකතුවෙලා කරනවා නම් ඉක්මනට ඉවර කරන්න පුළුවන්. නැවත කරලා බලමු.

> **실수** අත්වැරැද්ද
> - 술을 마시고 실수로 사장님께 '아저씨'라고 했어요.
>   මත්පැන් පානය කර අත්වැරැද්දකින් සමාගම අයිති පුද්ගලයට මාමා යයි කිවා.
> - 처음 이 일을 시작했을 때에는 일을 잘 몰라서 실수를 많이 했어요.
>   මුලින්ම මෙම වැඩය ආරම්භ කරන විට වැඩගැන ගොඩක් දන්නේ නැති නිසා අත්වැරදි ගොඩක් කලා.

> **-(으)ㄹ 텐데** වෙන්න පුළුවන් නිසා
> මුලින් පවසන වාක්‍යය අනුමාන කිරීමක් වනාතර දෙවන වාක්‍ය පළමු වාක්‍යය හේතු කොට ගෙන පවසයි.
> - 오늘 오후에 비가 올 텐데 우산을 가지고 가세요.
>   අද හවස වහින්න පුළුවන් නිසා කුඩයක් අරගෙන යන්න.
> - 지금 밥을 먹지 않으면 배가 고플 텐데…….
>   දැන් බත් කෑවේ නැත්නම් බඩගිනි වෙන්න පුළුවන් නිසා…….



මෙවර ඉවාන් මහතා හා පරු මහතා බවට පත්වී දෙබස නැවත කියවන්න. හොඳින් අසා නැවත කියෙවුවද? එසේනම් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. 바루 씨는 무슨 실수를 했어요? පරු මහතා කුමක්ද සිදුකල අත්වැරැද්ද.
2. 대화 후 두 사람은 무엇을 할까요? කතාවෙන් පසුව දෙදෙනා මොනවද කරන්නේ?

정답 1. 구멍을 잘못 뚫었어요. 2. 재단을 할 거예요.




어휘 2 වචන මාලාව 2 가구 제조 ගෘහ භාණ්ඩ නිෂ්පාදනය


ගෘහ භාණ්ඩ නිෂ්පාදනයට අදාළ ප්‍රකාශන මොනවදැයි දැන ගනිමුද?



원목을 재단하다
ලී කපන්න



홈을 파다
කාණුවක් කපන්න



구멍을 뚫다
සිදුරක් විදිනවා




연마하다/샌딩하다
යතුගානවා



사포질하다
වැලි කඩදාසියෙන් මදිනවා




도장하다
තීන්ත ගානවා




도색하다
සායම් ගානවා



줄자
ටේප් පටිය



직각자
කෝණ මානය




수평대
තිරස් අතට



ඉහත ඉගෙන ගත් වචන නැවත මතක් කර ප්‍රශ්නවලට පිළිතුරු සපයා බලමුද?

1. 그림에 맞는 표현을 〈보기〉에서 골라 넣으세요.


පින්තූරයට ගැළපෙන ප්‍රකාශය උදාහරණ කොටසින් තෝරා ලියන්න.



보기 홈을 파다 원목을 재단하다 도장하다 연마하다 도색하다

정답 1) 원목을 재단하다 2) 홈을 파다 3) 연마하다 4) 도장하다 5) 도색하다

-(으)ㄹ 것이다



ක්‍රියා පදයක් හෝ විශේෂණ පදයකට සම්බන්ධ කර අනාගතයේදී සිදුකරන හෝ සිදුවන වැඩක් පිළිබඳව අනුමාන කිරීම සඳහා භාවිතා කෙරේ.

자음 (ව්‍යඤ්ජන) → **-을 것이다**	모음 (ස්වර), 자음 'ㄹ' (ව්‍යඤ්ජනය -ㄹ) → **-ㄹ 것이다**
먹다 → 먹을 **것이다** 읽다 → 읽을 **것이다**	보다 → **볼 것이다** 살다 → **살 것이다**

· 가: 도색 작업이 언제 끝날까요? තීන්ත ගාන වැඩේ කීය වෙද්දි ඉවර වෙයිද?
  나: 3시까지는 **끝날 거예요.** 3 වෙද්දි නම් ඉවර වෙයි.
· 내일부터 날씨가 **맑을 것이다.** හෙට ඉඳලා කාලගුණය යහපත් වෙයි.
· 앞으로 한국에서 일하는 외국인 근로자의 수가 **증가할 것이다.**
  ඉදිරියට කොරියාවේ වැඩ කරන විදේශීය කම්කරුවන්ගේ සංඛ්‍යාව වැඩිවෙයි.

කර්තෘ ප්‍රථම පුරුෂ වන අවස්ථාවේදී කතා කරන පුද්ගලයාගේ චේතනාව යන්න ප්‍රකාශ වේ.

· 나는 오늘부터 한국어 공부를 열심히 **할 것이다.** මම අද සිට කොරියන් භාෂාව මහන්සි වී ඉගෙන ගන්නවා.



'-(으)ㄹ 것이다' තේරුණාද? '-(으)ㄹ 것이다' භාවිතා කර සංවාදය සම්පූර්ණ කරන්න.

2. '-(으)ㄹ 것이다'를 사용해서 대화를 완성하세요.
'-(으)ㄹ 것이다' භාවිතා කිරීමෙන් සංවාදය සම්පූර්ණ කරන්.

1) 가: 오늘 도장 작업을 다 끝낼 수 있을까요?
   අද තීන්ත ගාල ඉවර කරන්න පුලුවන්ද
   나: 네, ______________________. [문제 없다 ගැටළුවක් නැත]

2) 가: 직각자 못 봤어요?
   කෝණ මානය දුටුවේ නැද්ද?
   나: 아마 ______________________. [저쪽에 있다 ඔතන තිබුනා]

3) 가: 오전에 원목 재단 작업이 다 될까요?
   උදෑසන දැව කැපීමේ කටයුතු ඉවර කල හැකිද?
   나: 12까지는 ______________________. [끝나다 අවසානය]

4) 가: 이번 주 금요일까지 이 서류를 사무실에 내야 하는 거 맞죠?
   මේ සිකුරාදා වන විට ලිපි කාර්යාලයට භාරදිය යුතුයි නේද?
   나: 아마 ______________________. [그렇다 ඔව්]


정답 1) 문제 없을 거예요 2) 저쪽에 있을 거예요 3) 끝날 거예요 4) 그럴 거예요




활동 ක්‍රියාකාරකම්

가구 공장의 게시판입니다. 잘 읽고 질문에 답하세요.
එය ලී බඩු කර්මාන්ත ශාලාවක දැන්වීම් පුවරුවකි. එය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

칭찬 게시판 පැසසීමේ දැන්වීම්



바루 씨를 칭찬합니다!
의자 만들 때는 구멍을 뚫는 것이 중요한데 바루 씨가 정확한 곳에 잘 뚫었어요. 정말 멋졌어요!
පරු මහතාට ප්‍රශංසා කරමි!
පුටු සෑදීමේදී සිදුරු විදීම වැදගත් වන අතර, පරු මහතා නිවැරදිව සිදුරු විදීමට දන්නවා. එය විශිෂ්ටයි.



칸 씨를 칭찬합니다!
오후에 비가 온다고 했는데 칸 씨가 미리 원목에 덮개를 덮어 줘서 문제가 생기지 않았어요!
අපි ඛාන් මහතාට ප්‍රසංශා කරමු!
සවස වැස්ස වැටෙන බව කිවුව විට ඛාන් මහතා කලින්ම ආවරණ යෙදූ නිසා ගැටලුවක් තිබුණේ නැහැ.



민수 씨를 칭찬합니다!
탁자의 상태가 좋지 않아서 여러 번 사포질을 해야 했는데 민수 씨가 탁자를 아주 매끄럽게 만들어 줬어요.
මින්සු මහතාට ප්‍රසංශා කරමි!
මේසයේ තත්වය හොඳ නැති නිසා කිහිප වරක් එය සුමට කිරීමට සිදුවුනත් මින්සු මහතා එය ඉතාම සුමට ලෙස සෑදුවා.

정현 씨를 칭찬합니다!
입고된 상품이 너무 많아서 힘들었는데 정현 씨가 잘 정리해 줘서 금방 끝났어요!
ජොන්ග් හ්යුන්ග්ට ප්‍රසංශා කරමි!
තොග භාණ්ඩ රාශියක් තිබූ නිසා වෙහෙසට පත්වුනත් ජොන්ග් හ්යුන්ග් මහතා හොඳින් පිළියෙලකර දුන් නිසාවෙන් ඉකමනට අවසන් වුනා.

1. 네 사람은 왜 칭찬을 받았을까요? 맞는 그림을 연결하세요.
හතරදෙනා ප්‍රසංශා ලැබුයේ ඇයි? ගැළපෙන පින්තූරය සමග යා කරන්න.

① 바루　② 칸　③ 민수　④ 정현

㉠ 

㉡ 

㉢ 

㉣ 

정답 ① ㉢ ② ㉠ ③ ㉣ ④ ㉡



정보 තොරතුරු

직장에서의 칭찬 노하우


වැඩබිම තුළ ප්‍රසංශා කිරීම

직장에서 어떤 말을 들으면 기분이 좋을까요? 남녀 직장인 517명을 대상으로 들었을 때 가장 기분 좋은 칭찬의 말이 무엇인지 물어봤습니다. 그 결과 '오늘 정말 예쁘네요' 또는 '멋있네요'가 45.7%로 1위, '역시 우리 회사는 ○○ 씨가 없으면 안 돌아가요'가 25.1%로 2위, '다 ○○ 씨 덕분이죠'가 24.2%로 3위를 차지했습니다. 기타 의견으로는 '○○님, 정말 존경합니다', '동안이시네요(어려 보이세요)' 등이 있었습니다. 또한 언제 이런 칭찬을 많이 하느냐는 질문에는 '회식 자리에서 한다'는 응답이 45.5%로 가장 높았고, '평상시 틈틈이 한다'는 응답이 43.3%로 그 뒤를 이었습니다.

회사에서 성공적인 인간 관계를 만들고 싶은 직장인이라면 함께 일하는 동료와 상사를 기분 좋게 만드는 칭찬의 말을 틈틈이 하는 것도 좋은 방법이 될 것입니다.

රැකියා ස්ථානයේ කුමක් කියනවා ඇසුනේනම් සතුටට පත්වෙනවාද? පිරිමි ගැහැණු 571 දෙනෙකුගෙන් ඇසීමට වඩාත්ම කැමති පැසසුම කුමක්ද කියා ඇසුවා. 45.7 ක් අද ලස්සනයි නැත්නම් කඩවසම් යන්න ඇසීමට කැමතියි පැවසුවා. 25.1 අපේ සමාගම මහතා / මහත්මිය නැත්නම් වැඩකරන්න නොහැකියි යන්නත් 24.2 මහතා / මහත්මියගේ උදවුවෙන් යන්නත් පැවසුවා. වෙනත් පිළිතුරු අතර ගොඩක් ගරුකරනවා, තරුණයිනේ වැනි පිළිතුරු තිබෙනවා. කුමන අවස්තාවලදී පසසනවාද යන්නට 45.4 භෝජන සන්ග්‍රහවලදී ලෙසත් 43.3 එදිනෙදා පවසනවා යනුවෙනුත් පිළිතුරු දුන්නා.

සමාගම තුළ අනෙක් සේවකයන් සමග හොඳ සම්බන්දතාවයක් පවත්වාගැනීමට අවශ්‍යනම් අනෙක් අයව සතුටට පත්කරවන ප්‍රශංසාවන් කිරීම හොඳ ක්‍රමයක් වේ.



직장에서 들었을 때 기분 좋은 말

වැඩපොලේදී ඇසීමට කැමති වදන්





අංක 1 වාක්‍යයට සවන්දී නිවැරදි පින්තූරය තෝරාගන්න. හොඳින් අසා නිවැරදි පිළිතුර තෝරන්න.

1. 다음 그림을 보고 알맞은 대답을 고르십시오.
පහත පින්තූර දෙස බලා ගැලපෙන පිළිතුර තෝරන්න.

Track 147

이것은 무엇입니까? මේ මොකක්ද?

① ② ③ ④



අංක 2 හා 3 ප්‍රශ්නයට සවන්දී ගැලපෙන පිළිතුර තෝරන ප්‍රශ්නය වේ. අංක 4 හා 5 කතාවට සවන්දී ගැළපෙන පිළිතුරු තොරණ ප්‍රශ්නය වේ. දෙබසට සවන්දීමට පෙර හොඳින් කියවා බලන්න.

[2~3] 질문을 듣고 알맞은 대답을 고르십시오. ප්‍රශ්නයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන්න.

2. ① 물건이 다 들어왔어요. ② 빨리 주문을 해야겠어요.
③ 제품만 차에 실으면 돼요. ④ 상품 출고를 관리하는 일이에요.

3. ① 제가 먼저 할게요. ② 민수 씨가 하고 있을 거예요.
③ 저는 샌딩 작업을 해 봤어요. ④ 3시까지는 작업이 끝날 거예요.

[4~5] 하나의 이야기를 듣고 두 개의 질문에 대답하십시오.
එකම කතාවට සවන්දී ප්‍රශ්ණ දෙකටම පිළිතුරු සපයන්න.

4. 남자는 무슨 일을 했습니까? මිනිසා කළේ කුමක්ද?
① 도색을 했습니다. ② 사포질했습니다.
③ 원목을 운반했습니다. ④ 원목을 재단했습니다.

5. 남자에 대한 설명으로 알맞은 것을 고르십시오.
පිරිමි පුද්ගලයා පිළිබඳව ගැළපෙන යෙදුම තෝරන්න.
① 실수를 했습니다. ② 작업에 익숙합니다.
③ 일을 끝내지 못했습니다. ④ 앞으로도 이 일을 할 것입니다.



듣기 대본 ශ්‍රවණ පිටපත

1. ① 남: 줄자입니다. ටේප් පටිය වේ.
   ② 남: 직각자입니다. කෝණමානය වේ.
   ③ 남: 수평대입니다. මට්ටම් ලීය වේ.
   ④ 남: 도르래입니다. බොලොක්කය වේ.
2. 여: 출고 준비는 다 끝났어요? පිටත්වීමට සියල්ල සූදානම්ද?
3. 남: 지금 누가 샌딩 작업을 하고 있어요? දැන් කවුද ඔපමට්ටම් කිරීම කරන්නේ?

4-5.

여: 원목 재단하느라고 정말 고생 많았어요. 힘들었죠? ඔපමට්ටම් කරන්න ගොඩක් මහන්සි වුනා නේද?

남: 아닙니다. 선배님이 많이 도와주셔서 힘들지 않았어요. 그런데 재단이 잘 되었는지 모르겠어요. 그리고 시간도 다른 분들보다 오래 걸려서…….
ඇත්තටම නැහැ. ගොඩක් උදව් කල නිසා අමාරු වුණේ නැහැ. එහෙත් කැපීම හොඳින් කළාදැයි මා දන්නේ නැහැ. කාලයත් අනෙක් අයට වඩා ගතවුනා.

여: 걱정 마세요. 아까 보니까 아주 잘 되었던데요. 그리고 처음이니까 시간이 많이 걸리지만 익숙해지면 빨리 할 수 있을 거예요.
කරදර වෙන්න එපා. එය ඉතා හොඳට තිබෙනවා. පළමුවර නිසා කාලය මාගේ වැඩකි. වැඩිපුර ගත වුවත් පුරුදු වූ පසු ඉක්මනට කරන්න පුළුවන්.

남: 네, 알겠습니다. 열심히 배울게요. ඔව්, තේරුනා. හොඳින් ඉගෙන ගන්නම්.

정답 1. ③ 2. ③ 3. ② 4. ④ 5. ④

확장 연습 තවදුරටත් වන අභ්‍යාස L-47

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු තෝරන්න.

   여자는 무엇을 해야 합니까? කාන්තාව කළ යුත්තේ කුමක්ද?

   ① 거래처에 가야 합니다. ② 창고를 정리해야 합니다.
   ③ 재고를 파악해야 합니다. ④ 상품을 출고해야 합니다.

확장 연습 듣기 대본 තවදුරටත් වන අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 여: 아딧 씨, 거래처에 벌써 갔다 왔어요?
   ආදිත් මහතා, ඔබ දැනටමත් සේවාදායක ස්ථානයට ගිහින් ආවාද?

   남: 네, 생각보다 일이 빨리 끝났어요. 수피카 씨는 창고 정리 다 했어요?
   ඔව්, මම සිතුවාට වඩා ඉක්මනින් වැඩ ඉවර වුණා. සුපිකා මහත්මිය ගබඩා කාමරය ඔක්කොම පිරිසිදු කළාද?

   여: 네, 재고 목록도 모두 작성해서 반장님께 보여 드렸어요. 이따가 오후에 출고만 하면 돼요.
   භාණ්ඩ ලැයිස්තුවක් සාදා කළමණාකාරතුමාට පෙන්වා දුන්නා. තව ටිකකින් හවසට බඩු නිකුත් කරා නම් හරි.


정답 1. ④



EPS-TOPIK 읽기 කියවීම



අංක 1 වාක්‍යයට සවන් දී නිවැරදි පින්තූරය තෝරන ප්‍රශ්නයකි. හොඳින් සවන් දී නිවැරදි පින්තූරය තෝරන්න.

1. 다음 그림을 보고 맞는 문장을 고르십시오. පහත පින්තූර බලා ගැළපෙන වාක්‍යය තෝරන්න.



① 홈을 파고 있습니다. ② 조립을 하고 있습니다.
③ 사포질을 하고 있습니다. ④ 도색 작업을 하고 있습니다.



අංක 2 සිට අංක 3 දක්වා හිස්තැනට යෙදෙන නිවැරදි වචනය තෝරන ප්‍රශ්න වේ. හොඳින් කියවා ගැලපෙන පිළිතුර තෝරන්න.

[2~3] 빈칸에 들어갈 가장 알맞은 단어를 고르십시오. හිස්තැනට යෙදෙන වඩාත් නිවැරදි වචනය තෝරන්න.

2. 창고에 식료품을 보관할 때는 알맞은 온도를 ______________ 것이 매우 중요합니다.
ගබඩාවේ ආහාර ද්‍රව්‍ය ගබඩා කරන විට නිවැරදි උෂ්ණත්වය (පවත්වා ගන්න) එක ගොඩාක් වැදගත්.

① 가공하는 ② 냉방하는 ③ 유지하는 ④ 입고하는

3. 가구를 만들 때 제일 먼저 해야 하는 일은 바로 원목을 ________________ 일입니다. 용도에 맞게 정확한 크기로 재는 것이 중요합니다.
ලී බඩු හදන විට වඩාත් කලින් කල යුතු වැඩය වන්නේ වහාම ලී මැනලා (කපන) වැඩයයි. භාවිතය නිවැරදිව පරීක්ෂා කර ප්‍රමාණ අනුව කපන එක වැදගත්.

① 도색하는 ② 샌딩하는 ③ 조립하는 ④ 재단하는



අංක 3 සිට අංක 4 එක් ඡේදයක් කියවා ප්‍රශ්න වලට පිළිතුරු සපයන ගැටළුවයි. පෙර ඉගෙනගත් දෑ සිහි කරමින් ප්‍රශ්නයට පිළිතුරු සපයන්න

[4~5] 다음 글을 읽고 물음에 답하십시오. මීළඟට ඡේදය කියවා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

민수 씨, 다른 곳으로 옮기게 됐다면서요? 정말 서운해요.

그동안 민수 씨 덕분에 즐겁게 일할 수 있었어요. 회사 동료들이 모두 민수 씨를 좋아하는 거 알죠? 항상 일을 빨리 끝내면 저희를 도와줬던 민수 씨를 잊지 못할 거예요. 그리고 실수를 해도 짜증내지 않고 웃는 얼굴로 받아줘서 고마워요. 민수 씨는 정말 착하고 친절해서 다른 곳에 가서도 잘 지내실 거예요. 정말 고마웠어요. 일하면서 정말 큰 힘이 됐어요. 다른 곳에 가도 늘 건강하게 잘 지내세요. 꼭 연락할게요. - 바루 씀

මින්සු මහත්මයා, වෙනත් ස්ථානයකට මාරු කලා නේද? ඇත්තටම දුකයි.
ඒ කාලය තුළ මින්සු මහතා නිසා සතුටින් වැඩ කරන්නට පුළුවන් වුණා. වැඩපලේ සේවකයන් සියළුම දෙනා මින්සු මහතාට කැමති බව දන්නවද? නිතරම වැඩ ඉක්මනින් අවසන් කරමින් යුතුයි උදව් ලබා දුන් මින්සු මහතා අමතක කරන්න බැහැ. ඒ වගේම වරදක් වුණත් තරහා ගන්නේ නැතිව සිනා මුසු මුහුණෙන් සිටියාට ස්තූතියි. වැඩ කරනා විටදී ගොඩක් ලොකු ශක්තියක් වුණා. වෙනත් තැනකට ගියත් නිරෝගීව හොඳින් ඉන්න. අනිවාර්යයෙන්ම කෝල් කරන්නම්.



4. 위 글에 대한 내용으로 맞는 것을 고르십시오. ඉහත ඡේදයේ විස්තරයට ගැළපෙන පිළිතුර තෝරන්න.

① 민수 씨가 바루 씨에게 쓴 편지입니다.
② 바루 씨가 다른 회사로 가게 되었습니다.
③ 민수 씨가 바루 씨 때문에 화가 났습니다.
④ 바루 씨는 민수 씨에게 감사하고 있습니다.

5. 민수 씨에 대한 설명으로 맞는 것을 고르십시오. මින්සු මහතා පිළිබඳ විස්තරයට ගැළපෙන පිළිතුර තෝරන්න.

① 구멍을 뚫었습니다.
② 도구를 정리했습니다.
③ 실수를 하지 않습니다.
④ 동료들을 잘 도와줍니다.

정답 1. ① 2. ③ 3. ④ 4. ④ 5. ④

확장 연습 තවදුරටත් වන අභ්‍යාස

[1~2] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරන්න.

1.

원목을 다듬을 때에는 여러 번 사포질을 해야 합니다. 그렇게 해야 원목의 표면을 ____________ 만들 수 있습니다.

ලොග් සැකසීමේදී,, ඔබ බොහෝ වාර ගණනක් වැලි තැබිය යුතුයි. එසේ කිරීමෙන්,, ලොග් මතුපිට (ලිස්සන සුළුව) සුමට කිරීමට හැකියි.

① 딱딱한
② 매끄러운
③ 딱딱하게
④ 매끄럽게

2.

저는 가구를 만드는 공장에서 근무하고 있습니다. 공장에서 제가 하는 일은 나무를 ____________ 페인트칠을 하는 것입니다.

මම ගෘහ භාණ්ඩ සෑදීමේ කර්මාන්ත ශාලාවක වැඩ කරනවා. කම්හලෙහි මා කරන වැඩය වන්නේ ලී (කැපීම) සහ තීන්ත ආලේප කිරීමයි.

① 자르고
② 잘라도
③ 자르니까
④ 잘랐지만

3. 다음을 읽고 무엇에 대한 글인지 고르십시오.
පහත සඳහන් ඡේදය කියවා කුමක් පිළිබඳව කියවෙන්නේ දැයි තෝරාන්න.

제가 하는 일은 창고 관리입니다. 창고에 입고되는 상품과 출고되는 상품을 확인해서 기록합니다. 그리고 상품의 재고를 파악하는 것도 제 일입니다.

මම කරන වැඩය නම් ගබඩා කළමණාකරණයයි. ගබඩාවට ඇතුලත් කරන හා පිට කරන භාණ්ඩ පරීක්ෂා කර වාර්ථා කල යුතුයි. එමෙන්ම භාණ්ඩ වල තොග සොයා බැලීමද වැඩ වලට අයත්ය.

① 근무 조건
② 업무 내용
③ 작업 결과
④ 근무 기간

정답 1. ④ 2. ① 3. ②



다치지 않도록 조심하세요

තුවාලයක් සිදු නොවන්න පරිස්සම් වෙන්න

학습 안내 අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

▫ අධ්‍යයන අරමුණු	උපකරණ වලින් වැඩ කරන විට පරිස්සම් වියයුතු ආකාරය පැවසීම / අවදානම් අවස්ථා මගහැරීම
▫ ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස්	-(으)ㄴ 적이 있다/없다, -지 않도록 조심하다
▫ වචන භාවිතය සඳහා උපදෙස්	උපකරණ වලින් කරන වැඩ / විනාශයන්
▫ සංස්කෘතික තොරතුරු	වැඩපොළේ අනතුරු



대화 1 සංවාදය 1





ජිහුන් මහතා තුඅන් මහතාට වැඩ කරන විට ප්‍රවේසම් විය යුතු ආකාරය ගැන කියා දෙමින් සිටියි

지 훈 어! 투안 씨, 괜찮아요?
ආ තුන් මහතා, හොඳින් නේද?

투 안 네, 모서리 맞추려고 한 건데. 큰일 날 뻔했네요.
ඔව්, කෙලවර හරියට හදන්න කියල හැදුවේ.
තව පොඩ්ඩෙන් ලොකු අනතුරක් වෙනවා.

지 훈 저도 프레스 작업 하다가 다친 적이 있어요. 프레스 기계가 워낙 무거우니까 조금만 방심을 해도 큰 사고가 나더라고요. 작업할 때 집중하고 특히 손 조심하고요.
මමත් මුද්‍රණ වැඩ කරල තුවාල වෙලා තියනවා, මුද්‍රණ උපකරණ ගොඩක් බර නිසා පොඩ්ඩක් හරි එහාමෙහා වුනත් ලොකු අනතුරක් වෙන්න පුළුවන්, වැඩ කරන විට ප්‍රවේසම් වෙන්න, විශේෂයෙන්ම අත පරිස්සම් කරගන්න

투 안 계속 조심했는데 잠깐 딴생각을 하는 바람에…….
දිගටම පරිස්සමින් වැඩ කලත් ටික වෙලාවකට වෙනත් දෙයක් ගැන හිතපු ටිකට.

지 훈 많이 놀란 것 같으니까 좀 쉬었다가 해요.
ගොඩක් පුදුම වෙලා වගේ හින්ද ටිකක විවේක අරගෙන වැඩ කරන්න.

워낙 ගොඩක්
· 이 기계는 워낙 오래돼서 바꿔야 해요.
මෙම උපකරණය ගොඩක් පරණ එකක් හින්ද මාරු කරන්න ඕනේ.

-는 바람에 නිසා
ඉදිරියෙන් පවසන ක්‍රියාව පසුව ඇතිවන සිදුවීමට හේතුව/ මූලය වනවිට භාවිතා කරන යෙදුමකි.
· 길이 너무 막히는 바람에 늦었어요.
පාරේ ගොඩක් තදබදය වැඩි නිසා ප්‍රමාද වුනා.
· 비가 오는 바람에 야유회가 취소되었어요.
වැස්ස නිසා චාරිකාව අවලංගු වුනා.



හොඳින් සවන්දී අනුගමනය කළා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 투안 씨는 프레스 작업을 하다가 다쳤어요?
   තුඅන් මහතා ප්රෙස්ස් වැඩ කරලා තුවාල වුනාද?
2. 프레스 작업을 할 때 특히 무엇을 조심해야 해요?
   ප්රෙස් වැඩ කරන විට වඩාත්ම ප්‍රවේසම් වියයුතු දෙය කුමක්ද?

정답 1. 아니요, 다칠 뻔했어요. 2. 손을 조심해야 해요.




어휘 1 වචන මාලාව 1 기계 작업 උපකරණ වලින් කරන වැඩ




උපකරණවල කුමන වර්ග තිබේද? එමෙන්ම එම උපකරණ භාවිත කරන ආකාරය සම්බන්ධ කුමන වචන තිබේදැයි සොයා බලමු



프레스 기계
මුද්‍රණ උපකරණය



구부리다
නවනවා



찍어 내다
එලියට ගන්නවා



선반 기계
ලියවන පට්ටලය



갈다
ඔපමට්ටම් කරනවා



도려내다
කඩනවා




파내다
හාරනවා



밀링 기계
ඇලි කැපීමේ යන්ත්‍රය




깎다
කපනවා



절단하다
කපා දමනවා/ ඉරනවා



용접하다
පාස්සනවා



조립하다
එකතුකරනවා



ඉහත සදහන් වචන මාලාව දෙස නොබලා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1. 기계에 맞는 작업을 〈보기〉에서 골라 넣으세요. උපකරණයට ගැලපෙන වාක්‍ය උදහරනවලින් තෝරා දමන්න.

프레스	선반	밀링	기타

보기

갈다 구부리다 깎다 조립하다
절단하다 도려내다 파내다 찍어 내다

정답 프레스: 구부리다, 찍어 내다 선반: 갈다, 도려내다, 파내다 밀링: 깎다, 절단하다 기타: 조립하다

-(으)ㄴ 적이 있다/없다

G48-1

'-(으)ㄴ 적이 있다/없다' යන්න ක්‍රියා පදයකට සම්බන්ධ කොට යම්කිසි කාර්යයක් සිදු කිරීමට අදාළ අත්දැකීමක් තිබේද නැද්ද යන්න ප්‍රකාශ කිරීමේදී හෝ විමසීමේදී යොදා ගැනේ.

자음 (ව්‍යඤ්ජන) → **-은 적이 있다/없다**	모음 (ස්වර), 자음 'ㄹ' (ව්‍යඤ්ජනය -ㄹ) → **- ㄴ 적이 있다/없다**
입다 → 입**은 적이 있다/없다**	보다 → 본 **적이 있다/없다** 살다 → 산 **적이 있다/없다**

- 가: 리한 씨, 이 선반 기계를 사용할 수 있어요? රිහාන් මහත්තයා, ලියවන පට්ටලය පාවිච්චි කරන්න පුළුවන්ද?
  나: 네, 전에 **사용한 적이 있어요**. ඔව්. මීට කලින් පාවිච්චි කරලා තියෙනවා.
- 가: 투안 씨는 이 작업복 처음 입어 보지요? තුඅන් මහත්තයා මේ රාජකාරි ඇඳුම මුලින්ම නේද අඳින්නේ?
  나: 아니요, 전에 **입은 적이 있어요**. නැහැ. කලින් ඇඳලා තියෙනවා.
- 가: 바루 씨, 제주도에 간 적이 있어요? පාරු මහත්තයා. ජේජු දූපතට ගිහිල්ලා තියෙනවද?
  나: 아니요, **가 본 적이 없어요**. නැහැ. ගිහිල්ලා නැහැ.



비교해 보세요 සංසන්දනය කර බලන්න

✔ '-(으)ㄴ 적이 있다' සහ '-았/었-'

'-(으)ㄴ 적이 있다' සහ '-았/었-' -.දෙකම අතීතයේ යමක් පවසන අතර '-(으)ㄴ 적이 있다' විශේෂ අත්දැකීමක් හෝ අතීතයේ සිදුකලත් දැන් සිදු නොකරන ක්‍රියාවක් දැක්වීමට භාවිත කරයි, '-았/었-' අතීතයේ සිදුවූ දෙයක් සහ මේ වන විට අවසන් වූ දෙයක් දැක්වීමට භාවිතා කරයි.

- 밥을 먹은 적이 있다.(X) 밥을 **먹었다**.(O)
- 혼자 해외 여행을 **한 적이 있다**.(O)



'-(으)ㄴ 적이 있다/없다' ව්‍යාකරණය ගැන අවබෝධ වුණා නේද? එසේනම් පින්තූරය දෙස බලමින් සංවාදය සම්පූර්ණ කරන්න.

2. 그림을 보고 '-(으)ㄴ 적이 있다/없다'를 사용해서 대화를 완성하세요.
'-(으)ㄴ 적이 있다/없다' පින්තූරය දෙස බලා භාවිතාකර දෙබස සම්පූර්ණ කරන්න.

1) ✕
가: 철근을 조립할 수 있어요? රිබාර් එක එකතු කරන්න පුලුවන්ද?
나: 아니요, ________________. නැහැ, කලින් එකතු කරලා නැහැ.

2) ○
가: 용접을 해 봤어요? වෙල්ඩින් කරලා තියනවද?
나: 네, ________________. ඔව්, වෑල්ඩින් කරලා තියනවා.

3) ○
가: 물건을 포장할 수 있어요? භාණ්ඩ අසුරන්න පුලුවන්ද?
나: 네, ________________. ඔව්, භාණ්ඩ අසුරලා තිබෙනවා.

정답 1) 조립한 적이 없어요 2) 용접한 적이 있어요 3) 포장한 적이 있어요



대화 2 සංවාදය 2

Track 149



රිහාන් මහතා වැඩකරන ගමන් තුවාල වුනා, තුවාන් මහතා හා මියෝන්ග් මහතා රිහාන් මහතාට කුමක් පවසනවද කියා දෙබසට දෙවරක් සවන් දී නැවත කියන්න.

리 한 앗, 뜨거워!
ආ පිච්චෙනවා.

투 안 어, 팔에 불꽃이 튀었어요. 어떡해! 리한 씨, 움직이지 말고 가만히 있어요. 저기, 미영 씨! 얼음 좀 빨리 가져다주세요.
ඔ, අත පිච්චිලා වගෙයි. මොකද කරන්නේ. රිහන් මහතා හෙලවෙන්නේ නැතුව ඔහොම ඉන්න. මියොං මහත්මිය අයිස් ටිකක් ඉක්මනට අරගෙන එන්න

> **가만히** නිකන්
> සෙලවෙන්නේ නැතිව හෝ කතා කරන්නේ නැතිව
> · 휴가 때 다리를 다쳐서 가만히 침대에 누워만 있었어요.
> නිවාඩු දවස්වල කකුල තුවාල වෙලා සෙලවෙන්නේ නැතිව ඇඳ උඩට වෙලා හිටියා.

미 영 여기 얼음이요. 우선 이걸로 진정시키고 병원부터 가야겠어요. 투안 씨, 빨리 가서 공장장님께 말씀 드리세요.
මෙන්න අයිස්, මුලින්ම මේකෙන් පාලනය කරලා ඉක්මනට රෝහලට යන්න ඕනේ, තුඅන් මහතා ඉක්මනට ගිහිල්ල කලමනාකරතුමාට කියන්න.

> **부터** ඉස්සෙරලා
> කුමන හෝ වැඩක් ආරම්භය මුල දක්වයි
> · 우리 밥부터 먹고 일을 시작할까요?
> බත් කාලා වැඩ පටන් ගමුද?
> · 청소부터 하고 빨래를 하는 게 좋겠어요.
> පිරිසුදු කරලා රෙදි සෝදමුද?

투 안 네, 그리고 용접기가 아직 뜨거우니까 미영 씨도 다치지 않도록 조심하세요.
ඔව්, ඒවගේම පාස්සන උපකරණය තවමත් රස්නේ නිසා මියොං මහත්මියත් තුවාල නොවෙන්න පරිස්සම් වෙන්න.



හොඳින් සවන්දී අනුගමනය කළා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 리한 씨는 어떻게 하다가 팔을 다쳤어요?
   තුඅන් මහතා කුමක් කිරීමේදීද අත තුවාල වුනේ?
2. 미영 씨는 투안 씨에게 무엇을 가져다주었어요?
   මියොං මහත්මිය තුඅන් මහතාට මොනවද ගෙනත් දුන්නේ?

정답 1. 팔에 불꽃이 튀었어요. 2. 얼음을 가져다주었어요.



어휘 2 වචන මාලාව 2 재해 විනාශය

වැඩකරන අතරතුර අනතුරක් වෙලා තිබෙනවද? අනතුරු හා සම්බන්ද වචන විමසා බලමු?



손가락이 잘리다
ඇඟිල්ල කැපෙනවා




손가락이 끼이다
ඇඟිල්ල හිරවෙනවා



손가락이 베이다
ඇඟිල්ල තැලෙනවා



손가락이 데다
ඇඟිල්ල පිච්චෙනවා



발이 깔리다
ඇත හිරවෙනවා



못에 찔리다
ඇණයට ඇනෙනවා



유리가 박히다
වීදුරුවට කැපෙනවා



화상을 입다
ගිනි ගන්නවා



찰과상을 입다
හම තුවාල වෙනවා



가스에 중독되다
ගෑස් වලට අහුවෙනවා





ඉහත ඉගෙන ගත් වචන නැවත මතක් කර ප්‍රශ්නවලට පිළිතුරු සපයා බලමුද?

1. 그림을 보고 맞는 말을 연결하세요. පින්තූරය බලා ගැලපෙන වචනය යා කරන්න.

①  ②  ③  ④  ⑤ 

㉠ 손가락이 데다 ㉡ 찰과상을 입다 ㉢ 못에 찔리다 ㉣ 손가락이 베이다 ㉤ 손가락이 잘리다

정답 ① ㉤ ② ㉢ ③ ㉡ ④ ㉠ ⑤ ㉣

문법 2 සංවාදය 2 −지 않도록 조심하다



'−지 않도록 조심하다' යන්න ක්‍රියා පදයකට සම්බන්ධ කර ඉදිරියේදී යම් කටයුත්තක් කරන විට යම් තත්ත්වයක් සිදු නොවන ලෙස ප්‍රවේශම් වීම සහ වගබලා ගැනීම යන අර්ථයෙන් යොදා ගැනේ.

· 가: 자, 그럼 작업을 시작해 볼까요? එහෙනම්, වැඩේ පටන් අරන් බලමුද?
  나: 뜨거우니까 화상을 **입지 않도록 조심하세요**. රස්නෙ නිසා පිළිස්සීමක් නැති වෙන ලෙස ප්‍රවේශම් වන්න.

· 가: 어, 여기 유리 조각 있네. ආ, මෙතන කැඩිච්ච වීදුරු කෑලි තියනවනේ.
  나: **밟지 않도록 조심해**. 얼른 치워야겠다. නොපෑගෙන්න ප්‍රවේශම් වන්න. ඉක්මනින්ම අස්කරන්න ඕනේ.


අසන්නා යම්කිසි ක්‍රියාවක් අනිවාර්යයෙන්ම ඉටුවීම බලාපොරොත්තුවෙන් උපදෙසක් දීමේදීත් '−도록 하다' යොදාගැනේ.

· 건강을 위해서 매일 운동하도록 하세요. සෞඛ්‍ය ගැන සිතා දිනපතා ව්‍යායාම කරන්න.



'−지 않도록 조심하다' ව්‍යාකරණය ගැන අවබෝධ වුණා නේද? පින්තූර දෙස බලා ඉගෙනගත් ව්‍යාකරණ භාවිතා කර කතා කරන්න.

2. 그림을 보고 '−지 않도록 조심하다'를 사용해서 말해 보세요.
පින්තූර බල'−지 않도록 조심하다' භාවිතා කොට සංවාදය සම්පූර්ණ කරන්න.

1)  ______________________.

2)  ______________________.

3)  ______________________.

정답 1) 손가락이 끼이지 않도록 조심하세요
2) 유리가 박히지 않도록 조심하세요
3) 가스에 중독되지 않도록 조심하세요

유용한 표현 වැදගත් විය හැකි ප්‍රකාශන

죽을 뻔했어요. මැරෙන්න ගියා.

가: 이 많은 짐을 혼자 다 옮겼어요? මේ ඔක්කොම බඩු තනියම අරන් ගියද?
나: 네, **죽을 뻔했어요**. ඔව් මැරෙන්න ගියා.



활동 ක්‍රියාකාරකම්

작업을 할 때는 무엇을 조심해야 할까요? 〈보기〉처럼 주의할 것을 알려주세요.
වැඩ කරන විට පරිස්සම් විය යුත්තේ කෙසේද? උදාහරණයේ දැක්වෙන ලෙස ප්‍රවේසම් විය යුතු දේවල් කියාලා දෙන්න.

보기 උදාහරණ

프레스 기계를 사용할 때는
손가락이 잘리지 않도록 조심하세요.
මුද්‍රණ උපකරණය භාවිතා කරන විට
ඇඟිලි කැපෙන්නේ නැති වෙන්න
ප්‍රවේසම් වෙන්න

1)

2)

3)

4)

정답 1) 망치로 못을 박을 때는 못에 찔리지 않도록 조심하세요.
2) 밴딩기로 포장할 때는 손가락이 끼이지 않도록 조심하세요.
3) 용접할 때는 화상을 입지 않도록 조심하세요.
4) 거푸집을 설치할 때는 찰과상을 입지 않도록 조심하세요.




정보 තොරතුරු

작업장 사고

වැඩපලේ අනතුරු

작업장 사고 වැඩපලේ අනතුරු




붕괴 사고
කඩාවැටීමෙන් වන අනතුරු



감전 사고
විදුලි සර වැදීමෙන් වන අනතුරු



추락 사고
වැටීමෙන් සිදුවන අනතුරු




누전 사고
විදුලි පරිපත නිසා සිදුවන අනතුරු



낙하 사고
වැටීමෙන් සිදුවන් අනතුරු



폭발 사고
පිපිරීමෙන් සිදුවන අනතුරු



화재 사고
ගින්නෙන් සිදුවන අනතුරු




가스 누출 사고
ගෑස් පිටවීමෙන් සිදුවන අනතුරු

사고 발생 시 필요한 것 අනතුරක් ඇතිවූවිට අවශ්‍යවන දේවල්



소화기
ගිනිනිවන උපකරණය



비상벨
අනතුරු ඇඟවීමේ බෙලෙක



비상구
හදිසි පිටවීමේ දොරටුව

소화기 사용 방법 ගිනි නිවන උපකරණය භාවිතාකරන ආකාරය

① 

안전핀을 뽑고
ආරක්ෂිත පින් එක ඉවත් කර

② 

호스를 불쪽으로 향하고
බටය ගින්දර තිබෙන දෙසට යොමුකර

③ 


손잡이를 강하게 움켜쥔다
අතින් අල්ලන කොටස හොඳින් තද කරන්න.



바람이 부는 방향에서 불에 접근
සුලන් හමන දිශාවෙන් ගින්දර පිවිසීම




앞쪽의 불부터 소화
ඉස්සරහ තිබෙන ගින්දරවල සිට නිවීම අරඹන්න




위에서 아래로 소화
ඉහල සිට පහලට ගිනි නිවන්න



충분히 많은 소화기를 한번에 사용
ඇති තරම් ගිනිනිවන උපකරණ එකවර භාවිතා කරන්න.



불씨가 남아있는지 확인
ගිනි පුපුරු තිබෙනවද පරීක්ෂා කර බලන්න



사용한 소화기는 다시 충전함
භාවිත කල ගිනි නිවන උපකරණය නැවත පුරවා තබන්න






අංක 1 පින්තූරය දෙස බලා ගැලපෙන වචනය තෝරන ප්‍රශ්නයයි, අංක 2 හා 3 එකිනෙකට ගැලපෙන වචනය තෝරන ප්‍රශ්නයි, ප්‍රශ්නවලට සවන් දීමට සවන්දීමට පෙර එක් වරක් පිළිතුරු කියවා බලන්න,

1. 다음 그림을 보고 알맞은 것을 고르십시오.
පහත පින්තූරය දෙස බලා ගැලපෙන පිළිතුර තෝරන්න.





① ② ③ ④

[2~3] 질문을 듣고 알맞은 대답을 고르십시오.
ප්‍රශ්නයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන්න.

2. ① 네, 할 거예요. ② 네, 하고 싶어요.
③ 네, 할 수 없어요. ④ 네, 한 적이 있어요.

3. ① 깁스를 하세요. ② 찜질을 하세요.
③ 밴드를 붙이세요. ④ 파스를 붙이세요.



4 සහ 5 පිරිමි පුද්ගලයාගේ කතාවට සවන්දී ගැලපෙන පිළිතුර තොරණ ප්‍රශ්නයයි, සවන්දීමට පෙර ප්‍රශ්න හා පිළිතුරු වල අන්තර්ගතය හොඳින් කියවා බලන්න.

[4~5] 하나의 이야기를 듣고 두 개의 질문에 대답하십시오.
එකම කතාවට සවන්දී ප්‍රශ්ණ දෙකටම පිළිතුරු සපයන්න.

4. 남자는 무슨 작업을 합니까? පිරිමි පුද්ගලයා කුමන රැකියාවක් කරනවද?

① 용접 ② 선반
③ 밀링 ④ 프레스

5. 사고를 줄이려면 어떻게 해야 합니까? අනතුරු අඩුකිරීමට නම් කුමක් කල යුතුද?

① 빨리 움직여야 해요. ② 자주 사용해 보면 돼요.
③ 다른 작업을 함께 해야 해요. ④ 작동 방법을 잘 알고 있어야 해요.



듣기 대본 ශ්‍රවණ පිටපත

1. ① 여: 갈아요. වෙනස් කරනවා. ② 여: 깎아요. අඩුකරනවා.
   ③ 여: 절단해요. කපනවා. ④ 여: 찍어 내요. ගන්නවා.
2. 남: 밀링 작업을 해 본 적이 있어요? වෙල්ඩිං වැඩ කරලා තිබෙනවද?
3. 남: 손가락이 베였어요. මගේ ඇඟිලි කැපුනා.

4-5. 남: 저는 공장에서 프레스 작업을 하고 있어요. 프레스 기계는 좀 위험하지만 작동하는 방법을 잘 알고, 안전하게 사용하면 사고를 줄일 수 있어요. 일할 때 딴생각을 하거나 안전 수칙을 지키지 않으면 크게 다칠 수 있으니까 조심해야 해요. 전에 저도 다친 적이 있는데요, 정말 한순간이었어요.

මම වැඩපොලේ මුද්‍රණ වැඩක් කරනවා. මුද්‍රණ උපකරණය අනතුරු දායක වුනත් ක්‍රියාකරවන ආකාරය හොඳින් දැනගෙන පරිස්සමට ක්‍රියාත්මක කරනවානම් අනතුරු අඩුකරන්න පුළුවන්. වැඩ කරන විට වෙන දේවල් සිතීම හෝ අනතුරු අඩුකරන උපදේශ අනුගමනය නොකලොත් ලොකුවට තුවාල වෙන්න පුළුවන් නිසා ප්‍රවේසම් විය යුතුය. මීට කලින් මටත් තුවාල වූ අවස්ථාවක් තිබුනා. තුවාල වෙන්න පොඩි වෙලාවයි යන්නේ.

정답 1. ③ 2. ④ 3. ③ 4. ④ 5. ④

확장 연습 තවදුරටත් වන අභ්‍යාස

L-48

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු තෝරන්න.

   다음 중 들은 내용과 같은 것은 무엇입니까?
   පහත සඳහන් දෑ අතරින් අන්තර්ගතය හා සමාන දේවල් තෝරන්න.

   ① 남자는 밴딩기를 점검하려고 합니다.
   ② 여자는 밴딩 작업을 모두 마쳤습니다.
   ③ 밴딩기는 전원을 켜고 점검을 해야 합니다.
   ④ 밴딩기가 뜨거우면 식힌 후에 점검해야 합니다.

확장 연습 듣기 대본 තවදුරටත් වන අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 남: 수피카 씨, 밴딩 작업은 끝났어요? සුපිකා මහත්මිය, පාර්සල් කරන වැඩේ ඉවරද?
   여: 아니요, 밴딩기 작동이 잘 안 돼서요. 지금 점검하려고 전원을 껐어요.
   පාර්සල් කරන යන්ත්‍රය හරියට ක්‍රියාත්මක වෙන්නේ නෑ. දැන් පරීක්ෂණ කටයුතු සඳහා යන්ත්‍රය ක්‍රියා විරහිත කරනවා.
   남: 밴딩기는 전원을 끈 후에도 뜨거우니까 좀 더 기다렸다가 점검하세요.
   පාර්සල් කරන යන්ත්‍රය ක්‍රියා විරහිත කලපසුවත් රස්නය නිසා තවත් වේලාවක් බලා සිට ඉන්පසු පරීක්ෂා කර බලන්න.

정답 1. ④



EPS-TOPIK 읽기 කියවීම



අංක 1 සහ 2 පින්තූරය දෙස බලා ගැලපෙන යෙදුම තොරන ප්‍රශ්න වේ, ඉහත ඉගෙනගත් වචන යලිත් මතක් කරගනිමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

[1~2] 다음 그림을 보고 맞는 문장을 고르십시오. පහත පින්තූර බලා ගැළපෙන වාක්‍යය තෝරන්න.

1. 

① 선반 기계예요. ② 밀링 기계예요.
③ 용접 기계예요. ④ 프레스 기계예요.

2. 

① 못에 찔렸어요. ② 화상을 입었어요.
③ 유리가 박혔어요. ④ 찰과상을 입었어요.



අංක 3 හා 4 ප්‍රශ්නයට ගැලපෙන යෙදුම තෝරන ප්‍රශ්න වේ, අංක 5 ලිපිය කියවා ප්‍රශ්නයට ගැලපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ.

[3~4] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

3. 프레스 기계로 같은 모양을 여러 개 __________ 수 있습니다.
මුද්‍රණ යන්ත්‍රයෙන් එකම හැඩයට කිහිපයක් කපන්න පුළුවන්.

① 깎을 ② 파낼 ③ 구부릴 ④ 찍어 낼

4. 작업을 하다가 __________ 것을 막기 위해서는 환기를 자주 해야 합니다.
වැඩ කරන අතර ගැස් වලට හුරුවීම වැළක්වීමට නිතරම වාතයට නිරාවරණය විය යුතුය.

① 찰과상을 입는 ② 유리가 박히는 ③ 손가락이 잘리는 ④ 가스에 중독되는

5. 다음 질문에 답하십시오. මීළඟට ගැටලුවට පිළිතුරු සපයන්න.

공장에는 여러 종류의 기계가 있습니다. 이런 기계 덕분에 일하는 것이 더 쉬워졌지만 위험한 기계도 많아서 손가락이 잘리거나 화상을 입는 등의 사고도 종종 발생하게 되었습니다. 일을 할 때는 항상 신경을 쓰고 사고를 당하지 않도록 조심해야 합니다.

වැඩපොළේ විවිධ ආකාරයේ යන්ත්‍ර තිබේ, මෙවැනි යන්ත්‍ර නිසා වැඩ පහසුවුනත් අනතුරුදායක යන්ත්‍රත් බහුල නිසා ඇඟිලි කැපීම හෝ පිලිස්සීම් වැනි අනතුරුත් ටික ටික ඇතිවෙනවා, වැඩ කරන විට සැමවිටම අවධානයෙන් අනතුරක් නොවීමට වගබලා ගතයුතුයි.

이 글에 대한 내용으로 맞는 것을 고르십시오. මෙමෙ ලිපියට අදාලව නිවැරදි යෙදුම් තෝරන්න.

① 공장에는 위험한 기계도 많이 있다. ② 사고가 나면 빨리 신고를 해야 한다.
③ 기계를 사용하면 일이 더 어려워진다. ④ 기계를 작동하기 전에 연습을 해야 한다.

정답 1. ① 2. ② 3. ④ 4. ④ 5. ①



확장 연습 තවදුරටත් වන අභ්‍යාස

[1~4] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

1. 발목을 삐어서 병원에 갔습니다. 병원에서 준 ________을/를 가지고 약국에서 약과 파스를 샀습니다.

   වළලුකර උලුක්කු වූ නිසා රෝහලට ගියා රෝහලේදී දුන් බෙහෙත් ලයිස්තුව රැගෙන ඔසුසැලට ගොස් ඖෂධ සහ පැලැස්තර මිලට ගත්තා.

   ① 이력서　② 증명서　③ 신청서　④ 처방전

2. 젖은 손으로 전기 기계나 전선을 만지면 안 됩니다. ________ 사고가 날 수 있습니다.

   තෙත සහිත අත් වලින් විදුලි යන්ත්‍ර හෝ විදුලි රැහැන් ඇල්ලීමෙන් වලකින්න. (විදුලි සැර වැදීම්) වැනි අනතුරු සිදු විය හැක.

   ① 붕괴　② 추락　③ 감전　④ 충돌

3. 작업 도구를 사용할 때에는 항상 주의해야 합니다. 특히 칼이나 절단기를 이용해서 물건을 ________ 때에는 손을 다치지 않도록 조심해야 합니다.

   වැඩ කරන මෙවලම් භාවිතා කිරීමේදී නිතරම ප්‍රවේසම් විය යුතුයි. විශේෂයෙන් පිහි සහ කැපෙන තල භාවිත කරමින් භාණ්ඩ (කැපීමේදී) අත තුවාල නොවන ලෙස ප්‍රවේසම්.

   ① 붙일　② 자를　③ 접을　④ 그릴

4. 소화기를 ________ 우선 안전핀을 뽑아야 합니다. 그 다음 호스를 불쪽으로 향하게 하고 손잡이를 움켜쥐면 됩니다.

   ගිනි නිවන යන්ත්‍රය (භාවිතා කිරීමට නම්), ප්‍රථමයෙන් ආරක්ෂිත කුර/ඇණය ඉවත් කළ යුතුය.

   ① 옮기려면　② 사용하려면　③ 옮기면서　④ 사용하면서

정답 1. ④ 2. ③ 3. ② 4. ②



발음 උච්චාරණය  P-24

හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.

'ㄷ, ㅌ' හල්කිරීමකට පසු පිටුපසින් 'ㅣ[i]' ස්වරය පැමිණෙන අවස්ථාවේ, 'ㄷ, ㅌ' අක්ෂර [ㅈ], [ㅊ] ලෙස උච්චාරණය කරයි.

(1) 굳이, 맏이, 미닫이, 해돋이　(2) 같이, 밭이, 낱낱이, 붙이다

(3) 같이 식사하러 갈까요?　(4) 여기에 우표를 붙이세요.

(5) 저는 우리 집의 맏이예요.　(6) 저는 올해 1월에 해돋이를 봤어요.



안전화를 안 신으면 다칠 수 있어요

ආරක්ෂිත සපත්තු පළඳින්නේ නැත්නම් තුවාල වෙන්න පුළුවන්

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

▫ අධ්‍යයන අරමුණු	අනතුරුදායක තත්වයන්ගෙන් වැළකීම, අනතුරුගැන අනතුරු හැඟවීම
▫ ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස්	-(으)ㄹ 수 있다, -기 때문에
▫ වචන භාවිතය සඳහා උපදෙස්	ආරක්ෂක උපකරණ, වැඩබිමේ සිදුවන අනතුරු
▫ සංස්කෘතික තොරතුරු	ශරීර කොටස් සහ ආරක්ෂිත උපකරණ



대화 1 සංවාදය 1

Track 151



පහත දැක්වෙන්නේ කළමණාකාරීතුමා සහ අදිත් මහතාගේ සංවාදයයි. කළමණාකාරීතුමා අදිත් මහතා ආරක්ෂිත උපකරණ සියල්ල පැළඳුවා දැයි පරීක්ෂා කරමින් සිටියි. ප්‍රථමයෙන්ම සංවාදයට දෙවරක් සවන් දී අනුගමනය කරන්න.

관리자 아딧 씨, 보호구 모두 착용했지요?
අදිත් මහත්මයා, ආරක්ෂක උපකරණ ඔක්කොම පැළඳගත්තා නේද?

아 딧 네, 안전모도 쓰고 안전장갑도 꼈어요.
ඔව්, ආරක්ෂිත හිස්වැසුම දාල ආරක්ෂිත අත් මේස් දාගත්තා.

관리자 좋아요. 그런데 안전모 끈은 조금 더 조이는 게 좋겠어요. 그리고 오늘은 높은 곳에서 작업해야 하니까 안전대도 꼭 착용하세요.
හොඳයි, ඒ වුනත් ආරක්ෂක හිස් වැස්මේ පටිය ටිකක් තව තදට තියෙන එක හොඳයි, ඒ වගේම අද ඉහළ ස්ථානයක වැඩ කලයුතු නිසා ආරක්ෂක පටිත් අනිවාරයෙන්ම පළඳින්න.

아 딧 네, 알겠습니다. ඔව්, තේරුණා.

관리자 어! 그런데 안전화는 왜 안 신었어요? 안전화를 안 신으면 발을 다칠 수 있어요.
ඕ, නමුත් ඇයි ආරක්ෂක සපත්තු පැළඳුවේ නැත්තේ? ආරක්ෂක සපත්තු පළඳින්නේ නැත්නම් කකුල තුවාල වෙන්න පුළුවන්.

아 딧 어! 깜빡했네요. 바로 갈아 신을게요.
ඕ, අමතක වුණානේ, ඉක්මනින් මාරු කරලා දාගන්නම්.

> **깜빡하다** එක් වර අමතක වුවා
> මතකය නැති වීම හෝ එක්වර සිහියට නොපැමිණිම
> · 보호구를 챙기는 것을 깜빡했어요.
> ආරක්ෂක උපකරණ පැළඳීමට අමතක වුවා.

> **갈아 신다** මාරුකර පැළඳීම
> වෙනත් පාවහන් යුගලයක් මාරු කර පැළඳීමයි. ඇඳුමක් මාරු කර පැළඳීම 갈아입다 ගමන් කිරීමේ ක්‍රමය මාරු කිරීමේදී 갈아타다 යන්න භාවිතා කරයි.
> · 산책할 때는 편한 신발로 갈아 신으세요.
> ඔබ ඇවිදින විට, සැහැල්ලු සපත්තු වලට මාරු කර පළඳින්න.



හොඳින් සවන්දී අනුගමනය කලාද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 아딧 씨는 무슨 보호구를 착용해야 해요? අදිත් කිනම් ආරක්ෂිත උපකරණ පැළඳිය යුතුද?
2. 아딧 씨는 왜 안전화를 안 신었어요? අදිත් ඇයි ආරක්ෂිත සපත්තු පැළඳුවේ නැත්තේ?

정답 1. 안전모, 안전장갑, 안전대를 착용해야 해요. 2. 안전화를 신는 것을 깜빡했어요.



어휘 1 වචන මාලාව 1 보호구 ආරක්ෂිත උපකරණ

ආරක්ෂිත උපකරණ කිනම් දෑ තිබේද? ආරක්ෂිත උපකරණ වර්ග පිළිබඳ දැන ගනිමුද?



착용하다 පළඳිනවා

보호복 ආරක්ෂිත ඇඳුම

안전모 ආරක්ෂිත හිස්වැසුම

보안면 ආරක්ෂිත මුහුණු ආවරණය

용접면 වෙල්ඩින් මුහුණු ආවරණය

보안경 ආරක්ෂිත ඇස් කණ්නාඩි

마스크 මුඛ ආවරණය

귀마개 කන් ආවරණ ඇබය

귀덮개 ආරක්ෂිත කන් ආවරණය

안전대 ආරක්ෂිත පටිය



목장갑 රෙදි අත් ආවරණය



안전장갑 ආරක්ෂිත රබර් අත් ආවරණය



안전화 ආරක්ෂිත සපත්තු



안전장화 ආරක්ෂිත බූට් සපත්තු



ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න උත්සහ කරන්න.

1. 사진을 보고 알맞은 말을 연결하세요. පින්තූර බලා නිවැරදි වචනය සමග යා කරන්න.



① ② ③ ④ ⑤

㉠ 귀마개 ㉡ 보호복 ㉢ 마스크 ㉣ 안전장화 ㉤ 목장갑

정답 ① ㉡ ② ㉠ ③ ㉢ ④ ㉤ ⑤ ㉣

문법 1 සංවාදය 1　-(으)ㄹ 수 있다



ක්‍රියා පදයකට සම්බන්ධ කර යම්කිසි ක්‍රියාවක් සිදුවීමට ඇති හැකියාව මින් අදහස් කෙරේ. අනෙක් පසට දැනුම පිළිබඳ විමසීමේදී ද යොදාගත හැක.

자음 (ව්‍යඤ්ජන) → **-을 수 있다**	모음 (ස්වර), 자음 'ㄹ' (ව්‍යඤ්ජනය -ㄹ) → **-ㄹ 수 있다**
늦다 → 늦**을 수 있다**	다치다 → 다칠 **수 있다**
입다 → 입**을 수 있다**	만들다 → 만들 **수 있다**

- 가: 택시를 타고 갈까요? ටැක්සි එකක නැගලා යමුද?
  나: 지금 차가 막히는 시간이라서 택시를 타면 더 **늦을 수 있어요**.
  දැන් වාහන තදබද වෙලාව නිසා ටැක්සි එකක නැගලා ගියොත් තව ප්‍රමාද වෙන්න පුළුවන්.
- 가: 보안경을 안 쓰면 눈을 **다칠 수 있어요**.
  ආරක්ෂක උපැස් යුවලක් පාවිච්චි නොකළහොත් ඇස් තුවාල වෙන්න පුළුවන්.
  나: 네, 알겠습니다. 꼭 쓸게요. ඔව්. තේරුණා. අනිවාර්යයෙන්ම පාවිච්චි කරන්නම්.
- 가: 용접면을 꼭 써야 돼요? පෑස්සුම් මුහුණක් අනිවාර්යයෙන්ම පාවිච්චි කරන්න ඕනෙද?
  나: 그럼요. 얼굴에 화상을 **입을 수 있어요**. ඔව්. මුහුණ පිළිස්සෙන්න පුළුවන්.



대조적 정보 වෙනත් තොරතුරු

යම් කාර්යයක් කිරීමට ඇති හැකියාව ප්‍රකාශ කිරීමේදී සිංහල භාෂාවෙන් 'ටයික්වොන්ඩො පුළුවන්.' යන්නෙහි 'පුළුවන්' යන්න යොදාගෙන 'හැකියාව ඇත'යි අර්ථ ගන්වන නමුත් කොරියානු භාෂාවෙහි 'හැකියාව ඇත' යන්න පැහැදිලි කිරීමට '-(으)ㄹ 수 있다/없다' වාක්‍ය රටාව යොදාගනු ලැබේ.

- 그릇이 **뜨거울 수 있으니까** 조심하세요. භාජනය උණුසුම් විය හැකි නිසා ප්‍රවේසම් වන්න,



'-(으)ㄹ 수 있다' ව්‍යාකරණය ගැන අවබෝධ වුණා නේද? එසේනම් පින්තූරය බලා සංවාදය සම්පූර්ණ කරන්න.

2. 사진을 보고 '-(으)ㄹ 수 있다'를 사용해서 대화를 완성하세요.
ඡායාරූපය බල'-(으)ㄹ 수 있다' භාවිතා කර සංවාදය සම්පූර්ණ කරන්න.

1) 
귀를 다치다

가: 귀마개를 꼭 해야 해요?
ආරක්ෂිත කන් ආවරණ ඇබය අනිවාර්යයෙන්ම පැළඳිය යුතුද?
나: 네, 귀마개를 안 하면 ________________.
ඔව්, කන් ආවරණ ඇබය පැළඳුවේ නැතිනම් (කනට හානි වීමට ඉඩ ඇත).

2) 
손을 다치다

가: 안전장갑을 꼭 해야 해요? ආරක්ෂිත රබර් අත්මේස් අනිවාරයෙන්ම පැළඳිය යුතුද?
나: 네, 안전장갑을 안 끼면 ________________.
ඔව්, ආරක්ෂිත රබර් අත්මේස් පැළඳුවේ නැතිනම් (අතට හානි වීමට ඉඩ ඇත).

3) 
발을 다치다

가: 안전화를 꼭 신어야 해요? ආරක්ෂිත සපත්තු අනිවාරයෙන්ම පැළඳිය යුතුද?
나: 네, 안전화를 안 신으면 ________________.
ඔව්, ආරක්ෂිත සපත්තු පැළඳුවේ නැතිනම් (කකුලට හානි වීමට ඉඩ ඇත).

정답 1) 귀를 다칠 수 있어요 2) 손을 다칠 수 있어요 3) 발을 다칠 수 있어요



대화 2 සංවාදය 2

Track 152



ජිහුන් මහතා තුආන් මහතාට අනතුරු විය හැකි සිද්ධීන් පිළිබඳ පවසමින් සිටියි. පුද්ගලයින් දෙදෙනා මොනවගේ දෑ කතා කරමින් සිටිද? සංවාදයට දෙවරක් සවන් දෙන්න.

지 훈 어! 투안 씨, 장갑을 끼고 밀링 작업을 하면 안 돼요.
ඕ, තුආන් මහත්මයා, අත් මේස් දාගෙන ඇලි කැපීමේ වැඩ කරන්න එපා.

투 안 네? 공장장님이 작업을 할 때는 항상 장갑을 끼라고 하셨는데요.
ඔව්, මැනේජර් මහත්මයා වැඩ කරන විට නිතරම අත් මේස් පළඳින්න කියලනේ කිව්වේ.

지 훈 그렇지만 밀링 작업을 할 때는 장갑이 기계에 감길 수 있기 때문에 맨손으로 해야 돼요.
එහෙම වුනත් ඇලි කැපීමේ වැඩ කරන විට අත්මේස් යන්ත්‍රයේ එතෙන්න පුළුවන් නිසා හිස් අතින් කල යුතුයි,

투 안 아, 그러네요. 얼른 빨게요.
ආ, එහෙමද. ඉක්මනින් ගලවන්නම්.

지 훈 그리고 작업하는 동안 파편이 튈 수 있으니까 보안경도 잊지 말고요.
ඒ වගේම වැඩ කරන කාලය තුළ කුඩා කැබලි විසිවෙන්න පුළුවන් නිසා ආරක්ෂිත ඇස් ආවරණය පළඳින්නත් අමතක කරන්න එපා.

투 안 알겠어요, 지훈 씨.
තේරුණා, ජිහුන් මහත්මයා.

맨손 කිසිවක් නොපැළඳි අත
කිසිවක් නොපැළඳි අත යන්න අදහස් වේ
· 가: 어머, 화상을 입었어요?
අයියෝ, අත පිච්චුණාද?
나: 네, 맨손으로 뜨거운 냄비를 잡아서요.
ඔව්, නිකන් අතින් රස්නේ භාජනයක් ඇල්ලුව නිසයි.

얼른 ඇන්මම
වේලාවක් ගත් නොවී එම වේලාවෙම
· 얼른 일어나서 출근 준비를 하세요.
ඇන්ම, නැගිටලා වැඩට යන්න සූදානම් වෙන්න.
· 사장님이 들어오시자 직원들은 얼른 자리에서 일어났다.
ප්‍රධානීතුමා පැමිණි විට කාර්ය මණ්ඩලය ඉක්මණින් නැගිටුණා.



මෙවර ජිහුන් මහතා සහ තුආන් මහතා ලෙස සංවාදය අනුගමනය කරන්න. හොඳින් සවන් දී අනුගමනය කළාද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 지훈 씨는 투안 씨에게 무엇을 하면 안 된다고 했어요?
ජිහුන් මහතා තුආන් මහතාට කුමක් ද නොකල යුතුදැයි පැවසුවේ?

2. 밀링 작업을 할 때는 왜 맨손으로 해야 해요?
කපන වැඩ කරද්දී ඇයි නිකන් අතින් කල යුත්තේ?

정답 1. 장갑을 끼고 밀링 작업을 하면 안 된다고 했어요. 2. 장갑이 기계에 감길 수 있어서 위험해요.



어휘 2 වචන මාලාව 2 작업장 사고 වැඩබිමේදී සිදුවන අනතුරු

රැකියා ස්ථානයේදී සිදුවිය හැකි අනතුරු මොනවාද? අනතුරු සම්බන්ධයෙන් වන වචන මොනවාදැයි දැන ගනිමුද?



부딪히다/충돌하다
එකිනෙකා ගැටෙනවා



넘어지다
ඇද වැටෙනවා



미끄러지다
ලිස්සනවා



떨어지다/추락하다
ඉහළ සිට ඇද වැටෙනවා



구덩이에 빠지다
වලකට වැටෙනවා



파편이 튀다
කැබලි විසි වෙනවා



맞다
වදිනවා/ගැටෙනවා



기계에 감기다
යන්ත්‍රයට අහුවෙනවා




감전되다
විදුලි සැර වදිනවා



가스가 새다/누출되다
ගෑස් ලීක් වෙනවා



폭발하다
පුපුරනවා



불이 나다
ගිණි ගන්නවා



ඔබ ඉහත ඉගෙනගත් වචන සිහි කරමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


1. 그림을 보고 맞는 말을 연결하세요. පින්තූරය බලා ගැලපෙන වචනය හා යා කරන්න.

① ② ③ ④ ⑤

㉠ 폭발하다 ㉡ 추락하다 ㉢ 부딪히다 ㉣ 미끄러지다 ㉤ 넘어지다

정답 ① ㉡ ② ㉠ ③ ㉢ ④ ㉤ ⑤ ㉣

문법 2 සංවාදය 2 -기 때문에



ක්‍රියා පදයකට හෝ විශේෂණ පදයකට සම්බන්ධ වී යම් කාර්යයක් සිදුවීමට බලපෑ හේතුව සහ කාරණාව පැහැදිලි කරයි. නාම පදයක් යෙදෙන විට නාම පදය 'N 때문에' යොදාගනී.

· 작업을 할 때는 **감전될 수 있기 때문에** 안전장갑을 껴야 합니다.
  වැඩ කරන විට විදුලිසැර වදින්න පුළුවන් නිසා ආරක්ෂාකාරී අත්වැසුම් පැළඳිය යුතුයි.

· 바닥이 미끄러워서 쉽게 **넘어질 수 있기 때문에** 항상 주의해야 합니다.
  පොළොව ලිස්සන සුළු නිසා ලෙහෙසියෙන් වැටෙන්න පුළුවන් නිසා නිතරම ප්‍රවේශම් විය යුතුයි.

· 어제는 **피곤했기 때문에** 집에서 쉬었어요. ඊයේ මහන්සි වුන නිසා ගෙදර ඉඳගෙන විවේක ගත්තා.

'නාම පදය+이기 때문에' 'විශේෂණ පදය/ක්‍රියා පදය + 때문에' හේතු ප්‍රකාශ කිරීමේදී '–아서/어서' ව්‍යාකරණයට වඩා මෙම ව්‍යාකරණය තරමක් බැරෑරුම් හෝ සෘණාත්මක ප්‍රකාශන කිරීමේදී භාවිතා කරයි. අතීත කාලයෙන් ප්‍රකාශ කිරීමේදී '–았/었기 때문에' යොදනු ඇත.



비교해 보세요 සංසන්දනය කර බලන්න

✓ '–기 때문에' සහ '–아서/어서'

'–기 때문에' සහ '–아서/어서' යන දෙකම කිසියම් දෙයක හේතුව පිලිබිඹු කිරීමේදී භාවිතා වේ, පවසන පුද්ගලයාගේ හැඟීම් සහ තත්වය පිළිබඳ හේතුවක් අර්ථ දක්වන අවස්ථාවේදී බොහෝ විට '–아서/어서' භාවිතා කරයි. එමෙන්ම '–기 때문에' යන්න අතීත කාල '–았/었–' සමග සම්බන්ධ කල හැකි නමුත්, '–아서/어서' යන්න සම්බන්ධ කල නොහැක.

· 오랜만에 친구를 만나기 때문에 기뻐요. (X)
  오랜만에 친구를 **만나서** 기뻐요. (O)

· 고향에서 부모님이 **오셨기 때문에** 오늘은 못 만나요. (O)
  고향에서 부모님이 오셨어서 오늘은 못 만나요. (X)



'–기 때문에' ව්‍යාකරණය ගැන අවබෝධ වුණා නේද? එසේනම් උදාහරණය පරිදි සංවාදය සම්පූර්ණ කරන්න.

2. '–기 때문에'를 사용해서 대화를 완성하세요. '-기 때문에' භාවිතා කරමින් සංවාදය සම්පූර්ණ කරන්න.

1) 가: 높은 곳에서 작업할 때는 떨어지는 사고가 날 수 있습니다.
   ඉහළ ස්ථාන වල වැඩ කරන විට වැටීමේ අනතුරු වෙන්න පුළුවන.
   나: ____________________ 괜찮을 겁니다. [안전대를 맸다 ආරක්ෂිත පටි පළඳින්න]

2) 가: 지금 안에서 작업할 수 없어요? දැන් ඇතුලේ වැඩ නැද්ද?
   나: ____________________ 지금은 들어갈 수 없어요. [바닥이 미끄럽다 බිම ලිස්සනවා]

3) 가: 밀링 작업을 할 때는 ____________________ 보안경을 꼭 써야 해요. [파편이 튀다 කැබලි විසිවෙනවා]
   කපන වැඩ කරන විට (කැබලි කිරීම නිසා) ආරක්ෂිත ඇස් කණ්ණාඩි පැළඳිය යුතුය.
   나: 네, 알겠습니다. ඔව්, තේරෙනවා.

정답 1) 안전대를 맸기 때문에 2) 바닥이 미끄럽기 때문에 3) 파편이 튀기 때문에

활동 ක්‍රියාකාරකම්

위험한 상황에 대해 말할 수 있어요? 〈보기〉처럼 이야기해 보세요.

අනතුරුදායක අවස්ථාවන් ගැන කියන්න පුළුවන්ද? උදාහරණය පරිදි කතාකර බලන්න.

보기 උදාහරණ




바닥이 미끄러우면
넘어질 수 있어요. 조심하세요.
බිම ලිස්සලා වැටෙන්න පුළුවන්,
ප්‍රවේසම්.



바닥이 미끄럽다, 넘어지다
බිම ලිස්සනවා වැටෙනවා

1)




높은 곳에서 작업을 하다, 추락하다
උස් ස්ථානයක වැඩ කරනවා,
ඇදවැටෙනවා



2)




파편이 튀다, 화상을 입다
කැබලි විසිවෙනවා, පිළිස්සෙනවා



3)



안전장갑을 끼지 않다, 감전되다
ආරක්ෂිත අත් මේස් දාන්නේ නැහැ, විදුලි
සැර වැදෙනවා



4)



안전화를 신지 않다, 발을 다치다
ආරක්ෂිත පාවහන් පළඳින්නේ නැහැ,
කකුල තුවාල වෙනවා



정답 1) 높은 곳에서 작업을 하면 추락할 수 있어요. 조심하세요. 2) 파편이 튀면 화상을 입을 수 있어요. 조심하세요.
3) 안전장갑을 끼지 않으면 감전될 수 있어요. 조심하세요. 4) 안전화를 신지 않으면 발을 다칠 수 있어요. 조심하세요.



신체 기관과 보호구

ශරීර අංග හා ආරක්ෂිත උපකරණ

✚신체와 위험요소 ශරීරය හා අනතුරුදායක කොටස



✚보호구의 종류 ආරක්ෂිත උපකරණ වර්ග

산업안전보건법에서 정하고 있는 보호구는 다음과 같습니다. වෘත්තීය ආරක්ෂණය හා සෞඛ්‍ය තත්ත්ව පාලන අධිකාරියේ නිර්දේශිත ආරක්ෂිත උපකරණ පහත දැක්වේ.







අංක 1 අංක 2 ප්‍රශ්නවලට සවන්දී ගැලපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ. ප්‍රශ්නයට සවන්දීමට පෙර කිනම් පින්තූර ඇත්දැයි බලමු.

[1~2] 잘 듣고 내용과 관계있는 그림을 고르십시오.
හොඳින් සවන් දී විස්තරය හා සම්බන්ධයක් ඇති පින්තූරය තෝරන්න.

Track 153

1. ① ② ③ ④

2. ① ② ③ ④



අංක 3 සහ අංක 4න් දැක්වෙන්නේ නිවැරදි පිළිතුර තෝරන ප්‍රශ්නයි. අංක 5 සංවාදයට සවන් දී නිවැරදි පිළිතුරු තෝරන ප්‍රශ්නයකි. ප්‍රශ්නය ඇසීමට පෙර පිළිතුර එක් වරක් කියවා බලන්න.

[3~4] 질문을 듣고 알맞은 대답을 고르십시오.
ප්‍රශ්නයට සවන් දී වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

3. ① 벌써 확인했습니다. ② 얼른 쓰고 오겠습니다.
③ 빨리 갈아 신으십시오. ④ 이쪽으로 들어가면 됩니다.

4. ① 얼른 가서 찾아보세요. ② 장갑을 새로 샀어요.
③ 깜빡했어요. 지금 낄게요. ④ 병원에 가야 될 거 같아요.

5. 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오.
සංවාදය අසා ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුරු තෝරන්න.

남자가 해야 할 일이 아닌 것은 무엇입니까? පිරිමියා කළ යුතු වැඩක් නොවන දෙය කුමක්ද?

① 청소하기 ② 귀마개 하기
③ 마스크 쓰기 ④ 플러그 빼기



듣기 대본 ශ්‍රවණ පිටපත

1. 여: 떨어져서 다쳤어요. වැටිලා තුවාල වුණා.
2. 여: 보안경을 썼어요. ආරක්ෂිත කණ්නාඩි පැළඳුවා.
3. 여: 잠깐만요. 여기는 안전모가 없으면 들어갈 수 없습니다.
   පොඩ්ඩක්. ඉන්න මෙතන ආරක්ෂිත හිස් වැසුමක් නොමැතිව ඇතුළත් විය නොහැකියි.
4. 남: 어! 안전장갑을 안 꼈네요. 안전장갑을 안 끼면 손을 다칠 수 있어요.
   ආ. ආරක්ෂිත අත් මේස් පැළඳුවේ නැද්ද? පැළඳුවේ නැත්නම් අත තුවාල වෙන්න පුළුවන්.
5. 여 왜 귀마개를 안 하셨어요? 시끄럽지 않아요?
   ඇයි ආරක්ෂිත කන් ආවරණය පැළඳුවේ නැත්තේ? ශබ්දය වැඩි නැද්ද?

   남: 시끄럽지만 귀마개를 하면 불편해서요.
   ශබ්දය වැඩි වුනත් ආරක්ෂිත කන් ආවරණය පැළඳුවාම අපහසුයි.

   여: 그래도 여긴 소음이 심하기 때문에 귀마개를 꼭 해야 돼요. 그리고 작업장에는 먼지가 많으니까 마스크도 쓰는 게 좋아요.
   ඒ වුණත් මෙතන ශබ්ද වැඩි නිසා ආරක්ෂිත කන් ආවරණය අනිවාර්යයෙන්ම පළඳින්න. ඒ වගේම වැඩබිමේදී දූවිල්ල වැඩි නිසා මුහුණු ආවරණය පලඳින එකත් හොඳයි.

   남: 네, 그럴게요. හා, එහෙම කරන්නම්.

   여: 아! 작업이 끝난 후에는 기계의 플러그도 빼서 정리해 놓으세요.
   ආ..වැඩ ඉවර වෙලා යන්ත්‍රයේ කොටස් ගලවා පිළිවෙලක් කරන්න.

정답 1. ① 2. ② 3. ② 4. ③ 5. ①

확장 연습 තවදුරටත් වන අභ්‍යාස L-49

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු තෝරන්න.

   남자가 작업장에 가는 이유는 무엇입니까? පිරිමි පුද්ගලයා වැඩ බිමට යන හේතුව කුමක්ද?

   ① 안전모가 없어져서　② 안전대가 필요해서
   ③ 안전복을 챙겨야 해서　④ 안전화를 신어야 해서

확장 연습 듣기 대본 තවදුරටත් වන අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 여: 아딧 씨, 안전복 모두 챙겨 입었죠? අදිත් මහත්මයා, ආරක්ෂක උපකරණ ඔක්කොම පැළඳගත්තා නේද?

   남: 네, 오늘은 높은 곳에서 작업한다고 해서 안전대도 착용했어요. 안전모도 챙겼고요.
   ඔව්, අද උස් තැනක වැඩ කරන නිසා ආරක්ෂිත පටිය පැළඳගත්තා. ආරක්ෂක උපකරණ ඔක්කොම පැළඳගත්තා.

   여: 좋아요. 어! 그런데 안전화는 왜 안 신었어요?
   හොඳයි, ඒ වුණත් ආරක්ෂිත සපත්තු ඇයි පැළඳුවේ නැත්තේ?

   남: 아, 깜빡했어요. 작업장에 가서 안전화로 갈아 신고 올게요.
   ආනේ අමතක උනා වැඩපොලට ගිහින් ආරක්ෂිත සපත්තු මාරුකර පළඳින්න.

정답 1. ④



EPS-TOPIK 읽기 කියවීම



අංක 1 සහ අංක 2 පින්තූර බලා ගැලපෙන වාක්‍ය හෝ වචනය තෝරන ප්‍රශ්න වේ. ඉගෙන ගත් දේ මතක් කරමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

[1~2] 다음 그림을 보고 맞는 단어나 문장을 고르십시오.
පහත පින්තූර බලා ගැලපෙන වචනය හෝ වාක්‍යය තෝරන්න.

1. 

① 마스크 ② 보호복
③ 안전모 ④ 용접면

2. 

① 감전될 수 있습니다. ② 넘어질 수 있습니다.
③ 부딪힐 수 있습니다. ④ 추락할 수 있습니다.



අංක 3 සහ අංක 4 නිවැරදි වචනය තෝරන ප්‍රශ්න වේ. අංක 5 ආරක්ෂිත ක්‍රම පිළිබඳ නිවේදනය කියවා පිළිතුරු සොයන ප්‍රශ්නයකි.

[3~4] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

3. 소음이 심한 곳에서 작업을 할 때는 ___________을/를 껴야 합니다.
ශබ්දය අධික ස්ථානයක වැඩ කරන විට (ආරක්ෂිත කන් ආවරණය) පැළඳිය යුතුයි.

① 귀마개 ② 목장갑 ③ 보안경 ④ 안전장화

4. 높은 곳에서 작업을 할 때는 아래로 떨어질 위험이 있습니다. 그러므로 반드시 ___________ 을/를 매고 일을 해야 합니다.
ඉහළ ස්ථානවල වැඩ කරන විට වැටීමේ අවදානමක් තිබේ. එමනිසා අනිවාර්යයෙන්ම ආරක්ෂිත පටිය පළඳා වැඩ කල යුතුයි.




① 보안면 ② 안전대 ③ 안전화 ④ 안전장갑

5. 다음 질문에 답하십시오. පහත ගැටලුවට පිළිතුරු සපයන්න.

〈선반 작업 주의 사항〉 ලියවන් පට්ටල් වැඩ
1. 옷이나 머리카락이 기계에 감기지 않도록 작업복을 입고 모자를 쓰십시오.
2. 파편이 눈에 들어갈 수 있기 때문에 보안경도 반드시 착용해야 합니다.
3. 장갑이 기계에 감겨서 사고가 날 수 있으니까 맨손으로 작업하십시오.

ඇඳුම් වල හෝ කොණ්ඩයේ යන්ත්‍ර සූත්‍ර ගැටෙන්නේ නැති වන්න ආරක්ෂිත ඇඳුම් ඇඳලා හිස් වැසුම් පළඳින්න.
කැබලි ඇසට යන්න පුළුවන් නිසා ආරක්ෂිත කණ්නාඩි අනිවාර්යයෙන්ම පැළඳිය යුතුයි.
අත් මේස් යන්ත්‍ර සූත්‍ර වල දැවටී අනතුරු වෙන්න පුළුවන් නිසා හිස් අතින් වැඩ කරන්න.

위 글과 관계가 없는 그림을 고르십시오. ඉහත ඡේදය හා සම්බන්දයක් නැති පින්තූරය තෝරන්න.

① 
② 
③ 
④ 

정답 1. ④ 2. ① 3. ① 4. ② 5. ③



확장 연습 තවදුරටත් වන අභ්‍යාස

[1~3] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

1. 작업을 할 때는 ________ 조심해야 합니다. 조심하지 않으면 언제 사고가 날지 모르기 때문입니다.

   ඔබ වැඩ කරන (සෑම විටම) ප්‍රවේශම් විය යුතුයි. ඔබ පරෙස්සම් නොවේ නම්, කුමන අවස්ථාවක හෝ ඔබට අනතුරක් සිදුවිය හැකි බැවිනි.

   ① 일찍 ② 다시
   ③ 항상 ④ 직접

2. 전기 작업을 할 때에는 안전장갑을 꼭 챙겨야 합니다. 안전장갑을 ________ 감전될 수 있습니다.

   විදුලියෙන් වැඩ කරන විට, ආරක්ෂක අත්වැසුම් අනිවාර්යෙන් පැළඳිය යුතුමයි. ආරක්ෂිත අත් මේස් (පැළඳුවේ නැත්නම්) විදුලි සැර වදින්නට පුළුවන්.

   ① 끼지 않으면 ② 신지 않으면
   ③ 끼기 때문에 ④ 신기 때문에


3. 밀링 작업을 할 때는 파편이 눈에 들어갈 수 있습니다. 그러므로 보안경을 반드시 ________.

   කපන වැඩ වලදී කැබලි ඇසේ යන්න පුළුවන්, එම නිසා ආරක්ෂිත ඇස් ආවරණය අනිවාර්යෙන් (පැළඳිය යුතුමය).

   ① 써야 됩니다 ② 입어야 됩니다
   ③ 쓴 적이 있습니다 ④ 입은 적이 있습니다

정답 1. ③ 2. ① 3. ①



발음 උච්චාරණය  P-25

හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.

ව්‍යඤ්ජන 'ㅂ', 'ㄷ', 'ㄱ', 'ㅈ' ඉදිරියෙන් හෝ පිටුපසින් 'ㅎ' පැමිණෙන විට, එකින් එක මහප්‍රාණ [ㅍ], [ㅌ], [ㅋ], [ㅊ] ලෙස උච්චාරණය කරයි.

(1) 좋다, 넣고, 쌓지
(2) 축하, 입학, 백화점
(3) 생일 축하합니다.
(4) 한국어 수업은 9시에 시작해요.



열심히 해 준 덕분이에요


මහන්සියෙන් කරල දෙන නිසා

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

▫ අධ්‍යයන අරමුණු	වැඩ අගය කිරීම / සෞඛ්‍ය ගැන කතා කිරීම
▫ ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස්	-(으)ㄴ 덕분에, -기로 하다
▫ වචන භාවිතය සඳහා උපදෙස්	ආරක්ෂිත ක්‍රියාමාර්ග / සෞඛ්‍ය ප්‍රවර්ධනය
▫ සංස්කෘතික තොරතුරු	සෞඛ්‍ය පවත්වා ගැනීම උදෙසා ඇදීමේ ව්‍යායාම



대화 1 සංවාදය 1





මොනිකා මහත්මිය සුභ දෙයක් වුණා. සුභ දෙය කුමක්දැයි ප්‍රථමයෙන්ම සංවාදයට දෙවරක් සවන් දී අනුගමනය කරන්න.

사장님 어서 와요, 모니카 씨. 여기 좀 앉아요. 차 한잔할래요?
ආයුබෝවන් එන්න මොනිකා මහත්මිය, මෙහෙන් ටිකක් වාඩි වෙන්න. තේ කෝප්පයක් බොමුද?

모니카 아니요, 괜찮아요. නැහැ, කමක් නැහැ.

사장님 모니카 씨, 내일이 근로자의 날인 거 알죠? 이번 근로자의 날을 기념해서 우수 사원을 추천받았는데 모니카 씨가 뽑혔어요.
මොනිකා මහත්මිය, හෙට කම්කරු දිනය කියලා දන්නවාද? මෙවර කම්කරු දිනය සමරන නිසා දක්ෂම සේවකයා ගැන නිර්දේශ ලබාගත්තාතා, මේපාර මොනිකා මහත්මියව තමයි තේරුණේ.

모니카 네? 정말요? ඔව්? ඇත්තටම?

사장님 일도 잘하고 작업장 점검도 아주 꼼꼼히 한다고 들었어요. 모니카 씨가 열심히 해 준 덕분에 일이 더 편해졌어요. 정말 고마워요. 이건 감사 선물이에요.
වැඩත් හොඳින් කරලා වැඩබිම පරීක්ෂා කරලා දීලා, මොනිකා මහත්මිය මහන්සියෙන් කරලා දුන්න නිසා වැඩ ගොඩක් පහසු වුනේ, ඇත්තටම ස්තූතියි, මේක ස්තූති ත්‍යාගයක්.

> **꼼꼼히** පරික්ෂාකාරී
> · 신문을 꼼꼼히 읽으려면 시간이 많이 걸려요.
> පත්තරය ඉතා පරීක්ෂකාරීව කියවා බැලුවොත් කාලය ගොඩක් වැය වෙයි.
> · 계약서의 내용을 꼼꼼히 읽어 보세요.
> කොන්ත්‍රාත්තුව ප්‍රවේශමෙන් කියවා බලන්න.



හොඳින් සවන්දී අනුගමනය කළාද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 내일은 무슨 날이에요? අද දවස කුමක්ද?
2. 모니카 씨가 우수 사원으로 뽑힌 이유는 뭐예요?
   මොනිකා මහත්මිය විශිෂ්ට සේවකයකු ලෙස තෝරා ගත්තේ ඇයි?

정답 1. 근로자의 날이에요. 2. 일도 잘하고 작업장 점검도 꼼꼼히 잘해서요.



어휘 1 වචන මාලාව 1 안전 수칙 ආරක්ෂක ක්‍රියාමාර්ග



ආරක්ෂිත නීති සමග සම්බන්ධ වාග් මාලාව දෙස බලමු



안전 수칙을 지키다
ආරක්ෂිත නීති පිළිපැදීම



안전 수칙을 어기다
ආරක්ෂාව පිළිබඳ නියෝග කඩ කරනවා




규칙을 준수하다
නීති වලට කීකරුවෙනවා



살피다
පරීක්ෂා කරනවා



주의하다
අවධානය දෙනවා



점검하다
සෝදිසි කරනවා/පිරික්සනවා



정비하다
නඩත්තු කරනවා



보수하다
අලුත්වැඩියා කරනවා



개선하다
වැඩිදියුණු කරනවා



조치를 취하다
ක්‍රියාමාර්ග ගන්නවා



ඉහත වචන දෙස නොබලා ප්‍රශ්න විසඳන්න.

1. 빈칸에 맞는 표현을 〈보기〉에서 골라 문장을 완성하세요.
හිස්තැනට නිවැරදි ප්‍රකාශ උදාහරණ කොටසින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

1) 이런 도구는 위험하니까 사용할 때 다치지 않도록 ______________.
මෙම මෙවලම් අනතුරුදායක බැවින් භාවිතා කරන වාරයක් පාසා තුවාල නොවීමට වගබලා ගත යුතුය පරිස්සම් විය යුතුයි.

2) 기계를 오래 사용하려면 문제가 없는지 정기적으로 ______________ 합니다.
ඔබට යන්ත්‍රය දිගු කලක් භාවිතා කිරීමට අවශ්‍ය නම්, එහි ප්‍රශ්නයක් ඇත්දැයි නිතිපතා පරීක්ෂා කරන්න.

3) 용접기가 고장이 나서 공장장님이 어제 ______________.
වෙල්ඩින් යන්ත්‍රය කැඩී ඇති බැවින් ආයතන හිමිකරු (කැගැහුවා).

4) 안전하게 작업을 하려면 안전 수칙을 잘 ______________ 합니다
ආරක්ෂිතව වැඩ කිරීමට අවශ්‍ය නම් ආරක්ෂිත නීති පිළිපැපැදිය යුතුයි.

보기 어기다 주의하다 보수하다 점검하다 지키다

정답 1) 주의합니다 2) 점검해야 3) 보수했습니다 4) 지켜야

문법 1 සංවාදය 1 -(으)ㄴ 덕분에



'-(으)ㄴ 덕분에' යන්න ධනාත්මක ප්‍රතිඵලයේ හේතු පැහැදිලි කිරීමේදී භාවිතා වේ. ක්‍රියාපද සහ විශේෂණ පද යන සියල්ල සමග සම්බන්ධ කළ හැක.

자음 (ව්‍යඤ්ජන) → -은 덕분에	모음 (ස්වර), 자음 'ㄹ' (ව්‍යඤ්ජනය -ㄹ) → -ㄴ 덕분에
읽다 → 읽은 덕분에	사다 → 산 덕분에 만들다 → 만든 덕분에

· 공장을 미리 **보수한 덕분에** 이번 비에 큰 피해가 없었어요.
කර්මාන්තශාලාව කලින් අලුත්වැඩියා කළ නිසා මේ පාර වැස්සෙන් විශාල හානියක් සිදු වුනේ නැහැ.

· 여러분이 **도와주신 덕분에** 제가 이 상을 받게 되었습니다.
ඔබ සැම උදව් කළ නිසා මට මේ පරිත්‍යාගය ලබාගන්න පුළුවන් වුණා.

· 가: 투안 씨가 꼼꼼히 **확인한 덕분에** 일이 잘 진행됐어요.
තුඅන් මහත්තයා හොඳින් පරීක්‍ෂා කළ නිසා වැඩේ හොඳට කෙරුණා.

나: 아니에요. 교육을 잘 받은 덕분이에요. නැහැ. අධ්‍යාපනය හොඳින් ලැබූ නිසයි.

※ '덕분에' යන්න 'නාම පදය + 덕분에' යන ව්‍යුහයෙන් නාම පදයක් සමඟ සම්බන්ධ කොට යෙදිය හැක.

· **사장님 덕분에** 회사 생활을 잘하고 있습니다.
සමාගම් ප්‍රධානියාට ස්තුති වන්න සමාගමේ වැඩ හොඳින් කරගෙන යනවා.

· 요리를 잘하는 **아내 덕분에** 맛있는 음식을 먹고 있어요.
කෑම හොඳට උයන බිරිඳට ස්තුති වන්න රස කෑම කන්න ලැබෙනවා.



대조적 정보 වෙනත් තොරතුරු

සිංහල භාෂාවෙහි යම් සිදුවීමක් සිදුවීමට මුල් වූ කාරණාව සහ හේතුව යන දෙවර්ගයම එම සිදුවීමෙන් හටගන්නා ප්‍රතිපලයේ බලපෑම කුමක් වුවත් එකම අයුරින් ප්‍රකාශ කරන නමුත් කොරියානු භාෂාව ගත්කල යම් සිදුවීමක ප්‍රතිපලය ධනාත්මක /හොඳ නම් '-(으)ㄴ 덕분에' යොදා ගන්නා අතර ප්‍රතිපලය ඍණාත්මක / නරක නම් '-(으)ㄴ 덕분에' යොදා ගනිමින් ප්‍රකාශ කරනු ලැබේ.

· 친구가 도와**준 덕분에** 일을 빨리 끝낼 수 있었어요. යාළුවා උදවු කරපු නිසා වැඩේ ඉක්මනට කරන්න පුළුවන් වුණා.



'-(으)ㄴ 덕분에' ව්‍යාකරණය ගැන අවබෝධ වුණා නේද? එහෙමනම් උදාහරණ ලෙස සංවාදය සම්පූර්ණ කරන්න.

2. 그림을 보고 '-(으)ㄴ 덕분에'를 사용해서 대화를 완성하세요.
පින්තූර බලා '-(으)ㄴ 덕분에' භාවිතා කොට සංවාදය සම්පූර්ණ කරන්න.

1)

조치를 취하다

가: 많이 다칠 뻔했지요? ගොඩක් තුවාල වන්න ගියාද?
나: 네, 그런데 빨리 ________________ 별로 다치지 않았어요.
ඔව්, ඒ වුණත් ඉක්මනට.

2)

안전복을 입다

가: 화상을 입지 않았어요? ගින්නට ඇඳුම් ඇන්දේ නැද්ද?
나: 아니요, ________________ 괜찮아요.
නැහැ ආරක්ෂිත ඇඳුම් නිසා මුකුත් වුනේ නෑ.

정답 1) 조치를 취한 덕분에 2) 안전복을 입은 덕분에



대화 2 සංවාදය 2

Track 155



ඉන්දික මහතා සහ පාරු මහතා මොනවගේ දෑ කතා කරමින් සිටි ද? සංවාදයට දෙවරක් සවන් දී අනුගමනය කරන්න.

인디카 **바루, 안색이 안 좋네. 어디 아파?**
පාරු, මූණ ඇඳිලා ගිහින් වගේ, කොහේද අසනීපය?

바 루 **아픈 건 아니고. 요즘 일이 많아서 야근을 자주 했거든.**
අසනීපයක් නැහැ, මේ දවස් වල වැඩ වැඩි නිසා රෑ වැඩ ගොඩක් කළානේ.

인디카 **그렇게 일이 많아서 어떻게 해. 바쁘더라도 틈틈이 쉬면서 해. 그러다가 건강 해치겠다. 난 요즘 운동을 새로 시작했거든. 몸도 가볍고 입맛도 훨씬 좋아졌어.**
මේ විදිහට වැඩ ගොඩක් වුණහම කොහොමද කරන්නේ? කාර්යබහුල වුණත් ඉඳහිට විවේක ගන්න, එහෙම නැත්නම් සෞඛ්‍යයට හානි වේවි. මම මේ දවස්වල අලුතින් ක්‍රීඩාවක් පටන්ගත්තා. ශරීරයත් සැහැල්ලු වෙලා අභිරුචියත් තව ගොඩක් වැඩිවුණා.

> **틈틈이** ඉඳහිට
> · 일하면서 틈틈이 한국어를 공부했어요.
> මම වැඩ කරමින් සිටියදී ඉඳහිට කොරියානු භාෂාව ඉගෙනගත්තා.
> · 틈틈이 운동하는 습관을 길러 보세요.
> ඉඳහිට ව්‍යායාම් කරන පුරුද්ද වර්ධනය කර බලන්න.

바 루 **그래? 무슨 운동을 하는데?**
එහෙමද? මොකක්ද කරන ක්‍රීඩාව?

인디카 **친구들이랑 등산을 시작했어. 이번 주말에도 가기로 했는데 너도 갈래?**
යහළුවන් එක්ක කඳු නගින්න පටන්ගත්තා.මේ සති අන්තයේත් යන්න හිතන් ඉන්නවා ඔයත් එනවද?

바 루 **그럴까? 어디로 가기로 했어?**
එහෙනම් යමු, කොහේද යන්න හිතන් ඉන්නේ?



හොඳින් සවන්දී අනුගමනය කළා ද? එහෙම නම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 바루 씨는 왜 안색이 안 좋아요? පාරු මහතාගේ මූණ ඇඳිලා ගිහින් වගේ පෙනෙන්නේ ඇයි?
2. 인디카 씨는 요즘 무슨 운동을 해요? ඉන්දික මහතා මේ දිනවල කිනම් ව්‍යායාමද කරන්නේ?

정답 1. 야근을 자주 해서 안색이 안 좋아요. 2. 등산을 해요.



어휘 2 වචන මාලාව 2 건강 증진 සෞඛ්‍ය ප්‍රවර්ධනය



සෞඛ්‍ය ප්‍රවර්ධනය සම්බන්දයෙන් වන වචන වල කිනම් ඒවා ඇත්දැයි විමසා බලමුද?



건강을 챙기다
සෞඛ්‍යමත්ව සිටිනවා



건강을 해치다
සෞඛ්‍යට හානි වනවා



표준 체중을 유지하다
සම්මත බර පවත්වා ගන්නවා



유산소 운동을 하다
ව්‍යායාම කරනවා




스트레칭을 하다
ශරීරය ඇදීමේ ව්‍යායාම



골고루 섭취하다
විවිධාකාර පෝෂ්‍යදායි ආහාර ගන්නවා



청결을 유지하다
පිරිසිඳුව ඉන්නවා



휴식을 취하다
පිරිසිඳුව ඉන්නවා



기분 전환을 하다
හැඟීම් අලුත්කර ගන්නවා



건강 검진을 받다
සෞඛ්‍ය පරීක්ෂාවක් කරගන්නවා




ඉගෙන ගත් වචන මතක් කරමින් ප්‍රශ්නයට පිළිතුරු සපයා බලමුද?

1. 그림을 보고 맞는 말을 연결하세요. පින්තූරය බලා ගැලපෙන වචනය යා කරන්න.



정답 ① ㉣ ② ㉤ ③ ㉡ ④ ㉢ ⑤ ㉠

문법 2 සංවාදය 2 -기로 하다



'-기로 하다' යන්න 'තීරණයක් කරනවා', 'අදිෂ්ඨානය කරනවා' සහ ' පොරොන්දුවක් වෙනවා' යන අර්ථය ගන්නා අතර ක්‍රියා පද සමග පමණක් එකතු වේ. හල් කිරීමේ න්‍යායන් නොමැතිව '-기로 하다' යොදාගත හැක.

- 내일부터 출근하기 전에 운동을 **하기로 했어요.**
  හෙට සිට වැඩට යන්න කලින් ව්‍යායාම කරන්න තීරණය කළා.
- 가: 리한 씨, 등산화를 샀네요. රිහාන් මහත්තයා, කඳු නැගීමේ සපත්තු මිලට ගත්තානේ.
  나: 네, 회사 동료들이랑 등산을 **가기로 했어요.**
  ඔව්. සමාගමේ යාලුවොත් එක්ක කඳු නගින්න යන්න තීරණය කළා.
- 가: 몸이 안 좋다면서요? අසනීප වුනාලු නේද?
  나: 그래서 건강 검진을 **받기로 했어요.** ඒ නිසා ශරීර පරීක්ෂාවක් කරගන්න තීරණය කළා.



비교해 보세요 සංසන්දනය කර බලන්න

✔ '-기로 하다' සහ '-(으)ㄹ게요'

'-기로 하다' සහ '-(으)ㄹ게요' යන ව්‍යාකරණ දෙවර්ගයම පොරොන්දුවක් අර්ථ දක්වන විට භාවිතා කරයි. '-기로 하다' බොහෝ විට '-기로 했어요' යන ආකෘතියෙන් භාවිතා කර, දැනටත් වී ඇති පොරොන්දුවක් ප්‍රකාශ කරන අතර '-(으)ㄹ게요' යන්න කතා කරන පුද්ගලයා අසා සිටින පුද්ගලයාට කුමක් හෝ පොරොන්දුවක් වන විට භාවිතා කරයි.

- 가: 내일은 회사에 일찍 오세요.
  나: 네, 일찍 오기로 했어요.(X) / 네, 일찍 **올게요.**(O)



'-기로 하다' ව්‍යාකරණය ගැන අවබෝධ වුණා නේද? එසේනම් උදාහරණ ලෙස සංවාදය සම්පූර්ණ කරන්න.

2. 그림을 보고 '-기로 하다'를 사용해서 문장을 완성하세요.
පින්තූර බලා '-기로 하다' භාවිතා කොට වාක්‍ය සම්පූර්ණ කරන්න.

1)  저는 오늘부터 ____________________.

2)  밤에 자기 전에 ____________________.

3)  주말에 친구들과 ____________________.

정답 1) 유산소 운동을 하기로 했어요 2) 스트레칭을 하기로 했어요 3) 자전거를 타기로 했어요



활동 ක්‍රියාකාරකම්

여름철 건강 관리에 대한 안내문입니다. 잘 읽고 질문에 답하세요.
පහත දැක්වෙන්නේ ග්‍රීස්ම සෘතුවේ සෞඛ්‍ය පවත්වා ගතයුතු ආකාරය ගැන විස්තරයකි, හොඳින් කියවා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

여름철 냉방병을 예방하기 위한 대책

ග්‍රීස්ම සෘතුවේ අධික වායුසමීකරණ භාවිතය නිසා ඇතිවන ලෙඩරෝග වලින් වැළකීමට ගතහැකි ක්‍රියාමාර්ග



1. 실내외 온도차를 5℃ 정도로 유지하세요.
   ඇතුලත උෂ්ණත්වය සෙන්ටිග්‍රේට් අංශක 5ක පමණටවත් තබාගන්න.
2. 가벼운 긴팔 옷을 준비해서 체온을 유지하세요.
   සැහැල්ලු අත් දිග ඇඳුම් පිළියෙල කරගෙන උෂ්ණත්වය පාලනය කරගන්න.
3. 에어컨을 끄고 환기를 해 주세요.
   වායුසමීකරණ විවෘත කර වාතාශ්‍ර ෆැන්ද දාන්න.
4. 실내 적정 습도를 유지하세요.
   ඇතුලත නිවැරදි ආර්ද්‍රතාවය තබාගන්න.
5. 냉방 중인 실내에서는 절대 금연하세요.
   සීත කාමර ඇතුළත දුම්බීම සම්පූර්ණයෙන්ම තහනම්.
6. 밀폐된 공간에서는 실내의 먼지를 깨끗이 청소하세요.
   වායුරෝධි අවකාශයෙන් ඇතුළත දූවිලි පිරිසිඳුව පිරිසිඳු කරන්න.

1. 읽은 내용과 같으면 ○ 다르면 ×에 표시하세요.
   කියවූ විස්තරය හා සමාන නම් ◯ ද වෙනස් නම් × ද යොදන්න.

   1) 실내 온도는 실외보다 10℃ 이상 낮아야 합니다. ○ ×

   2) 여름에도 긴팔 옷을 준비하면 좋습니다. ○ ×

   3) 에어컨을 켤 때 창문을 열어서 환기를 해야 합니다. ○ ×

   4) 건조한 것은 좋지 않기 때문에 습도를 맞춰야 합니다. ○ ×

정답 1. 1) X 2) O 3) X 4) O



정보 තොරතුරු

건강을 위한 스트레칭

සෞඛ්‍ය පවත්වා ගැනීම සඳහා ඇදිමේ ව්‍යායාම



종아리 කෙන්ඩා

1. 의자를 잡고 왼쪽 다리를 뒤로 뻗어요.
   පුටුවක් අල්ලාගෙන වම් කකුල පිටුපසට තබන්න.
2. 왼쪽 무릎을 곧게 펴고 천천히 오른쪽 다리를 구부려요.
   වම්පස දණහිස සම්පූර්ණයෙන් දිගහැර දකුණුපස පාදය අකුලනවා.



허벅지 කලවා

1. 의자를 잡고 서서 왼쪽 다리를 손으로 잡고 서요.
   පුටුවක් අල්ලා හිටගෙන වම් කකුල අතින් අල්ලා ගන්න.
2. 손으로 잡은 왼쪽 다리를 위로 뻗어요.
   අතින් අල්ලන වම් කකුල ඉහළට ගන්න.



어깨 උරහිස

1. 오른팔을 펴서 왼쪽 어깨 쪽으로 돌려요.
   දකුණු හාහුව නවා වම් උරහිස පැත්තට ගෙනයන්න.
2. 왼손으로 오른쪽 팔꿈치를 잡아요.
   වම් අතින් දකුණු හාහුව අල්ලන්න.



옆구리 පැත්ත

1. 양손은 깍지를 끼고 팔을 머리 위로 올려요.
   අත් දෙක එකට අල්ලාගෙන හාහු හිස කෙලින් ඉහළට ඔසවන්න.
2. 몸을 옆으로 구부려요.
   ශරීරය පැත්තකට නවන්න.



팔 බාහුව

1. 오른팔을 구부려서 머리 뒤로 넘겨요.
   දකුණු බාහුව නවා හිස පිටුපසට ගන්න.
2. 왼손으로 오른팔의 팔꿈치를 아래로 밀어요.
   වම් අතින් දකුණු බාහුවේ බාහු ප්‍රදේශය යටට නවන්න.



목 බෙල්ල

1. 양손은 깍지를 껴서 머리 뒤를 잡아요.
   අත් දෙක එකට අල්ලාගෙන හිස පිටුපස අල්ලන්න.
2. 상체를 숙이지 않고 머리를 당겨요.
   ශරීරය නවන්නේ නැතිව හිස අදින්න.



EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK



අංක 1 සවන් දුන් අන්තර්ගතය හා සම්බන්ධ යෙදුම් තෝරන ප්‍රශ්නයයි. හොඳින් සවන් දෙන්න.

1. 듣은 것을 고르십시오. ඔබට ඇසුනු දේ තෝරන්න.



① 정비해요. ② 준수해요.
③ 점검해요. ④ 확인해요.



අංක 2 සහ අංක 3 මීළඟට සිදුවිය හැකි අන්තර්ගතය තෝරන ප්‍රශ්න වන අතර අංක 4 සහ අංක 5 එකම සංවාදයට හොඳින් සවන්දී නිවැරදි පිළිතුරු තෝරන ප්‍රශ්නයි. ප්‍රශ්නවලට සවන්දීමට පෙර උත්තර එක් වරක් කියවා බලන්න.

[2~3] 질문을 듣고 알맞은 대답을 고르십시오.
ප්‍රශ්නයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන්න.

2. ① 다행이에요. ② 큰일이에요.
③ 정말 속상해요. ④ 힘들 거예요.

3. ① 운동을 했어요. ② 내일 하기로 했어요.
③ 영화를 보기로 했어요. ④ 청소를 한다고 했어요.

[4~5] 하나의 이야기를 듣고 두 개의 질문에 대답하십시오.
එකම සංවාදය අසා ප්‍රශ්ණ දෙකටම පිළිතුරු සපයන්න.

4. 여기는 어디입니까? මෙතන කොහේද?

① 공원 ② 병원
③ 회사 ④ 학교

5. 들은 내용으로 맞는 것을 고르십시오. ඇසූ විස්තරයට නිවැරදි එක තෝරන්න.

① 수진 씨는 건강을 잘 챙깁니다.
② 민수 씨는 운동이 필요합니다.
③ 수진 씨는 검진 결과를 받았습니다.
④ 민수 씨는 건강 검진을 받을 겁니다.



듣기 대본 ශ්‍රවණ පිටපත

1. 여: 기계를 정비하고 있어요. යන්ත්‍රය සවි කරමින් සිටී.
2. 남: 미리 확인한 덕분에 다치지 않았어요. කල්තියාම පරීක්ෂා කරපු නිසා තුවාල නොවී බේරුණා.
3. 남: 내일 뭐 할 거예요? හෙට කරන්නේ කුමක්ද?

4-5. 남: 수진 씨, 병원에는 웬일이에요? සුජින් මහත්මිය, ඇයි රෝහලට පැමිණියේ?

여: 건강 검진이 있어서 왔어요. 민수 씨는요? මම සෞඛ්‍ය පරීක්ෂණයක් සඳහා පැමිණියා. මින්සු මහතා?

남: 저는 검진 결과를 보러 왔어요. මම සෞඛ්‍ය පරීක්ෂණ ප්‍රතිඵල බැලීමට පැමිණියේ.

여: 그래요? 결과 잘 나왔어요? එහෙමද? ප්‍රතිඵල හොඳට ආවද?

남: 제가 운동을 너무 안 해서요. 유산소 운동도 하고 음식을 골고루 섭취하라고 했어요.
මම ව්‍යායාම් ගොඩක් කරන්නේ නෑ. අරොබික් ව්‍යායාම කරමින් සමබර ආහාර වේලක් ගැනීමට තීරණය කලා.

여: 그렇군요. 저도 건강에 신경을 못 써서 좀 걱정이 돼요.
ආ එහෙමද. මමත් සෞඛ්‍ය පිළිබඳ අවධානය යොමු කරන්න බැරි වුණ නිසාටිකක් බයයි.

정답 1. ① 2. ① 3. ③ 4. ② 5. ②

확장 연습 වැඩිදුර අභ්‍යාස

L-50

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු තෝරන්න.

남자는 무엇을 하려고 합니까? පිරිමි පුද්ගලයා මොනවද කරන්න යන්නේ?

① 쉬려고 합니다.
② 운동을 하려고 합니다.
③ 일을 시작하려고 합니다.
④ 건강 검진을 받으려고 합니다.

확장 연습 듣기 대본 වැඩිදුර අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 여: 아딧 씨, 주말에 못 쉬었어요? 많이 피곤해 보여요. අජිත් මහතා. සති අන්තයේ විවේක ගත්තේ නැද්ද?

남: 요즘 몸이 안 좋아요. 얼마 전에 건강 검진을 받았는데 건강이 나빠졌더라고요. 그래서 운동을 좀 시작해 보려고요.
මේ දවස් වල ඇඟට හරි නෑ. මීට ටික දවසකට කලින් මම සෞඛ්‍ය පරීක්ෂණයක් කළාම මගේ සෞඛ්‍යය තත්වය නරක අතට හැරෙමින් තියෙනවා කියලා පෙන්නුවා. ඒ නිසා ව්‍යායාම කරන්න පටන් අරගන්න කියලා.

여: 좋은 생각이에요. 일 때문에 바쁘더라도 건강은 꼭 챙겨야지요.
හොඳ අදහසක් වැඩ නිසා කාර්යබහුල වුණත් සෞඛ්‍ය හොඳින් රැකි ගන්න ඕනේ.

정답 1. ②



EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සහ අංක 2 හිස්තැනට ගැලපෙන වඩාත් නිවැරදි එක තෝරන්න. ඉගෙන ගත් දේ මතක් කරමින් ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

[1~2] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오.
හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

1. 불량품이 계속 나오고 있으니까 문제를 ____________ 수 있는 방법을 찾아야 합니다.
   වැරදියට නිෂ්පාදනය වූ නිපැයුම් දිගටම එන නිසා එම ප්‍රශ්නය (විසඳීමට) හැකි ක්‍රමවේදයක් සෙවිය යුතුයි.

   ① 개선할 ② 주의할 ③ 준수할 ④ 정비할

2. 작업장 환경이 별로 깨끗하지 않아서 늘 ____________ 위해 애쓰는 편입니다.
   වැඩබිම පරිසරය වැඩිය පිරිසිදු නැති නිසා නිතරම එය (පිරිසිදුව තබාගන්න) කරන්න උත්සාහ කරනවා.

   ① 휴식을 취하기 ② 스트레칭을 하기
   ③ 골고루 섭취하기 ④ 청결을 유지하기




අංක 3 සහ අංක 4 පින්තූරය හා සම්බන්ධ වාක්‍ය තෝරන ප්‍රශ්නයයි. එමෙන්ම අංක 5 ඡේදය කියවා ප්‍රශ්නයට පිළිතුර සොයන ප්‍රශ්නයයි.

[3~4] 다음 그림을 보고 맞는 문장을 고르십시오.
පහත පින්තූර බලා ගැළපෙන වාක්‍යය තෝරන්න.

3. 

   ① 팔 운동을 하고 있어요.
   ② 목 운동을 하고 있어요.
   ③ 허리 운동을 하고 있어요.
   ④ 허벅지 운동을 하고 있어요.

4. 

   ① 조치를 취하세요.
   ② 기계를 살펴보세요.
   ③ 안전 수칙을 지키세요.
   ④ 작업 도구를 점검하세요.

5. 안내판의 설명으로 맞지 않는 것을 고르십시오.
විස්තර පත්‍රිකාවේ විස්තරයට නිවැරදි නොවන එක තෝරන්න.

> [안전 교육]
> ආරක්ෂාව පිළිබඳ අධ්‍යාපනය
> 일시: 2월 27일(목) 14:00~16:00
> දිනය: පෙබරවාරි 27 දින ප. ව. 2.00 - 4.00
> 장소: 대강당
> ස්ථානය: ශාලාව

① 안전 교육을 합니다.
② 교육은 대강당에서 합니다.
③ 목요일 오전에 교육을 합니다.
④ 두 시간 동안 교육을 할 겁니다

정답 1. ① 2. ④ 3. ② 4. ③ 5. ③



확장 연습 වැඩිදුර අභ්‍යාස

[1~2] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

1\. 제 취미는 운동입니다. 땀을 흘리면서 운동을 하면 스트레스도 ________ 건강도 좋아지기 때문에 저는 자주 운동을 합니다.

මගේ විනෝදාංශය ව්‍යායාම කිරීමයි. දහඩිය වගුරවමින් ක්‍රීඩා කිරීමෙන් ආතතිය (ලිහිල් කරනවා වගේම) සෞඛ්‍යයටද හිතකර බැවින් මම නිතර ව්‍යායාම කරනවා.

① 받고　② 주고　③ 풀리고　④ 쌓이고

2\. 건강 검진을 했는데 담배 때문에 건강이 안 좋아졌다고 의사가 말했습니다. 그래서 담배를 ________ 했습니다.

සෞඛ්‍ය පරීක්ෂණයක් කල අතර දුම්වැටි නිසා සෞඛ්‍ය තත්වය නරක් වෙලා යැයි වෛද්‍යවරයා පැවසුවා. ඒනිසා දුම්වැටි (නවත්වන්න) තීරණය කළා.

① 사기로　② 끊기로　③ 키우기로　④ 피우기로

3. 다음 글을 읽고 무엇에 대한 글인지 고르십시오.
පහත ඇති ඡේදය කියවා කුමක් සම්බන්ධව සදහන් වී ඇත්ද යන්න තෝරන්න.


저는 축구를 좋아합니다. 그래서 시간이 있을 때마다 동료들과 함께 공장 운동장에서 축구를 합니다. 축구 경기를 보는 것도 좋아합니다. 주로 텔레비전으로 경기를 보지만 가끔 축구장에 직접 가기도 합니다.

මම පාපන්දු ක්‍රීඩාවට කැමතියි, එමනිසා කාලය ඇති අවස්ථාවක් පාසා එකට වැඩ කරන යහළුවන් සමග කාර්මාන්ත ශාලාවේ ක්‍රීඩා පිටියේදී පාපන්දු ක්‍රීඩා කරනවා, පාපන්දු ක්‍රීඩා තරඟ බලන්නත් කැමතියි, බොහෝ විට රූපවාහිනියෙන් ක්‍රීඩා තරඟ බලන නමුත් ඉඳහිට පාපන්දු ක්‍රීඩා පිටියට ගොස් කෙලින්ම බලන අවස්ථාද තිබෙනවා.

① 연휴 계획　② 운동 규칙　③ 취미 활동　④ 작업 일정

정답 1. ③　2. ②　3. ③



발음 උච්චාරණය  P-26

හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.

ඉදිරිපස අක්ෂරය ව්‍යඤ්ජනයකින් අවසන් වී පසුපස අක්ෂරය ස්වර '이', '야', '여', '요', '유' වලින් පටන් ගන්නා අවස්ථාවේදී 'ㄴ' එකතු කර පිළිවෙලින් [니], [냐], [녀], [뇨], [뉴] ලෙස උච්චාරණය කරයි.

(1) 맨입, 솜이불, 한여름　(2) 담요, 눈요기, 식용유
(3) 웬 일이에요?　(4) 무슨 약을 먹어요?



한국에 가서 일을 하고 싶은데요


කොරියාවට ගිහින් වැඩ කරන්න කැමතියි

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

▫ අධ්‍යයන අරමුණු	රැකියා බලපත්‍ර ක්‍රමය සම්බන්ධ ප්‍රශ්ණ සහ පිළිතුරු / කොරියානු භාෂාව ප්‍රවීණතා විභාගය සම්බන්ධ විමසීම්
▫ ක්‍රියාකාරකම්	EPS-TOPIK විභාගයට අයදුම්පත්‍ර පිරවීම
▫ වචන භාවිතය සඳහා උපදෙස්	සේවානියුක්ති අවසරපත් ක්‍රමය / කොරියානු භාෂාව ප්‍රවීණතා විභාගය
▫ සංස්කෘතික තොරතුරු	සේවානියුක්ති අවසරපත් ක්‍රමය තේරුම් ගැනීම



대화 1 සංවාදය 1





පහත දැක්වෙන්නේ ඉබන් මහතා සහ කාර්මික මානව සම්පත් සංස්ථාවේ කාර්යාලීය සේවකයෙකුගේ සංවාදය වේ. ප්‍රථමයෙන්ම සංවාදයට හොඳින් සවන්දී අනුගමනය කරන්න.

이반 저, 한국에 가서 일을 하고 싶은데요.
මම කොරියාවට ගිහින් වැඩ කරන්න කැමතියි.

직원 아, 그러세요? 이쪽으로 앉으세요. 어떤 일을 하고 싶으세요?
ආ, එහෙමද? මේ පැත්තෙන් වාඩි වෙන්න. කුමන වැඩක්ද කරන්න කැමති?

이반 제조업 쪽 일을 해 보고 싶어요.
නිෂ්පාදන අංශයේ වැඩ කරල බලන්න කැමතියි.

직원 잘됐네요. 제조업에서 사람을 제일 많이 뽑고 있거든요.
ඒක හොඳයි, නිෂ්පාදන අංශය මිනිසුන් වඩාත් වැඩියෙන් තෝරා ගන්නවා.

> 사람을 뽑다
> මිනිසුන් තෝරා ගන්නවා

이반 그런데 고용허가제로 한국에 가면 몇 년 정도 일할 수 있어요?
එසේ වුවත් සේවානියුක්ති අවසරපත් ක්‍රමයෙන් කොරියාවට ගියත් කොපමණ වසර ගණනක් වැඩ කරන්න පුළුවන්ද?

> 취업 기간
> සේවා කාලය

직원 취업 기간은 3년인데 재계약을 하면 최대 1년 10개월까지 더 있을 수 있어요.
ආරම්භක කාලය වසර තුනක් වුවද කාලය සම්පූර්ණ වීමෙන් පසුව තවත් වසරකුත් මාස 10ක් වැඩිකරන්න පුළුවන්.

이반 아, 그렇군요. 신청하려면 어떻게 해야 하죠?
ආ, එහෙමද? අයදුම් කිරීම කොහොම කලාම හරිද?





හොඳින් සවන් දී අනුගමනය කළාද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 이반 씨는 어디에서 일하고 싶어해요? ඉබන් මහතා කොහෙද වැඩ කරන්න කැමති?
2. 이반 씨는 어떤 일을 하고 싶어해요? ඉබන් මහතා මොනවගේ වැඩද කරන්න කැමති?

정답 1. 한국 2. 제조업




어휘 1 වචන මාලාව 1 고용허가제 සේවානියුක්ති අවසරපත් ක්‍රමය



සේවා නියුක්ති අවසරපත් ක්‍රමය හා සම්බන්ධ වචන පහත දැක්වේ. මොනවගේ වචන තිබේ දැයි බලමු.




제조업
නිෂ්පාදන/කර්මාන්ත අංශය



건설업
ඉදිකිරීම් අංශය



서비스업
සේවා අංශය



축산업
මස් සහ කිරි කර්මාන්තය




농업
කෘෂිකර්මාන්තය



어업
ධීවර කර්මාන්තය



고용허가제
සේවා නියුක්ති අවසරපත් ක්‍රමය



문의하다
විමසීම් කරනවා



ඉහලින් ඇති වචන මාලාව දෙස නොබලා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න උත්සාහ කරන්න.


1. 〈보기〉와 같이 말해 보세요. උදාහරණය අනුව කතා කරල බලන්න.


보기



가: 고용허가제로 한국에 가면 어떤 일을 하고 싶어요?
සේවානියුක්ති අවසරපත් ක්‍රමයට කොරියාවට ගිහින් මොන වැඩද කරන්න කැමති?

나: 제조업 쪽 일을 하고 싶어요.
නිෂ්පාදන අංශයේ වැඩ කරන්න කැමතියි.

1) 

2) 

3) 

4) 

2. 〈보기〉처럼 대답으로 맞는 것의 번호를 고르시오.
උදාහරණය අනුව පිළිතුරට ගැලපෙන අංකය තෝරන්න.

보기

가: 한국에 가서 일을 하고 싶은데요.
කොරියාවට ගිහින් වැඩ කරන්න කැමතියි.

나: ____②____



1) 가: 고용허가제에 대해서 좀 알아보고 싶은데요.
සේවා නියුක්ති අවසරපත් ක්‍රමය සම්බන්ධව ටිකක් දැනගන්න අවශ්‍යයි.

나: ____________



2) 가: 고용허가제로 한국에서 얼마 동안 일할 수 있어요?
සේවානියුක්ති අවසරපත් ක්‍රමයෙන් කොරියාවේ කොපමණ කාලයක් වැඩ කරන්න පුළුවන්ද?

나: ____________



3) 가: 네, 고용허가제 담당 김민수입니다.
ඔව්, සේවානියුක්ති අවසරපත් ක්‍රමයේ බඳවා ගැනීම් නිලධාරී කිම්මින්සු වේ.

나: ____________




① 계약 기간은 3년입니다.
② 그래요? 어떤 일을 하고 싶으세요?
③ 고용허가제 홈페이지에 자세히 나와 있어요.
④ 안녕하세요. 고용허가제에 대해서 문의하려고 하는데요.

정답 1. 1) 가: 고용허가제로 한국에 가면 어떤 일을 하고 싶어요?
나: 건설업 쪽 일을 하고 싶어요.
2) 가: 고용허가제로 한국에 가면 어떤 일을 하고 싶어요?
나: 서비스업 쪽 일을 하고 싶어요.
3) 가: 고용허가제로 한국에 가면 어떤 일을 하고 싶어요?
나: 농업 쪽 일을 하고 싶어요.
4) 가: 고용허가제로 한국에 가면 어떤 일을 하고 싶어요?
나: 어업 쪽 일을 하고 싶어요.
2. 1) ③ 2) ① 3) ④



대화 2 සංවාදය 2





ඉබන් මහතා සහ ගුරුතුමා කොරියානු භාෂා ප්‍රවීනතා විභාගය පිළිබඳ කතා කරමින් සිටියි. මොනවගේ දෑ කතා කරමින් සිටි ද? මුලින්ම සංවාදය දෙවරක් සවන් දෙන්න.

이 반 **선생님, 잠깐 시간 있으세요?** ගුරුතුමියනි, ටිකකට වෙලාව තියෙනවද?

선생님 **네, 무슨 일이에요?** ඔව්, මොකක්ද කෙරෙන්න ඕනේ?

이 반 **제가 이번에 한국어능력시험을 신청했는데 뭘 공부해야 할지 모르겠어요.**
මම මෙවර කොරියානු භාෂාව ප්‍රවීණතා විභාගයට අයදුම් කලා, මොනවද පාඩම් කරන්න ඕනද කියල දන්නේ නැහැ.

> 기출문제 ▶ පසුගිය විභාග පෙරහුරු ප්‍රශ්ණ

선생님 **그래요? 시험에는 듣기하고 읽기만 나오니까 기출문제를 풀어 보세요.**
එහෙමද? විභාගයට සවන් දීම සහ කියවීම පමණක් එන නිසා පසුගිය ප්‍රශ්න පත්‍ර කරල බලන්න.

이 반 **시험은 모두 몇 문제예요?** විභාගයේ ඔක්කොම ප්‍රශ්ණ කීයක්ද?

선생님 **각각 25문제씩 나와요.** එක් එක් කොටසින් ප්‍රශ්ණ 25 බැගින් එනවා.

> 자격이 주어지다 ▶ සුදුසුකම් ලබනවා

이 반 **몇 점을 받으면 한국에 갈 수 있어요?**
ලකුණු කොපමණක් ගත්තමද කොරියාවට යන්න පුළුවන්ද?

선생님 **200점 만점 기준으로 80점이 넘은 사람 중 성적이 높은 사람부터 고용허가제로 일할 수 있는 자격이 주어지게 돼요.**
ලකුණු 200න් ලකුණු 80ට වඩා ලබා ගන්න අය අතුරින් වැඩි ලකුණු ලබා ගන්න අය සේවානියුක්ති අවසරපත් ක්‍රමය යටතේ වැඩ කරන්න මුළින්ම සුදුසුකම් ලබනවා.

이 반 **열심히 공부해야겠네요. 감사합니다, 선생님.**
මහන්සියෙන් ඉගෙන ගන්න ඕන. ස්තුතියි ගුරුතුමියනි.



මෙවර ගුරුතුමා සහ ඉබන් මහතා ලෙස සංවාදය නැවත කියන්න. හොඳින් සවන්දී අනුගමනය කළා ද? එහෙම නම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 이반 씨는 무슨 시험을 신청했어요? ඉබන් මහතා අයදුම් කලේ කිනම් විභාගයද?
2. 한국에 가려면 몇 점을 받아야 해요? කොරියාවට යාමට කොපමණ ලකුණු කීයක් තිබිය යුතුද?

정답 1. 한국어능력시험 2. 80점 이상을 받아야 해요.




어휘 2 වචන මාලාව 2 한국어능력시험 කොරියානු භාෂාව ප්‍රවීණතා විභාගය

කොරියානු භාෂාව ප්‍රවීණතා විභාගය හා සම්බන්ධ කිනම් යෙදුම් ඇත්දැයි බලමු.

신분증 හැඳුණුම්පත	수험료 පන්ති ගාස්තු(අමතර ඉගැන්වීම්)	수험표 විභාග ප්‍රවේශ පත්‍රය	접수증 අයදුම් කිරීමේ සහතිකය (අයදුම් කිරීමේ රිසිට් පත)
증명 사진 අයදුම්කරුගේ ඡායාරූපය (හඳුනා ගැනීමේ ඡායාරූපය)	성적표 ප්‍රතිඵල සටහන	합격하다 සමත් වෙනවා (සුදුසුකම් ලබනවා)	불합격하다 අසමත් වෙනවා (සුදුසුකම් නොලබනවා)



ඉහලින් ඇති වචන මාලාව දිහා නොබලා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න උත්සාහ කරන්න.



1. 그림을 보고 알맞은 말을 연결하세요. පින්තූරය බලා ගැලපෙන වචනය යා කරන්න.

① • 　　• ㉠ 수험표

보험금 지급 사유 රක්ෂණය ගෙවන හේතු	사업장 이탈 없이 1년 이상 근무한 외국인 근로자의 출국(일시 출국 제외) සේවකයා අනතුරක් නැතිව වසරක් පිරීමෙන් අනතුරුව විදේශීය කම්කරුවා පිටත්ව යාමේදී	외국인 근로자 출국(일시 출국 제외) -자진 출국 또는 강제 퇴거의 경우도 해당 විදේශීය කම්කරුවා පිටත්ව යාමේදී / ස්ව කැමැත්තෙන් පිටත්ව යාමේදී අනිවාර්ය අත්හැරීමේදී

◆ 미리 보험금을 청구하면 인천공항에서도 보험금을 받고 환전까지 할 수 있는 서비스가 시행 중입니다.
ඉක්මනින් රක්ෂණ ඉල්ලීම කලාම ඉන්චොන් ගුවන් තොටුපළෙන්ද රක්ෂණ ආවරණ මුදල් ලබාගන්න තුරු සේවාව ලබා දෙනු ලැබේ.

1. 위 표의 내용과 관계가 있는 것을 연결하세요.
ඉහත සටහනේ ප්‍රකාශ තොරතුරු වල ඇති දේ තෝරන්න.

① 귀국 비용 보험 •

② 출국 만기 보험 •

• ㉠ 한 번에 보험료 납입

• ㉡ 외국인 근로자가 가입

• ㉢ 외국인 근로자의 퇴직금

• ㉣ 근로계약 후 보름 내 가입

정답 1. ①-㉠/㉡, ②-㉢/㉣

외국인 근로자 보험

විදේශීය කම්කරු රක්ෂණය

외국인 근로자 전용 보험 විදේශීය කම්කරුවන් සඳහා විශේෂිත රක්ෂණ

외국인 근로자는 4대 보험 외에 외국인 근로자 전용 보험에 가입해야 합니다. 전용 보험으로는 출국 만기 보험, 귀국 비용 보험, 상해 보험, 임금 체불 보증 보험이 있습니다. 이 중에서 귀국 비용 보험과 상해 보험은 외국인 근로자가 반드시 가입해야 합니다.

විදේශීය කම්කරුවන්ට ඇති රක්ෂණ ආවරණ 4ට අමතරව වෙනත් විශේෂිත රක්ෂණ කිහපයකටත් ලියාපදිංචි විය යුතුයි. මෙම රක්ෂණ ආවරණ පිටත්වීම සහතික කරන රක්ෂණ ආවරණය/ ආපසු පිටත්ව යාමේ පිරිවැය රක්ෂණය/ හදිසි අනතුරු රක්ෂණ/ ඇප සහතික රක්ෂණය ලෙස වර්ග කෙරේ, මේ අතරින් ආපසු පිටත්ව යාමේ පිරිවැය රක්ෂණය සහ හදිසි අනතුරු රක්ෂණය විදේශීය ජාතික කම්කරුවා අනිවාර්යෙන්ම ලබාගත යුතුයි.

보험의 종류 රක්ෂණ වර්ග	가입 목적 ඉල්ලීමේ අරමුණු	가입 주체 ඉල්ලීම් කරන හේතුව
고용 보험 රැකියා රක්ෂණය	실업 예방, 고용 촉진 및 생활 안정, 재취업 지원 රැකියා ආරක්ෂාව සලසනවා/ රැකියාව දියුණු කරනවා/ ජීවනෝපාය ආරක්ෂා කිරීම සහ නැවත සේවා නියුක්ත කිරීමට උදව් කරනවා	사용자, 외국인 근로자 කම්පැණිය, විදේශීය කම්කරුවා
산재 보험 හානිපූරණ රක්ෂණය	업무상 재해에 대한 보상, 요양, 재활 සේවා නියුක්තව සිටියදී අනතුරක් වී තාවකාලිකව එක්තැන් වූ විට වැටුප් ගෙවීම සහ වෛද්‍ය ගාස්තු ගෙවීම	사용자 පරිශීලකයා
건강 보험 සෞඛ්‍ය රක්ෂණය	질병, 부상에 대한 예방, 진단, 치료, 사망 및 보건 증진 වලකනවා/ තුවාල සහ රෝගී අවස්ථා වල ප්‍රතිකාර සහ රෝග විනිශ්‍යය වෛද්‍ය ආරක්ෂාව සලසනවා	사용자, 외국인 근로자 පරිශීලකයා, විදේශීය කම්කරුවා
국민 연금 විශ්‍රාම රක්ෂණය	노령, 장애, 사망 등으로 소득이 없는 당사자 및 유족의 생활 보장 ආබාධ වීමෙන් හෝ මරණය නිසා විශ්‍රාම යාමෙන් දිගු කාලීනව වැඩ කල නොහැකි සේවකයන්ට හෝ යැපෙන්නන්ට විශ්‍රාම ඉතුරුම්දායක මුදල් සැපයීම	사용자, 외국인 근로자 පරිශීලකයා, විදේශීය කම්කරුවා
귀국 비용 보험 ආපසු යාමේ පිරිවැය රක්ෂණය	외국인 근로자의 귀국 시 필요한 비용 충당 විදේශීය කම්කරුවාගේ ආපසු තම රටට යාමේ පිරිවැය ආවරණ රක්ෂණය	외국인 근로자 විදේශීය කම්කරුවා
상해 보험 හදිසි අනතුරු රක්ෂණය	업무상 재해 이외의 외국인 근로자의 사망 · 질병 대비 රැකියා අනතුරු හැර මරණය රෝග හෝ ආබාධ වන විදේශීය කම්කරුවන්ට ආවරණය සපයනවා	외국인 근로자 විදේශීය කම්කරුවා
출국 만기 보험 පිටත්වීම සහතික කරන රක්ෂණය	중소기업의 퇴직금 일시 지급에 따른 부담 완화 කුඩා සහ මධ්‍යම පරිමානයේ ව්‍යාපාර වල විශ්‍රාම ගැනීමේ ගාස්තු ගෙවීමේ වගකීම බැහැර කරනවා	사용자 පරිශීලකයා
임금 체불 보증 보험 වැටුප් ගෙවීම සහතික රක්ෂණය	외국인 근로자에 대한 임금 체불 대비 විදේශීය කම්කරුවාගේ නොගෙවූ වැටුප් සහ වැටුප් ආවරණ ඉල්ලීමට උදව් කිරීම	사용자 පරිශීලකයා (සේවා යෝජක)

보증 보험금 신청 및 수령 සහතික වීමේ රක්ෂණ ආවරණ මුදල් ඉල්ලීම සහ ප්‍රතිලාභ ලබා ගැනීම

외국인 근로자는 사업장에서 임금체불이 발생한 경우 고용노동부 고용센터 또는 근로감독과에 임금 체불 사실을 신고하여 확인을 받은 후, 한국산업인력공단에 보험금 지급을 신청할 수 있습니다. 보험기간 이내에 임금체불이 아닌 기타 사유(이탈, 출국, 사망 등)로 외국인 근로자와 근로 계약이 해지된 경우 사용하는 보험금 사업자(서울보증보험)에 대해 납입한 보험료 중 경과 보험료(최저 보험료)를 제외한 미경과 보험료에 대해 환급을 받을 수 있습니다.

විදේශීය කම්කරුවාට වැඩපළේ ගෙවීම ප්‍රමාද වන අවස්ථා වල රැකියා කම්කරු මධ්‍යස්ථානයට හෝ සේවානියුක්ති හා කම්කරු අමාත්‍යාංශයේ කම්කරු විමර්ශණ අංශයට වාර්තා කරන්න පුළුවන්. රක්ෂණ කාලය තුළ වැටුප් හිඟ නැති වෙනත් හේතු (වෙන්ව යාම/රට හැරයාම/මරණය) ආදියෙන් විදේශීය කම්කරුවාගේ සේවා ගිවිසුම අවසන් වන කාලයේ රක්ෂණ ආයතනයේ ගෙවීම් රක්ෂණ ආවරණ ප්‍රතිලාභ සහ රක්ෂණ වන්දි සම්බන්ධ මුදල් ලබාගන්න පුළුවන්.



EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK



අංක 1 සහ අංක 2 සංවාදයට සවන් දී කුමන සංවාදයක් ද යන්න තෝරන ප්‍රශ්න වේ, අංක 3 හොඳින් සවන්දී නිවැරදි පිළිතුර තෝරන ප්‍රශ්නයක් වේ.



[1~2] 다음을 듣고 무엇에 대한 대화인지 고르십시오.
පහත දේ සවන් දී කුමක් සම්බන්ද සංවාදයක්ද යන්න තෝරන්න.

1. ① 보험 가입 ② 보험금 납입 ③ 보험금 환급 ④ 보험금 청구

2. ① 내역서 ② 진단서 ③ 청구서 ④ 영수증

3. 질문을 듣고 알맞은 대답을 고르십시오.
ප්‍රශ්නයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන්න.

① 네, 매달 보험료를 내요.
② 네, 지금 식사 중이에요.
③ 네, 귀국 전에 신청하려구요.
④ 네, 입국하자마자 가입했어요.



අංක 4 සහ අංක 5 සංවාදයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන ප්‍රශ්නයි. සංවාදයට සවන් දීමට පෙර උදාහරණය අන්තර්ගතය වරක් හොඳින් කියවා බලන්න.

[4~5] 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오.
කතාවට සවන්දී ප්‍රශ්ණ වලට ගැලපෙන පිළිතුරු තෝරන්න.

4. 두 사람이 이야기하는 보험은 무엇입니까?
දෙදෙනා කතා කරන රක්ෂණ ක්‍රමය කුමක්ද?

① 산재 보험 ② 상해 보험 ③ 귀국 비용 보험 ④ 출국 만기 보험

5. 두 사람은 무엇에 대해 이야기하고 있습니까?
දෙදෙනා කුමක් සම්බන්දව කතා කරමින් ඉන්නවාද?

① 병원비 ② 치료비 ③ 휴업 급여 ④ 장애 보상금



듣기 대본 ශ්‍රවණ පිටපත

1. 남: 보험을 들려고 하는데요. රක්ෂණ සඳහා අයදුම් කිරීමටද පැමිණියේ?
   여: 네, 이쪽에 앉으세요. ඔව්, මෙතනින් වාඩි වෙන්න.
2. 여: 보험금을 청구할 때 어떤 치료를 받았는지 볼 수 있는 서류가 필요하다고 해요.
   රක්ෂණ හානිපූර්නයට අයදුම් කිරීමේදී කුමන ප්‍රතිකාර ලබාගෙන තියෙනවද යන්න කියවෙන ලියවිලි අවශ්‍ය වෙනවා.
   남: 아, 그 서류는 병원에서 발급 받을 수 있어요. ආ, ඒ ලියකියවිලි ඉක්මනින් රෝහලෙන් ලබා ගත හැකියි.
3. 남: 보험금을 청구했어요? රක්ෂණ වන්දි ඉල්ලුම් කරනවද?
4. 남: 이 보험은 반드시 가입해야 하는 보험이에요?
   මේ රක්ෂණ ආවරණය අනිවාර්යයෙන්ම ලබාගත යුතු රක්ෂණයක්ද?
   여: 네, 작업장이 아닌 곳에서 다칠 수도 있는 거잖아요. 꼭 가입해야죠.
   ඔව්, වැඩපලෙන් පිටතදී තුවාල වෙන්න පුළුවන් කම තියෙනවා අනිවාර්යයෙන්ම ලබාගන්න.
5. 여: 지난번에 치료 받으신 후에도 계속 몸이 안 좋으시다는 거죠?
   අවසන් වරට ප්‍රතිකාර ලබාගත් පසුවත් දිගටම ශරීරයට හොඳ නැද්ද?
   남: 네, 이런 경우에 받을 수 있는 보상이 있어요?
   ඔව්, මේ හේතුවෙන් ලබාගන්න තියෙන පාරිතෝෂිත තියෙනවාද?
   여: 네, 있습니다. ඔව්, තියෙනවා.

정답 1. ① 2. ② 3. ③ 4. ② 5. ④

확장 연습 තවදුරටත් වන අභ්‍යාස

L-54

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු තෝරන්න.

   남자가 여자를 찾아 온 이유는 무엇입니까? පිරිමියා ගැහැණු පුද්ගලයා සොයා ආ හේතුව කුමක්ද?

   ① 보험이 만기가 되어서
   ② 보험에 가입하기 위해서
   ③ 보험료를 확인하기 위해서
   ④ 보험금을 신청하고 싶어서

확장 연습 듣기 대본 තවදුරටත් වන අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 남: 실례합니다. 저, 얼마 전에 수술을 받았는데 보험금을 받을 수 있어요?
   සමාවන්න, මම ටික කලකට පෙර සැත්කමක් කළා රක්ෂණ වන්දි ලබා ගත හැකිද?
   여: 그럼요. 이럴 때를 위해서 보험 가입을 하셨는데요.
   ඔව්. මේ වගේ අවස්ථාවන් වෙනුවෙන් තමයි රක්ෂණයකට ලියාපදිංචි වුනේ.
   남: 보험금은 어떻게 신청해야 돼요? රක්ෂණ වන්දි සඳහා කොහොමද අයදුම් කරන්නේ?
   여: 신분증하고 진료비 영수증만 있으면 돼요.
   හැඳුනුම් පත වෛද්‍ය වියදම් සහ බිල්පත පමණක් තිබුනානම් ප්‍රමාණවත්.

정답 1. ④



EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සහ අංක 2 පින්තූරය බලා නිවැරදි වාක්‍ය තෝරන ප්‍රශ්න වේ, උදාහරණය හොඳින් කියවා පින්තූරයට ගැළපෙන පිළිතුර තෝරන්න.

[1~2] 다음 그림을 보고 맞는 문장을 고르십시오. පහත පින්තූර බලා ගැළපෙන වාක්‍යය තෝරන්න.

1.



① 사망했어요. ② 장해가 남았어요.
③ 질병에 걸렸어요. ④ 상해를 입었어요.

2.

① 영수증입니다. ② 내역서입니다.
③ 청구서입니다. ④ 진단서입니다.



අංක 3 සිට අංක 4 හිස්තැනට ගැලපෙන වඩාත් නිවැරදි යෙදුම තෝරන්න, එමෙන්ම අංක 5 සංවාදය කියවා ප්‍රශ්නයට පිළිතුර සොයන ප්‍රශ්නයකි. හොඳින් කියවා නිවැරදි පිළිතුර තෝරන්න.

3. 보험금을 ______________ 먼저 보험금을 청구해야 합니다.
රක්ෂණ වන්දි (ලබා ගැනීමට නම්) රක්ෂණ වන්දි ඉල්ලා සිටිය යුතුයි.

① 내려면 ② 타려면 ③ 신청하려면 ④ 지급하려면

4. 이 보험은 ______________이/가 되면 그동안 낸 보험금을 전부 돌려 받을 수 있습니다.
මේ රක්ෂණයේ (කල් ඉකුත් වුනොත්) මේ වෙනකල් ගෙවපු සියලුම රක්ෂණ මුදල් ආපසු ලබා ගත හැකිය.

① 만기 ② 신청 ③ 소멸 ④ 보상

5. 다음 질문에 답하십시오. පහත ගැටලුවට පිළිතුරු සපයන්න.

여: 다쳐서 일도 못하고 생활이 어려워서 어떡해요.
තුවාල වෙලා වැඩ නොකර ජීවිතය අමාරු නිසා මොනව කරන්නද?
남: 그래도 보험금으로 평균 임금의 70%를 받을 수 있으니까 다행이에요.
එහෙම උනත් රක්ෂණයෙන් සාමාන්‍ය වැටුපෙන් 70 ක් ලබාගන්න පුළුවන් නිසා වාසනාවක්.

두 사람은 무엇에 대해 이야기를 하고 있습니까? දෙදෙනා මොනවා සම්බන්දව කතා කරමින් ඉන්නවද?

① 병원비 ② 치료비 ③ 휴업 급여 ④ 장애 보상금

정답 1. ② 2. ① 3. ② 4. ① 5. ③



확장 연습 තවදුරටත් වන අභ්‍යාස

[1~2] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

1. 물건을 교환하거나 환불할 때에는 물건을 살 때 받은 ________을/를 반드시 가지고 가야 합니다.

   භාණ්ඩයක් වෙනත් භාණ්ඩයකට මාරු කිරීම, මුදල් ලබා ගැනීම හා භාණ්ඩ මිලදී ගන්නා විට (බිල්පත) අනිවාර්යෙන් රැගෙන යා යුතුයි.

   ① 영수증 ② 처방전 ③ 보고서 ④ 신분증

2. 계단에서 넘어져서 다리를 좀 다쳤습니다. 보험에 가입해 ________ 병원비를 지원받을 수 있었습니다.

   මම පඩි පෙළින් වැටී කකුල තුවාල වුණා. රක්ෂණය (අයදුම් කරලා තිබුන නිසා) රෝහල් ගාස්තු වලට උදව්වක් ලබා ගන්න පුලුවන් වුනා.

   ① 놓기 때문에 ② 놓을 테니까 ③ 놓은 덕분에 ④ 놓는 바람에

3. 다음 글을 읽고 무엇에 대한 글인지 고르십시오. පහත ඇති ඡේදය කියවා කුමක් සම්බන්ධව සඳහන් වී ඇත්ද යන්න තෝරන්න.

고용허가제를 통해 한국에 온 외국인 근로자들은 상해 보험에 가입해야 합니다. 상해 보험은 업무 외적인 사고나 질병에 대해서도 보상받을 수 있습니다.

සේවානියුක්ති අවසරපත් ක්‍රමය මාර්ගයෙන් කොරියාවට පැමිණි විදේශික කම්කරුවන් හදිසි අනතුරු රක්ෂණය අයදුම් කල යුතුයි, හදිසි අනතුරු රක්ෂණය ආයතනයෙන්/වැඩබිමෙන් පිටතදී වන අනතුරු සහ රෝගයන් සඳහා ද වන්දි ලබා ගත හැකිය.

① 보험 가입 안내 ② 보험 회사 소개
③ 상해 보험 종류 ④ 보험금 납입 방법

정답 1. ① 2. ③ 3. ①



발음 උච්චාරණය



P-30

හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.

ක්‍රියාප්‍රකෘතියේ හල්කිරීම් ලෙස ‘ㄴ, ㅁ’ හෝ යෙදෙන විට මීට පිටුපසින් ‘ㄱ, ㄷ, ㅅ, ㅈ’ වලින් පටන්ගන්නා ප්‍රත්‍යයෙදේ නම් [ㄲ], [ㄸ], [ㅆ], [ㅉ] ලෙස උච්චාරණය කරයි.

(1) (신발을) 신고, (의자에) 앉자
(2) (실을) 감자, (음식이) 남고
(3) 운동화를 신고 왔어요.
(4) 땀을 많이 흘렸으니까 머리를 감자



급여 명세서를 확인해 보세요


කරුණාකර ඔබේ ගෙවීම් පත් පරීක්ෂා කර බලන්න

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

▫ අධ්‍යයන අරමුණු	වැටුප් වාර්තාව පරීක්ෂා කිරීම / අමතර ගෙවීම් පරීක්ෂා කිරීම
▫ ක්‍රියාකාරකම්	වැටුප් වාර්තාවේ ඉතිරි කොටස කියවීම
▫ වචන භාවිතය සඳහා උපදෙස්	වැටුප් සහ බදු / අමතර දීමනා
▫ සංස්කෘතික තොරතුරු	මාසික වැටුප්



대화 1 සංවාදය 1





පුද්ගලයින් දෙදෙනා වැටුප් වාර්තාව පිළිබඳ කතාකරමින් සිටියි. වැටුප් වාර්තාවට අනුව සැබවින්ම ලැබෙන මුදල් වලට කුමක්යැයි කියන්නේද? මුලින්ම සංවාදයට දෙවරක් සවන්දී අනුගමනය කරන්න.

민수 이반 씨, 통장 확인해 봤어요? 월급이 들어왔을 텐데요.
පුද්ගලයින් දෙදෙනා වැටුප් වාර්තාව පිළිබඳ කතාකරමින් සිටියි. වැටුප් වාර්තාවට අනුව සැබවින්ම ලැබෙන මුදල් වලට කුමක් කියන්නේද? මුලින්ම සංවාදයට දෙවරක් සවන්දී අනුගමනය කරන්න.

> **통장** බැංකු පොත
> · 통장을 확인하다 බැංකු පොත පරීක්ෂා කිරීම

이반 네, 그런데 생각보다 적은 것 같아요. 계약서에서 본 금액이 아니더라고요.
ඔව්, නමුත් හිතුවට වඩා අඩුයි වගේ! ගිවිසුම තුල සටහන් වෙලා තියෙන්නේ මේ මුදල නෙමෙයිනේ.

지은 아, 그건 각종 보험과 세금 때문이에요. 계약된 임금에서 세금하고 보험료를 뺀 만큼 받거든요.
ආ, ඒක රක්ෂණ ගාස්තු සහ බදු නිසානේ, මූලික ගෙවීම් වල බදු සහ රක්ෂණ ගාස්තු කැපිලා ඉන්පසුව ඉතිරි මුදල ලැබෙනවා.

> **각종** ඔක්කොම වගේ

이반 아, 계약서의 임금을 모두 받는 게 아니군요.
ආ, ගිවිසුමේ ගෙවීම් ඔක්කොම ලැබෙන්නෙ නැහැ.

지은 네, 급여 명세서를 보면 실수령액이라는 게 있는데, 그게 이반 씨가 실제로 받는 돈이에요.
ඔව්, ගෙවීම් වැටුප් වාර්තාව් බැලුවම වැරදි වගේ පේනවා, ඒක ඉබන් මහත්මිය ඇත්තටම ලැබූ මුදල්ය.

> **실제로** ඇත්තෙන්ම/ සැබවින්ම

이반 그렇군요. 다시 급여 명세서를 확인해 봐야겠어요. 고마워요.
එහෙමද. නැවත ගෙවීම්පත් පරීක්ෂා කර බලන්න ඕන. ස්තුතියි.



හොඳින් සවන්දී අනුගමනය කළාද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 이반 씨가 계약된 임금보다 임금을 적게 받은 이유는 뭐예요?
   ඉබන් මහත්මිය ගිවිසුම් කරගත් වැටුපට වඩා අඩු වැටුපක් ලැබීමට හේතුව කුමක්ද?
2. 실제로 받는 돈을 알고 싶으면 급여 명세서에서 무엇을 봐야 해요?
   ඇත්තටම ලැබුනු මුදල් දැන ගැනීමට අවශ්‍යය නම් පඩි වාර්තාවේ කුමක් බැලිය යුතුද?

정답 1. 계약된 임금에서 세금하고 보험료를 뺀 만큼 받기 때문이에요. 2. 실수령액이라고 해요.



어휘 1 වචන මාලාව 1 급여와 세금 වැටුප සහ බදු



වැටුප් ගෙවීම් ලැයිස්තුවේ කුමක් තිබේද? වැටුප් ගෙවීම් ලැයිස්තුවේ කුමක් පරික්ෂා කරන්න අවශ්‍යදැයි විමසා බලමුද?



급여 명세서
වැටුප් පත (වැටුප් වාර්තාව)



급여 내역
වැටුප් විස්තරය




기본급
මූලික වැටුප



실수령액
දළ වැටුප



세금
බදු



식대
යැපීම් දීමනාව



총액
මුළු වැටුප



공제하다
අඩු කිරීම



상여금
ප්‍රසාද දීමනා(බෝනස්)



퇴직금
අර්ථ සාධක අරමුදල



국민연금
ජාතික විශ්‍රාම වැටුප්



연말정산
බදු වාර්තාව



ඉදිරියෙන් ඇති වචනමාලාව දෙස නොබලමින් පහත ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න උත්සාහ කරන්න.


1. 그림을 보고 〈보기〉처럼 대화를 완성하세요. පින්තූර බලා උදාහරණ පරිදි සංවාදය සම්පූර්ණ කරන්න.



보기

가: 급여 명세서에서 뭘 확인해야 해요?
ගෙවීම් පොත්පත් (වැටුප් වාර්තා) මාසිකව පරික්ෂා කළාද?

나: 세금이 맞는지 잘 계산해 보세요.
බදු නිවැරදිව හරියට ගණන් හදල බලන්න.



1) 2)  3) 4) 

2. 빈칸에 맞는 표현을 골라 대화를 완성하세요.
හිස්තැනට ගැළපෙන ප්‍රකාශය තෝරා සංවාදය සම්පූර්ණ කරන්න.

1)
가: 이번 달에는 월급이 조금 많은 것 같아요.
මේ මාසයේ වැටුප ටිකක් වැඩියි වගේ.
나: 곧 있으면 추석이니까 ____________이 같이 나왔을 거예요.
චුසොක් එන නිසා ප්‍රසාද දීමනා බෝනස් එකත් එක්කම ලබා ගන්න පුලුවන්.

① 상여금 ② 퇴직금

2)
가: 주민세하고 소득세는 뭐예요? ජීවන බද්ද සහ ආදායම් බදු මොනවාද?
나: 그건 월급에 대한 기본적인 ____________이에요/예요.
එය වැටුප සම්බන්ධ මූලික බද්දයි.

① 세금 ② 보험료

3)
가: 급여 명세서에서 실제로 받는 돈을 확인하려면 뭘 봐야 해요?
වැටුප් වාර්තාවේ පුහුණුවේදී ලැබූ මුදල් පරික්ෂා කිරීමට මොකක්ද බැලිය යුත්තේ?
나: ____________이라고 쓰여 있는 부분을 보세요.
දළ වැටුප අවසානයේ අතට ලැබෙන මුදල ලෙස ලියා තිබෙන කොටස බලන්න.

① 실수령액 ② 공제 총액

4)
가: 보너스는 어떻게 계산해요? බෝනස් ගණන් හදන්නේ කොහොමද?
나: 보통은 ____________을 기준으로 100%, 200% 이렇게 계산해요.
මූලික වැටුප සාමාන්‍යයෙන් 100 ප්‍රතිශයට 200 ප්‍රතිශයට ගණනය කෙරේ

① 수당 ② 기본급

정답 1. 1) 가: 급여 명세서에서 뭘 확인해야 해요? 나: 총액이 맞는지 잘 계산해 보세요.
2) 가: 급여 명세서에서 뭘 확인해야 해요? 나: 실수령액이 맞는지 잘 계산해 보세요.
3) 가: 급여 명세서에서 뭘 확인해야 해요? 나: 기본급이 맞는지 잘 계산해 보세요.
4) 가: 급여 명세서에서 뭘 확인해야 해요? 나: 식대가 맞는지 잘 계산해 보세요.
2. 1) ① 2) ① 3) ① 4) ②



대화 2 සංවාදය 2

Track 170



මේ දිනවල ඛාන් මහතාට වැඩ වැඩි නිසා රාත්‍රී වැඩ මුරය කලා. ආයතනන සේවිකාව සමඟ කුමක් පිළිබඳ සංවාදයක යෙදී සිටියිද? මුලින්ම සංවාදයට දෙවරක් සවන් දෙන්න.

여직원 **칸 씨, 안녕하세요. 요즘 많이 바쁘지요?**
ඛාන් මහත්මයා. ආයුබෝවන්. මේ දවස් වල ගොඩක් කාර්යය බහුලයිද?

칸 **네, 일이 많아서 지난주에도 계속 야근을 했어요.**
ඔව්. වැඩ ගොඩක් තියෙන නිසා ගිය සතියෙත් දිගටම රාත්‍රී වැඩ කළා.

여직원 **그러게요. 곧 명절이라서 그런지 일이 몰리네요.**
එහෙමද. ජාතික නිවාඩු දිනයක් උණත් වැඩට තදින් යොමුවෙලා වැඩ කළා.

칸 **그래도 야근 수당도 받고 상여금도 받으니까 이번 달은 부자 되겠어요.**
එහෙම උණත් රෑ වැඩ දීමනාව ලබාගෙන ප්‍රසාද දීමනාව ලැබුන නිසා මේ මාසයේ පොහොසත් වුණා.

여직원 **하하, 휴일에는 좀 쉬세요. 돈도 좋지만 건강도 챙기셔야죠.**
හාහා, නිවාඩු දිනයේ ටිකක් විවේක ගන්න. මුදල් වැදගත් උනත් සෞඛ්‍ය ගැනත් හිතන්න.

칸 **그럴게요. 고마워요.**
එහෙම කරන්නම්. ස්තුතියි.

> **일이 몰리다**
> වැඩට තදින් යොමුවෙලා වැඩ කරනවා

> **-아서/어서 그런지**
> ක්‍රියාවකට නාම විශේෂණයකට හෝ නාම + 이다' පදය එක් කිරීමෙන් අස්ථිර හේතුවක් පෙන්වයි.
> • 오늘은 날씨가 좋아서 그런지 공원에서 산책하는 사람들이 많네요.
> අද කාලගුණය හොඳ නිසා උද්‍යානයේ ඇවිදින පුද්ගලයන් ගොඩයි.



දැන් කාන්තා සේවිකාව සහ ඛාන් මහත්මයා අතර සංවාදය අනුගමනය කරන්න. හොඳින් සවන්දී අනුගමනය කලාද? එසේනම් පහත ගැටලුවට පිළිතුරු ලබා දෙන්න.

1. 칸 씨는 왜 계속 야근을 했어요?
   ඛාන් මහත්මය රාත්‍රි වැඩමුරම කරන්නේ ඇයි?
2. 칸 씨가 여직원에게 이번 달은 부자가 되겠다고 한 이유는 뭐예요?
   ඛාන් මහත්මයා, මේ මාසේ පොහොසතෙක් වුනා කියන්න හේතුව කුමක්ද?

정답 1. 일이 많았어요.
2. 이번 달에는 야근 수당도 받고 상여금도 받기 때문이에요.



어휘 2 වචන මාලාව 2 수당 දීමනා


මූලික වැටුප සඳහා වන දීමනා කවද්ද ලැබෙන්න තියෙන්නේ? දීමනා සහ සම්බන්ධ වචන මොනවාදැයි දැන ගනිමුද?



법정 근로 시간
සම්මත වැඩ කරන කාලය/පැය ගණන (පැය 8)



연장 근로 시간
අතිකාල වැඩ කරන කාලය/පැය ගණන




야간 근로 시간
රාත්‍රී වැඩ කරන කාලය/පැය ගණන (පැය 8)



휴일 근로 시간
නිවාඩු දින වැඩ කාලය/පැය ගණන




수당을 받다
ප්‍රසාද දීමනා ලැබෙනවා (බෝනස් ලැබෙනවා)



포함되다
ඇතුලත් වෙනවා (වැටුප ප්‍රසාද දීමනා)




별도로 지급하다
වෙන වෙනම ගෙවනවා




가불하다
අත්තිකාරම් ගෙවනවා(පොළී නොමැතිව ඉදිරි වැටුපෙන් කපා ගැනීමට කලින් ලබා දෙන මුදල)

한시간 : 5,210원
두 시간 : 10,420원
세시간 : 15,640원
...
...

시급
පැයක වැටුප



일당
දිනක වැටුප



최저임금
අවම වැටුප



ඉහත ඇති වචනමාලව දෙස නොබලා පහත ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න උත්සහ කරන්න.

1. 빈칸에 맞는 표현을 골라 대화를 완성하세요.
හිස්තැනට ගැළපෙන ප්‍රකාශය තෝරා සංවාදය සම්පූර්ණ කරන්න.

1)

가: 야간 근로 수당은 얼마예요? රාත්‍රී වැඩ සේවක දීමනාව කොපමණද?
나: 일한 시간만큼 줘요. 하지만 일반 근무 시간의 __________보다는 높아요.
වැඩ කර තරමට දෙනවා. නමුත් සාමාන්‍ය වැඩ කරන වෙලාවල් වලට වඩා (පැයට වැටුප) වැඩියි.

① 시급　　② 세금

2)

가: 수당은 언제 받을 수 있어요? ප්‍රසාද දීමනා කවද්ද ලබාගන්න පුළුවන්ද?
나: 보통은 월급에 __________ 나오니까 월급하고 같이 지급돼요.
සාමාන්‍යයෙන් වැටුප (ඇතුලත්ව) ලැබෙන නිසා වැටුප සමඟ ගෙවනවා.

① 가불해 ② 포함돼

3)

가: 이번 달에는 수당이 안 나온 것 같아요. මේ මාසයේ ප්‍රසාද දීමනා ගෙවීම් ලැබෙන්නේ නැහැ වගේ.
나: 네, 경리과에서 문제가 있어서 이번 달만 __________.
ඔව්. ගිණුම් වල ප්‍රශ්ණයක් නිසා මේ මාසයේ විතරක්(වෙනත් අයුරකින් ගෙවනවා).

① 수당을 받는대요 ② 별도로 지급한대요

4)

가: 시급은 얼마예요? පැයකට වැටුප කීයද?
나: 보통은 __________을 기준으로 계산하면 돼요.
සාමන්‍යයෙන් (අවම ගෙවීමා මූලිකව එකතු කර දෙනවා).

① 일당 ② 최저임금

2. 그림을 보고 알맞은 말을 연결하세요.

පින්තූරය බලා ගැලපෙන වචනය සම්බන්ධ කරන්න.

① ② ③ ④

㉠ 야간 근로 시간 ㉡ 법정 근로 시간 ㉢ 연장 근로 시간 ㉣ 휴일 근로 시간

정답 1. 1) ① 2) ② 3) ② 4) ② 2. ① ㉡ ② ㉣ ③ ㉠ ④ ㉢



유용한 표현 වැදගත් වන ප්‍රකාශන.

일손이 부족해요. කම්කරුවන් හිඟයි.

가: 요즘은 주문이 많아요. මේ දින වල ඇනවුම් ගොඩයි.
나: 네, **일손이 부족해요.** ඔව්. **කම්කරුවන් හිඟයි.**



활동 ක්‍රියාකාරකම්

이반 씨의 급여 명세서입니다. 잘 읽고 질문에 답하세요.
ඉබන් මහත්මයාගේ වැටුප් විස්තරයයි. හොඳින් කියවා ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

2014년 6월분 급여 명세서 2014 ජූනි මස වැටුප් විස්තරය

성명: 이반 නම x ඉබන්	사원번호: 20130213 සේවක අංකය - 20130213	급여산정기간: 2014년 6월 1일 ~ 6월 30일 ගෙවීම් කාලය - 2014ග06ග01ඩ06ග30	
은행 බැංකුව	한국은행 කොරියා බැංකුව	계좌번호 ගිණුම් අංකය	123-4567-898990

세부내역 තොරතුරු විස්තර

급여 내역 ඉපයීම්		세금 내역 බදු ගෙවීම්		공제 내역 අඩු කිරීම්	
기본급 මූලික වැටුප	1,088,890원	소득세 බද්ද	10,888원	국민연금 රජයේ ගාස්තු	55,252원
연장 근로 수당 අතිකාල දීමනා	36,470원	주민세 ජීවන බද්ද	1,088원	건강 보험 සෞඛ්‍ය රක්ෂණය	19,890원
야간 근로 수당 රාත්‍රී වැඩ දීමනාව	46,890원			고용보험 සේවක රක්ෂණය	5,252원
휴일 근로 수당 නිවාඩු දින වැඩ දීමනා	0원				
식대 ආහාර දීමනාව					

급여 총액 මුළු ඉපයීම්	1,172,250	세금 총액 මුළු බදු	11,976	공제 총액 මුළු අඩු කිරීම්	80,394
실수령액 දළ වැටුප (අවසානයේ අතට ලැබෙන මුදල)				1,079,880	

1. 이반 씨가 이번 달에 실제로 받은 돈은 얼마입니까?
   ඉබන් මහත්මයාගේ මේ මාසයේ අතට ලැබුනු මුදල කොපමණද?

   ① 1,088,890원 ② 1,079,880원 ③ 1,172,250원 ④ 1,197,600원

2. 급여 명세서에 대한 설명으로 알맞은 것을 고르십시오.
   වැටුප් විස්තරය සම්බන්දයෙන් වඩාත් නිවැරදි එක තෝරන්න.

   ① 이반 씨는 세금으로 10,888원을 냈습니다.
   ② 이반 씨는 고용보험에 가입하지 않았습니다.
   ③ 이반 씨는 법정 근로 시간 이외에 일을 했습니다.
   ④ 이반 씨가 2013년 6월에 일한 것에 대한 임금입니다.

정답 1. ② 2. ③

월급

මාසික වැටුප්

월급을 받는 방법 වැටුප් ලබන ක්‍රම

월급은 한 달에 한 번 일한 것에 대한 대가를 받는 것을 말합니다. 월급은 보통 한국에서 개설한 은행의 통장으로 바로 입금됩니다. 월급은 현금으로 바로 받는 것보다는 통장으로 계좌이체를 해서 받는 것이 안전합니다. 또한 월급을 받을 때는 기본급과 수당 공제 내역이 기재된 월급명세서를 함께 받아서 금액이 정확한지 확인하는 것이 좋습니다.

මාසික වැටුප් මාසයක් වැඩ කිරීම වෙනුවෙන් ලබා දෙන ප්‍රතිලාභ ගෙවීමක් ලෙස හඳුන්වනවා, මාසික වැටුප සාමාන්‍යයෙන් කොරියාවේදී බැංකු පොතට කෙලින්ම බැර කරනවා, වැටුප මුදලින් කෙලින්ම ලබන ක්‍රමයට වඩා බැංකු පොතට කෙළින්ම බැර කරන එක ආරක්ෂිතයි, තවද වැටුප් ලැබීමේදී මූලික වැටුප සහ දීමනා වලින් අඩු කිරීම් කර පඩි වාර්තාව සමඟ එකවර ලබාගෙන පරික්ෂා කිරීම වඩාත් හොඳයි.

월급 계산하기 මාසික වැටුප ගණනය කිරීම

급여는 기본급과 수당으로 구성됩니다. 기본급은 최저 임금보다 높게 책정되어야 합니다. 수당은 연장 근로 수당, 야간 근로 수당, 휴일 근로 수당이 있습니다. 각 수당들은 기준 시급의 1.5배에서 2.5배로 계산됩니다. 수당의 기준과 계산식은 대략 다음과 같습니다.

සම්පූර්ණ වැටුප මූලික වැටුප සහ දීමනා වලින් සමන්විත වේ, මූලික වැටුප අවම වැටුපට වඩා වැඩි විය යුතුයි, දීමනා ලෙස අත්තිකාල දීමනා. රාත්‍රී වැඩ දීමනා. නිවාඩු දින දීමනා ආදිය තිබේ, එක් එක් අත්තිකාල දීමනා ගෙවීම සාමාන්‍ය පැයක වැටුපට මෙන් 1.5 සිට 2.5 දක්වා ඉහළ අගයකින් ගෙවයි, දීමනා වල අනුපාතය ගණනය කිරීම පහත දැක්වෙන පරිදි වේ.

수당 දීමනා	기준 අර්ථ දැක්වීම(විස්තර කිරීම)	공제 내역 අඩු කිරීම්
연장 근로 අත්තිකාල දීමනා	1일 8시간 초과 일할 경우 දිනකට පැය 8කට වඩා වැඩ කිරීමේදී	기준 시급×근로 시간×1.5배 සාමාන්‍ය පැයක වැටුප × වැඩ කල පැය ගණන × 1.5
야근 근로 රෑ වැඩ දීමනා	밤 10시부터 새벽 6시 사이에 일할 경우 රාත්‍රී 10 සිට අළුයම 6 දක්වා වැඩ කිරීමේදී	기준 시급×근로 시간×2배 සාමාන්‍ය පැයක වැටුප × වැඩ කල පැය ගණන × 2
휴일 근로 නිවාඩු දින වැඩ දීමනා	휴일에 일할 경우 නිවාඩු දින වැඩ කිරීමේදී	기준 시급×근로 시간×1.5배 සාමාන්‍ය පැයක වැටුප × වැඩ කල පැය ගණන × 1.5
휴일 연장 නිවාඩු දින අත්තිකාල දීමනා	휴일에 8시간 이상 일할 경우 නිවාඩු දින පැය 8කට වඩා වැඩ කිරීමේදී	기준 시급×근로 시간×2배 සාමාන්‍ය පැයක වැටුප × වැඩ කල පැය ගණන × 2
휴일 야간 නිවාඩු දින රෑ වැඩ දීමනා	휴일밤 10시부터 새벽 6시 사이에 일할 경우 නිවාඩු දින රාත්‍රී 10 සිට අළුයම 6 දක්වා වැඩ කිරීමේදී	기준 시급×근로 시간×2.5배 සාමාන්‍ය පැයක වැටුප × වැඩ කල පැය ගණන × 2.5

최저 임금제 අවම වැටුප් නීතිය

근로자들의 생활 안전을 위해 임금의 최저 기준을 법으로 보장하는 제도입니다. 최저 임금은 매년 발표하며, 매년 그 금액이 다릅니다.

කම්කරුවාගේ ජීවිතය ආරක්ෂාව සඳහා අවම වැටුප් නීතිය හඳුන්වා දී තිබේ. අවම වැටුප් නීතිය වාර්ෂිකව නිවේදනය කිරීමෙන් වාර්ෂිකව ඒ වෙනස්කම් දන්වනවා.

구분 වර්ෂය	시간급 පැයක වැටුප	일급 (8시간 근무) දිනක වැටුප (දිනකට පැය 8)	월급 මාසික වැටුප	
			주 40시간제 (5인 이상 사업장) සතියකට පැය 40 (සේවකයන් 5කට වඩා ඇති කම්පැණි වල)	주 44시간제 (4인 이하 사업장) සතියකට පැය 44 (සේවකයන් 4ට වඩා අඩු කම්පැණි වල)
2011년	4,320원	34,560원	902,880원	976,320원
2012년	4,580원	36,640원	957,220원	1,035,080원
2013년	4,860원	38,880원	1,015,740원	1,098,360원
2014년	5,210원	41,680원	1,088,890원	-



EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK



අංක 1 සහ අංක 2 හොඳින් සවන්දී කුමක් පිළිබඳ සංවාදයක්ද යන්න තෝරන ප්‍රශ්නයි. සවන් දීමට පෙර වචන හොඳින් එක් වරක් කියවා බලන්න.

[1~2] 다음을 듣고 무엇에 대한 대화인지 고르십시오.
පහත දේට සවන් දී කුමක් සම්බන්ද සංවාදයක්ද යන්න තෝරන්න.

Track 171

1. ① 상여금　② 실수령액　③ 공제 총액　④ 세금 총액

2. ① 보험　② 기본급　③ 보너스　④ 연장 근로 수당



අංක 3 සහ අංක 4 ගැළපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ. අංක 5 සංවාදයට සවන් දී ප්‍රශ්නයට ගැලපෙන පිළිතුර තෝරන ප්‍රශ්නයකි. සවන් දීමට පෙර උදාහරණයේ අන්තර්ගතය එක් වරක් කියවා බලන්න.

[3~4] 질문을 듣고 알맞은 대답을 고르십시오.
ප්‍රශ්නයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන්න.

3. ① 네, 별도로 지급한대요.　② 네, 세금이 공제된 금액이에요.
③ 네, 가불을 신청해 보세요.　④ 네, 월급하고 같이 받으면 돼요.

4. ① 네, 급여 명세서를 보세요.　② 네, 보험료를 다 더해 보세요.
③ 네, 최저 임금을 확인해 보세요.　④ 네, 기본급하고 수당을 더해 보세요.

5. 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오.
කතාබහට සවන්දී ප්‍රශ්ණයට ගැලපෙන පිළිතුර ලකුණු කරන්න,

여자는 왜 월급을 많이 받았습니까? කාන්තාව ඇයි වැටුප ගොඩක් ලැබුවේ?

① 세금이 많아져서　② 수당이 포함돼서
③ 기본급이 올라서　④ 상여금을 받아서



듣기 대본 ශ්‍රවණ පිටපත

1. 남: 이 금액이 제가 받는 월급이지요? මේ මුදල මම ලබාගත් වැටුපද?

   여: 네, 총액에서 세금을 뺀 금액을 실제로 받게 돼요.
   ඔව්. මුලු වැටුපෙන් බදු අඩුකල විට දල වැටුප ලැබෙනවා.

2. 여: 이번 달에는 월급이 많네요. මේ මාසයේ වැටුප ගොඩයි.

   남: 네, 연장 근무랑 야간 근무가 많았거든요. ඔව්. අත්තිකාල දීමනා රාත්‍රී වැඩ දීමනා ගොඩක් තියනවා.

3. 남: 월급을 미리 받을 수 있어요? වැටුප වේලාසන ලබා ගන්න පුලුවන්ද?

4. 여: 세금이 얼마인지 알아요? බදු කොපමනණද කියලා දන්නවද?

5. 남: 이번 달에 월급 나왔어요? මේ මාසයේ වැටුප ලැබුනද?

   여: 네, 그런데 생각보다 조금 많네요. ඔව්. නමුත් හිතුවට වඩා ටිකක් වැඩියි.

   남: 휴일 근로 수당이 같이 들어왔을 거예요. 한번 확인해 보세요.
   නිවාඩු දින වැඩ දීමනාවත් සමග ඇවිල්ලා වගේ. එක පාරක් පරික්ෂා කරල බලන්න.

정답 1. ② 2. ④ 3. ③ 4. ① 5. ②

확장 연습 තවදුරටත් වන අභ්‍යාස L-55

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු තෝරන්න.

   월급이 많이 나온 이유는 무엇입니까? වැටුප් වැඩිපුර ලැබීමට හේතුව කුමක්ද?

   ① 일을 열심히 해서 ② 상여금이 들어와서
   ③ 밤에 일한 돈을 받아서 ④ 주말 근무 수당이 나와서

확장 연습 듣기 대본 තවදුරටත් වන අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 여: 타타 씨, 월급이 들어온 것 같던데 통장 확인해 봤어요?
   ටාටා මහතා, වැටුප් දාලා වගෙයි බැංකු පොත වරක් පරීක්ෂා කර බැලුවාද?

   남: 네, 그런데 생각보다 많이 나온 것 같아요. 지난달에는 야간 근무도 없었고 주말에도 일을 안 했는데요.
   ඔව්, ඒත් හිතුවට වඩා වැඩි වැටුප් ප්‍රමාණයක් ඇවිත් වගෙයි. ගිය සතියේ රාත්‍රී වැඩ මුරයත් නැතිව සති අන්තයෙත් වැඩ කළේ නැනේ.

   여: 추석 상여금이 있어서 월급이 많은 거예요.
   චුසොක් දිනයට බෝනස් තියෙන නිසා වැටුප වැඩි වෙලා ඇත්තේ.

   남: 아, 그래요? 상여금도 받았으니 좀 더 열심히 일해야겠네요.
   ආ එහෙමද? ප්‍රසාද බෝනස් ලැබුණු නිසා තවත් මහන්සි වෙල වැඩ කරන්න ඕනේ.

정답 1. ②



EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සහ අංක 2 ගැලපෙන වචන තෝරන ප්‍රශ්නයි. ඉහත ඉගනගත් වචන සිහිකරමින් ප්‍රශ්නවලට පිලිතුරු සපයන්න

[1~2] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

1. 1년 이상 근무한 근로자가 회사를 그만둘 때는 __________ 을/를 지급해야 합니다.
   වසරකට වඩා වැඩියෙන් සේවය කල කම්කරුවාට රැකියාවෙන් ඉවත් වීමේදී අර්ථසාධක මුදල් ගෙවීමට සිදු වේ.

   ① 상여금　② 기본급　③ 보너스　④ 퇴직금

2. 실수령액은 월급의 총액에서 세금을 __________ 금액입니다.
   දල වැටුපේ මූලික වැටුපෙන් මුලු වැටුප (අඩු කිරීම) ඉතිරිය වේ.

   ① 포함한　② 가불한　③ 공제한　④ 지불한



අංක 3 සහ 4 සංවාදයේ මාතෘකාව තෝරන ප්‍රශ්න වේ. අංක 5 වසර අවසාන බදුගෙවීම පිළිබඳ ඡේදය කියවා පිලිතුරු සපයන ප්‍රශ්නයක් වේ.

[3~5] 다음 질문에 답하십시오. පහත ගැටලුවට පිළිතුරු සපයන්න.

3. 가: 어젯밤 몇 시까지 일을 했어요? ඊයේ රෑ කීය දක්වා වැඩ කළාද?
   나: 조금 늦게까지 일을 했지만 10시 전에 퇴근했어요.
   ටිකක් පරක්කු වෙනකම් වැඩ කළනමුත් 10ට කලින් වැඩ අවසන් කළා.

   두 사람은 무엇에 대해 이야기하고 있습니까? මිනිසුන් දෙදෙනා කුමක් සම්බන්දව කතා කරමින් සිටින්නේ?

   ① 법적 근로 시간　② 야간 근로 시간　③ 연장 근로 시간　④ 휴일 근로 시간

4. 가: 수당을 계산할 때 왜 6,030원으로 해요? දීමනා ගණනය කිරීමේදී ඇයි වොන් 6030ට හදන්නේ?
   나: 그 금액이 법으로 정한 임금의 최소 기준이거든요.
   ඒ ගණන නීතියෙන් නියම කර ඇති අවම පැයක වැටුප නිසා.

   두 사람은 무엇에 대해 이야기하고 있습니까? දෙදෙනා කුමක් සම්බන්දව කතා කරමින් ඉන්නවාද?

   ① 국민연금　② 고용 보험　③ 최저 임금　④ 급여 내역

5. 근로자들은 기본급 이외에 상여금과 수당 등 매월 다른 금액의 급여를 받게 됩니다. 그렇지만 매월 발생하는 근로 소득에 대한 세금을 정확하게 계산하는 것은 굉장히 복잡합니다. 따라서 급여를 지급할 때 간단한 세금 계산표로 세금을 공제하고, 다음해 2월에 실제 부담해야 할 세금을 정확하게 계산합니다. 이것을 ㉠__________(이)라고 합니다.
   කම්කරුවන්ට මූලික වැටුප බෝනස් ගෙවීම් ආදිය සෑම මාසයකම වෙන වෙනම ලබා දෙනවා, ඒ උණත් සෑම මසකම සිදුවන කම්කරු ආදායම් සම්බන්ධ බදු නිවැරදිව ගණන් බලන එක අමාරුයි, මේ නිසා ගෙවීම් කිරීමේදී ප්‍රයෝජනවත් බදු ගණනය කර බදු අඩුකර නැවත දෙවන මස ඇත්තටම තීරණය කර ගණනය කරනවා, මෙය ㉠(වසර අවසාන ගණන්) කියලා කියනවා.

   ㉠에 들어갈 알맞은 말을 고르십시오. ㉠ ස්ථානයට වඩාත් ගැලපෙන ප්‍රකාශය ලකුණු කරන්න.

   ① 연말 정산　② 세금 공제　③ 보험료 납부　④ 급여 명세서

정답 1. ④ 2. ③ 3. ② 4. ③ 5. ①



확장 연습 තවදුරටත් වන අභ්‍යාස

[1~2] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

1.

> 월급이 생각보다 적게 들어온 것 같습니다. 급여 명세서를 한번 ______ 봐야겠습니다.
>
> වැටුප හිතුවටත් වඩා අඩුවෙන් ඇවිත් තිබෙනවා වාගෙයි. පරීක්ෂා කරලා බලන්න වෙනවා.

① 옮겨　　② 바꿔
③ 취소해　　④ 확인해

2.

> 급여 명세서를 ________ '실수령액'이라는 것이 있습니다. 이것이 바로 근로자가 실제로 받는 돈입니다.
>
> වැටුප් වාර්ථාව බැලුවම, .දළ වැටුප. කියල එකක් තියෙනවා. ඒ ගාන තමයි කෙලින්ම කම්කරුවාට අතට ලැබෙන වැටුප.

① 보면　　② 봐서
③ 적으면　　④ 적어서

3. 다음 글을 읽고 무엇에 대한 글인지 고르십시오. පහත ඇති ඡේදය කියවා කුමක් සම්බන්ධව සඳහන් වී ඇත්ද යන්න තෝරන්න.

> 일을 하면 한 달에 한 번 통장으로 월급이 들어옵니다. 보통 한국에서 개설한 통장으로 입금됩니다. 현금으로 받는 것보다는 통장으로 입금되는 것이 안전합니다.
>
> වැඩ කරන විට, වැටුප බැංකු පොතට මසකට වරක් පැමිණේ. කොරියාවේදී සාමාන්‍යයෙන් සල්ලි මුදලින් අතට ගන්නවාට වඩා විවෘත කල බැංකු පොතකට පඩිය දමන එක ආරක්ෂාකාරී.

① 월급 계산 방법　　② 통장 개설 방법
③ 월급 지급 방법　　④ 통장 사용 방법


정답 1. ④ 2. ① 3. ③



발음 උච්චාරණය



හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.

හන්ජා හෙවත් (චීන රූපාක්ෂර) භාවිතා කර නිර්මාණය කළ වචනයක් යෙදෙන අවස්ථාවේදී ඉදිරිපස අක්ෂරයේ හල්කිරීම 'ㄹ' වී, පිටුපස අක්ෂරයේ මුල් ව්‍යඤ්ජනය 'ㄷ, ㅅ, ㅈ' වන විට මේ ㄷ, ㅅ, ㅈ අක්ෂර [ㄸ], [ㅆ], [ㅉ] ලෙස උච්චාරණය කරයි.

(1) 발달, 열심, 말살　　(2) 열정, 발전, 실전
(3) 컴퓨터 기술이 발달했어요.　　(4) 저는 한국어를 열심히 공부해요.



이번 여름 휴가 계획은 세웠어?


මෙවර ගිම්හාන නිවාඩුවට මොනවද කරන්නේ කියල සැලසුම් කලාද?

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

- අධ්‍යයන අරමුණු — නිවාඩු ගැන දැනගැනීම, ලෙඩ නිවාඩු දැමීම
- ක්‍රියාකාරකම් — නිවාඩු අයදුම් කරන ආකාරය අවබෝධ කරගැනීම
- වචන භාවිතය සඳහා උපදෙස් — නිවාඩු, ලෙඩ නිවාඩු
- සංස්කෘතික තොරතුරු — නිවාඩු පිලිබඳව කම්කරු නීතිය අවබෝධ කරගැනීම



대화 1 සංවාදය 1





දෙදෙනා ග්‍රීස්ම නිවාඩුව ගැන කතාකරමින් සිටි, ඉබන් මහතාට කවදා නිවාඩු ඉල්ලන පුළුවන් වේවිද? මුලින්ම සංවාදය දෙවරක් සවන්දී අනුගමනය කරන්න.

지훈　이반, 이번 여름 휴가 계획은 세웠어?
ඉබන් මෙවර ග්‍රීස්ම නිවාඩුවට මොනවද කරන්නේ කියල සැලසුම් කළා ද?

이반　아직 아무도 휴가 얘기를 안 해서 휴가를 써도 될지 눈치를 보는 중이야.
තවමත් කවුරුවත් නිවාඩු ගැන මුකුත්ම කියන්නේ නැති නිසා නිවාඩු ඉල්ලන්නවත් ලැබෙයිද නැද්ද කියල බලා බලා ඉන්නෙ.

> **눈치를 보다**
> අනිත් අය මොනවද කරන්නේ කියල බලනවා

지훈　7월 말에는 쉬는 공장이 많으니까 일이 그렇게 많지 않을 거야. 그때쯤 휴가를 신청해 봐.
ජුලි මාසය අගදී නිවාඩු දෙන වැඩපොළවල් ගොඩක් තිබෙන නිසා වැඩ එච්චර ගොඩක් තිබෙන එකක් නැහැ, එතකොට නිවාඩු ඉල්ලලා බලන්න.

이반　그래야겠다. 근데 보통 휴가는 얼마나 쓸 수 있어?
එහෙම කරන්න ඕනෙ. එත් සාමාන්‍යයෙන් නිවාඩුව කොච්චර කාලයකට දෙනවද?

지훈　1년에 연차 15일까지 쓸 수 있는데, 여름 휴가로는 일반적으로 3~4일 정도 쓰는 편이야.
අවුරුද්දකට නිවාඩු 15 දක්වා ගන්න පුළුවන්, ග්‍රීස්ම නිවාඩුවට සාමාන්‍යයෙන් දවස් 3~4 විතර ගන්න පුළුවන්.

> **일반적으로**
> සාමාන්‍යයෙන්



හොඳින් අසා නැවත කියෙව්වා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 이반 씨는 여름 휴가 계획을 세웠어요?
   ඉබන් මහතා ග්‍රීස්ම කාලයට මොනවද කරන්නේ කියල සැලසුම් කළා ද?
2. 보통 휴가는 일 년에 얼마나 쓸 수 있어요? සාමාන්‍යයෙන් අවුරුද්දකට නිවාඩු කියක් ගන්න පුලුවන්ද?

정답　1. 아니요, 아직 세우지 못했어요.　2. 일 년에 연차 15일까지 쓸 수 있어요.



어휘 1 වචන මාලාව 1 **휴가** නිවාඩුව



නිවාඩු දිනය හා නිවාඩුව වෙනස් වෙන්නේ කෙසේද? එහෙනම් නිවාඩුව හා සම්බන්ධ වචන ඉගෙන ගනිමු ද?




휴가를 신청하다
නිවාඩු ඉල්ලනවා




휴가를 내다
නිවාඩු දානවා




휴가를 받다
නිවාඩු ලැබෙනවා




휴가를 쓰다
නිවාඩු ගන්නවා




유급 휴일
පඩි සහිත නිවාඩු




무급 휴일
පඩි රහිත නිවාඩු



법정 휴일
නීතිමය නිවාඩු



약정 휴일
එකඟ වූ නිවාඩු



연차 휴가
වාර්ෂික නිවාඩ



출산 휴가
මාතෘ නිවාඩු



Tip 휴가와 휴일 නිවාඩු හා නිවාඩු දින

휴가와 휴일은 근로자가 쉬는 날이라는 점에서 공통점을 갖습니다. 그러나 휴일이 처음부터 근로 의무가 없는 날인 반면, 휴가는 근로 의무가 있는 날이지만 근로자의 청구나 특별한 사유의 충족으로 인해 이를 면제 받은 날이라는 점에서 차이가 있습니다.

නිවාඩු හා නිවාඩු දින වල කම්කරුවන් විවේක ගන්න දිනයන් යන අදහසින් එකවගේ තේරුමක් තිබෙනවා. නමුත් නිවාඩු දිනය මුල ඉදලම වැඩ නැති දිනයක් වන අතර නිවාඩුව වැඩ තිබෙන දවසක් වුනත් කම්කරුවාගේ විශේෂ ඉල්ලීමක් මත හෝ විශේෂ හේතුවක් නිසා වැඩ නොකිරීමට අවසර ලබාගත් දිනයක් වන අදහසින් අර්ථය වෙනස් වෙයි.



ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න උත්සහ කරන්න.

1. 그림을 보고 알맞은 말을 연결하세요. පින්තූරය බලා ගැලපෙන වචනය සම්බන්ධ කරන්න.

① • • ㉠ 무급 휴가

② • • ㉡ 유급 휴가

③ • • ㉢ 연차 휴가

④ • • ㉣ 출산 휴가

2. 빈칸에 맞는 표현을 골라 대화를 완성하세요.
හිස්තැනට ගැළපෙන ප්‍රකාශය තෝරා සංවාදය සම්පූර්ණ කරන්න.

1)
가: 내일은 달력에 빨간 날도 아닌데 쉬네요.
හෙට දින දර්ශනයේ රතුපාට දිනයක් නොවුවත් නිවාඩු ගන්නවනේ.
나: 네, ___________ 휴일이라서 우리 회사는 쉬어요.
ඔව්, කලින් එකඟ වැඩ නිවාඩුවක් නිසා අපි නිවාඩු ගන්නවා.

① 법정 ② 약정

2)
가: 연차를 사용하는 기간 동안은 임금이 나오지 않는 거예요?
වාර්ෂික නිවාඩු ගන්නා විට පඩි ලැබෙන්නේ නැද්ද?
나: 아니요, ___________ 휴일이니까 임금이 지불돼요.
නැහැ, පඩි සහිත නිවාඩු නිසා පඩි ලැබෙනවා.

① 무급 ② 유급

3)
가: 우리 회사는 ___________ 휴가를 얼마나 줘요?
අපේ සමාගම මාතෘ නිවාඩු කොපමණ කාලයක් දෙනවද?
나: 아기를 낳기 전후로 3개월 준대요. ප්‍රසූතියට පෙර හා පසු මස තුන බැගින් දෙනවා.

① 연차 ② 출산

4)
가: 이번에 휴가를ㅤ___________ 어디에 가고 싶어요?
මෙවර නිවාඩු ලැබුනොත් කොහෙද යන්නේ?
나: 친구들하고 부산에 가 보려고요. යහළුවන් එක්ක බූසාන් යන්න හිතන ඉන්නවා.

① 받으면 ② 신청하면

정답 1. ① ㉡ ② ㉠ ③ ㉣ ④ ㉢ 2. 1) ② 2) ② 3) ② 4) ①



대화 2 සංවාදය 2

Track 173



ඉබන් මහතා ලෙඩ නිවාඩු ඉල්ලීමට සේවකයෙකු සමග කතාකරමින් සිටී. මුලින්ම සංවාදය දෙවරක් සවන් දෙන්න.

이반 병가를 신청하고 싶은데요.
ලෙඩ නිවාඩු දමන්න ඕනේ.

직원 네, 병가라면 어디 아프신 거예요?
ඔව්, ලෙඩ නිවාඩු දාන්න නම් කොහෙද අමාරුව තිබෙන්නේ.

이반 네, 허리가 좀 아파서 병원에 갔는데 수술을 받는 게 좋겠다고 하네요.
ඔව්, කොන්ද ටිකක රිදෙන නිසා රෝහලට ගියහම ශල්‍යකර්මයක් කරන එක හොඳයි කියල කියනවා

직원 수술이요? 그럼 심한 거 아니에요?
ශල්‍යකර්මයක්? එහෙනම් ගොඩක් අමාරු ඇතිනේද?

심하다
ගොඩක් අමාරුයි

이반 간단한 수술이라고 하셨어요. 한 일주일 정도 병가를 쓰면 될 것 같아요.
පොඩි ශල්‍යකර්මයක් කියල කියනවා. එක සතියක් පමණ ලෙඩ නිවාඩු ගත්තොත් ඇති කියල හිතන්නේ.

간단하다
සරල

직원 네, 알겠습니다. 여기 병가 신청서와 필요한 서류들이에요. 잘 읽어 보시고 가급적 빨리 제출해 주세요.
ඔව්, තේරුණා. මේ තියෙන්නේ ලෙඩ නිවාඩු අයදුම් පත්‍රය හා අවශ්‍ය අනෙක් ලියකිවිලියි, හොඳින් කියවල බලල ඉක්මනට බාරදෙන්න.

가급적 빨리
හැකිතරම් ඉක්මනට



ලෙඩ නිවාඩු අයදුම් කරන්නේ කෙසේද? ලෙඩ නිවාඩු හා සම්බන්ධ වචන මොනවාදැයි දැන ගනිමු

1. 이반 씨는 왜 병가를 신청하러 왔어요? ඉබන් මහතා ඇයි ලෙඩ නිවාඩු ඉලන්නේ?
2. 이반 씨는 얼마 동안 병가를 쓰려고 해요? ඉබන මහතා කොපමණ කාලයකට ලෙඩ නිවාඩු ඉල්ලනවද?

정답 1. 허리가 좀 아파서 수술을 받아야 해요.
2. 한 일주일 정도 병가를 쓰려고 해요.



어휘 2 වචන මාලාව 5 병가 ලෙඩ නිවාඩු



ලෙඩ නිවාඩු අයදුම් කරන්නේ කෙසේද? ලෙඩ නිවාඩු හා සම්බන්ද වචන සොයාබලමු?



병가
ලෙඩ නිවාඩු



병가 사유
ලෙඩ නිවාඩු ඉල්ලීමට හේතුව




병가 기간
ලෙඩ නිවාඩු කාල සීමාව

소속
විස්තර



직위
රැකියාව



비상 연락처
හදිසි අවස්ථාවක ඇමතිය හැකි අංකය



통원 치료를 하다
නේවාසික ප්‍රතිකාර



입원을 하다
රෝහලට ඇතුල්වෙනවා



조퇴하다
ඉක්මනට ගෙදර යනවා



결근하다
දැනුම් දීමකින් නිවාඩු දමනවා



무단결근하다
දැනුම් දීමකින් තොරව නිවාඩු දමනවා



ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න උත්සහ කරන්න.

1. 그림을 보고 알맞은 말을 연결하세요.
පින්තූරය බලා ගැලපෙන වචනය සම්බන්ධ කරන්න.



정답 1. ① ㉡ ② ㉠ ③ ㉣ ④ ㉢

2. 빈칸에 맞는 표현을 〈보기〉에서 골라 넣으세요.
හිස්තැනට ගැලපෙන වචනය උදාහරණ තුළින් තෝරා දමන්න.

소속 අංශය	전기과 විදුලි අංශය
성명 නම	이반 ඉබන්
1)	사원 ලිපිකරු
2)	허리통증으로 인한 수술 කොන්දේ අමාරුව නිසා කරන ශල්‍යකර්මය
3)	2015년 4월 6일 ~ 2015년 4월 12일 (7)일간 2015 වර්ෂය 4 මස 6 දින 2015 වර්ෂය 4 මස 12 දින දින(7)ක
1)	031-777-5678

위와 같이 병가를 신청하오니 허락하여 주시기 바랍니다.
ඉහත දැක්වෙන ආකාරයට ලෙඩ නිවාඩු අයදුම් කරන අතර අවසර ලබාදෙන්න.

2015년 4월 1일
2015 වර්ෂය 4 මස 1 දින

소속: 전기과 අංශය විදුලි කාර්මික
성명: 이반 නම ඉබන්

*신청기간이 1주일 이상일 경우 진단서 첨부
අයදුම් කරන කාලය සතියකට වඩා වැඩිනම් වෛද්‍ය වාර්තාව ඉදිරිපත් කරන්න

보기　기간　비상 연락처　직위　사유

정답 2. 1) 직위 2) 사유 3) 기간 4) 비상 연락처

활동 ක්‍රියාකාරකම්

다음을 읽고 질문에 답하세요.
පහත දැක්වෙන්න කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

휴가 신청서 නිවාඩු අයදුම් පත්‍රය

결재 අවසරය	

아래와 같이 허가 신청서를 제출하오니 허락해 주시길 바랍니다
පහත දැක්වෙන ආකාරයට පඩි සහිත නිවාඩු අනුමත කර දැනුම් දෙන්න

2015년 7월 24일

휴가 신청자 නිවාඩු අයදුම් කරන්නා	성명 නම	박지훈 (확인)	소속 및 직위 අංශය හා රැකියාව	기계과 대리 කාලසීමාව
휴가 내용 නිවාඩු අන්තර්ගතය	구분 අංශය හා රැකියාව	생리 휴가 ( ) 출산 휴가 ( ) මානසික ආතතියට නිවාඩු මාතෘ නිවාඩු 병가 ( ) 연월차휴가 (✓) 기타 ( ) ලෙඩ නිවාඩු මාසික නිවාඩු වෙනත්		
	사유 හේතුව	여름 휴가 ග්‍රීස්ම නිවාඩුව		
	기간(시간) කාල සීමාව	2015년 7월 25일 ~ 2015년 7월 28일 2015 වර්ෂය 7 මස 25 දින ~ 2015 වර්ෂය 7 මස 27 දින		
행선지 ගමන්කරන ස්ථානය	전라남도 순천 චොන්රානම්දෝ සුන්චොන්			
긴급 연락처 හදිසි ඇමතුම් අංකය	010-1234-5678			

1. 위의 휴가 신청서의 내용과 다른 것을 고르세요.
ඉහත පඩි සහිත නිවාඩුව හා වෙනස් දෙය තෝරන්න.

① 연차 휴가를 신청하려고 합니다.
② 여름휴가로 전라남도 순천에 갈 예정입니다.
③ 휴가 기간 3일 전에 휴가 신청서를 제출했습니다.
④ 박지훈 씨는 현재 기계과 대리로 일하고 있습니다.



휴가에 대한 근로 기준법의 이해

නිවාඩුව පිළිබඳ කම්කරු නීතිය

법정 휴일(휴가) නීතිය මගින් නියමකර ඇති නිවාඩු

「근로 기준법」에 의해 규정된 휴가 또는 휴일을 말합니다. 근로 기준법상 휴일은 제 55조에 의한 '유급 주휴일'(사용자는 근로자에게 1주일 평균 1회 이상의 유급 휴일을 주어야 한다.)과 「근로자의 날 제정에 관한 법률」에 의한 '근로자의 날(매년 5월 1일)'입니다.

කම්කරු ප්‍රමිති පනත මඟින් නියම කර ඇති නිවාඩු දින හෝ නිවාඩුදීම, කම්කරු ප්‍රමිති පනත යටතේ නිවාඩු දිනවල සේවකයින්ට ගෙවිය යුතු සතිපතා නිවාඩු සේවකයකු සතියකට අවම වශයෙන් එක් ගෙවන නිවාඩු එක්වරකට අවම වශයෙන් සතියකට ගෙවා දැමිය යුතුය (මැයි 1 කම්කරු දිනය).

약정 휴일(휴가) අනුමත නිවාඩු

회사의 단체 협약 등에서 정하여 시행하는 휴가 또는 휴일을 말합니다. 약정 휴일에 관해서는 근로 기준법에서 규정하고 있지 않습니다. 약정 휴일에 관하여는 회사의 단체협약 등에서 정하여 시행하고 있으며 단체 협약에서 정해진 사항에 대해서는 노사 당사자가 준수해야 합니다.

එය සාමූහික ගිවිසුම් මගින් නිශ්චය කරනු ලබන හා බලාත්මක වන නිවාඩු හෝ නිවාඩු සඳහා යොමු වේ. නිතිපතා නිවාඩු දින කම්කරු ප්‍රමිති පනත මගින් ආවරණය නො වේ. නිවාඩු සමය තුළ, එය සාමූහික ගිවිසුම මගින් ක්‍රියාත්මක වන අතර එය සාමූහික ගිවිසුමේ සඳහන් කරුණු කම්කරු හා කළමනාකරණ පක්ෂ විසින් නිරීක්ෂණය කළ යුතුයි.

구분 කොටස	법정 නීතිය	약정 අනුමත
휴일 නිවාඩු දිනය	- **주휴일** සතියේ නිවාඩු - **근로자의 날** කම්කරු දිනය	- **공휴일** පොදු නිවාඩු - **회사 창립일** සමගම පටන්ගත් දිනය - **기타 휴무일** වෙනත් නිවාඩු දින
휴가 නිවාඩුව	- **연차 휴가** පඩි සහිත නිවාඩු - **생리 휴가** මානසික නිවාඩු - **산전 · 후 휴가** දඩුවම නිවාඩු	- **하계휴가** ගිම්හාන නිවාඩු - **경조 휴가** සම්මත නිවාඩු

유급 휴일 පඩි සහිත නිවාඩු

근로의 의무는 있으나 근로 기준법 등에 의거 근로가 면제되는 날로 유급으로 하고 쉬는 휴일입니다. 1주일에 평균 1회 이상 주어야 하는 임금이 지불되는 휴일을 말합니다(근로 기준법 제 55조). 이와 달리 근로의 의무가 있으나 취업 규칙, 단체 협약 등을 통하여 무급으로 하고 쉬는 휴일을 무급 휴일이라고 합니다.

වැඩ කිරීම සඳහා වගකීමක් තිබේ, එහෙත් එය කම්කරු ප්‍රමිති පනත යටතේ වැඩ නිදහස ලබන දිනයක ගෙවනු ලබන නිවාඩු දිනයකි. එය අර්ථය වන්නේ සතියකට අවම වශයෙන් සතියකට වරක් වැටුප් ගෙවනු ලබන නිවාඩු (කම්කරු ප්රමිති පනතේ 55 වන වගන්තිය) යි. අනෙක් අතට වැඩ කිරීම සඳහා වගකීමක් තිබේ.නමුත් රැකියා නීති රීති සාමූහික ගිවිසුම් ආදිය ගෙවා නොතිබීම නිවාඩු නොගෙවන නිවාඩු දින ලෙස හැඳින්වේ.



EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK



අංක 1 හා 2 හොඳින් සවන්දී කුමක් පිළිබඳ දෙබසක්ද යන්න තෝරන ප්‍රශ්න වේ, සවන්දීමට කලින් වචන හොඳින් කියවා බලන්න.

[1~2] 다음을 듣고 무엇에 대한 대화인지 고르십시오.
පහත දේ සවන් දී කුමක් සම්බන්ද සංවාදයක්ද යන්න තෝරන්න.



1. ① 병가 신청　② 병가 휴직　③ 병가 사유　④ 병가 기간

2. ① 무급 휴일　② 법정 휴일　③ 약정 휴일　④ 유급 휴일



අංක 3 සහ 4 නිවැරදි පිළිතුර තෝරන ප්‍රශ්න වේ, අංක 5 සංවාදයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන ප්‍රශ්නයක් වේ. සවන්දීමට පෙර පිළිතුර එක් වරක් කියවා බලන්න.

[3~4] 질문을 듣고 알맞은 대답을 고르십시오.
ප්‍රශ්නයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන්න.


3. ① 네, 휴직을 신청하세요.　② 네, 진단서를 제출하세요.
③ 네, 사유를 이야기하세요.　④ 네, 병가 기간을 확인하세요.

4. ① 연차 휴가를 냈어요.　② 지금 휴가 중이에요.
③ 휴가를 5일 받았어요.　④ 먼저 휴가를 신청하세요.

5. 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오.
සංවාදයට සවන් දී ප්‍රශ්ණයට ගැලපෙන් නිවැරදි පිළිතුරු තෝරන්න.

여자는 왜 고향에 가려고 합니까? ගැහැණු පුද්ගලයා කුමක් නිසා ගමට යන්න හදනවද?

① 어머니가 아프셔서　② 동생이 결혼을 해서
③ 중요한 약속이 있어서　④ 가족과 휴가를 보내려고



듣기 대본 ශ්‍රවණ පිටපත

1. 남: 얼마 동안 병가를 내실 예정이에요? කොපමණ කාලයක් ලෙඩ නිවාඩු දමන්න හිත සිටිනවද?
   여: 5일이면 될 것 같아요. දවස් 5 තිබුනොත් ඇති.
2. 여: 임금을 받고 쉬는 날이 있다던데요?
   පඩි සහිතව නිවාඩු ගන්න පුළුවන් දවස් තියනවා කියල අහන්න ලැබුනා.
   남: 네, 일주일에 하루는 일하지 않아도 임금을 받아요.
   ඔව් සතියකට දවසක් වැඩ නොකලත් පඩි ලැබෙනවා.
3. 남: 아파서 지난주에 1주일 동안 결근했는데 내야 할 서류가 있어요?
   අසනීප වෙලා ගිය සතියේ සතියක්ම වැඩට ආවේ නැති නිසා බාරදිය යුතු ලියකියවිලි තියෙනවද?
4. 여: 올해 쓸 수 있는 휴가가 있어요? මේ අවුරුද්දේ ලබාගත හැකි නිවාඩු තිබෙනවද?
5. 남: 이번 휴가에 고향에 가려고요? මෙවර නිවාඩුවට ගමේ යන්න කියල හිතන ඉන්නවා.
   여: 네, 어머니가 몸이 안 좋으셔서 다녀와야 할 것 같아요.
   ඔව්, අම්මට සනීප නැති නිසා ගිහිල්ල එනවා.
   남: 걱정이 많겠어요. 조심해서 다녀오세요. ගොඩක් කරදර වෙනවනේද? පරිස්සමට ගිහිල්ල එන්න.

정답 1. ④ 2. ④ 3. ② 4. ④ 5. ①

확장 연습 තවදුරටත් වන අභ්‍යාස



L-56

1. 대화를 듣고 질문에 알맞은 대답을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු තෝරන්න.

   여자가 고향에 가는 이유는 무엇입니까? කාන්තාවකට ගමට යන හේතුව කුමක්ද?

   ① 어머니가 편찮으셔서　　② 회사를 그만둬야 해서
   ③ 고향에서 일하기 위해서　　④ 연차를 신청하기 위해서

확장 연습 듣기 대본 තවදුරටත් වන අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 남: 리리 씨, 왜 갑자기 고향에 가는 거예요? 무슨 일 있어요?
   ලිලී මහත්මිය, ඇයි හදිස්සියෙන් ගමේ යන්නේ? මොකක් හරි හදිස්සි වැඩක් තියෙනවාද?
   여: 네, 어머니가 좀 아프셔서 뵙고 오려고요. ඔව්, අම්මට ටිකක් අසනීපයි. ටිකක් බලලා එන්නයි කියලා.
   남: 걱정이 많겠어요. 그런데 출국하려면 준비할 게 많죠?
   හිතට සැනසීමක් නැතුව ඇති එහෙනම්. සූදානම් කර ගන්න ගොඩක් දේවල් ඇති නේද?
   여: 네, 오늘 연차 신청하고 가족들 선물도 좀 사려고요.
   ඔව්, අද නිවාඩු ඉල්ලුම් කරලා පවුලේ අයට තෑගි ටිකකුත් ගන්නයි ඉන්නේ,



정답 1. ①



EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 හා 2 ගැලපෙන වචන තෝරන ප්‍රශ්න වේ, ඉහත ඉගෙනගත් වචන දෙස බලමින් පිළිතුරු සපයන්න.

[1~2] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

1.
올 여름에 회사에서 휴가를 __________ 고향에 다녀올 거예요.
මෙවර ග්‍රීස්මයට සමාගමෙන් නිවාඩු ලැබුනොත් ගමේ ගිහිල්ල එනවා.

① 내면 ② 쓰면 ③ 받으면 ④ 신청하면

2.
가: 안색이 안 좋아요. 일찍 들어가서 쉬는 게 어때요?
පෙනුම එතරම් හොඳ නැහැ, වේලපහ වැඩ ඉවරවී ගොස් විවේක ගන්න එක කොහොමද?
나: 네, __________ 먼저 들어가 보겠습니다. ඔව්, වේලපහ වැඩ ඉවරවී යන්නම්

① 결근하고 ② 조퇴하고 ③ 신청하고 ④ 휴직하고

අංක 3 හා 4 දෙබසේ මාතෘකාව තෝරන ප්‍රශ්න වේ, අංක 5 නිවාඩු දින පිළිබඳ ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

[3~4] 다음 질문에 답하십시오 මීළඟට ගැටලුවට පිළිතුරු සපයන්න.

3.
가: 아기를 낳을 때는 얼마 동안 쉬어요? දරු ප්‍රසූතියකට කොපමණ නිවාඩු ලැබෙනවද?
나: 3개월 동안 쉴 수 있도록 근로 기준법에 정해져 있어요.
මස 3 නිවාඩු ලබන්න පුළුවන් ලෙස කම්කරු නීතියේ දැක්වෙනවා.

두 사람은 무엇에 대해 이야기하고 있습니까? දෙදෙනා කුමක් පිලිබඳව කතාකරමින් සිටීද?

① 무급 휴가 ② 병가 휴가 ③ 연차 휴가 ④ 출산 휴가

4.
가: 그럼 회사에 연락도 없이 출근 안 한 거예요?
එහෙනම් සමාගමටත් නොදන්වා වැඩ අවසන් නොකලද?
나: 그런가 봐요. ඒ වගේ පෙන්නේ.

두 사람은 무엇에 대해 이야기하고 있습니까? දෙදෙනා කුමක් පිලිබඳව කතාකරමින් සිටීද?

① 병가 내다 ② 휴직하다 ③ 조퇴하다 ④ 무단결근하다

5.
㉠__________은 법으로 정한 날은 아니지만 회사가 휴일로 정하고 있는 날입니다. 유급으로 할 것인지 무급으로 할 것인지도 회사의 규정에 따라 다릅니다. 근로자의 날은 법정 휴일로 ㉠__________에 포함되지 않습니다.
(කලින් තීරණය කරගත් නිවාඩු දින), නීතිය මගින් තීරණය නොකලත් සමගම විසින් නිවාඩු දිනයන් ලෙස නම් කරනු ලබන දිනයන් වේ, සමාගමට අනුව පඩි රහිතද සහිතද යන්න වෙනස් වේ. කම්කරු දිනය නීතිය මගින් නියම කරගත් දිනයක් බැවින් එය (කලින් තීරණය කරගත් නිවාඩු දින)යකට අයත් නොවේ.

㉠에 들어갈 알맞은 말을 고르십시오. ㉠ට ගැලපෙන පිළිතුර තෝරන්න.

① 무급 휴일 ② 연차 휴일 ③ 약정 휴일 ④ 유급 휴일

정답 1. ③ 2. ② 3. ④ 4. ④ 5. ③



확장 연습 තවදුරටත් වන අභ්‍යාස

[1~2] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

1\.

> 이번 주 토요일부터 휴가라서 고향에 갑니다. 토요일에 ______을 해서 다음 주 금요일에 돌아오려고 합니다.
>
> මේ සතියේ සෙනසුරාදා නිවාඩු දවසක් බැවින් ගමේ යනවා. සෙනසුරාදා මෙරටින් පිටවී ලබන සතියේ සිකුරාදා අපසු එන්නයි ඉන්නේ.

① 입학 ② 출국
③ 출장 ④ 결근

2\.

> 연차 휴가는 유급 휴가이기 때문에 쉬지 않고 일한 사람한테는 ______을 줍니다.
>
> වාර්ෂික නිවාඩු. ගෙවුම් නිවාඩු බැවින් විවේක නොගෙන වැඩ කල පුද්ගලයන් හට අතිරේක දීමනා ගෙවනු ලැබේ

① 월급 ② 수당
③ 세금 ④ 일당

3\. 다음 글을 읽고 무엇에 대한 글인지 고르십시오.
පහත ඇති ඡේදය කියවා කුමක් සම්බන්ධව සඳහන් වී ඇත්ද යන්න තෝරන්න.

> 몸이 많이 아파서 일을 하기 어려울 때에는 병가를 내야 합니다. 병가를 낼 때는 병가 신청서와 필요한 병원 서류들을 회사에 제출하면 됩니다. 미리 제출할 수 없으면 나중에라도 내야 합니다.
>
> ඇඟට ගොඩක් අමාරු වී වැඩ කර ගන්න බැරි අවස්ථා වලදී ලෙඩ නිවාඩු දැමිය යුතුයි. ලෙඩ නිවාඩු දමන අවස්ථාවන්හිදී ලෙඩ නිවාඩු දැමීමේ ඉල්ලුම් පත්‍රය සහ අවශ්‍ය වන රෝහල් ලියකියවිලි ආයතනයට ලබා දිය යුතුයි. කළින් ලබා දීමට නොහැකි නම් පසුව වුවද ලබා දිය යුතුයි.

① 병가 신청 ② 건강 주의
③ 병원 방문 ④ 회사 생활

정답 1. ② 2. ② 3. ①

유용한 표현 වැදගත් යෙදුම්

한눈 팔면 안 돼요. අවධානය යොමු කරනවා (වෙන දෙයක් නොබලා)

가: **한눈 팔면 안 돼요.** 기계를 사용할 때는 위험해요.
අවධානය යොමු කරනවා (වෙන දෙයක් නොබලා). යන්ත්‍රය ක්‍රියාත්මක කරන විට අනතුරු දායකයි.

나: 네, 주의할게요. ඔව් පරිස්සම් වෙන්නම්.



사업장을 변경하고 싶은데


වැඩකරන ස්ථානය මාරුකරගන්න අවශ්‍ය වුනත්

학습 안내
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

□ අධ්‍යයන අරමුණු	වැඩකරන ස්ථානය මාරුකරන ක්‍රියාවලිය දැනගැනීම, තාවකාලිකව රටින් පිටවීමේ ක්‍රියාවලිය පරීක්ෂා කිරීමග.
□ ක්‍රියාකාරකම්	නැවත කොරියාවට ඇතුල්වීමට අවසර දීමේ ලේඛනය අවබෝධ කරගැනීම
□ වචන භාවිතය සඳහා උපදෙස්	වැඩකරන ස්ථානය මාරුකිරීම, නියමිත කාලයට පෙර ආපසු යාම හා තාවකාලිකව රටින් පිටවීම
□ සංස්කෘතික තොරතුරු	වැඩකරන ස්ථානය වෙනස් කිරීම



대화 1 සංවාදය 1





ආදිත් මහතා වෙනත් සමාගමකට මාරුවීමට සිතාගෙන වැඩකරන ස්ථානය වෙනස්කිරීමේ අයදුම්පතක් ඉදිරිපත්කිරීමට සැරසෙයි. දෙදෙනා කුමක් පිළිබඳව කතාකරනවාද කියා දෙබසට දෙවරක් සවන්දී ඉන්පසුව කියවා බලන්න.

카림 아딧, 너 회사 옮길 거라며? 무슨 일 있어?
ආදිත්‍ය ඔබ වෙනත් සමාගමකට යනවා කියන්නේ? මොකක්ද හේතුව?

아딧 우리 회사가 사정이 안 좋아서 곧 문을 닫을 것 같아. 그래서 사장님이 사업장 변경 신청서를 내라고 하시더라고.
අපේ සමාගමේ තත්වය අසතුටුදායක නිසා සමාගම වසාවී වගේ. ඒ නිසා ප්‍රධානියා වැඩකරන ස්ථානය මාරුකරන ඉල්ලුම්පතක් ඉදිරිපත් කරන්න කියලා පැවසුවා.

> **사정이 안 좋다**
> තත්වය හොඳ නැහැ

카림 그랬구나. 사장님도 힘드실 텐데 널 많이 생각해 주시는 것 같다.
ඒක තමයි. ප්‍රධානියටත් ගොඩක් අපහසුවුනත් ඔයා ගැනත් හිතනවා වගෙයි.

> **섭섭하다**
> දුකයි

아딧 맞아. 같이 일하면서 정이 많이 들었는데 너무 섭섭해. 그래도 난 계속 일을 해야 하니까……. 근데 사업장 변경 신청서는 근로 계약이 끝나고 한 달 이내에 해야 한다면서?
ඇත්ත, එකට වැඩකරමින් ගොඩක් සමීපවුනා වගෙයි. වෙන්වීමට සිදුවීම ගැන දුකයි. නමුත් මම දිගටම වැඩකලයුතු නිසා……. නමුත් වැඩකරන ස්ථානය වෙනස්කරන ඉල්ලීම වැඩ ගිවිසුම අවසන්වී මාසයක් ඇතුලත කරන්න ඕනෙලු?

> **정이 들다**
> සමීප වෙනවා

카림 응, 한 달 안에 고용 센터에 가서 제출해야 돼.
ඔව්, මාසයක් තුල රැකියා මධ්‍යස්ථානයට ගොස් බාරදිය යුතුයි.



හොඳින් සවන් දී නැවත කියෙවුවාද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 아딧 씨는 왜 회사를 옮기려고 해요? ආදිත්‍ය මහතා ඇයි වෙනත් සමාගමකට යන්න හදන්නේ?
2. 사업자 변경 신청서는 언제까지 내야 해요? වැඩකරන ස්ථානය වෙනස්කරන ඉල්ලුම්පත කවදාට කලින් බාරදිය යුතුද?

정답 1. 회사 사정이 안 좋아서 다닐 수가 없어요. 2. 근로 계약이 끝나고 한 달 이내에 내야 해요.



어휘 1 වචන මාලාව 1 사업장 변경 වැඩකරන ස්ථානය වෙනස් කිරීම



වැඩකරන ස්ථානය වෙනස් කරන්නේ කෙසේද? වැඩකරන ස්ථානය වෙනස්කිරීමට සම්බන්ධ වචන මොනවාදැයි බලමු.



근로계약이 만료되다
වැඩ ගිවිසුම කල් ඉකුත් වෙනවා



근로계약이 해지되다
වැඩ ගිවිසුම අවලංගු වෙනවා



계약을 갱신하다
ගිවිසුම අලුත් කරනවා



갱신을 거절하다
ගිවිසුම ප්‍රතික්ෂේප කරනවා



사업장 변경 이유
වැඩකරන ස්ථානය වෙනස්කිරීමට හේතු



임금을 체불하다
වැටුප් ගෙවනවා



휴업하다
තාවකාලිකව වසනවා




폐업하다
සම්පූර්ණයෙන්ම වසනවා




폭언을 하다
බනිනවා



폭행을 하다
පහර දෙනවා



사업장 변경 신청서
වැඩකරන ස්ථානය වෙනස්කිරීමේ ඉල්ලුම්පත



사업장 추가
අමතර වැඩකරන ස්ථාන

유용한 표현 වැදගත් යෙදුම්

큰일 날 뻔했네요. ලොකු කරදරයක් සිද්දවෙන්නයි ගියේ.

가: 버스 안에서 넘어졌어요. බස් එක ඇතුලේ වැටුනා.

나: **큰일 날 뻔했네요.** 괜찮아요? **ලොකු කරදරයක් වෙන්නයි ගියේ.** දැන් මොකද?



වචන දෙස නොබලා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 빈칸에 맞는 표현을 골라 대화를 완성하세요.

හිස්තැනට ගැළපෙන ප්‍රකාශය තෝරා සංවාදය සම්පූර්ණ කරන්න.

1)

가: 근로계약이 만료되면 어떻게 할 거예요?
වැඩ ගිවිසුම කල් ඉකුත්විමෙන් පසුව කුමක් කල යුතුද?
나: 계약을 ____________ 하려고요. 지금 다니는 회사가 좋은 것 같아서요.
ගිවිසුම අලුත් කරගැන්න කියලා. දැන් යන සමාගම හොඳයි වගේ.

① 갱신　　② 해지

2)

가: 더 이상 공장은 운영 안 하는 거예요? ඉදිරියට කර්මාන්ත ශාලාව පවත්වාගෙන යන්නේ නැද්ද?
나: 아니요, 사정이 있어서 지금은 잠시 ____________ 중이에요.
නැහැ. ගැටලුවකට මුහුණ පාපු නිසාවෙන් දැන් තාවකාලිකව වහලා තියෙන්නේ.

① 휴업　　② 폐업

3)

가: 근무지 ________은 몇 번까지 가능해요? වැඩකරන ස්ථානය කී වරක් වෙනස්කල හැකිද?
나: 3번까지는 바꿀 수 있는 걸로 알고 있어요. තුන්වරක් මාරුකරන්න පුළුවන් කියල දන්නවා.

① 신청　　② 변경

4)

가: 근무지를 바꾸고 싶은 이유가 있어요?
වැඩකරන ස්ථානය වෙනස්කිරිමට හේතුවක් තියනවාද?
나: 몇 달째 임금을 못 받았어요. ____________도 변경 사유가 되지요?
මාස කිහිපයක වැටුප් ලැබුනේ නැහැ .වැටුප් නොලැබීමත් වෙනස්කිරීමට හේතුවක් විය හැකියි නේද?

① 해고　　② 임금 체불

2. 그림을 보고 알맞은 말을 연결하세요.

පින්තූරය දෙස බලා ගැලපෙන වචනය යා කරන්න.

①　②　③　④

㉠ 폭행을 하다　㉡ 폭언을 하다　㉢ 휴업하다　㉣ 폐업하다

정답 1) ① 2) ① 3) ② 4) ② 2. ① ㉡ ② ㉠ ③ ㉣ ④ ㉢



대화 2 සංවාදය 2

Track 176



ආදිත් මහතා පියා නිසාවෙන් ගමේ ගොස් පැමිණීමට බලාපොරොත්තු වේ. දෙදෙනා කුමක් ගැන කතාකරනවද කියා දෙබසට මුලින්ම දෙවරක් සවන් දෙන්න.

아딧 아버지가 지난달에 큰 수술을 받으셨어.
තාත්තා ගිය මාසයේ ලොකු සැත්කමකට මුහුණ දුන්නා.

이반 정말? 이제 좀 어떠셔?
ඇත්තද? දැන් කොහොමද?

아딧 많이 안 좋으신 것 같아. 아무래도 고향에 다녀와야 할 것 같은데…….
එතරම් හොඳ නැහැ වගේ. කොහොම වුනත් ගමේ ගිහිල්ල එන්න ඕනේ…….

이반 걱정이 많겠다. 고향에 가게 되면 지금 일은 어떻게 하고?
ගොඩක් කරදර වෙනවා වගේ. ගමේ යනවානම් දැන්කරන රැකියාවට මොකද කරන්නේ?

아딧 일시 출국했다가 재입국하는 방법이 있다고 들었어. 그런데 회사가 한창 바쁠 때라서 말 꺼내기가 쉽지 않네.
තාවකාලිකව රටින් පිටවී නැවත පැමිණියහැකි ක්‍රමයක් තියනවා කියල අහන්න ලැබුනා. ඒත් සමාගමේ වැඩ අධික කාලය නිසාවෙන් කියන එක ලේසි නැහැ.

이반 그렇겠다. 그래도 사장님께 한번 이야기해 봐.
එක තමයි.නමුත් ප්‍රධානියාට කියල බලන්න.

말을 꺼내다 කතා කරනවා

한창 ගොඩක්



මෙවර ආදිත්‍ය මහතා හා ඉවාන් මහතා බවට පත්වී දෙබස නැවත කියන්න. හොඳින් අසා නැවත කියෙවුවාද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 아딧 씨는 왜 고향에 다녀오려고 해요? ආදිත්‍ය මහතා ඇයි ගමේ යන්න හදන්නේ?

2. 아딧 씨는 사장님께 왜 일시 출국하고 싶다는 말을 쉽게 얘기하지 못해요? ආදිත්‍ය මහතා තාවකාලිකව රටින් පිටවී යන බව ප්‍රධානියාට පැවසීම අපහසු යයි පවසන්නේ ඇයි?

정답 1. 아버지가 편찮으셔서 고향에 다녀오려고 해요. 2. 회사가 한창 바쁘기 때문에 얘기하기가 쉽지 않아서요.



어휘 2 වචන මාලාව 2

조기 귀국과 일시 출국
කලින් රටට ආපසු යාම සහ තාවකාලිකව රටින් පිටවීම



පෞද්ගලික හේතුමත තාවකාලිකව රටින් පිටවීමට අවශ්‍ය නම් කුමක් කල යුතුද? කලින් රටට ආපසු යාම හා තාවකාලිකව රටින් පිටවීමට සම්බන්ධ වචන ඉගෙන ගනිමු?




조기 귀국하다
කලින් රටට ආපසු යාම




일시 출국하다
තාවකාලිකව රටින් පිටවීම



재입국하다
නැවත රටට ඇතුල්වීම



면제되다
රැකියාවෙන් නිදහස් වෙනවා



개인 사정
පෞද්ගලික හේතු



집안 사정
පවුලේ යම් හේතුවක්



병환
අසනීප තත්වයෙන් පසු වෙනවා



편찮으시다
අසනීප වෙනවා

재입국 허가 신청서
නැවත රටට ඇතුල්වීමට ඉල්ලීම

동의서(허가서)
අවසර ලබාදීමේ ලිපිය

출국 예정 신고서
රටින් පිටවීමේ සැලසුම දැනුම්දෙන ලිපිය

Tip 일시 출국 තාවකාලිකව පිටවීම

본인의 결혼이나 부모님의 병환 등과 같은 사정으로 일시적으로 출국하기를 원할 경우, 사업주의 동의를 얻어서 고향에 다녀올 수 있습니다. 출국 전에 미리 재입국 허가 신청서를 제출하면 재입국 시 재입국 허가가 면제됩니다.


තමන්ගේ විවාහය සහ දෙමාපියන්ගේ රෝග තත්වයක් වැනි හේතුවකට තාවකාලිකව රටින් පිටවීමට බලාපොරොත්තු වනවිට සමාගමේ අවසරය ලබාගෙන ගමේ ගොස් පැමිණීමට හැකිය. රටින් පිටවීමට පෙර නැවත රටට ඇතුල්වීමේ ඉල්ලීම්පත යැවිය යුතු අතර නැවත රටට අතුල්වනවිට ඇතුල්වීමට අවසර ලබාදෙනවා.



වචන දෙස නොබලා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 그림에 맞는 표현을 〈보기〉에서 골라 넣으세요.

පින්තූරයට ගැලපෙන යෙදුම උදාහරණ වලින් තෝරා දමන්න.



1) ______ → 2) ______ → 3) ______ → 4) ______

보기　퇴사하다　　조기 귀국하다　　출국 예정 신고서를 제출하다　　개인 사정이 생기다

2. 빈칸에 맞는 표현을 골라 대화를 완성하세요.

හිස්තැනට ගැළපෙන ප්‍රකාශය තෝරා සංවාදය සම්පූර්ණ කරන්න.

1)

가: 개인적인 사정이 생겨서 고향에 잠시 다녀오게 됐어요.
　පෞද්ගලික හේතුවක් නිසාවෙන් ටිකකට ගමේ ගිහිල්ල එන්න වෙනවා.

나: 네, 반장님께 들었어요. __________ 신청서는 제출했어요?
　ඔව්, කණ්ඩායම් නායකතුමාගෙන් අසන්න ලැබුනා.නැවත ඇතුල්වීමේ ඉල්ලුම්පත ඉදිරිපත් කලාද?

① 사업장 변경　　② 재입국 허가

2)

가: 이렇게 빨리 고향에 돌아가는 거예요? මෙච්චර ඉක්මනට ගමේ ගිහිල්ල එන්න යනවද?

나: 네, 어머니가 편찮으셔서 __________하게 됐어요.
　ඔව්. අම්මට අසනීප නිසා කලින් යන්න වෙනවා.

① 재입국　　② 조기 귀국

3)

가: 이번 주까지 근무하고 다음 주 출국이죠?
　මේ සතිය දක්වා වැඩකරලා ලබන සතියේ රටින් පිටවෙනවා නේද?

나: 네, 금요일에 __________ 나면 출국 준비하려고요.
　ඔව්. සිකුරාදා වැඩ අවසන් වී රටින් පිටවීමට සූදානම් වෙනවා.

① 신고하고　　② 퇴사하고

4)

가: 재입국 허가 신청서를 제출하고 일시 출국했다가 입국하면 다시 허가를 받아야 해요?
